326 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 326 - இல. 02
Volume 326 - No. 02

2026 අප්‍රේල් 08 වන බදාදා
2026 ஏப்பிரல் 08, புதன்கிழமை
Wednesday, 08th April, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 221-235]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

උතුරු හා නැඟෙනහිර පුරාවිද්‍යාත්මක ස්ථාන [තීරුව 235]

විදේශ විනිමය ගනුදෙනුවලදී ගෝලීය වශයෙන් පිළිගත් ඩිජිටල් ගෙවීම් වේදිකා භාවිතය [තීරුව 247]

**කල්තැබීමේ යෝජනාව:**

මැද පෙරදිග යුද්ධය හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට වන බලපෑම අවම කිරීම [තීරු 251-384]


---

# பிரதான உள்ளடக்கம்


**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 221-235]

**தனி அறிவித்தல் மூல வினா:**

வடக்கு மற்றும் கிழக்கிலுள்ள தொல்பொருளியல் இடங்கள் [ப: 235]

வெளிநாட்டுப் பரிவர்த்தனைகளின்போது உலகளவில் அங்கீகரிக்கப்பட்ட டிஜிட்டல் கட்டண தளங்களைப் பயன்படுத்துதல் [ப: 247]

**ஒத்திவைப்புப் பிரேரணை:**

மத்திய கிழக்குப் போர் இலங்கையின் பொருளாதாரத்தின்மீது செலுத்தும் தாக்கத்தைக் குறைத்தல் [ப: 251-384]


---

# PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS [Cols. 221-235]

QUESTION BY PRIVATE NOTICE:

Archaeological Sites in North and East [Col. 235]

Use of Globally Recognized Digital Payment Platforms in Foreign Exchange Transactions [Col. 247]

ADJOURNMENT MOTION:

Mitigate the Impact of Middle Eastern War on Sri Lanka's Economy [Cols. 251-384]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 අප්‍රේල් 08වන බදාදා***
*2026 ஏப்பிரல் 08, புதன்கிழமை*
*Wednesday, 08th April, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Report on the observations and steps taken in terms of the Standing Order No. 120(4) of the Parliament with regard to the matters mentioned on the Ministry of Finance, Planning and Economic Development in the Report of the Committee on Public Enterprises, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Enterprises.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Speaker, I present the Report on the submission of observations and steps taken in terms of the Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the Parliament of Sri Lanka in the report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා සී/ස හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) පානදුර, වලාන පාර, අංක 01 යන ලිපිනයෙහි පදිංචි අනුදි යසාරා ප්‍රනාන්දු මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම;

(2) පානදුර, වෑකඩ, කල්දේරම් මඩුවත්ත, අංක 321/ජී යන ලිපිනයෙහි පදිංචි ජානක ඉඳුනිල් අබයවීර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) පානදුර, දිබ්බැද්ද, කහටගහවත්ත, දෙවන පටුමඟ, අංක 142/47 යන ලිපිනයෙහි පදිංචි කාලිංග ගනනාත් පේදුරුආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) පානදුර, වදුරාමුල්ල, සිරි රහල් මාවත, අංක 276/2ඒ යන ලිපිනයෙහි පදිංචි පී. චින්තා පීරිස් මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අරුණ පනාගොඩ මහතා**
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මත්තේගොඩ, ජාතික නිවාස සංකීර්ණය, අංක 10බී - 8/109, ප්‍රජා ශක්ති සංවර්ධන සමිතියේ සභාපති අමිල තාරක ආයුවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) හෝමාගම, සමගි මාවත, අංක 271/4 යන ලිපිනයෙහි පදිංචි එම්.ජී. ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -1318/2025- (1), ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### මුල්ලියවලෛ තැපැල් කාර්යාලය: ස්ථිර ගොඩනැඟිල්ලක්
### முள்ளியவளை அஞ்சல் அலுவலகம்: நிரந்தரக் கட்டடம்
### MULLIYAWALAI POST OFFICE: PERMANENT BUILDING

1456/2025

**2. ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුලතිව්, මුල්ලියවලෛ තැපැල් කාර්යාලය ආරම්භයේ සිට මේ දක්වා කුලී ගොඩනැඟිල්ලක ක්‍රියාත්මක වන බවත්;

(ii) ඒ සඳහා වෙන් කර ඇති භූමිය මේ වන විට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යටතේ පවතින බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) උතුරු පළාතේ මේ වන විට පෞද්ගලික ගොඩනැඟිලිවල ස්ථාපිත කර ඇති තැපැල් කාර්යාල සංඛ්‍යාව සහ ඒවා සඳහා ගෙවනු ලබන මාසික කුලී මුදල එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මුල්ලියවලෛ තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට ගනු ලබන පියවර කවරේද;

(iii) ඒ සඳහා 2026 අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடாக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு, முள்ளியவளை அஞ்சல் அலுவலகம் ஆரம்பத்திலிருந்து இன்றுவரை வாடகைக் கட்டடத்தில் இயங்குகின்றது என்பதையும்;

(ii) அந்த அலுவலகத்துக்கென ஏற்கெனவே ஒதுக்கப் பட்டுள்ள காணி தற்போது இராணுவத்தின் வசமுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) வட மாகாணத்தில் தற்போது தனியார் கட்டடங்களில் நிறுவப்பட்டுள்ள அஞ்சல் அலுவலகங்களின் எண்ணிக்கை மற்றும் அவற்றுக்கென செலுத்தப்படுகின்ற மொத்த வாடகைத் தொகை மாவட்ட வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) முள்ளியவளை அஞ்சல் அலுவலகத்துக்காக நிரந்தரக் கட்டடமொன்றை அமைக்க எடுக்க விருக்கும் நடவடிக்கை யாது என்பதையும்;

(iii) அதற்கென 2026 வரவு செலவுத்திட்டத்தில் நிதி ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Is he aware that the -

(i) Mullaitivu, Mulliyawalai Post Office has been operating in a rented building since its inception; and

(ii) land allocated for it is currently under the Sri Lanka Army?

(b) Will he inform this House -

(i) separately, as per district, the number of post offices currently established in private buildings in the Northern Province and the monthly rent paid for them;

(ii) the steps that will be taken to build a permanent building for the Mulliyawalai Post Office; and

(iii) whether allocations have been made for it in the Budget, 2026?

(c) If not, why?

**ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

මුල්ලියවලෛ තැපැල් කාර්යාලය පෞද්ගලික ගොඩනැඟිල්ලක දැනට කුලී පදනම මත පවත්වා ගෙන යනු ලබයි. මුල්ලියවලෛ තැපැල් කාර්යාලය සඳහා වෙන් කර ඇති භූමිය මේ වන විට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 23වන බල ඇණිය විසින් භාවිත කරනු ලබයි. එම භූමිය 2026 ජූලි මාසය වන විට නිදහස් කර දීමට යුද්ධ හමුදාව වෙතින් වාචික තහවුරුවක් ලැබී තිබේ.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයේ (ආ) (i) කොටසට අදාළව list එකක් තිබෙනවා. එහි තැපැල් කාර්යාල 24ක් ගැන සඳහන් කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාට අවශ්‍ය නම් මට ඒක කියවන්න පුළුවන්. එහෙම නැත්නම් සභාගත කරන්න පුළුවන්. There is a list of 24 post offices. May I proceed to read it?

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
ஆம். வாசித்தால் நல்லதென நினைக்கின்றேன்.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
All right.

(ආ) (i)

| No. | Rental paying post office | Monthly Rental - (Rs.) January 2026 |
|---|---|---|
| **Regional Superintendent of Posts** | | |
| 01. | Achchuveli | 25,000.00 |
| 02. | Kaithady | 35,000.00 |
| 03. | Kankesanthurai | 32,000.00 |
| 04. | Karaveddi | 30,000.00 |
| 05. | Kyts | 6,000.00 |
| 06. | Kodikamam | 50,000.00 |
| 07. | Kokuvil | 25,500.00 |
| 08. | Kopai | 20,000.00 |
| 09. | Manipai | 35,000.00 |
| 10. | Nainativu | 11,000.00 |
| 11. | Pandatharippu | 12,000.00 |
| 12. | Point Pedro | 37,500.00 |
| 13. | Thellippalai | 20,000.00 |
| 14. | Urumpirai | 17,500.00 |
| 15. | Valvettithurai | 30,000.00 |
| 16. | Vannarpannai | 25,000.00 |
| 17. | Velanai | 12,000.00 |
| 18. | Pungudutivu | 13,000.00 |
| **Regional Superintendent of Posts - Mullaitivu** | | |
| 01. | Mulliyawalai | 20,000.00 |
| 02. | Puthuk-kudiyiruppu | 23,000.00 |
| **Regional Superintendent of Posts - Mannar** | | |
| 01. | Chillawathurai | 5,000.00 |
| 02. | Erukkalampiddy | 27,500.00 |
| 03. | Pesalai | 14,000.00 |
| 04. | Chankalei | 40,000.00 |

(ii) මුල්ලියවලෛ තැපැල් කාර්යාලය සඳහා වෙන් කර ඇති, දැනට යුද්ධ හමුදාව විසින් භාවිත කරනු ලබන ඉඩම විධිමත් පරිදි තැපැල් දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.

(iii) 2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් වී නැත. එම ඉඩම් කොටස විධිමත් පරිදි තවම පවරාගෙන අවසන්ව නැති බැවින්, 2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන නොමැති වුවත් ඉඩම නිරවුල් කර ගැනීමෙන් අනතුරුව 2027 වර්ෂය සඳහා තැපැල් කාර්යාලය ඉදි කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීමට හැකියාව තිබේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ சபாநாயகர் அவர்களே, இற்றைக்கு 40 ஆண்டுகளுக்கு முன்னர் இருந்தே முள்ளியவளை அஞ்சல் அலுவலகத்தின் ஊடான சேவை வழங்கல் தரமுயர்த்தப்பட்டு நடைபெறுவதாக அறிய முடிகின்றது. ஆனால், அதற்கான நிரந்தரக் கட்டடம் மற்றும் காணிதான் இல்லை. தொடர்ந்து வாடகைக் கட்டடங்களில் இயங்கிவரும் முள்ளியவளை அஞ்சல் அலுவலகத்துக்கான காணி அளவீடு 1986.07.02ஆம் திகதி மேற்கொள்ளப்பட்டு, அஞ்சல் அலுவலகக் கட்டடத்துக்குக்கான வரைபடமும் தயாரிக்கப்பட்டிருந்தது. (P Plan No M21 Survey Map)

கேப்பாப்புலவு தொடக்கம் குமுழமுனை வரையான கிட்டத்தட்ட 22 கிராம அலுவலர் பிரிவுகளுக்கான அஞ்சல் சேவைகளை வழங்கும் குறித்த அஞ்சல் அலுவலகத்துக்குரிய காணி, இராணுவ கையகப்படுத்தலில் அவர்களின் பயன்பாட்டில் இல்லாத வெற்றுக் காணியாகவே காணப்படுகின்றது. அதாவது, இராணுவத்தின் கட்டுப்பாட்டில் இருக்கின்ற அந்தக் காணியில் எந்தவிதக் கட்டடங்களும் இல்லை. தேசிய மக்கள் சக்தியின் ஆட்சியில் இராணுவம் உள்ளடங்கலாக பல்வேறு திணைக்களங்களினதும் ஆக்கிரமிப்பிலுள்ள காணிகள் விடுவிக்கப்படுவதற்கான ஒழுங்குகள் நடைபெறுவதாகக் கூறப்படும் இவ்வேளையில், முள்ளியவளை அஞ்சல் அலுவலகத்துக்கென 35 ஆண்டுகளுக்கு முன்னர் அளவீடு செய்து வரைபடம் தயாரிக்கப்பட்ட குறித்த காணியை - இராணுவக் கையகப்படுத்தலிலும் பயன்பாடற்று காணப்படும் குறித்த காணியை - இவ்வாண்டே விடுவிப்பதற்குரிய தலையீட்டை வெகுசன ஊடகப் பிரதி அமைச்சர் என்ற வகையில் தாங்கள் மேற்கொள்வீர்களா? என்பதை என்னுடைய முதலாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)

ගරු කථානායකතුමනි, වැදගත් ප්‍රශ්නයක් එතුමා ඇහුවේ. ඇත්තටම උතුරේ ඉඩම් නිදහස් කිරීම අපි ක්‍රමයෙන් කරගෙන යන එකක්. එය ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. මේ ඉඩම නිදහස් කර ගැනීම සඳහා මැනුම් කටයුතු අපි ආරම්භ කරලා තිබෙන බව. ඒ පිළිබඳව පෞද්ගලිකව තහවුරුවක් ලැබිලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය නිවැරදියි. 1986දී ඒකට හදපු ගොඩනැඟිලි සැලසුමක් තිබෙනවා. ඉඩමේ සැලසුම අනුමත වෙලා තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වනවා ඉතා ඉක්මනින් ඉඩම නිදහස් කරගෙන නව ගොඩනැඟිල්ලක් ඉදි කරන්න.

ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි, අපි පසුගිය කාලය තුළ ලංකාව පුරාම තැපැල් කාර්යාල නව ගොඩනැඟිලි 18ක් සහ ගොඩනැඟිලි අලුත්වැඩියා කටයුතු 211ක් කර තිබෙන බව. ඒ සඳහා වැය වුණු සම්පූර්ණ මුදල රුපියල් මිලියන 1,200ක්. අපි මේ වර්ෂයේත්, ලබන වර්ෂයේත් දිගටම තැපැල් කාර්යාල සඳහා නව ගොඩනැඟිලි ඉදිකිරීමේ සහ නඩත්තු කිරීමේ කටයුතු කරනවා. මම ගරු මන්ත්‍රීතුමාට දැනුම් දෙන්න කැමැතියි, මේ ඉඩම නිදහස් කර ගැනීම ජූලි මාසය වන විට අවසන් කරන්න බලාපොරොත්තු වන බව. ඉන් පසුව ලබන අවුරුද්දේ නව ගොඩනැඟිලි ඉදිකිරීමේ කටයුතු ගැන සොයා බලන්නම් කියලාත් මම එතුමාට දැනුම් දෙන්න කැමැතියි.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

வட மாகாணத்திலுள்ள 5 மாவட்டங்களில் மிகவும் தாமதமான அஞ்சல் சேவைகள் நடைபெறும் மாவட்டமாக முல்லைத்தீவு மாவட்டமே காணப்படுகின்றது. 'வடக்கின் வசந்தம்' திட்டத்தின் ஊடாக முல்லைத்தீவுக்கு வழங்கப்பட்ட அஞ்சல் பரிவர்த்தனை வாகனம், கொரோனா இடர்காலப்பகுதியில் மீளப் பெற்றுக் கொள்ளப்பட்டது. அதன் பின்னர், மாவட்டத்துக்குரிய அஞ்சல் சேவைகள் பேருந்துகள் ஊடாகவே இடம்பெறுகின்றன. முல்லைத்தீவுக்கு உள்ளேயே, முல்லைத்தீவில் இருந்து 30 கிலோமீற்றர் தொலைவிலுள்ள உடையார்கட்டுக்கு ஓர் அஞ்சலை, சாதாரண அஞ்சலாகவோ, பதிவஞ்சலாகவோ, ஏன் விரைவு அஞ்சலாகவோ அனுப்புவ தென்றாலும்கூட, குறைந்தது 3 நாட்கள் எடுக்கும். இந்த அவல நிலை இலங்கையிலேயே அங்குதான் காணப் படுகின்றதென நான் நினைக்கின்றேன். இதனால் அரச திணைக்களங்களில் இருந்து பல நிறுவனக் கட்டமைப்புகளில் அஞ்சல் பரிமாற்றம் மீதான நம்பிக்கையீனம் முல்லைத்தீவில் கூடிக்கொண்டே செல்கின்றது. மாவட்டத்துக்கு குறைந்தது ஒரு வாகனமாவது இருக்கின்றபோது, இவ்வாறான தாமத அஞ்சல் சேவை இடம்பெறுவதற்கு வாய்ப்பில்லை. கடந்த காலத்தில் முல்லைத்தீவுக்கென வழங்கப்பட்ட அஞ்சல் பரிவர்த்தனை வாகனத்தை மீண்டும் முல்லைத்தீவுக்கு இவ்வாண்டே வழங்கி, அஞ்சல் சேவைகளின் சமத்துவ நிலையை முல்லைத்தீவிலும் உறுதிப்படுத்துவீர்களா? என கௌரவ பிரதி அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)

ගරු කථානායකතුමනි, මම එතුමාට ස්තුතිවන්ත වෙනවා ඒ තොරතුර දැනුම් දීම වෙනුවෙන්. අපි ගිය අවුරුද්දේ අලුත් වාහන මිලදී ගැනීම් කළා. නමුත්, මුලතිව් දිස්ත්‍රික්කය ගැන මේ අවස්ථාවේ මම පෞද්ගලිකව දැනුවත් නැහැ. මේ අවුරුද්දේත් අපි අලුත් වාහන මිලදී ගැනීම් කරනවා. මම අද දවස ඇතුළත තැපැල්පතිතුමා සමඟ සාකච්ඡා කරලා අපට ඒ වාහනය නැවත ලබා දෙන්න පුළුවන්ද, තිබෙන තත්ත්වය මොකක්ද කියලා ඔබතුමාට දැනුම් දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -1563/2025- (2), ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -1651/2025- (2), ගරු සුනිල් රත්නසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -1655/2025- (2), ගරු චානක මාදුගොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 1 -1318/2025- (1), ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல்வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ எம்.எஸ். உதுமாலெப்பை சார்பாக நான் அந்த வினாவைக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.*
*Question ordered to stand down.*

## විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය: පුරප්පාඩු
### பல்கலைக்கழகங்களின் கல்விசார் பணியாட்டொகுதி: வெற்றிடங்கள்
### ACADEMIC STAFF OF UNIVERSITIES: VACANCIES

1563/2025

**3. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා වෙනුවට)**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி-மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. (Prof.) L.M. Abeywickrama)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය පාඨමාලා වෙනුවෙන්, 2023 වර්ෂය සඳහා බඳවාගත් සිසුන්ගේ පාඨමාලා මේ දක්වා ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(iv) එම පාඨමාලා ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் பல்கலைக்கழகங்களில் கல்விசார் பணியாட்டொகுதியில் தற்பொழுது நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கு எடுக்கப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) உருகுணை பல்கலைக்கழகத்தில் 2023ஆம் ஆண்டில் இணைச் சுகாதார பாடநெறிகளுக்கு இணைத்துக்கொள்ளப்பட்ட மாணவர்களுக்கான பாடநெறிகள் இதுவரை ஆரம்பிக்கப்படாது உள்ளமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி பாடநெறிகள் ஆரம்பிக்கப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of vacancies currently existing in the academic staff of the universities of Sri Lanka;

(ii) the measures that have been taken to fill those vacancies;

(iii) the reasons for not commencing the Allied Health Science Courses for the students who were enrolled to the University of Ruhuna in year 2023 so far; and

(iv) the date on which the said courses will be commenced?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| විශ්වවිද්‍යාලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන විශ්වවිද්‍යාලය | 3027 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 22 |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 08 |
| වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | 09 |
| ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය | 07 |
| ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 70 |

(ii) <u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන විශ්වවිද්‍යාල</u>

2026.03.30 දිනට අත්‍යවශ්‍ය සේවක පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා විශ්වවිද්‍යාලවලින් ලැබෙන ඉල්ලීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් පවතින අතර ඒ සඳහා අනුමැතිය ලබා දුන් පසු බඳවා ගැනීමේ කටයුතු අදාළ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විසින් කරනු ලැබේ.

තවද, 2025/2026 වසරේදී සහාපති/රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය හා කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීමේ නිලධාරි කමිටුවේ නිර්දේශ මත අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද උක්ත අධ්‍යයන සේවක පුරප්පාඩු 3,027 අතරින් පුරප්පාඩු 1,458ක් සඳහා බඳවා ගැනීම අදාළ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විසින් මේ වනවිට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර 2026.02.26 දිනට අධ්‍යයන සේවක පුරප්පාඩු 445ක් සඳහා බඳවා ගැනීම අවසන් කර ඇති අතර ඉතිරි තනතුරු පුරප්පාඩු පිරවීම සිදු කරමින් පවතී.

<u>ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය</u>

අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් 2025.07.22 දිනැතිව යොමු කරන ලද රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීමේ කමිටුව විසින් 2025 වර්ෂයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II/I)/කථිකාචාර්ය (ස්ථිර නොකළ) කථිකාචාර්ය (ආධුනික) තනතුරු 08ක් අනුමත කර තිබුණි. 2024.03.13 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II/I)/කථිකාචාර්ය (ස්ථිර නොකළ) කථිකාචාර්ය (ආධුනික) තනතුරු 04ක් සහ කථිකාචාර්ය (තාවකාලික) තනතුරු 10ක් අනුමත කර තිබුණි.

මේ වනවිට අනුමත කරන ලද ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II/I)/ කථිකාචාර්ය (ස්ථිර නොකළ), කථිකාචාර්ය (ආධුනික) තනතුරු12 අතරින් තනතුරු 06ක් බඳවා ගෙන ඇත. ඉතිරි තනතුරු 06න් තනතුරු 04ක සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කොට පාලක සභාව වෙත යොමු කර ඇත. එක් තනතුරක සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතය. අනුමත කරන ලද කථිකාචාර්ය (තාවකාලික) තනතුරු 10න් 05ක් බඳවා ගෙන ඇති අතර කථිකාචාර්ය (තාවකාලික) තනතුරු 02ක සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර පාලක සභාව වෙත යොමු කර ඇත. ඉතිරි කථිකාචාර්ය (තාවකාලික) තනතුරු 03 සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

තවද, මේ වනවිට නැවත පුරප්පාඩුව පවතින විශ්‍රාන්ත මහාචාර්ය තනතුරු 04 සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II/I)/ කථිකාචාර්ය (ස්ථිර නොකළ)/ කථිකාචාර්ය (ආධුනික) 07ක් පිරවීම සඳහා නැවත ඉල්ලීමක් බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණ කමිටුව වෙත යොමු කිරීමට නියමිතය.

<u>ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය</u>

පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

[ගරු නිහාල් ගලප්පත්ති මහතා ]

| අනු අංකය | පුරප්පාඩු වී ඇති වූ තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩුව පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| 01 | මහාචාර්ය (ප්‍රමුඛ) | 03 | 2025.08.10 දින පළ කරන ලද පුවත්පත් දැන්වීමකට අනුව මහාචාර්ය (ප්‍රමුඛ) එක් අයදුම්පතක් ලැබුණු අතර, ඊට අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතී. අනෙක් පුරප්පාඩු තනතුරු 02ක බඳවා ගැනීම් සඳහා අයදුම්පත් කැඳවීමට 2026.01.18 වන දින පුවත්පත් දැන්වීම් පළ කරන ලද අතර බඳවා ගැනීමට අදාළ ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| 02 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/II කථිකාචාර්ය, කථිකාචාර්ය (ආධුනික) | 02 | පුරප්පාඩුව ඇති තනතුරු 02න් එක් තනතුරක් බඳවා ගැනීම සඳහා 2025.12.22වන දින අනුමැතිය ලැබී ඇති අතර, ඒ සඳහා අයදුම්පත් කැඳවීමට 2026.01.18 දින පුවත්පත් දැන්වීම් පළ කර ඇත. 2025.12.31 දින සිට කථිකාචාර්ය තනතුරේ සේවය කරන ලද ස්වාමීන් වහන්සේ නමක් සේවයෙන් ඉල්ලා අස්වී ඇති අතර එම පුරප්පාඩුව පිරවීම සඳහා රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණ කමිටුව වෙත අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| 03 | උපදේශක (බෞද්ධ) | 01 | බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබී නොමැත. |
| 04 | උපදේශක (චීන) | 01 | චීන භාෂා උපදේශක තනතුරට බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබී ඇති නමුත්, එම තනතුරට අදාළ බඳවා ගැනීම් පරිපාටි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මේ දක්වා සකස් කර නොමැති බැවින් එම පරිපාටි සකස් කළ පසුව බඳවා ගැනීමේ කටයුතු සිදු කරනු ඇත. |
| 05 | උපදේශක (ජපන්) | 01 | ජපන් භාෂා උපදේශක තනතුර අදාළ බඳවා ගැනීම් සිදු කිරීම සඳහා අනුමැතිය ලැබී නොමැති අතර, බඳවා ගැනීමේ පරිපාටි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මේ දක්වා සකස් කර නොමැත. |

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සම්පූර්ණ පුරප්පාඩු සංඛ්‍යාව - 08

<u>වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය</u>

මහාචාර්ය තනතුරු 01ක් හා කථිකාචාර්ය තනතුරු පුරප්පාඩු 09ක් සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය ලැබී ඇති අතර, කථිකාචාර්ය තනතුරු 07ක් සඳහා මේ වනවිට සම්මුඛ පරීක්ෂණ කැඳවා ඇත. මේ අතරින් පුරප්පාඩු වී ඇති මහාචාර්ය තනතුර සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය ලැබී ඇති අතර, ඒ සඳහා අභ්‍යන්තර උසස්වීම් සලකා බලමින් ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

<u>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය</u>

අදාළ තනතුරු පුරප්පාඩු 07 සඳහා බඳවා ගැනීමට මේ වනවිට පුවත්පත් දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවා ඇති අතර, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතය.

<u>ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය</u>

රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණ කමිටුව වෙත ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් 2024 දෙසැම්බර් 31 දිනට තිබූ අධ්‍යයන පුරප්පාඩු 54ක් බඳවා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කළ ඉල්ලීම සඳහා 2025 අගෝස්තු මස 19 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය හරහා තනතුරු 30ක් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සිදු කිරීමට නියමිතය.

තවද, 2025 අගෝස්තු මස 19 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් ලද අධ්‍යයන පුරප්පාඩු 30ට අමතරව ඒ වනවිට ඇති වී තිබූ ඉතිරි තනතුරු පුරප්පාඩු 40 බඳවා ගැනීම සඳහා වන ඉල්ලීම රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට 2025 සැප්තැම්බර් මස 14 දින ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා කමිටුවේ අනුමැතිය අපේක්ෂිතය.

(iii) රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ දැඩි හිඟය හේතුවෙන් ඉහත ශිෂ්‍ය කණ්ඩායම සඳහා අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමේදී ප්‍රමාදයක් ඇති විය.

අධ්‍යයන කාර්ය මණ්ඩලය 104ක් සිටිය යුතු වුවද මේ වනවිට රාජකාරි කටයුතු සිදු කරනු ලබන සාමාජිකයන් ගණන 43කි. තවද අනධ්‍යයන කාර්ය මණ්ඩලයේද මේ වනවිට රාජකාරි කටයුතු සිදු කිරීමට නිලධාරින් 49 දෙනෙකු පමණක් සිටින අතර ඉන් 13 දෙනෙකු අධ්‍යයන නිවාඩු ලබාගෙන ඇත.

ඒ අනුව, මෙම පීඨයේ පවතින කාර්ය මණ්ඩලවල පුරප්පාඩු සඳහා අනුමත තාවකාලික කාර්ය මණ්ඩලයෙන් 20ක් බඳවා ගැනීමට 2025.12.20 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන් අතර ඒ අනුව අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 17 දෙනෙකු හා අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 03 දෙනෙකු බඳවාගෙන ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2025.09.19 දිනැතිව අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 79ක් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇත. ඒ අතරින් තනතුරු 51ක් (අධ්‍යයන තනතුරු 36ක් හා අනධ්‍යයන තනතුරු 15ක්) බඳවා ගැනීම සඳහා අමප/26/0380/802/002 - I හා 2026.03.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව මෙම තනතුරු සඳහා කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.

(iv) 2023/2024 ශිෂ්‍ය කණ්ඩායම සඳහා අධ්‍යයන කටයුතු 2026 ජනවාරි 05වන දින ආරම්භ කරන ලදී.

(ආ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1651/2025 - (2), ගරු සුනිල් රත්නසිරි මහතා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු සුනිල් රත්නසිරි මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය)හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් මා ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය: මාර්ග සංවර්ධනය
## பரந்த இணைப்பு மற்றும் அபிவிருத்திக் கருத்திட்டம்: வீதி அபிவிருத்தி
## INCLUSIVE CONNECTIVITY AND DEVELOPMENT PROJECT: ROAD DEVELOPMENT

1655/2025

5. **ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චානක මාදුගොඩ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சானக மாதுகொட சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chanaka Madugoda)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය - Inclusive Connectivity and Development Project - ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට කාපට් අතුරා සංවර්ධනය කර ඇති මාර්ගවල දුර ප්‍රමාණය කොපමණද;

(iii) එම එක් එක් මාර්ගයේ නම සහ වැය කරන ලද මුදල දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වැඩ ආරම්භ කර, එහෙත් වැඩ අවසන් කර නොමැති මාර්ග සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ඉහත ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ මේ වනවිට කාපට් අතුරා සංවර්ධනය කර ඇති මාර්ගවල දුර ප්‍රමාණය සහ එයට වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ගාල්ල දිස්ත්‍රික්කයට අදාළව එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iv) ඉහත ව්‍යාපෘතිය ගාල්ල දිස්ත්‍රික්කය තුළ ආරම්භ කිරීමට දීර්ඝ කාලයක් ගතවීමට හේතු කවරේද;

(v) ඉහත ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பரந்த இணைப்பு மற்றும் அபிவிருத்திக் கருத்திட்டம் - Inclusive Connectivity and Development Project - ஆரம்பிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) இன்றளவில் மேற்படி கருத்திட்டத்தின்கீழ் 'காபட்' இடப்பட்டு அபிவிருத்தி செய்யப் பட்டுள்ள வீதிகளின் நீளம் யாது என்பதையும்;

(iii) அந்த ஒவ்வொரு வீதியினதும் பெயர் மற்றும் செலவிடப்பட்ட தொகை மாவட்ட வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iv) அபிவிருத்திப் பணிகள் ஆரம்பிக்கப்பட்டுள்ள போதிலும், அப்பணிகள் நிறைவு பெறாமலுள்ள வீதிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி கருத்திட்டம் காலி மாவட்டத்தில் ஆரம்பிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) இன்றளவில் மேற்படி கருத்திட்டத்தின்கீழ் காலி மாவட்டத்தில் 'காபட்' இடப்பட்டு அபிவிருத்தி செய்யப்பட்டுள்ள வீதிகளின் நீளம் மற்றும் அதற்காகச் செலவிடப்பட்டுள்ள நிதி வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) காலி மாவட்டத்துக்கு ஏற்புடையதாக மேற்படி கருத்திட்டத்தின் தற்போதைய முன்னேற்றம் யாது என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டத்தை காலி மாவட்டத்தில் ஆரம்பிக்க நீண்ட காலம் எடுத்தமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி கருத்திட்டத்தை நிறைவு செய்வதற்கு உத்தேசிக்கப்பட்டுள்ள திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the date on which the Inclusive Connectivity and Development Project was commenced;

(ii) the distance of the roads that have been carpeted and developed under the said project so far;

(iii) the names and spending for each road, separately, under each district; and

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iv) the number of roads of which work has started but not yet been completed?

(b) Will he also inform this House -

(i) the date on which the said project was commenced in the Galle District;

(ii) the distance of the roads that have been carpeted and developed in the Galle District so far under the said project and the amount spent on it, separately;

(iii) the current progress of the project in the Galle District;

(iv) the reasons for the prolonged delay in commencing the concerned project in the Galle District; and

(v) the date on which the said project is scheduled to be completed?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2021.11.03

(ii) 2026.02.28 දිනට කාපට් අතුරා අවසන් කර ඇති මුළු ප්‍රමාණය කි.මී. 776.25කි.

(iii) මීට අදාළව දීර්ඝ පිළිතුරක්** සපයා ඇත.

(iv) 2026.02.28 දිනට කොන්ත්‍රාත් පිරිනමා ඇති මුළු මාර්ග ගණන 324ක් (කි.මී. 1021) වන අතර, මාර්ග 167ක වැඩ සම්පූර්ණයෙන්ම අවසන් කර මාර්ග හිමිකාරිත්වයට භාර දී ඇත. ඒ අනුව 2026.02.28 දිනට මාර්ග 157ක ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

(ආ) (i) 2024.11.05

(ii)

| වැඩ විස්තරය/කොන්ත්‍රාත් පැකේජය | කොන්ත්‍රාත් අංකය | 2026/02/28 දිනට කාපට් අතුරා අවසන් කර ඇති මාර්ග දුර ප්‍රමාණය (කි.මී) | 2026/02/28 දිනට වැයකර ඇති මුදල රු. මිලියන |
|---|---|---|---|
| දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන, වදුරඹ, යක්කලමුල්ල සහ හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 16.74 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | LK-RDA-353940-CW-LOT 01 | 14.56 | 280.32 |
| දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම, රත්ගම සහ බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 14.63 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය /වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | LK-RDA-353940-CW-LOT 02 | 12.64 | 217.34 |
| දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැලිවිටිය දිවිතුර, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 12.35 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | LK-RDA-353940-CW-LOT 03 | 11.54 | 212.23 |
| දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ, තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 12.64 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | LK-RDA-353940-CW-LOT 04 | 11.390 | 230.62 |
| එකතුව | | 50.130 | 940.51 |

(iii)

| වැඩ විස්තරය/කොන්ත්‍රාත් පැකේජය | කොන්ත්‍රාත් අංකය | 2026/02/28 දිනට භෞතික ප්‍රගතිය (පැකේජය අනුව) | 2026/02/28 දිනට භෞතික ප්‍රගතිය (දිස්ත්‍රික්කය අනුව) |
|---|---|---|---|
| දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන, වදුරඹ, යක්කලමුල්ල සහ හබරාදූව ප්‍රාදේශීය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 16.74 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | LK-RDA-353940-CW-LOT 01 | 82.98 % | 84.43 % |
| දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම, රත්ගම සහ බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 14.63 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | LK-RDA-353940-CW-LOT 02 | 83.89 % | |
| දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැලිවිටිය දිවිතුර, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 12.35 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | LK-RDA-353940-CW-LOT 03 | 86.00 % | |
| දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 12.64 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | LK-RDA-353940-CW-LOT 04 | 85.49 % | |

(iv) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රමාදයක් සිදු නොවූ අතර, ව්‍යාපෘතියේ සැලසුම අනුව ක්‍රියාත්මක කරන ලදී.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(v)

| වැඩවිස්තරය/ කොන්ත්‍රාත් පැකේජය | කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත් කාලය අවසන් වන දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|
| දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන, වදුරඹ, යක්කලමුල්ල සහ හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 16.74 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | LK-RDA-353940-CW-LOT 01 | 22/06/2026 | ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී. |
| දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම, රත්ගම සහ බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 14.63 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | LK-RDA-353940-CW-LOT 02 | 30/04/2026 | ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී. |
| දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැලිවිටිය දිවිතුර, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 12.35 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/වැඩිදියුණු කිරීම සහ නඩත්තුකිරීම | LK-RDA-353940-CW-LOT 03 | 19/03/2026 | ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී. කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුව කොන්ත්‍රාත්කරු ඉල්ලා සිටින කාල දිගුව ඇගයීමට ලක් කරමින් පවතී. |
| දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිලෝමීටර් 12.64 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය/වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම | LK-RDA-353940-CW-LOT 04 | 05/11/2025 | ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී. කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුව කොන්ත්‍රාත්කරු ඉල්ලා සිටින කාල දිගුව ඇගයීමට ලක් කරමින් පවතී. |

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න, ගරු රවි කරුණානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### උතුරු හා නැඟෙනහිර පුරාවිද්‍යාත්මක ස්ථාන
### வடக்கு மற்றும் கிழக்கிலுள்ள தொல்பொருளியல் இடங்கள்
### ARCHAEOLOGICAL SITES IN NORTH AND EAST

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Speaker, I would like to pose my Question under Standing Order No. 27(2) to the Minister of Religious and Cultural Affairs.

Sir, the perception that Sri Lanka's Department of Archaeology functions as a "Buddhist-only" institution is rooted in systemic institutional practices and exclusionary actions on the ground.

Regarding the Koneswaram Temple, Thanthamalai Murugan Temple, Nelkalmalai archaeological site, the Divisional Secretariat of Kuchchaveli, Kurundurmalai Temple, Vedukkunari Malai and Thaiyiddy, I request for the following clarifications:

1. Koneswaran Temple: Is the Minister aware that 18 acres belonging to the Koneswaran Temple and 453 acres within the Trincomalee Fort remain inaccessible to devotees due to Departmental obstruction - despite funding being available - while 58 unauthorized structures have been permitted in the vicinity?

கௌரவ அமைச்சர் அவர்களே, திருகோணமலை யிலுள்ள கோணேஸ்வரம் ஆலயத்துக்குச் சொந்தமான 18 ஏக்கர் காணியில் ஒரு வாழை மரத்தைக்கூட நடமுடியாத நிலை இருக்கின்றது. ஆனால், அதே ஆலயத்துக்கு வெளியில் 58 கடைகள் இருக்கின்றன. அவை பெரும்பான்மைச் சமூகத் தினருக்குச் சொந்தமான கடைகள் என்பதுடன், சட்டவிரோத மாகவே இயங்கியும் வருகின்றன. தொல்பொருள் திணைக்கள மானது, சட்டவிரோதமான கடைகளுக்கு அனுமதி வழங்கு கின்றது. ஆனால், ஆலயத்துக்குச் சொந்தமான காணியில் ஒரு வாழை மரத்தைக்கூட நடுவதற்கு அனுமதிப்பதில்லை.

2. Thanthamalai Murugan Temple: Is the Minister aware that vital renovations and safety developments are blocked due to archaeological designations, leaving structures at risk of collapse and even preventing the Ceylon Electricity Board from installing basic metering facilities?

கௌரவ அமைச்சர் அவர்களே, தாந்தாமலை முருகன் ஆலயத்தில் பொருத்தப்பட்டுள்ள இலங்கை மின்சார சபைக்குச் சொந்தமான மீற்றர் பெட்டி எரிந்திருக்கிறது. அங்கு புதிதாக ஒரு மீற்றர் பெட்டியைப் பொருத்துவதற்குக்கூட, தொல்பொருள் திணைக்களத்தினர் அனுமதி வழங்குவதில்லை. ஆலய வளாகத்துக்குள் ஓர் அரச மரம் வளர்ந்து கட்டிடம் இடிந்து விழுகின்ற நிலையில் இருக்கின்றது. அரச மரமோ, வாழை மரமோ, தென்னை மரமோ கட்டிடம் இடிந்து விழுகின்ற நிலைக்கு வளர்ந்திருந்தால், அந்த மரத்தை வெட்டத்தான் வேண்டும். அதற்கான அனுமதியை உங்களுடைய அமைச்சின் கீழுள்ள தொல்பொருள் திணைக்களம் மறுக்கின்றது.

3. Nelkalmalai - Kiran: Is the Minister aware of reports that a new Buddhist temple has been constructed on an archaeological land under the guise of "restoration", while long-standing Hindu places of worship in the same district face severe restrictions?

கௌரவ அமைச்சர் அவர்களே, தாந்தாமலை முருகன் ஆலயத்தில் Electricity Boardக்குச் சொந்தமான மீற்றர் பெட்டியை மாற்றுவதற்கு அனுமதியில்லை. ஆனால், அதே

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

மாவட்டத்தின் கிரான் பிரதேச செயலாளர் பிரிவில் தொல்பொருள் இடமென அடையாளப்படுத்தப்பட்ட ஓர் இடத்தில் புதிதாக ஒரு விகாரை அமைக்கப்பட்டு இருக்கின்றது. This is not a restoration; this is a reconstruction. ஒரே மாவட்டம்; இரண்டு சட்டம்! அதாவது, சைவ ஆலயங்களுக்கு ஒரு சட்டம்; பௌத்த விகாரைகளுக்கு இன்னொரு சட்டம்.

4. Kuchchaveli Coastal Belt: Is the Minister aware that approximately 38 new Buddhist temples are being erected along a 47-kilometre stretch, where fewer than 500 Sinhalese Buddhist families reside?

கௌரவ அமைச்சர் அவர்களே, திருகோணமலையின் குச்சவெளிப் பிரதேசத்தில் புதிதாக 38 பௌத்த விகாரைகளை அமைப்பதற்கு நடவடிக்கை எடுத்து வருகின்றார்கள். ஆனால், அந்தப் பிரதேசத்தில் 500க்கும் குறைவான சிங்களக் குடும்பங்களே இருக்கின்றன. கிட்டத்தட்ட 10 சிங்களக் குடும்பங்களுக்கு ஒரு விகாரை! இது எந்த வகையில் நியாயம்? தமிழ் மக்களுடைய இனப்பரம்பலை மாற்றுவதற்கு திருகோண மலையில் இவ்வாறான நடவடிக்கைகள் தொடர்கின்றன .

5. Kurundurmalai in Mullaitivu: Is the Minister aware that over 78 acres are being obstructed, Tamil Hindu observances are restricted and Tamil fishermen are prohibited from using the Kurundurkulam Tank, whereas Sinhalese fishermen are granted access?

What is the logic, Hon. Minister? குருந்தூர் மலையில் ஆலயத்துக்குச் சொந்தமான 78 ஏக்கர் காணியில் விவசாய நடவடிக்கைகளில் ஈடுபட முடியாது. ஆனால், குருந்தூர் குளம் தொல்பொருள் திணைக்களத்துக்குச் சொந்தமானதெனச் சொல்லி, அங்கு மீன்பிடியில் ஈடுபட்ட தமிழ் மீனவர்களுக்கு அனுமதி மறுக்கப்பட்டு இருக்கின்ற அதேநேரம், சிங்கள மீனவர்கள் Civil Defence Force, இராணுவத்தின் அனுசரணை யுடன் மீன்பிடிக்கிறார்கள். இது எந்த வகையில் நியாயம்? அதேபோல், குருந்தூர் மலையில் ஒரு தேங்காயை உடைத்து மதவழிபாட்டில் ஈடுபட முடியாத சூழல் இருக்கின்றது.

6. Vavuniya and Jaffna: Is the Minister aware that Vedukkunari Malai and Thaiyiddy face similar restrictions on worship and an unauthorized construction on a disputed land is conducted under State protection?

கௌரவ அமைச்சர் அவர்களே, வவுனியா, வெடுக்குநாறி மலையிலுள்ள ஆலயத்திலும் மத வழிபாடுகளில் ஈடுபட அனுமதியில்லை. ஏன்? அது தொல்பொருள் சார்ந்த இடமெனச் சொல்கின்றார்கள். ஆனால், தையிட்டியில் தனியாருடைய காணியில் சட்டவிரோதமான ஒரு கட்டடத்தை அமைத்து, அதை விகாரை என்று சொல்லி, நீங்கள் சட்டபூர்வமாக்கப் பார்க்கின்றீர்கள். நேற்றைய தினம்கூட, பாதுகாப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் இதே பிரச்சினை எழுப்பப்பட்டது. மயிலிட்டி பிரதேசத்திலுள்ள காணிக்கை மாதா தேவாலயம் இராணுவத் தினரால் இடிக்கப்பட்டு இருக்கின்றது. ஆனால், தையிட்டியில் சட்டவிரோதமான விகாரை!

In light of the above:

- On what legal or historical basis are these discriminatory actions permitted and were the local affected communities ever consulted?
- What immediate steps will the Government take to restore access, remove biased restrictions, ensure equal religious rights and halt actions that appear designed to alter the ethnic demography of these regions?

Hon. Minister, along with that, I would like to raise another couple of issues. நான் மட்டக்களப்பு மாவட்டத்தை உதாரணமாக வைத்துச் சொல்கின்றேன். அங்கிருக்கின்ற தொல்பொருள் திணைக்கள அதிகாரிகள் பிரதேச செயலாளருடன் பேச மறுக்கிறார்கள்; பிரதேச சபையினருடன் பேச மறுக்கிறார்கள். அவர்கள் தொல்பொருள் இடங்களை அடையாளப்படுத்துவதாகச் சொல்லி, பொலிசாருடன் சென்று, தாங்கள் ஏதோ இரகசியப் பொலிஸாரென எண்ணிச் செயற்படுகின்றார்கள். மட்டக்களப்பு மாவட்டத்திலுள்ள அலுவலகங்களுக்கு, அரசாங்கத்தால் வெளியிடப்படுகின்ற Circular, Gazette உட்பட எல்லா ஆவணங்களும் சிங்கள மொழியிலே வருகின்றன. அங்கிருக்கின்ற அதிகாரிகளுக்கு சிங்கள மொழி தெரியாது. தயவுசெய்து, அவற்றைத் தமிழ் மொழியில் அனுப்புங்கள்! மட்டக்களப்பு மாவட்டத்தில் பணிபுரிந்த தமிழ் தெரிந்த தொல்பொருள் திணைக்கள ஊழியர்களை இடமாற்றம் செய்துவிட்டு, அந்தப் பிரதேச மக்களின் மொழி தெரியாத, சிங்கள மொழி பேசுகின்றவர்களை நீங்கள் அங்கு நியமிக்கின்றீர்கள். தொல்பொருள் திணைக் களத்துக்கு எதிராக இவ்வளவு குற்றச்சாட்டுகள் இருக்கும் நிலையில், குறைந்தபட்சம் இருக்கின்ற தமிழ் பேசும் ஊழியர்களையாவது அங்கு நியமிக்க வேண்டும் என்பது என்னுடைய கோரிக்கையாகும்.

**ගරු (ආචාර්ය)හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්න මම සූදානම්.

ඇත්තටම ගරු මන්ත්‍රීතුමා මේ ඉදිරිපත් කරන්නේ එතුමාගේ ප්‍රදේශයේ තිබෙන ගැටලු. ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේවා ඉදිරිපත් කරන විලාසය සහ ඔබ ඒ සඳහා භාවිත කරන වාක්‍යවල ඇඟවුමක් තිබෙනවා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කරන මැදිහත්වීම්වල ස්වරූපය ගැන. එම නිසා මේ ප්‍රශ්නවලට නිරවද්‍ය විධියටම මා පිළිතුරු දිය යුතුයි. ඊට අමතරව මා ඉතා හොඳ අවබෝධයකින් කටයුතු කරමින් ඉන්නවා, අනවබෝධය නිසා, දූරදර්ශීභාවය නැතිව කටයුතු කරපු නිසා මේ ප්‍රදේශවල ඇති වන ගැටලු විසඳා ගැනීම සම්බන්ධව. එම ගැටලු විසඳාගන්න පුළුවන් ගැටලු.

ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව බෞද්ධාගමික ආයතනයක් විධියට විතරක් කටයුතු කිරීම ගැනයි ඔබතුමා විමසන්නේ. නමුත් ඒක කොහෙත්ම පිළිගන්න පුළුවන් තත්ත්වයක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේම පවතින පුරාවිද්‍යා උරුම හා පුරාවිද්‍යා ස්ථාන පොදුවේ ගත්තාම බහුතරයක තිබෙන්නේ බෞද්ධ පසුබිමක්; බෞද්ධ පදනමක්. ඒක කාටවත් ප්‍රතික්ෂේප කරන්න බැහැ. මොකද, ඒක ඓතිහාසිකව

ගොඩනැඟිලා තිබෙන විධිය. ඒත් පුරාවිද්‍යාව කියන්නේ, ඉතිහාසය කියන්නේ, නැත්නම් මානව විද්‍යාව, සමාජ විද්‍යාව වාගේ විෂයයන් කියන්නේ ආගමක් හඟවන විෂය පථ නොවෙයි, ආගමක් අනුව ක්‍රියාත්මක වන විෂය පථ නොවෙයි. ඒවා විෂයානුබද්ධ දැනුම සහ අර්ථ කථන මතයි ක්‍රියාත්මක වන්නේ. හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි වාගේ ආගමික පසුබිම් සහිත ස්ථානත් තිබෙනවා. ඒ හා බැඳුණු ආගමික ස්ථානත් තිබෙනවා. ඒ වාගේම ඓතිහාසික ස්ථානත් තිබෙනවා. ඒවායේ ඓතිහාසික අගය හෝ ඇඟවුම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් බෞද්ධ කරන්න ගිහිල්ලා නැහැ, ඒවා වෙනස් කරන්නේත් නැහැ. පනතෙන් එහෙම අවකාශයක් ඇත්තේත් නැහැ. ඇත්තටම ඒ වාගේ ස්ථානවල හින්දු කෝවිල් ක්‍රියාත්මක වනවා. ඒවාට කිසිදු බාධාවක් නැහැ. ශිව දේවාල තිබෙනවා. ඒවායේ ආගම අදහනවා. කිසිදු බාධාවක් නැහැ. ඒ විතරක් නොවෙයි. ඔබේ අපේ ජීවිතවලට සම්බන්ධ ආගමික උත්සව, මහා ශිව රාත්‍රි උත්සවය වෙන්න පුළුවන්, මේ සියල්ල ඒ ස්ථාන අනුබද්ධවත් සමරන අවස්ථා තිබෙනවා. ඒවාට කිසිදු බාධාවක් නැහැ.

ගරු මන්ත්‍රීතුමා විශේෂයෙන්ම මගෙන් විමසනවා, ස්ථාන හයක් සම්බන්ධව.

1. කෝනේෂ්වරම් කෝවිල ගැනයි පළමුවෙන්ම අහන්නේ. ගරු කථානායකතුමනි, කෝනේෂ්වරම් කෝවිල ගත්තොත්, මේ භූමිය ත්‍රිකුණාමලයේ ෆ්‍රෙඩ්රික් බලකොටුව තිබෙන පුරාවිද්‍යා රක්ෂිත භූමිය තුළ පිහිටා තිබෙනවා. මෙම කෝවිල හෝ එම භූමිය වෙනම පුරාවිද්‍යා ස්ථානයක් ලෙස වෙන් කර නැහැ. මම ඉතාම ඕනෑකමින් කියනවා, පුරාවිද්‍යා පනත හා සම්බන්ධ ප්‍රතිපාදන පිළිබඳව සරලමතිකව, සාමාන්‍ය කෙනෙකුට තිබෙන අවබෝධයෙන් විතරක් කථා කරන්න යෑම අපව අනතුරකට හෙළනවා කියන එක. ඒ නිසා හරිම ප්‍රවේශමට මම අමාත්‍යවරයා හැටියටත්, ඔබතුමන්ලා ගරු මන්ත්‍රීතුමන්ලා හැටියටත් මේ ගැන කටයුතු කළ යුතුව තිබෙනවා. එහෙම නැත්නම් අනවබෝධය නිසාම අපට පාලනය කරන්න බැරි සමාජ ආතතියක්, ඝර්ෂණයක් හට ගන්න පුළුවන්. ඉතින් මේ භූමි මෙහෙම වෙන් කරලා නැහැ. මේ පුරාවිද්‍යා භූමියේ සංරක්ෂණ කටයුතු හා නඩත්තු කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිත මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් සිදු කරනවා. මෙන්න මේක ඉතාම වැදගත් තොරතුරක්, පොදු සමාජය සාමාන්‍යයෙන් දන්නේ නැති. මේ ඓතිහාසික ස්ථානවල භූමියේ අයිතිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතුව තිබුණාට සමහර තැන්වල වැඩ කරන්න අර්ථ පතිත්වය සපයන්නේ මධ්‍යම සංස්කෘතික අරමුදල. වෙන වෙනම පාලනය වන පාලක මණ්ඩලවලින් ගත් තීරණ අනුව සහ වෙන වෙනම පාලනය වන පනත් කෙටුම්පත් දෙකක් අනුව තමයි ඒ කටයුතු කෙරෙන්නේ. ඔබතුමා විමසන ආකාරයට ගෝකන්න විහාරයට හෝ මෙම කෝවිලට පැමිණෙන බැතිමතුන්ගෙන් කිසිදු මුදලක් අය කරන්නේ නැහැ. ඔබතුමන්ලා දන්නවා, සාමාන්‍යයෙන් දඹුල්ල විහාරයට හෝ සීගිරියට පිවිසුණොත් මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ප්‍රවේශ පතක් නිකුත් කරන බව. නමුත්, එතැන එහෙම මුදල් අය කරන්නේ නැහැ.

මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ප්‍රදර්ශනය කිරීම සඳහා සකස් කරන ලද ප්‍රදේශය සඳහා එම ආයතනය මඟින් ටිකට් පත්‍රයක් නිකුත් කරනු ලබනවා.

මා දන්නා තරමින් ආගමික ස්ථානයක් වශයෙන් ඒ විධියටවත් එතැන වෙනසක් කරලා නැහැ.

2. මෙම ස්ථානය ආශ්‍රිතව පුරාවිද්‍යාත්මක සාධක පවතින බැවින් විස්තීර්ණ ගවේෂණයක් සිදු කිරීමකින් පසුව පුරාවිද්‍යා සාධක නොමැති බව නිශ්චිතව තහවුරු වන්නේ නම් පමණක් මෙම ඉල්ලීම සලකා බලන්න පුළුවන්.

අපි මුළු ලංකාවේම ගවේෂණ කටයුතු අවසන් කරලා නැති බව ඔබතුමා දන්නවා. මේවා ඉතා ප්‍රවේශමට කළ යුතුව තිබෙනවා. ඒ වාගේම මේ ස්ථානවල ඉතාම ප්‍රවේශමට ඉවත් කළ යුතු අනවසර ඉදිකිරීම් තිබෙනවා. ඒ වෙනුවෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටියක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මොකද, ජනතාව තමයි ඒ තැන්වල ඉන්නේ. කාලය ගත වෙලා ගිහින් තිබෙනවා. මිනිස්සු තමන්ගේ කටයුතු කරලා තිබෙන්නේ පනතට අනුව නොවෙයි. ඒ පනත උල්ලංඝනය වන තැන්වලදී පසුගිය රජයන් ඒ මොහොතේදීම මැදිහත් වෙලා ඒ දේවල් සිදු කළා නම් මේවා මෙහෙම ඔඩු දුවන්නේ නැහැ. අනුරාධපුරයේ ඇතුළුනුවර සම්බන්ධයෙන් මේ වාගේ බරපතළ අර්බුදයක් දැන් හටගෙන තිබෙනවා. ඒවාට UNESCO වාගේ ආයතන සම්බන්ධ වෙන්නේ ලෝක ප්‍රමිතීන් එක්කයි. ඒ නිසා අපට මේවාට ඉතාම ප්‍රවේශමෙන්, ගැටලුවක් ඇති නොවන විධියට මැදිහත් වෙන්න සිදු වෙනවා.

ඔබතුමා මෙතැන තිබෙන මීටර් බෝඩ් එකක් ගැන විමසුවා. ඇහැට පෙනෙන විධියට, දැනට එහි පුරාවිද්‍යාත්මක සාධක තිබෙනවා. විස්තීර්ණ ගවේෂණයක් කිරීම ඉක්මනට කරන්න පුළුවන් දෙයක්. මම ඒ ගැන අධ්‍යක්ෂ ජනරාල්තුමාගෙන් විමසුවා. ගැටලුවක් නැහැ කියලා තහවුරු වෙනවා නම් එය සිදු කරන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, පනතේ තිබෙන ප්‍රතිපාදන අනුව අපට ඒ වාගේ මැදිහත්වීමක් කරන්න බැහැ, මේ නිෂ්කාසන වාර්තාව ගන්නේ නැතුව. ඒවා කරන්න පුළුවන්. මම ඒවාට උනන්දුවෙන් මැදිහත් වෙනවා.

3. මෙම ස්ථානය ආශ්‍රිතව අක්කර 1,213ක් තුළ පුරාවිද්‍යාත්මක සාධක පවතින බැවින් වෙන් කළ පුරාවිද්‍යා ප්‍රදේශයක් ලෙස පවත්වා ගෙන යනු ලබනවා. මෙම භූමිය ඇතුළත පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතු හැර වෙනත් ඉදිකිරීම් කිසිවක් සිදුකර නොමැත කියා තමයි දෙපාර්තමේන්තුව වාර්තා කරන්නේ.

සමහර වෙලාවට බාහිර පුරවැසියෙකුට බැලූ බැල්මට පෙනෙන්න පුළුවන් යම්කිසි ඉදිකිරීමක්. එතකොට අපි කලබල වෙන්නේ නැතුව කල්පනාවෙන් යුතුව බලන්න ඕනෑ, මේක පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතුවලට අයිති එකක්ද, බාහිර පාර්ශ්වයක් කරපු එකක්ද, අලුතින් පටන් ගන්න යන පන්සලක්ද, කෝවිලක්ද කියලා. ඒ පිළිබඳව හරියටම විමසන්නේ නැතුව අදහස් පළ කිරීම අනතුරට හෙළීමක් කියා මා අදහස් කළේ ඒ නිසායි. ඒ හැර වෙනත් කිසිදු කාරණයක් නැහැ.

4. මෙම කලාපය තුළ පුරාවිද්‍යා ස්ථාන කිහිපයක් පවතින අතර ඒ තුළ නව විහාරස්ථාන ඉදිකිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කිසිදු අවසරයක් ලබා දී නොමැත. කෙසේ වෙතත් දැනට මෙහි ඇත්තේ වසර ගණනක් පැරණි පන්සල් වේ.

පුරාවිද්‍යා ස්ථාන කිව්වාම පන්සල් හැටියට වටහා ගන්න එපා කියලා මම නැවතත් ඉල්ලීමක් කරනවා. හැම තැනම එහෙම නැහැ. එහෙම නොවන තැන් තිබෙනවා. නමුත්, ශ්‍රී ලංකාවේ තනිකරම පුරාවිද්‍යා වටිනාකම පමණක් තිබෙන තැන් තිබෙනවා; ඒක obvious. ඒක තමයි ඉතිහාසයේ ගමන් කරපු පිළිවෙළ. එහි බෞද්ධ පසුබිමක් තිබෙනවා. දැනට තිබෙන වසර ගණනක් පැරණි පන්සල්වල යම්කිසි අලුත්වැඩියා කටයුත්තක් කෙරෙනවාද දන්නේ නැහැ. ඒ ගැන පරීක්ෂා කර බලන්න පුළුවන්. අපට ඒ

[ගරු (ආචාර්ය)හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

ගැන තර්ක කරන්න කිසිදු දෙයක් නැහැ. මම හිතන විධියට, පන්සල් 38ක් කියලා ඉලක්කමෙන් සඳහන් වුණා. නමුත්, එහෙම අවසර දීමක් කරලා නැහැ.

5. අක්කර 78ක් සහිත පුරාවිද්‍යා ස්මාරක භූමියක් වන කුරුන්දි පුරාවිද්‍යා ස්ථානය පුරාවිද්‍යා රක්ෂිත භූමියක් ලෙස ප්‍රකාශයට පත් කර තිබෙනවා. එයට පරිබාහිරව තවදුරටත් පුරාවිද්‍යාත්මක සාධක විසිරී ඇති අක්කර 229ක් සහිත භූමි ප්‍රදේශයක්ද නැවත ගැසට් කිරීමට යෝජනා වෙලා තිබෙනවා. මෙම කුරුන්දුර්කුලම් වැව පුරාවිද්‍යා භූමියෙන් පිටත පිහිටා ඇති බැවින් එහි සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මැදිහත්වීමක් සිදු කර නැහැ.

ගරු කථානායකතුමනි, ඒ වැවේ මාළු ඇල්ලීම හෝ ධීවර කටයුතු පිළිබඳව කෙනෙක් අවිශේෂයෙන් කරුණු දක්වනකොට ඒක සංවාදය තුළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට බැර වෙනවා. නමුත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඒ වැවත් එක්ක ගනුදෙනුවක් නැහැ. ඒ වැව අයිති වෙන්නේ වාරිමාර්ග හෝ වෙනත් පදනමකට. මේ ගැන බොහොම ප්‍රවේශමට අපි කරුණු දක්වමු, ගරු මන්ත්‍රීතුමනි. අපි දෙගොල්ලන්ටම ඕනෑ කරන්නේ මේවා දියුණු කර ගන්න.

6. වන සංරක්ෂණ භූමියක් තුළ පිහිටා ඇති වෙඩුක්කුනාර්මලෙ පුරාවිද්‍යා ස්ථානය රක්ෂිත භූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරමින් පවතිනවා.

මේ වචනවල වෙනස්කම් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. රක්ෂිත භූමියක් කියන්නේ එකක්; gazetted monument කියන්නේ තව එකක්. පෞද්ගලික ඉඩමක - private land එකක - තිබෙන ගැසට් කරපු ස්මාරකයක් කියන්නේ තව එකක්. මේවා අතර සියුම් වෙනස්කම් තිබෙනවා.

එම ස්ථානයේ ඇති ස්මාරක බෞද්ධ ස්මාරක ලෙස හඳුනාගෙන තිබෙනවා. ක්‍රිස්තු පූර්ව 2වන සියවසට අයත් ලෙන් ලිපිවල අන්තර්ගත කරුණු මඟින් ඒ බව සනාථ වනවා. මෙම පුරාවිද්‍යා පරිශ්‍රය ආශ්‍රිතව අනවසර ඉදිකිරීම සිදු කර ඇති බැවින් විවිධ ගැටලු උද්ගත වෙලා තිබෙනවා, මා කලින් කිව්වා වාගේ. මේ සම්බන්ධව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නීතිමය කටයුතු දැනටත් සිදු කර තිබෙනවා. මෙම අනවසර ඉදිකිරීම් තුළින් පුරාවිද්‍යා භූමි දර්ශනයට හානි වෙලා තිබෙනවා. මේකට තමයි කියන්නේ archaeological landscape කියලා. ඒක ඉතාම වැදගත් එකක්. පුරාවිද්‍යා භූමි දර්ශනය කියන්නේ ඒ ස්මාරකය අවට නිශ්චිත දුරක් ඇතුළත රකින්න ඕනෑ තත්ත්වයක්. සීගිරි පර්වතය විතරක් නොවෙයි, භූමි දර්ශනයට අයිති. අපි අපේක්ෂා නොකරන තරම් දුරට සීගිරි වනාන්තරය තුළ සීගිරියටම අයිති වනවා, landscape එක. ඒකත් රැක ගන්න අපි බැඳිලා ඉන්නවා, තව පැත්තකින් ජගත් ලෝක උරුමයක් විධියට ඒක තිබෙන නිසා. ඒ හින්දා මේවා ගැන අපි ඉතා ප්‍රවේශමෙන් තමයි වැඩ කරගෙන ඉන්නේ. කෙසේ වුවද, ඕනෑම අයෙකුට මෙම ස්ථානය තුළ ආගමික වතාවත් සිදු කිරීමට කිසිදු බාධාවක් නැහැ. එහිදී පුරාවස්තුවලට කිසිදු හානි කිරීමක් හෝ අනිසි බලපෑමක් සිදු නොවිය යුතුයි. පුරාවස්තු විනාශ කිරීම, විකෘති කිරීම, විතැන් කිරීම හෝ වෙනස් කිරීම පුරාවස්තු ආඥාපනතේ නීති උල්ලංඝනය කිරීමක්.

අවසාන වශයෙන් මම කියන්නේ මේකයි. පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය කරලා නඩත්තු කරගෙන යනු ලබන්නේ සියලුම ජාතීන්ට අයත් උරුම. මා කලින් කිව්වා වාගේ, සියලුම ජාතීන්ට අයත් උරුම. එනම්, ජාතික උරුම වශයෙන්. "ජාතික" කියන වචනය හරිම පෘථුල විධියට අපි භාර ගත යුතුව තිබෙනවා. එහෙත් කිසිවකුට පුරාවස්තු ආඥාපනත උල්ලංඝනය වන ආකාරයට කටයුතු කරන්නට බැහැ. මේ පුරාවස්තු ආඥාපනතේ තිබෙන ප්‍රබලතාව තමයි නිතරම සාමාන්‍ය සමාජයත් එක්ක ගැටෙන්නේ, ගරු කථානායකතුමනි. ඔබතුමන්ලා ඉදිරිපත් කරන්නේ ඒ කටයුතු, ඒ නිරීක්ෂණ. මේවා සම්බන්ධව ඉතාම හොඳින්, පුළුල්ව කටයුතු කරගෙන යන්න මම බලාපොරොත්තු වනවා. ඔබතුමන්ලාගේ පෙන්වා දීම් අගය කරනවා. ඒවා වැදගත්.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ சபாநாயகர் அவர்களே, நான் கௌரவ அமைச்சரிடம் தொல்பொருள் சம்பந்தமான ஒரு வகுப்பு எடுப்பதற்கு இந்தச் சபைக்கு வரவில்லை. கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய மக்களின் பிரச்சினைகள் பற்றித்தான் நாங்கள் சொல்லி இருக்கிறோமே தவிர, தொல்பொருள் சட்டத்தைப் பற்றியோ, தொல்பொருளின் முக்கியத்துவத்தைப் பற்றியோ அல்ல. இந்த நாட்டில் தொல்பொருட்கள் பாதுகாக்கப்பட வேண்டும் என்பதில் நாங்களும் உங்களுடன் இணங்குகின்றோம். நீங்கள் சொல்கின்றீர்கள், இது Buddhist-only institution அல்ல என்று. ஆனால், logoவை எடுத்துப் பாருங்கள்! அதில் தர்ம சக்கரத்தைத்தான் முன்னால் போட்டு இருக்கிறார்கள். நீங்கள் நாளைக்கு அதில் Cross, திரிசூலம் உட்பட எல்லா மதங்களின் அடையாளத்தையும் போடுங்கள்! அதற்குப் பிறகு, it would not be a Buddhist institution என்று சொல்லலாம்.

நீங்கள் சொன்னீர்கள், மத வழிபாடு செய்வதற்குத் தடையில்லை, ticket எடுக்கவில்லை என்று. எங்களுடைய மக்களுக்கு மதவழிபாட்டை எப்படிச் செய்ய வேண்டும் என்பதை நீங்கள் கற்றுக்கொடுக்க வேண்டிய அவசியம் இல்லை. மத வழிபாட்டில் ஈடுபடும்பொழுது, அவ்விடத்தில் ஒரு கற்பூரத்தைக் கொளுத்த விடாமல் தடுப்பதை அல்லது ஒரு நேர்த்திக் கடன் வைத்து தேங்காய் உடைப்பதைத் தடுப்பதைத்தான் நான் மத வழிபாட்டுக்குத் தடை என்று சொல்கின்றேன். Ticket எடுப்பது பற்றி நான் சொல்லவில்லை.

You, conveniently, omitted responding to the illegal 58 shops that had been constructed by people who are not Tamil; you have, categorically, not even mentioned a word about the illegal Thaiyiddy Viharaya. That itself shows that there is bias in your Answer.

கௌரவ அமைச்சர் அவர்களே, நான் பேசுவதை வைத்து எப்படிப் பேசுகின்றேன் என்பது தொடர்பில் நீங்கள் விளக்கமளிக்கத் தேவையில்லை. உங்களுடைய சனாதிபதி அவர்கள் ஒரு முறையில் பேசுவார்; சபாநாயகர் அவர்கள் ஒரு முறையில் பேசுவார்; நீங்கள் ஒரு முறையில் பேசுவீர்கள்! நான் பேசுவதை வைத்து, "நீங்கள் இப்படிப் பேசுவது பிழை" என நீங்கள் சொல்ல முடியாது. அது என்னுடைய பேச்சுச் சுதந்திரம்! அதைப் பற்றி நீங்கள் விளக்கமளிக்கத் தேவை யில்லை.

குருந்தூர் குளத்தில் மீன்பிடிப்பதற்கு தொல்பொருள் திணைக்களத்தால் தடைவிதிக்கப்படவில்லை என்று நீங்கள் சொல்கின்றீர்கள். நீங்கள் அந்த இடத்துக்கு வந்து பாருங்கள்! அந்தப் பிரதேசத்தைச் சேர்ந்த எங்களுடைய கௌரவ

பாராளுமன்ற உறுப்பினர் அவர்கள் இங்கு இருக்கிறார். குச்சவெளிப் பிரதேசத்தில் இருக்கின்ற விகாரை நீண்ட காலமாக இருக்கின்ற விகாரையென நீங்கள் சொல்கின்றீர்கள். அது சட்டரீதியாக அமைக்கப்பட்ட விகாரை அல்ல. UNESCO, World Heritage Organization போன்ற அமைப்புகள் வந்து இவ்வாறான விடயங்களில் ஈடுபட்டால் எங்களுக்குப் பிரச்சினை இல்லை. பிக்குமார் defenderஇல் வந்து விகாரைகளை அமைத்துவிட்டுச் சென்றதற்குப் பிறகு நீங்கள் சொல்கின்றீர்கள், அது நீண்ட காலமாக இருக்கின்ற விகாரை என்று. அதுமாத்திரமன்றி, நாங்கள் பிழையான தகவலைச் சொல்வதாகவும் கூறுகின்றீர்கள். நெலுகல் மலை பிரதேசத்திலுள்ள விகாரை நீண்ட காலமாக இருக்கின்ற விகாரையென நீங்கள் சொல்கின்றீர்கள். மட்டக்களப்பு மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் எங்களுடைய கட்சிக்காக -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please shorten your Question.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Yes, Sir, I am winding up.

உங்களுடைய கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்கள் தலைமைதாங்குகின்ற அந்தக் கூட்டத்தில் அவர்களே சொல்லியிருக்கிறார், இதனை தொல்பொருள் திணைக்களம் கட்டவில்லை என்று. நெலுகல் மலையில் இருக்கின்ற Army campஇல் இருக்கின்ற இராணுவத்தினர்தான் இதனைக் கட்டினார்கள். இதனை உங்களுடைய அமைச்சின் கீழுள்ள தொல்பொருள் திணைக்களம் மேற்பார்வை செய்யவும் இல்லை. Ministry of Cultural Affairs இதற்கு அப்போது நிதி ஒதுக்கவும் இல்லை. அநுராதா யஹம்பத் அவர்கள் ஆளுநராக இருந்தபொழுது ஆரம்பித்துவைத்த வேலைதான் இது. தேசிய மக்கள் சக்தி அரசாங்கத்தினர் எல்லா இன மக்களையும் சமமாகப் பார்ப்பார்கள், எல்லா இன மக்களிடமும் நீதியாக நடந்துகொள்வார்கள் என்றே மக்கள் எதிர்பார்க்கின்றார்கள். மற்றவர்கள் செய்த பிழைகளுக்கு நீங்கள் எங்களைக் குற்றம் சுமத்துகிறீர்கள்! தொல்பொருள் விடயம் சம்பந்தமான உங்களுடைய செயற்பாடுகளும் கருத்துகளும் -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, shorten your Question.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I am winding up.

மக்கள் பிரதிநிதிகளாகிய நாங்கள் மக்களுடைய பிரச்சினை களைச் சொல்கின்றோம். இன்றைக்கு நீங்கள் சொன்ன பதில் என்ன?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please wind up.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Speaker, I am winding up. There is an allocated time for this. Just because the Hon. Minister took too long to answer, that is not my problem. You should have asked him to shorten his Answer.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Now, you have already taken three minutes.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Under Standing Orders and as discussed at the Parliamentary Business Committee, there is agreement on how Questions under Standing Order No. 27(2) should be raised and how they should be responded to. So, in light of that, give me my time.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Now, you have taken three minutes for the clarification.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I have five minutes. Read the Standing Orders.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, that five minutes is to raise the Question.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
No, five minutes to raise -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, no.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, okay.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, do not argue.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Speaker, you take the most amount of time in this House, obstructing Members from speaking.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, no.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Let me wind up.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, now, you wind up. You have taken four minutes now.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
See, again you are taking time.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please wind up.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I have to wind up my response. I cannot wind up just because you want me to wind up.

கௌரவ அமைச்சர் அவர்களே, தாந்தாமலையில் புதியதொரு மின்சார மீற்றர் பெட்டியைப் பொருத்துவதற்குக் கூட, சட்டத்திலுள்ள ஏற்பாடுகளைப் பார்க்க வேண்டுமென நீங்கள் சொல்கின்றீர்கள். நீங்களும் நானும் பிறப்பதற்கு முதலே பல்லாயிரக்கணக்கான ஆண்டுகளாக சைவ மத வழிபாடு இடம்பெற்றுவந்த இடம்தான் தாந்தாமலை! அங்கு மின்சாரம் தாக்கி யாராவது செத்துப் போனால், அதற்கு நீங்களா பொறுப்பு? தாந்தாமலை என்ற இடம் gazette பண்ணப்படக்கூட இல்லை. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் சொன்னதுபோல, கடந்த காலத்திலும் மட்டக்களப்பு மாவட்டத்தில் பிரச்சினை ஏற்பட்டதற்குக் காரணம், தொல்பொருள் திணைக்களத்தினர் இலங்கையின் சட்டத்தை மதிக்காததுதான். தொல்பொருள் திணைக்களம் -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, now you have to stop.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, since the Hon. Speaker does not want to permit me -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you can answer.

**ගරු (ආචාර්ය) හිනිදූම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ගරු කථානායකතුමනි, කෙටි පැහැදිලි කිරීමකින් මේ කාරණය අවසන් කරන්න මම බලාපොරොත්තු වෙනවා. මම පුරාවිද්‍යා පනතේ තිබෙන ප්‍රබලතාව, ඒ සම්බන්ධව කටයුතු කරන විධිය, ප්‍රතිචාර දක්වන විධිය ගැන බොහොම කාරුණිකව ගරු මන්ත්‍රීතුමාට කරුණු දැක්වූයේ පුරාවිද්‍යා පනත ගැන පාඩමක් කියා දෙන්න නොවෙයි. ඒ ප්‍රතිචාරය ගැන නැවතත් ඔහොම පැහැදිලි කරන එක තුළම තිබෙන්නේ ඔබතුමන්ලා අපෙන් දුරස් වෙන්න හදනවා වාගේ දෙයක්. එහෙම කරන්න එපා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීමක්]* Hon. Rasamanickam, please let me finish.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, please finish your answer. Do not go into a Debate.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
පාර්ලිමේන්තුවේ සුහදත්වය-

**ගරු (ආචාර්ය) හිනිදූම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
සුහදත්වය නොවෙයි. මේවා ගැන මේ තරම් විවෘත මනසකින් කටයුතු කරන්න බලාපොරොත්තු වන අමාත්‍යවරයෙකු හැටියටත්, අදාළ අණ පනත්වල තිබෙන සීමාකම් නිසාම පුරාවිද්‍යා පනතත්, මධ්‍යම සංස්කෘතික අරමුදල පනතත් සංශෝධනය කරන්න කැබිනට් අනුමැතිය ඉල්ලා තිබෙන අමාත්‍යවරයෙකු හැටියටත් මම බලාපොරොත්තු වෙනවා මේවා ගැටලුවකින් තොරව විසඳන්න.

සමහර කරුණු නොමඟ යවනසුලුයි. පුරාවිද්‍යා ස්ථානයක කපුරු පත්තු කරන එක පිළිබඳව සාකච්ඡාවට ගන්නේ ඇයි, ගරු මන්ත්‍රීතුමනි? ආගම හරස් කර ගන්න අමාරු තැනක්, ඒක. ඔබතුමා වාගේම අප සියලුදෙනාටම ඓතිහාසික ස්ථාන, ඒවා. අපි සීගිරි අප්සරාවන්ගේ පින්තූර ගන්න flashguns පාවිච්චි කරන්න දෙන්නේ නැත්තේ ඇයි? ඒවා තේරුම් ගන්න ඕනෑ ජාතික උරුමයන් හැටියට ඒ බරින්. හැම ජාතියකටම, හැම ආගමකටම ඒවා ප්‍රවේසම් කරලා දෙන එක තමයි වර්තමාන රජයේ වගකීම. මා නැවතත් ඔබතුමාට කියන්නේ මා ඉතාම විවෘත මනසින් මේ පිළිබඳව කටයුතු කරමින් ඉන්න බවයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට උපදෙස් දීලා තිබෙනවා නෙළුගල- *[බාධා කිරීමක්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
*එහෙම නම් නීති විරෝධීව කඩ 57ක්- [බාධා කිරීමක්]*

**ගරු (ආචාර්ය) හිනිදූම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
මම කෙටි ප්‍රශ්නයක් අහන්නද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, conclude your answer.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

මම අවසන් කරනවා. කරුණාකරලා ඔබතුමන්ලා විමසා බලන්න ඔය අපෙන් අහන ප්‍රශ්න ගැනම. ඔය කියන කඩසාප්පු හැදුවේ කොයි කාලයේද, ඒවාට අවසර දීලා තිබෙන්නේ කවුද කියලා සොයා බලන්න. *[බාධා කිරීමක්]* අවසන් වතාවටත් මං කියන්නේ, කාරුණිකව ඉල්ලා සිටින්නේ- *[බාධා කිරීමක්]* අපි මේ කටයුත්ත හරියට කරගෙන යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Minister, please conclude.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

පනතේ තිබෙන නීති රීති ප්‍රකාරව විතරයි කටයුතු කරන්නේ. ඉතුරු ටික කටයුතු කරන්නේ අවබෝධයෙන්. ඒ අවබෝධය බාර ගන්න හැමදෙනාම සූදානම් වෙලා, හොඳින් කටයුතු කරමු කියලා යෝජනා කරමින්, මගේ පිළිතුරු සැපයීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The next Question under Standing Order No. 27(2) to be raised by the Hon. Ravi Karunanayake.

## II

## විදේශ විනිමය ගනුදෙනුවලදී ගෝලීය වශයෙන් පිළිගත් ඩිජිටල් ගෙවීම් වේදිකා භාවිතය

### வெளிநாட்டுப் பரிவர்த்தனைகளின்போது உலகளவில் அங்கீகரிக்கப்பட்ட டிஜிட்டல் கட்டண தளங்களைப் பயன்படுத்துதல்

### USE OF GLOBALLY RECOGNIZED DIGITAL PAYMENT PLATFORMS IN FOREIGN EXCHANGE TRANSACTIONS

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Thank you, Hon. Speaker, for allowing me to raise this Question.

ශ්‍රී ලංකා සංචාරක ආදායම්, ඩිජිටල් සේවා හා සුළු හා මධ්‍යම ව්‍යාපාරික මූලික අපනයනය මඟින් බාහිර අංශය නැවත ගොඩනැඟීමට උත්සාහ කරමින් සිටී. එහෙත් ගෝලීය ගෙවීම් ක්‍රමවේදයන්හි වේගවත් පරිවර්තනය හා රටේ විදේශ විනිමය හා ගෙවීම් පද්ධති අතර සැලකිය යුතු අසමානතාවක් පවතින බව පෙනේ. සංචාරක පැමිණීම වැඩිවීමත්, තරුණයන් අතර ඩිජිටල් ව්‍යාපාරිකත්වය වේගයෙන් වර්ධනය වීමත් සිදු වුවද මුදල් පිළිගැනීම, ගෙවීම් වේදිකා - payment platforms - හා විනිමය ක්‍රමවල සීමා හා අකාර්යක්ෂමතා ආදායම් ගලා ඒමට බාධා කරමින්, වෙළෙඳ පොළ විකෘති කරමින් සහ පුරවැසියන්ට හා ව්‍යාපාරවලට අනවශ්‍ය පිරිවැය පනවමින් ඇත.

With regard to modernizing Sri Lanka's foreign exchange ecosystem and supporting emerging sectors, I would like to ask the Hon. Minister of Finance, Planning and Economic Development the following questions:

1. What are the officially recognized and accepted "hard currencies" in Sri Lanka for transactions, settlements and reserves, and what criteria are used to determine such classifications?
2. Given the significant inflow of tourists, why has the Government not operationalized or encouraged the acceptance of currencies such as the Russian Ruble, the Indian Rupee, the Chinese Yuan and the Japanese Yen for domestic transactions through banks, hotels and digital payment systems?

Sir, I am asking this because, in the down South, you have other payment platforms which do not ensure that credit card payments get credited to Sri Lanka; instead, such monies go outside the country.

3. What are Central Bank's policy, regulatory or operational constraints that prevent the wider use of these currencies, both in cash transactions and card-based payments within Sri Lanka?
4. Why is there a substantial spread between the buying and selling rates of foreign currencies offered by banks and financial institutions? What oversight mechanisms are in place to ensure that such spreads are fair and not exploitative to consumers and businesses?

Sir, as you know, today, if a foreigner or a person who lives overseas comes to Sri Lanka, he would get Rs. 309 for a dollar at the Airport, but if he wants to buy a dollar, he has to pay Rs. 320. This type of disparity does not exist in any part of the world. So, I would look through the Answer for an explanation as to why there is such a big spread.

5. Advise total profits earned by licensed banks and the Central Bank from foreign exchange transactions with the Government and the public during the years 2023, 2024, 2025 and to date?
6. Why are globally recognized digital payment platforms such as PayPal, Wise and Skrill not fully enabled or interoperable in Sri Lanka for receiving export proceeds, freelance income and service payments?

Sir, as you know, we can remit funds out of the country, but anyone who wants to be paid for his services rendered from Sri Lanka to a person abroad cannot use a payment platform that brings dollars into the country. So, it is a crime.

7. What steps has the Government taken to facilitate seamless inward remittances and digital payments for Sri Lankan freelancers, startups and SMEs engaged in cross-border trade in services?
8. While digital currencies are not legally recognized, it is widely reported that cryptocurrency transactions continue to take place outside the formal financial system. What measures are being taken to regulate, monitor and bring such activities within the next tax net?

[ගරු රවි කරුණානායක මහතා]

Sir, there has been a report regarding a fraud that took place in the NDB, which had been going on for the last three years. Monies had been taken out of the country, remitted abroad. This had been reported in the Annual Reports for 2023/2024 and 2024/2025, but the Bank Supervision Department of the Central Bank has not been able to look into that matter. So, people are being harassed in these small matters by the Central Bank while big matters are not even looked into by the Central Bank. I have always been saying that it is the independence of the Central Bank that is really affecting the credibility of our economic system. So, I would greatly appreciate if you could look into this matter and get us an Answer.

Thank you, Sir.

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා කාලය ලබා ගන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, I just want to-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, the Hon. Deputy Minister has asked for time.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, the Hon. Minister (Dr.) Anil Jayantha or the Hon. Deputy Minister Nishantha Jayaweera always answer these Questions. But, when it comes to Questions relating to the Central Bank, there are 11 outstanding. What do they expect? Are they a separate entity which does not report to Parliament? This is the eleventh Question that the Central Bank is not answering. I am saying this for your own good, for the good of the Government. We are from the Opposition. So, this type of nonsense should not be permitted, Sir. I would greatly appreciate if you would look into this matter.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා අද දින පාර්ලිමේන්තුවට පැමිණ නොමැති බැවින්, ගරු රවි කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ 2026.01.22 අසන ලද ප්‍රශ්නයට, මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් ඉදිරි දිනයකදී පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව මා වෙත දන්වා තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, අද න්‍යාය පත්‍රය හදිසියේ සකස් කළත්, ලොකු අසාධාරණයක් වෙලා තිබෙනවා. ඔබතුමා බලන්න, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පහයි අද ඇතුළත් කර තිබෙන්නේ. නමුත් ප්‍රශ්න දහයක්වත් ඇතුළත් කරන්න තිබුණා. ඔබතුමා කාලය කළමනාකරණය කර ගන්න ඕනෑ නිසා ප්‍රශ්න අහන මන්ත්‍රීවරුන්ට වෙලාව දෙන්නේත් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අද නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කරලා නේ තිබුණේ. හදිසියේ ඊයේ කථා කරලා තමයි අද රැස්වීම් යොදා ගත්තේ.

වරප්‍රසාද ප්‍රශ්නය, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ 32 වගන්තිය ප්‍රකාරව, ගරු අධිකරණ ඇමතිතුමා විසින් අසභ්‍ය අභිනයක් සිදු කිරීමෙන් මාගේ වරප්‍රසාද කඩ වී ඇති බවටයි මම මේ යෝජනාව ඉදිරිපත් කළේ.

ගරු කථානායකතුමනි, "නහි වෙරෙන වෙරානි - සම්මන්තීධ කුදාචනං, අවෙරෙන ච සම්මන්ති - එස ධම්මො සනන්තනො" කියලා අපි ඉගෙන ගෙන තිබෙනවා. ඒ වාගේම සමාව දීම දේව ගතියක් කියලා අපේ දෙමාපියන්, වැඩිහිටියන් අපට උගන්වලා තිබෙනවා. අපි ඒවා අත් දැකලා තිබෙනවා. ගරු කථානායකතුමනි, එතුමා මගේ පැරණි මිත්‍රයා. ඒ නිසා එතුමා අතින් වරදක් වුණත් ඒ ගැන මගේ අහිතක් නැහැ. මම එතුමා කෙරෙහි මෛත්‍රී කරනවා. ඒ නිසා මම මේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරියට ගෙනියන්නේ නැහැ. මොකද, මේ ක්‍රියාදාමය තුළින් එතුමාට පෞද්ගලිකව අගතියක් වෙන්න පුළුවන්. ඒ නිසා මම එතුමාට සමාව දෙනවා, එතුමාට මෛත්‍රී කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා.

## මැද පෙරදිග යුද්ධය හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට වන බලපෑම අවම කිරීම
## மத்திய கிழக்குப் போர் இலங்கையின் பொருளாதாரத்தின்மீது செலுத்தும் தாக்கத்தைக் குறைத்தல்
## MITIGATE THE IMPACT OF MIDDLE EASTERN WAR ON SRI LANK'S ECONOMY

[පූ.භා. 10.19]

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "මැද පෙරදිග කලාපයේ ඇති වූ යුද උණුසුම සමඟ ගෝලීය වශයෙන් දැඩි සැපයුම් දාම අර්බුදයකට මුහුණ දෙන්නට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස බලශක්ති ප්‍රභවයක් ලෙස වැඩිම ඉල්ලුම පවතින ඉන්ධන සැපයුම සෘජු අවදානමකට ලක් විය. එසේම උද්ගත වූ යුද වාතාවරණය මත ගෝලීය ඉන්ධන මිල ඉතිහාසයේ ඉහළම අගයකට ලක් වූ අතරම යුද තත්ත්වය පදනම්ව නාවික ක්ෂේත්‍රයේ රක්ෂණ වාරික සහ අනෙකුත් වියදම් කැපී පෙනෙන ලෙස ඉහළ යාමක් සිදු විය.
>
> එම නිසා ඉන්ධන, ගෑස් සහ ගල් අඟුරු සැපයුම ස්ථාවරව පවත්වා ගෙන යාම, රාජ්‍ය සේවය අඛණ්ඩව, කාර්යක්ෂමව හා ක්‍රමානුකූලව පවත්වා ගනිමින් ආර්ථික කටයුතු පවත්වා ගැනීමට මෙන්ම මහජනතාව සඳහා අවශ්‍ය සේවාවන් සැපයීම, අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදා හැරීමේ රාජ්‍ය හා පෞද්ගලික සැපයුම් දාමයන් අඛණ්ඩව පවත්වා ගනිමින් මහජනතාවට වෙළෙඳ පොළ හිඟයකින් තොරව සාධාරණ මිලට භාණ්ඩ සැපයීම තහවුරු කිරීම, දෛනික ජන ජීවිතයේ ඇති වන ගැටලු සහ බලපෑම් ක්ෂණිකව හඳුනා ගෙන අවශ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් ඒ සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම යනාදි පියවර ගනිමින් සියලු පීඩනයන් මැද රටේ ආර්ථික ක්‍රියාවලිය බාධාවකින් තොරව පවත්වා ගැනීම සහ දෛනික ජන ජීවිතයට අවම බලපෑමක් ඇති වන ආකාරයෙන් තත්ත්වය කළමනාකරණය කර ගැනීමටත් රජය සිය උපරිම ශක්තිය යොදවමින් ඒ සඳහා කැප වී සිටී.
>
> ගෝලීය අර්බුද අවස්ථාවක රටේ ජනතාවට දැනෙන පීඩනය අවම කිරීමට රජය උපරිම කැපවීමෙන් කටයුතු කිරීමේදී ඒ සඳහා රටක් වශයෙන් පෙළ ගැසෙමින් අවශ්‍ය සහාය ලබා දිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු කථානායකතුමනි, අපි මේ පසු කරමින් ඉන්නේ ලෝක යුද තත්ත්වයක් නැති වුණත් මැද පෙරදිග කලාපය පදනම්ව මතු වුණු යුද තත්ත්වය හේතුවෙන් බරපතළ සැපයුම් දාම අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙන මොහොතක්. ඒ හේතුවෙන් බලශක්ති අර්බුදයක් ලෝකය පුරාම ඇති වී තිබෙනවා. එය සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින සෑම රාජ්‍යයකටම එක හා සමානව බලපාමින් තිබෙනවා. මේ අර්බුදය හේතුවෙන් අපි රටක් ලෙස, සමාජයක් ලෙස බරපතළ ලෙස පීඩාවට පත් වෙමින් අර්බුදවලට, ගැටලුවලට මුහුණ දෙමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ලෝක සමාජය ඉතිහාසයේ කවදාවත් රේඛීය ගමන් මඟක ගියේ නැහැ. ඉතිහාසයේ ඉඳන්ම හැම දාම ලෝකයේ කලබැගෑනි මතු වෙමින් තමයි සමාජය ඉස්සරහට ගමන් කළේ. සමාජ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යයනය කරද්දිත් අපි හඳුනාගන්නවා, සමාජ සංවර්ධන ක්‍රියාවලිය කියන්නේ සර්පිලාකාර ගමන් මඟක යන ක්‍රියාවලියක් කියලා. ඒ නිසා සමාජ ක්‍රම විධියටත්, සමාජ ක්‍රම තුළත් කියන දෙයාකාරයෙන්ම සමාජ තුළ අර්බුද නිර්මාණය වෙනවා. අපි සමාජයක් ලෙස පවතින්නේම නිෂ්පාදන ක්‍රියාවලිය මත. සමාජ සත්වයන් වන අප සමාජයක් ලෙස පවතින්නේ නිෂ්පාදන ක්‍රියාවලිය මත. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය බලය ඉතිහාසයේ ඉඳන්ම අවශ්‍ය වුණා. සමාජ ක්‍රම විධියට අධ්‍යයනය කරද්දී අපි හඳුනාගන්නවා, ප්‍රාථමික සාමූහික සමාජයේ ඉඳන් වහල්, වැඩවසම්, ධනේශ්වර, කොමියුනිස්ට් කියන සමාජ අවධි. ඒ හරහා සමාජ සංවර්ධන ක්‍රියාවලිය සිද්ධ වුණා. ඒ හැම ක්‍රියාවලියකදීම, හැම සමාජ අවධියකදීම බලය, බලශක්තිය කියන එක නිෂ්පාදන ක්‍රියාවලිය තුළ තිබෙන බව අපි අත්දැකලා තිබෙනවා.

අපි ප්‍රාථමික සාමූහික සමාජය ගත්තොත්, සාමූහික ශ්‍රම ක්‍රියාවලිය මත තමයි සමාජය පැවතුණේ. බලය බවට පත් වුණේ බාහු බලය. ප්‍රාථමික සාමූහික සමාජයෙන් එහාට ගිහිල්ලා වහල්හිමි සමාජය නිර්මාණය වෙනකොට වහල්හිමි සමාජයේත් ප්‍රධාන නිෂ්පාදන බලය වුණේ, බාහු බලය. ඒ අනුව වහලා මත නිෂ්පාදන ක්‍රියාවලිය තීරණය වුණා. වහල්හිමියා වහලා මත පීඩනය යොදවමින් වහලාගේ බාහු බලය මත නිෂ්පාදන ක්‍රියාවලිය පවත්වාගෙන ආවා. එතැනදීත් බලය ප්‍රධාන කාරණයක් බවට පත්

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

වුණා. ඒ වාගේම, වහල්හිමි සමාජය වැඩවසම් සමාජය බවට පත් වෙනකොට නිෂ්පාදන ක්‍රියාවලියේ නිෂ්පාදන උපකරණවල යම් සංවර්ධනයක් සිද්ධ වුණා වාගේම, ඊට සමගාමීව බලය සහ බලශක්තිය කියන එක තීරණාත්මක වුණා. වැඩවසම් ක්‍රමයේ අවසාන අවධිය වෙනකොට විශේෂයෙන් වාෂ්ප බල යන්ත්‍රය ඇතුළු බලවේග තාක්ෂණය නිර්මාණය වෙනවා. ඒක නිර්මාණය වෙන්න මූලික පදනම වෙන්නේ වාෂ්ප බලය, බලශක්තිය ලෙස යොදාගන්න ගත්තාට පස්සේ.

ඊට පස්සේ සමාජ ක්‍රමය නැවත සංවර්ධනය වුණා. අපි ඊට පස්සේ හඳුනාගන්නවා, මීට අවුරුදු 500කට විතර එහා නිර්මාණය වුණු ධනේෂ්වර සමාජය. ධනේෂ්වර සමාජයේත් මුල් අවධියේ ප්‍රධාන බලශක්ති ප්‍රභවය බවට පත්වෙනවා, ගල් අඟුරු. පොසිල ඉන්ධන සොයා ගත්තාට පස්සේ ගල්අඟුරු තමයි ප්‍රධාන ඉන්ධන ප්‍රභවය බවට පත් වෙන්නේ. ධනේෂ්වර සමාජ අවධියේ නැත්නම් කාර්මික විප්ලවය සිද්ධ වෙන අවධියේ ප්‍රධාන බලශක්ති ප්‍රභවය බවට පත්වන්නේ ගල් අඟුරු. ඒක තවදුරටත් ඉස්සරහට සංවර්ධනය වෙනවා. ඒ සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස ඛනිජ තෙල් කියන එක ප්‍රධාන සහ පහසු බලශක්ති ප්‍රභවය බවට පත්වෙනවා. ඊට පස්සේ ලෝකයේ සමාජ සංවර්ධනය සිද්ධ වෙනවා, රටවල් වෙන් වෙනවා, යටත්විජිත නිර්මාණය වෙනවා, යටත්විජිතවලින් රටවල් නිදහස් වෙනවා, රටවල් සංවර්ධනය කරා ගමන් කරනවා. ලෝකයේ සංවර්ධනය වුණු සහ සංවර්ධනයේ ඉහළම හිනිපෙත්තට ගිය රටවල්, අනෙකුත් රටවල් සූරාකෑම සහ කොල්ලකෑම හරහා ඔවුන්ගේ රාජ්‍යයන් නිර්මාණය කරනවා, ඔවුන්ගේ රාජ්‍යයන් ආදර්ශවත් රාජ්‍යයන් ලෙස ගොඩනඟනවා. හැබැයි ඒකට පදනමක් තිබෙනවා. විශේෂයෙන්ම ඒ පදනම පතුළේ තිබෙන්නේ බලශක්තිය අත්පත් කර ගැනීම, නැත්නම් කොල්ලකෑම. ඔය කියන පදනම තුළ තමයි මේ අර්බුදයට මඟ පෑදෙන්නේ. මේ අර්බුදයට මූලික හේතුව වෙන්නේ, බලශක්තිය. එහෙම නැත්නම් මේ යුද්ධයට හේතුව, බලශක්තිය. මේ යුද්ධයට හේතුව වෙලා තිබෙන්නෙත් ඛනිජ තෙල්. ඛනිජ තෙල් මත තමයි මේ යුද්ධය ආරම්භ වීම තීරණය වෙන්නේ.

ඉතිහාසයේ ඉඳලාම මැද පෙරදිග කලාපය කියන්නේ ලෝකයේ ඛනිජ තෙල් සුලබව තිබෙන, පහසුවෙන් ඛනිජ තෙල් ගොඩගන්න පුළුවන් භූමි කලාපයක් බව අපි දන්නවා. එම නිසාම මැද පෙරදිග කලාපය සෑම රටකටම ප්‍රධාන වෙලා තිබෙනවා. ඒ වාගේම වැදගත් වෙලා තිබෙනවා. සෑම රටකම නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව සහ වර්ධිතව ගෙන යන්න නම්, සංවර්ධනය කරගෙන ඉස්සරහට අරගෙන යන්න නම්, අනිවාර්යයෙන්ම මැද පෙරදිග කලාපයේ නිෂ්පාදනය වන ඛනිජ තෙල් තමන්ට අත්පත් කර ගැනීම සඳහා වන ක්‍රමවේදයක් තමන් හොයා ගන්න ඕනෑකම තිබෙනවා. මේ යුද්ධයට මඟ පෑදෙන්නෙත් ඔන්න ඔය කියන මූලික පදනම. මැද පෙරදිග කලාපය තුළ තමන්ගේ අණසක පතුරවා ගන්න, තමන්ගේ අණසක පතුරවන්න උත්සාහ කරන රාජ්‍යයන් සිටිනවා. එකක් නොවෙයි, රාජ්‍යයන් විශාල ප්‍රමාණයක් මේ සඳහා තරගයක නියැළෙනවා. ඒ තරගය තුළදී තමන්ගේ අරමුණු ඉෂ්ට කර ගැනීම වෙනුවෙන් කේන්ද්‍ර ගණනාවක් විසින් එක් එක් රාජ්‍යයන් තුළ තමන්ගේ බලය යොදවමින් සහ තමන්ගේ ආධිපත්‍යය යොදවමින් තමන් තහවුරු වීම සඳහා වන ක්‍රියාවලියේ නිරත වෙමින් සිටිනවා. බල කේන්ද්‍ර ගණනාවක් විසින් මැද පෙරදිග කලාපය තමන්ට වුවමනා ලෙස නතු කර ගැනීම සඳහා වන වැඩ පිළිවෙළක ඉන්නවා. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි ඉරානය මූලික කරගෙන මේ යුදමය වාතාවරණය නිර්මාණය වෙන්නේ.

ඒ යුද වාතාවරණය නිර්මාණය වෙන්න බලපෑ ප්‍රධානම සාධකය, මූලය බවට පත් වෙන්නේ ඛනිජ තෙල්. යුද්ධය ආරම්භ වෙලා ඉස්සරහට යද්දි සිදු වන ඊළඟ කාරණය තමයි, සැපයුම් දාමයේ අර්බුදයක් ඇති වීම. ඒ සැපයුම් දාමයේ අර්බුදය නිර්මාණය වෙන්නෙත් ඛනිජ තෙල් මත පදනම් වෙලා. ඒ නිසාම ඛනිජ තෙල් අර්බුදයක්, එහෙම නැත්නම් බලශක්ති අර්බුදයක් ලෝකය පුරා නිර්මාණය වෙන්න පටන් ගන්නවා. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි අපටත් මේ අර්බුදය නිර්මාණය වෙන්නේ.  අපේ රට තුළටත් මේ අර්බුදය ගමන් කරන්න පටන් ගන්නේ. එහි ප්‍රතිඵලයක් විධියට තමයි අපේ රටට, අපේ සමාජයට මේ බලපෑම එන්න පටන් ගන්නේ.

රටක් විධියට ගත්තොත්, අපිත් ඉතිහාසයේ ඉඳලාම රේඛීයව ගමන් කළේ නැහැ. ඒ නිසා මෙවැනි අර්බුද ලෝකය තුළ නිර්මාණය වන නිසාම  සමාජ ක්‍රමයක් ලෙස සංවර්ධනය වෙලා ඉස්සරහට යද්දි පි රටක්, ආර්ථිකයක් ලෙස යම් ස්ථාවරත්වයක්, ශක්තිමත්භාවයක් අත්පත් කර ගත යුතුව තිබෙනවා. නමුත් අපි දන්නවා, ලෝකයේ සිදු වන කුඩා කැලඹීමකින් පවා අපට බලපෑමක් සිදු වන බව. ඒ කැලඹීමට මුහුණ දීමට නොහැකිව අර්බුද ගණනාවකට අපි නතු වනවා. මේකත් ඒ ජාතියේ එකක්. අපි රටක් විධියට මේ අර්බුදයට මුහුණ දෙනවා. හේතුව තමයි, මේ අර්බුදය තුළ ස්ථාවරව, එහෙම නැත්නම් මේ අර්බුදයට මුහුණ දීම සඳහා වන ශක්තිමත්භාවය අත්පත් කර ගැනීම සඳහා වන අපේ හැකියාව අවම වෙලා තිබීම. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි මේ අර්බුදය අපට නිර්මාණය වෙන්නේ. ඒ නිසාම අපි මේ රට භාර ගත්තාට පසුව ආණ්ඩුවක් ලෙස අපේ ප්‍රධානම කාර්යය බවට පත් කර ගත්තේ අපේ නිෂ්පාදන ආර්ථිකය ගොඩනැඟීමයි. හැබැයි, ඒක මාසයෙන්, මාස දෙකෙන්, අවුරුද්දෙන් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. අපි රටක් ලෙස අවම වශයෙන් 1977ට පෙර තිබුණු තත්ත්වයටවත් ඇවිල්ලා හිටියා නම් අපිට ආර්ථිකයක් විධියට යම් ශක්තිමත්භාවයක් අත්පත් කර ගන්න පුළුවන්කම තිබුණා. අන්න ඒ සඳහා වන ක්‍රියාවලියේ ගමන් කරමින් සිටින මොහොතක තමයි අපිට මේ අර්බුදය නිර්මාණය වෙලා තිබෙන්නේ.  ඒ නිසා දැන් අපිට තිබෙන්නේ ආර්ථිකය නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා වර්ධනය කරනවා වෙනුවට, අපි ඒ ආර්ථිකය කළමනාකරණය කරන්නේ කොහොමද කියලා කල්පනා කරන එකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over now.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
මම තව පොඩි වෙලාවක් ගන්නවා, ගරු කථානායකතුමනි.

නිෂ්පාදන ආර්ථිකයක් ලෙසත්, ශක්තිමත් ආර්ථිකයක් ලෙසත් සංවර්ධනය කිරීම කෙසේ වෙතත්, මේ මොහොතේ අපට කරන්න සිද්ධ වෙලා තිබෙන මූලික කාර්යභාරය තමයි ආර්ථිකය තුළ ජනතාවට සිදු වන බලපෑම අවම වන ලෙස කළමනාකරණය කර ගැනීම. අන්න ඒ සඳහා තමයි අපි ආණ්ඩුවක් ලෙස මේ මොහොතේ මැදිහත්ව කටයුතු කරමින් සිටින්නේ. ඒ නිසා මේ පාර්ලිමේන්තුව විධියට, ආණ්ඩු පක්ෂය හා විපක්ෂය විධියට, රාජ්‍ය සේවය විධියට, රාජ්‍ය නිලධාරින් විධියට, රාජ්‍ය ආයතන විධියට සහ පොදුවේ සමාජය විධියට මේ අර්බුදය රටේ ආර්ථිකයට අවම බලපෑමක් වන ලෙස කළමනාකරණය කර ගැනීම සඳහා සියලු දෙනා මැදිහත් විය යුතුයි කියලා අපි හිතනවා. අන්න ඒ සඳහා සියලු දෙනා එකතු විය යුතුයි කියන යෝජනාව තමයි මගේ පැත්තෙන් ඉදිරිපත් කරන්නේ. ඒ වෙනුවෙන් සියලු දෙනාට එකතු වෙන්න, සියලු දෙනාට මැදිහත් වෙන්න, සංවිධානය වෙන්න කියන ආරාධනය කරන්න කැමැතියි.  මට කථා කරන්න මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani to second the Adjournment Motion. You have ten minutes.

[පූ.භා. 10.31]

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අද දවසේ ඉදිරිපත් කර තිබෙන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ස්ථිර කිරීම තමයි මට පැවරුණු කාර්යභාරය වෙන්නේ. ගරු කථානායකතුමනි, අපි 2024 අවුරුද්දේ මේ රට භාර ගන්නකොට ආර්ථික, දේශපාලන, සමාජීය වශයෙන් සමස්තය අතින් කඩා වැටුණු රටක් තමයි අපිට ලැබුණේ. එසේ කඩා වැටුණු රටක අපිට තිබුණු පළමු අභියෝගය තමයි රටේ ආර්ථික ස්ථාවරභාවය ගොඩනඟන එක.

ගරු කථානායකතුමනි, කඩා වැටුණු රටක අවුරුද්දක් ඇතුළත අපට ආර්ථිකයේ සියලු ක්ෂේත්‍රයන්හි යම් දර්ශක ප්‍රමාණයක් අත්පත් කර ගන්න පුළුවන් වෙයි කියලා අපි පුරෝකථනය කර ගැනීමක් කර ගත්තා. ඇත්තටම මේ රටේ මහජනතාවගේ වාසනාවට අපි බලාපොරොත්තු වුණාටත් වඩා වැඩි වර්ධනයක් මේ සියලු ක්ෂේත්‍රයන්හි අත්පත් කර ගන්නට අපට හැකියාව ලැබුණා කියලා මම කියනවා. ඒ නිසාම අපි හිතුවාටත් වඩා හොඳ ආර්ථික ස්ථාවරභාවයක් ඇති කර ගන්න අපට පුළුවන් වුණා. පළමුවැනි අභියෝගය අපි හිතුවාටත් වඩා හොඳින් ජයග්‍රහණය කර ගන්න ආණ්ඩුවක් හැටියට අපට හැකියාව ලැබුණා.

ගරු කථානායකතුමනි, ඉතාම හොඳ ආර්ථික ස්ථාවරභාවයක් ගොඩ නඟා ගන්න පුළුවන් වීම ඇතුළේ 2025 අවුරුද්දේ අය වැය හිඟය 2.4 දක්වා අඩු අගයකට අරගෙන එන්න අපට හැකියාව ලැබුණා. ඒ වාගේම තමයි ජංගම ගිණුමේ ධන අතිරික්තය ඩොලර් බිලියන 1.8 දක්වා වැඩි කර ගන්නත් අපට පුළුවන්කම ලැබුණේ අපි බලාපොරොත්තු වුණු හැම අංශයකම හිතුවාට වඩා වැඩි ආර්ථික වර්ධනයක් අත්පත් කරගන්න හැකි වෙච්ච නිසා. ඒ නිසාම අපේ සමස්ත ආදායම සියයට 17.5ක් දක්වා වැඩි කර ගන්න හැකියාව ලැබුණා.

ගරු කථානායකතුමනි, අපේ 2025 අය වැය කියන්නේ කඩා වැටුණු රටක මාස පහක් ඇතුළත අපි ඉදිරිපත් කරන පළමුවැනි අය වැය. ඒ අය වැය ඇතුළේත් ආර්ථික ස්ථාවරභාවය හදා ගැනීම තුළින්ම අපේ රටේ මහජනතාවට ඉතාම හොඳ ප්‍රතිලාභ ප්‍රමාණයක් අත්පත් කර දෙන්න අපට හැකියාව ලැබුණා. ඒ වාගේම තමයි 2026 වර්ෂයේ අපි ඉදිරිපත් කරපු දෙවැනි අය වැය. ඒ අය වැය ඇතුළේත් අපේ රටේ ජනතාවගේ ජීවිත ඉතා ඉහළ තැනකට ඔසවා තැබීම වෙනුවෙන් අපට පියවර රැසක් ගන්නට හැකියාව ලැබුණා.

ගරු කථානායකතුමනි, අපි රට ස්ථාවර කරලා සංවර්ධන මාවතේ ඉතාම පරිස්සමින් ගමන් කරමින් යන මොහොතක තමයි 2025 නොවැම්බර් මාසයේදී අනපේක්ෂිත විධියට "දිට්වා" සුළි කුණාටුවට මුහුණ දෙන්න සිදු වන්නේ. අපේ රට මුහුණ දුන් දැවැන්තම ස්වාභාවික ව්‍යසන අතරින් එකක් තමයි "දිට්වා" සුළි කුණාටුව. ගරු කථානායකතුමනි, මේ ව්‍යසනය නිසා අපේ දිස්ත්‍රික්කවල බහුතර ආදරණීය ජනතාවකගේ ජීවිත ප්‍රමාණයක් නැති වුණා. ඒ ජීවිත වෙනුවෙන් ජීවිත දෙන්න ආණ්ඩුවක් විධියට අපට නොහැකි වුණත්, ඉතිරි වුණු ආදරණීය ජනතාවගේ ජීවිත නඟා සිටුවීම වෙනුවෙන් අපට ආණ්ඩුවක් විධියට ඉතාම හොඳ තීන්දු තීරණ ගන්න හැකියාව, ශක්තිමත්භාවය අපි හදාගෙන තිබුණා, ගරු කථානායකතුමනි. කඩා වැටුණු රටක සිදුවන දැවැන්තම ස්වාභාවික ව්‍යසනය රටේ පොදු කඩා වැටීමක් බවට පත් කර නොගෙන, රටේ මහජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීම වෙනුවෙන් තීන්දු තීරණ ගන්න අපට හැකියාව ලැබුණා. විශේෂයෙන්ම ඒ ප්‍රදේශවල ජනතාවට දෙන්න ඕනෑ ප්‍රතිලාභ ගත්තොත්, ඔවුන් කටු මැටි පැලක සිටියා නම් ඒ ජීවිත ඊට වඩා හොඳ ස්ථාවරභාවයකට ගන්න, මාර්ග පද්ධතිය ස්ථාවර තත්ත්වයකට ගොඩනඟන්න, ඒ සියලු අංශ ස්පර්ශ කරමින් "දිට්වා" සුළි කුණාටුවෙන් වූ හානිය කළමනාකරණය කරන්න මේ මොහොත වන විට අපි ඉතාම හොඳින් කටයුතු කරමින් ඉන්නවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අපට මේ තත්ත්වයන් ඉතාම හොඳින් කළමනාකරණය කර ගන්න හැකියාව ලැබුණේ, ඒක අපේ රට ඇතුළේ තිබෙන ප්‍රශ්නයක් නිසායි. එම නිසා ඒ ජීවිත තිබුණාටත් වඩා හොඳින් ඔසවා තබන්නට අවශ්‍ය තීන්දු තීරණ ගන්න අපට හැකියාව ලැබුණා. ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුව නිසාවෙන් රටේ ඇති වූ තත්ත්වයට මුහුණ දීමේදී අපි සමස්ත පොදු මහ ජනතාවටම බලපාන විධියට තීන්දු තීරණ ගත්තේ නැහැ. "දිට්වා" සුළි කුණාටුව ඇති වුණා කියලා අපි ඉන්ධන මිල වැඩි කළේ නැහැ, ගෑස් මිල වැඩි කළේ නැහැ. ඒ තත්ත්වය ඉතාම හොඳින් කළමනාකරණය කර ගන්න අපට හැකියාව ලැබුණා.

ගරු කථානායකතුමනි, දැන් අපේ රට තුළත් මේ අර්බුදකාරී තත්ත්වය නිර්මාණය වෙලා තිබෙන්නේ මේ වනකොට ලෝකයේ බහුතර කලාපයක් යුද්ධමය කලාපයක් බවට පත් වෙමින් තිබෙන නිසායි. ගරු කථානායකතුමනි, මෙවැනි තත්ත්වයන් හමුවේ අපේ රටටත් යම් බලපෑමක් ඇති වන්න පුළුවන්. එසේ ඇති වන බලපෑමේ සැබෑ තත්ත්වයන්ට තමයි අපි දැන් මුහුණ දෙමින් ඉන්නේ. ඉන්ධන අර්බුදය ගත්තත්, ගෑස් අර්බුදය ගත්තත්, විදුලිය අර්බුදය ගත්තත්, ඒ වාගේම භාණ්ඩවල මිල ඉහළ යෑම ගත්තත්, ඒ සමස්තයෙන්ම කියන්නේ මෙවැනි අර්බුදකාරී අවස්ථාවකදී අපට මුහුණ දෙන්න වන සැබෑ තත්ත්වයයි.

ගරු කථානායකතුමනි, 2022-2023 කාලයේ ඇති වුණු බලශක්ති අර්බුදය ගත්තොත්, ලෝක වෙළෙඳ පොළේ බලශක්ති මිල ඉහළ යෑමට ප්‍රධාන හේතුව වුණේ ඩොලරයේ අගය ඉහළ යෑමයි. හැබැයි, අපි දැන් මුහුණ දෙන්නේ එවැනි තත්ත්වයකට නොවෙයි. 2023 වර්ෂය ගත්තොත්, පෙට්‍රල්වල මිල සියයට 279ක් වාගේ ප්‍රමාණයකින් ඉහළ ගිහින් තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, මේ වෙලාවේ ඉන්ධන මිල ඉහළ යෑමට බලපා තිබෙන කාරණා හැටියට ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා කරපු යෝජනාව ඇතුළේ තිබුණේ ඉතාම සාධනීය කාරණායි. ගරු කථානායකතුමනි, ඒවා අරගෙන බැලුවොත්, ලෝක යුද්ධමය තත්ත්වය නිසාවෙන් ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ යෑමත්, ඒ වාගේම ප්‍රීමියම් එක ඉහළ යෑමත් නිසා මේ වනකොට ඉන්ධන වෙළෙඳ පොළට සෘජු බලපෑමක් ඇති වෙලා තිබෙනවා. මේ වනකොට මුළු ලෝකයම බලශක්ති අර්බුදයක් කරා ගමන් කරමින් තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, තෙල් නිෂ්පාදනය කරන රටවල් හැර අනෙකුත් සියලුම රටවල් වාගේ තෙල් මිල ඉහළ දමා තිබෙනවා. ඒ ඉහළ යෑම සියයට 6ත්, 50ත් අතර ප්‍රමාණයක් වනවා.

ගරු කථානායකතුමනි, ලෝකයත් එක්ක සාපේක්ෂ වශයෙන් බලනකොට අපේ රටේ ඉන්ධන මිල ඉහළ ගිහිල්ලා තිබෙන්නේ සියයට 8ක වාගේ ප්‍රමාණයකින්. ඒක ඉතාම හොඳින් කළමනාකරණය කරන්න ආණ්ඩුවක් හැටියට අපි පියවර අරගෙන තිබෙනවා. ඒ වාගේම තෙල් මිල ඉහළ යෑමේ බර ඒ අයුරින්ම තෙල් පාරිභෝගිකයාට අපි ලබා දීලා නැහැ. විශේෂයෙන්ම මේ තත්ත්වය අපි මොන තරම් ඉහළින් කළමනාකරණය කරනවාද

[ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය]

කියලා කිව්වොත්, ඩීසල් ලීටරයකින් රුපියල් 100ක් ආණ්ඩුව දරා ගන්නවා. ඒ වාගේම පෙට්‍රල් ලීටරයකින් ආණ්ඩුව රුපියල් 20ක මුදලක් දරා ගන්නවා. ගරු කථානායකතුමනි, අපි දන්නවා, ඉන්ධන මිල ඉහළ යෑම අපේ සමස්ත ආර්ථිකයටම බලපාන්න පුළුවන් බව. ඒක ප්‍රවාහනයට බලපාන්න පුළුවන්, නිෂ්පාදන පිරිවැය ඉහළ යෑමට බලපාන්න පුළුවන්, ඒ වාගේම අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ යෑමට බලපාන්න පුළුවන්. ඒ වාගේම විදුලි බිල ඉහළ යෑමටත් එය බලපානවා කියන එකත් යථාර්ථයක්. ගරු කථානායකතුමනි, මෙවැනි තත්ත්වයන් ඉතාම හොඳින් කළමනාකරණය කරමින්, අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟයකින් තොරව සපයමින්, ආර්ථිකය නතර කරලා තීන්දු තීරණ ගන්නේ නැතුව, ආර්ථිකය පවත්වාගෙන යමින්, ඒ වාගේම රට කඩා වැටීමකින් තොරව ඉදිරියට අරගෙන යෑම වෙනුවෙන් මේ තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා ආණ්ඩුවක් විධියට අපි තීන්දු තීරණ ගනිමින් ඉන්නවා.

මේ තත්ත්වය හමුවේ බලපෑමට ලක් වන ඉලක්කගත ජන කණ්ඩායම් වෙනුවෙන් සහන ලබා දීමටත් අපි කටයුතු කරමින් ඉන්නවා. ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මෙවැනි අවස්ථාවකදී ආර්ථිකය කඩා වැටෙන්නේ නැතුව ආර්ථික ශක්තිමත්භාවය හදා ගනිමින්, ඉලක්කගත ජන කණ්ඩායම් වෙනුවෙන් සහන ලබා දීම සම්බන්ධයෙන් ජනාධිපතිතුමා ඊයේ මේ ගරු සභාවේදී කථා කළා. අපි රුපියල් බිලියන 100ක සහන පැකේජයක් මේ විශේෂ අවස්ථාවේදී මහජනතාව වෙනුවෙන් හඳුන්වා දී තිබෙනවා. විදුලිය ජනනය සඳහා යන අමතර පිරිවැයෙහි බර විදුලි පාරිභෝගිකයින් මත නොතබා අපි ඒකක 90ට වඩා අඩුවෙන් පාවිච්චි කරන පාරිභෝගිකයින් සඳහා රුපියල් කෝටි 1,500ක මුදලක් මේ සහන පැකේජය තුළින් වෙන් කර තිබෙනවා. ඒ වාගේම ධීවර ජනතාව වෙනුවෙන් මාස තුනක කාලයකට ඉන්ධන සහනාධාරයක් ලබා දීම සඳහා රුපියල් කෝටි 6,000ක මුදලක් වෙන් කර තිබෙනවා. බහුදින ධීවර යාත්‍රා සඳහා එක් වරක් පමණක් ගෙවනු ලබන රුපියල් 150,000ක සහනාධාරයට අවශ්‍ය මුදල් අපි වෙන් කර තිබෙනවා. යල කන්නයේ වී වගාව සඳහා ගොවි ජනතාව වෙනුවෙන් ලබා දෙන පොහොර සහනාධාරය රුපියල් 30,000 දක්වා අපි වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම අතිරේක භෝග වගාවන් සඳහා ලබා දෙන සහනාධාරය රුපියල් 18,000ක් දක්වා වැඩි කරලා තිබෙනවා. යූරියා කිලෝග්‍රෑම් 50ක් සඳහා රුපියල් 10,200ක ස්ථාවර මිලක් පවත්වා ගන්නට අපට මේ අර්බුදය හමුවේ වුණත් හැකියාව ලැබිලා තිබෙනවා. විශේෂයෙන්ම කුඩා තේ වතු හිමියන්ට එක් වරක් පමණක් ලබා දෙන රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙන්නත් අපි කටයුතු කරලා තිබෙනවා.

අඩු ආදායම්ලාභීන්ට මේ තත්ත්වයේ බලපෑම වැඩි වෙන්න පුළුවන්. අන්න ඒ නිසා අපි ඒ ඉලක්කගත කණ්ඩායම වෙනුවෙන් මේ වෙලාවේ සහන පැකේජයක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. අන්ත දිළිඳු කණ්ඩායම වෙනුවෙන් රුපියල් 7,500කින් අස්වැසුම ප්‍රතිලාභය වැඩි කිරීමටත්, ඒ වාගේම ඊළඟ කණ්ඩායම වෙනුවෙන් රුපියල් 5,000කින් අස්වැසුම ප්‍රතිලාභය වැඩි කිරීමටත්, ඒ වාගේම සංක්‍රාන්තික කණ්ඩායම වෙනුවෙන් රුපියල් 2,500කින් අස්වැසුම ප්‍රතිලාභය වැඩි කිරීමටත් අපි කටයුතු කරලා තිබෙනවා. මම අපේ රටේ ආදරණීය ජනතාවට කියන්න කැමැතියි, මෙය ගෝලීය අර්බුදයක් නිසා ඇතිවුණු තත්ත්වයක් වුණත්, මේ උත්සව සමයේ ඉන්ධන, ගෑස් සහ අත්‍යවශ්‍ය භාණ්ඩ කිසිදු හිඟයකින් තොරව සැපයීම කරන්න පුළුවන් තැනට අපි මේ කටයුතු කළමනාකරණය කර තිබෙන බව.

සැපයුම් දාමයේ හා ආර්ථිකයේ මෙහෙයුම් කමිටුව මඟින් මනා කළමනාකාරිත්වයක් සහිතව ආර්ථිකයේ සමතුලිතභාවය පවත්වාගෙන යෑම වෙනුවෙන් අඛණ්ඩ මැදිහත්වීමක් කරමින් ඉන්නවා. ඒ වාගේම රාජ්‍ය සේවය, විදේශ කටයුතු, ආරක්ෂාව ඇතුළු සමස්තය පිළිබඳව මෙවැනි මොහොතකදී ඇති වෙන්න පුළුවන් තත්ත්වයන් කළමනාකරණය කර ගනිමින් රටේ සුරක්ෂිතභාවය මෙන්ම ජනතාවගේ සුරක්ෂිතභාවයත් අපි ගොඩ නඟමින් ඉන්නවා.

ගරු කථානායකතුමනි, අපි මේ තත්ත්වය ලෝකයේ අනෙක් සියලු රටවලට වඩා ඉතාම හොඳින් කළමනාකරණය කරමින් ඉන්න බව මම කියන්න කැමැතියි. ඒ නිසා මේ උත්සව සමයේ රටේ මහජනතාව කිසිදු කැලඹීමකට, පීඩාවකට ලක් විය යුතු නැහැ. පටු දේශපාලන අරමුණක් වෙනුවෙන් මේ මොහොත පාවිච්චි කරන්නේ නැතිව මේ සමස්තය කළමනාකරණය කර ගනිමින් ලෝකයේ පවතින තත්ත්වය ඉතාම හොඳින් ජය ගැනීමට සාමූහිකව අපි එකතු වෙමු කියා විපක්ෂයේ ඉන්න ගරු මන්ත්‍රීවරුන්ටත්, රටේ ඉන්න ආදරණීය ජනතාවටත් ආරාධනය කරමින්, අද දවසේ ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ගෙන එන ලද කාලෝචිත යෝජනාව ස්ථිර කරමින් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Arjuna Sujeewa Senasinghe. You have 12 minutes.

[පූ.භා. 10.42]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට ඇත්තටම සන්තෝෂයි, ජනතා විමුක්ති පෙරමුණේ සහ මාලිමාවේ මන්ත්‍රීවරුන් ඉතාම ආදරණීය ලෙස බලශක්තිය සම්බන්ධයෙන්, නිෂ්පාදන සම්බන්ධයෙන් දැන් කථා කිරීම ගැන. මේ අය විපක්ෂයේ හිටියා නම් මේ වනකොට ආණ්ඩු පක්ෂයේ බෙල්ල මිරිකලා; උද්ඝෝෂණ කරලා රට වට්ටලා. යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා ඉතාම ලස්සනට බලශක්තිය සම්බන්ධයෙන්, ගල් යුගය සම්බන්ධයෙන්, වහල්භාවය සම්බන්ධයෙන්, නිෂ්පාදන සම්බන්ධයෙන්, තාප විදුලි නිෂ්පාදනය සම්බන්ධයෙන් අදහස් පළ කළා. නමුත්, මේක නොවෙයි තිබෙන ප්‍රශ්නය.

ගරු කථානායකතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව සෑහෙන අසාර්ථකයි, ඔබතුමාත් එක්කම. ඒක ඔබතුමාත් දන්නවා. ගරු කථානායකතුමනි, මේ වනකොට ඇති වී තිබෙන යුද්ධමය තත්ත්වය ලෝකයටම බලපා තිබෙනවා. හෝමුස් සමුද්‍ර සන්ධිය විවෘත කරලා තිබෙනවා, අප්‍රේල් වෙනකම් තෙල් තිබෙනවා කියලා "ලොරි ටෝක්" දුන්නා. එහෙම තිබුණා නම්, තෙල් මිල වැඩි කරන්න ඕනෑ නැහැ නේ. ඉන්දියාව එහෙමයි මේ දේවල් කළමනාකරණය කරන්නේ. ඉගෙන ගන්න, ඉන්දියාවෙන්. ඒ රටේ ජනගහනය බිලියන 1.5යි; ලංකාවේ මිලියන 22යි. මේ හුණ්ඩුවට කර ගන්න බැහැ කියලා ජනාධිපතිවරයා පිළිගන්නවා. ගරු කථානායකතුමනි, අප්‍රේල් වෙනකම් තෙල් තිබෙනවා නම් තෙල් මිල වැඩි කරන්නේ මොකටද? මාස දෙක තුනකට තෙල් තිබෙන්න ඕනෑ. සියයට 40යි තෙල් තිබෙන්නේ. අනාථ වෙලා ඉන්නේ; හොල්මන් වෙලා ඉන්නේ, ජනාධිපතිවරයා. ඊයේ හරි අහිංසක විධියට කථා කළේ. වෙන දවස්වල නම් ඇවිල්ලා තග පාට් එක දාලා යන්නේ. මොකක්ද මේ කියන්නේ? මේකයි මේ හේතුව. රටට තිබෙන ආදරයකට නොවෙයි. ලංකාවට බය හිතෙන

වාර්තාවක් ලෝක බැංකුවෙන් ලැබී තිබෙනවා. ආසියාවේ වැඩිම විදුලි බිල, සියයට 33කට කන්න නැහැ, තරුණයින්ට රැකියා නැහැ කියලා එහි තිබෙනවා. අපි නොවෙයි මේ කියන්නේ, ලෝක බැංකුව. අද රුපියල ඩොලරයට සාපේක්ෂව ගත්තාම 315යි; 290ට තිබුණේ. මේක තමයි අද මේ රටේ තත්ත්වය.

ගරු මන්ත්‍රීතුමිය කිව්වා, සියයට 8කින් ලංකාවේ තෙල් මිල වැඩි වෙලා, අනික් රටවලත් තෙල් මිල වැඩි වෙනවා කියලා. හැබැයි, අනික් රටවල එහෙම තෙල් මිල වැඩි වෙලා නැහැ. මගේ ළඟ තිබෙන ලේඛනය අනුව වැඩිම තෙල් මිල තිබෙන්නේ කාම්බෝජයේ. එය සියයට 68යි; වියට්නාමයේ සියයට 50යි. ලෝකයේ තෙල් මිල වැඩිම රටවල් අතුරින් ලංකාව ඉන්නේ තුන්වැනි තැන. මෙන්න, කෙරුවාව. ඕක තමයි අපි කිව්වේ, පළපුරුද්ද නැහැ, හැකියාව නැහැ, උද්ඝෝෂණය පමණයි පුළුවන් කියලා. බිලියන ගණනක් විනාශ කළා. මේ රටේ සාම්පූර් බලාගාරය පටන් ගන්න දුන්නේ නැහැ. අපේ රට කාලකණ්ණි කළා. ප්‍රභාකරන් සහ JVP එක තමයි රට විනාශ කළේ. *[බාධා කිරීමක්]* ආ! නොවෙයි. උද්ඝෝෂණ කරලා රටේ සංවර්ධනයක් ඇති වෙන්න දුන්නේ නැහැ; නිෂ්පාදන ඇති වෙන්න දුන්නේ නැහැ. *[බාධා කිරීමක්]* දැන් ඉන්නවා, බබාලා වාගේ. දැන් මොකක්ද මේ කියන්නේ? සියයට 35යි, විදුලි බිල; ලෝකයේ තුන්වැනි තැන ඉන්නේ අපේ රට. උත්තර දෙන්න මේකට. ලෝකයේ තුන්වැනි තැනට තිබෙන්නේ අපේ රටේ විදුලි බිල. විදුලි බිල සියයට 30කින් අඩු කරනවාය කියලා තමයි බලයට ආවේ. තෙල් මිලත් අඩු කරනවාය කියලා තමයි ආවේ. හාල් ගෙන්වන්නේ නැහැ කිව්වා. හාල් ගෙන්වන්නේ නැහැ කියපු කෙනාගේ බඩ විතරයි මහත් වෙලා තිබෙන්නේ. වෙන මොනවාත් වෙලා නැහැ. හාල් ඊයේත් order කරලා. ජනාධිපතිවරයා, කියපු ඔක්කොටම ප්‍රතිවිරුද්ධව ඒ කාලයේ රැවුල වවලා, කොණ්ඩේ වවලා ඉඳිද්දී කථා කරපුවා අපි ළඟ තිබෙනවා. ඒ, කොණ්ඩේ කපලා, double-pocket shirts ඇඳලා ලස්සනට ඉන්න කාලයේ නොවෙයි, ඊට කලින් කථා කරපුවා. ඒ ඔක්කොම කථා අහලා බලන්න. අපට පෙන්වන්න දෙනවා නම් අපි ඒ ඔක්කොම පෙන්වනවා. මහ ලේකම්තුමිය අපට ඒකට ඉඩ දෙන්නේ නැහැ නේ. ඒකට එහෙම නීතියකුත් නැහැ. නැත්නම් මට පෙන්වන්න පුළුවන්, රූපවාහිනියේ ගිය කථා ටික. ඒ කථා එකින් එකට දාලා පෙන්වන්න පුළුවන්, කොහොමද ඒගොල්ලන් රට කෑවේ, ඒ කාලයේ මේ අය උද්ඝෝෂණ කළේ කොහොමද කියලා.

ඊළඟට බලන්න, විදුලි ගාස්තුව වැඩි වීම ගැන. ඊයේ ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා කියනවා, රුපියලයි කියලා. බලන්න, විදුලි ගාස්තුව වැඩි වෙලා තිබෙන විධිය. රුපියල් 4,700 නම් 5,100යි; රුපියල් 6,000 නම් 6,400යි; රුපියල් 8,000 නම් 9,000 ගණනක්. සියයට 20කින් විතර විදුලි බිල වැඩි වෙනවා. තව ඉස්සරහට විදුලි ගාස්තුව ඊට වඩා වැඩි වෙනවා, මේ ගල් අඟුරු හොරකමත් එක්ක. ඒක තනිකර හොරකමක්. පොලීසිය භාර ඇමතිවරයා මේ වෙලාවේ සභාවේ ඉන්නවා. එතුමා මේ ගැන දන්නේ නැහැ වාගේ ඉන්නවා, වෙන වෙන දේවල් කථා කර කර. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මේ රටේ සිදු වුණු ගල් අඟුරු හොරකම පිළිබඳව විගණන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා; මේගොල්ලන්ගේ මේ විගණන වාර්තාව. මොකක්ද, මේකෙන් කියන්නේ? ඒක දැන් පිළිගන්නවාලු. ජනාධිපතිතුමාට ඒක පිළිගන්න සෑහෙන කල් ගියා; ගල් අඟුරු කන්නම වුණා. නැත්නම් එතුමා ඒක පිළිගන්නේ නැහැ. ගල් අඟුරු කෑවාද කියලා ඇහුවා. එතකොට, අර චීන අසූචි පොහොර නැව කාලා බලලාද අනුර කුමාර කිව්වේ ඒක අසූචි කියලා?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කෙසෙල් ගෙඩි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
කෝලිකුට්ටුවේ නැට්ට නේ, කෑවේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නැට්ට හයි කරමින් ඉන්නවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තවම නැට්ට හයි කරනවා, කෝලිකුට්ටුවේ. සල්ෆියුරික්, ග්‍රැෆයිට් තවම නිෂ්පාදනය කරනවා. විනාශ වෙලා ඉන්නේ; හොල්මන් වෙලා ඉන්නේ. ධීවරයෝ ඔක්කොම අනාථයි. ලංකාවේම ජනතාව අනාථයි. ගොවීන්ට නිෂ්පාදන කටයුතු කර ගන්න බැහැ. එක ගොවියෙක්වත් මේ වතාවේ වවන්නේ නැහැ. කීයද කිලෝ එකකට ගෙවන්නේ? මාළු app එක වෙනුවට දැන් එවනවා, විදුලිය කපන app එක. මොකක්ද, මේ කරන්නේ? බලන්න, ලංසු කැඳවලා කරපු ගල් අඟුරු හොරකම ගැන. ලංසුවේ වරදක් නැහැ, ටෙන්ඩරයේ වරදක් කියලා කිව්වා. ටෙන්ඩරයක ඉඳන්ම හොරකම. ඇමතිතුමාට මම මේවා කියන්නේ. එතුමා දන්නේ නැහැ වාගේ ඉන්නවා. මේවාට ක්‍රියාමාර්ග ගන්න. ඔබතුමා ලොරි ටෝක් දීලා පොඩි පොඩි හාල්මැස්සෝ අල්ලන එක නොවෙයි, මේ ටෙන්ඩර් හොරකම අල්ලන එකයි කරන්න ඕනෑ. බලන්න, සමාගම් තුනක් ලියාපදිංචි කරලා නැහැ. ලියාපදිංචි නොකරපු සමාගම් තුනෙන් එකක් තමයි, Trident Champher කියන්නේ. මේ විගණන වාර්තාවේ තමයි එහෙම කියන්නේ.

ඊළඟට, පැටවුම් වරායේදී සාම්පල පරීක්ෂා කළ Mitra SK South Africa (Pty) Limited එකත් ඒ සඳහා ප්‍රතීතතාවක් නැති සමාගමක්. ඒ සමාගමට බැරි හින්දා ඊට පස්සේ ඒක දෙනවා, PT Mitra S K Analisa Testama Samarinda කියන තවත් හොර සමාගමකට. ඒකටත් බැහැ. ඒකත් ප්‍රතික්ෂේප වුණු සමාගමක්. එතැනම තිබෙනවා නේ, හොරකම. සාම්පල පරීක්ෂා කරන්න දෙන්නේත් හොරෙකුට. ඒකට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

සම්බන්ධයි, අනික් කුමාරත් සම්බන්ධයි. දෙදෙනාම කුමාරලා. දෙදෙනාම ඒකට සම්බන්ධයි. එකට ගහලා තිබෙන්නේ. එකට කථා කරගෙන, ලියාපදිංචිය නැති කලින් ගෙන්වපු නැති සමාගමකට දීලා තිබෙන්නේ. ඒක බෙහෙත් ගෙන්වපු සමාගමක්; කිසිම ඉතිහාසයක් නැහැ; blacklist කරපු සමාගමක්. ඒකට තමයි දීලා තිබෙන්නේ. ඒකේ සාම්පල පරීක්ෂා කරපු සමාගමත් හොර සමාගමක්. ඊට පස්සේ, ඒ පරීක්ෂා කිරීම කරන්න තව සමාගමක් පත් කළා. ඒකත් හොර සමාගමක්. *[බාධා කිරීමක්]* ජනාධිපති නොවෙයි, විගණකාධිපති තමයි එහෙම කියන්නේ. ජනාධිපති එහෙම කිව්වේ නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේක ආරක්ෂා කරන්න try කළා, මුල ඉඳන්ම බොරු කිය කියා. අන්තිමට ගල් අඟුරු කිලෝ එකක් විතර කාලා තමයි කිව්වේ, මේක හොඳ නැහැ කියලා. එතෙක් දත් මැද මැද හිටියේ ගල් අඟුරුවලින්, කෑවේ නැහැ. ඊට පස්සේ මොකක්ද කියන්නේ? ඒ

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

හොර සමාගමත් කියනවා, ඒ නැව් 12ම තිබුණේ බාල ගල් අඟුරු කියලා. Mitra SK South Africa (Pty) Limited කියන සමාගමත් කියනවා, බාල ගල් අඟුරු කියලා. PT Mitra S K Analisa Testama Samarinda කියන සමාගමත් කියනවා, බාල ගල් අඟුරු කියලා; ඒ හොර සමාගමත් කියනවා, ගල් අඟුරු බාලයි කියලා. *[බාධා කිරීමක්]* කුමාරවරුන්ගේ හොරකම. බිලියන 40කට වැඩියි මේ හොරකම. අනුර කුමාර මහත්මයා කියනවා, නැවකට ඩොලර් මිලියන 6ක් ගෙවන්න ඕනෑ කියලා. ඩොලර් මිලියන 2කට ගන්න පුළුවන් මේ වාගේ හොර ගල් අඟුරු. ඉන්දියාවේ එහෙම තිබෙනවා, බාල ගල් අඟුරුවලින් විදුලිය නිෂ්පාදනය කරන බලාගාර. මේ ගැන ඔබතුමන්ලා කථා කරන්න. මම දන්නවා, මාලිමාවේ හොඳ අය ඉන්න බව. ඔවුන් මේ හොරකමට කැමති නැහැ. ගිහිල්ලා කියන්න, මේ ඇමතිවරුන්ට. හාල්මැස්සෝ ඉස්සරහට දමමින්; මේ නිලධාරින් පොඩි පොඩි එවුන් දමමින්, බොරුවට වාර්තාගත කරන්න, බොරුවට ප්‍රවෘත්තිවලට දෙන්න හදනවා. ලංකාවේ දැනුමක් නැති පිරිසකුත් ඉන්නවා. මිනිසුන්ගේ තරහ අවුස්සලා, අනෙකාට වරද්දන්න කියලා සියයට දෙකකට, තුනකට ෆන් එකක් දෙන්න කරන වැඩ නවත්වා මේවා කරන්න.

ඊළඟට මෙන්න මේ කාරණය බලන්න. මේක පරස්පර විරෝධියි. අපි 2025 නොවැම්බර් 13 සිට දෙසැම්බර් 30 දක්වා කාලය ගනිමු. 25වැනි දා නැව ආවාට පස්සේ දවස් 40ක් ගල් අඟුරු ගෙන්වන්න කිසිම දෙයක් කළේ නැහැ. ඒක තමයි අපට මේ වැරදිලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය මේවා දැන ගන්න. ලෝකයේ වෙනත් රටවල මේ ප්‍රශ්නය නැහැ. ලංකාවට විතරයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. ඉන්දියාවේ විදුලි බිල වැඩි වෙලා නැහැ. පාකිස්තානය බංකොලොත් රටක්. නමුත්, පාකිස්තානයේත් විදුලි බිල වැඩි කරලා නැහැ. පාකිස්තානයේ සියයට 25ක් විතර සූර්ය බලයෙන් විදුලිය නිපදවා තිබෙනවා. නමුත්, පාකිස්තානය සූර්ය බලයෙන් විදුලිය නිපදවන එක නැවැත්වූවා. සූර්ය බලයෙන් විදුලිය නිපදවන ප්‍රතිශතය දැන් හොඳටම අඩු වෙලා. දැන් සූර්ය බලයෙන් විදුලිය නිෂ්පාදනය වෙන්නේ නැහැ. ඔබතුමන්ලා දන්නවා, solar power, wind power, hydropower වලට මාස 3කින් ගෙවලා නැහැ කියන එක. දැන් විශාල අනතුරකට මේ රට වැටෙන්න යන්නේ. මාස 3ක් ඒ සමාගම්වලට මුදල් ගෙවලා නැහැ. විශාල මුදලක් එකතු වෙලා තිබෙනවා, ඒ සමාගම්වලට ගෙවන්න. ගල් අඟුරු වංචාව නිසා ලංකාවේ බලශක්තියට සියයට 50කට වැඩිය පාඩුවක් වෙනවා. නැව් 7ක් ගෙන්වන්න හම්බ වෙන්නේ නැහැ. ගෙන්වන ගල් අඟුරු ප්‍රමාණයෙන් සියයට 70යි නිෂ්පාදනය කරන්න පුළුවන්. එතකොට හැමදාම සියයට 30ක shortfall එකක් එනවා. ඒ shortfall එකතු වෙලා, එකතු වෙලා ඇවිල්ලා අන්තිමට නැව් 7කුත් ගෙනෙන්න බැරි වෙනවා. අප්‍රේල් මාසය වනකොට ඒ නැව් 7 ගෙනෙන්න බැහැ. මේගොල්ලන් ඒ දවස් 40 ඇතුළත ගල් අඟුරු ගෙන්නුවේ නැහැ. එතැනින් මුළු ක්‍රියාවලියම කඩාගෙන වැටුණා. ඊට පස්සේ ගෙනාපු ගල් අඟුරු ප්‍රසම්පාදනයෙන් ආපසු හොරකම් කළා. ඒ ඇමතිවරයා දිගින් දිගටම කිව්වා, මේක අප්‍රේල් මාසයේ දාන්න කියලා. වාරකන් නැති කාලයේ ගෙන්වන්න ඕනෑය කිව්වා. නමුත්, ඒක කළේ නැහැ.

ඊට පස්සේ මොකක්ද කියන්නේ? ක්ෂණික ප්‍රසම්පාදනයක් දෙනවා, Taranjot Resources (Pvt.) Limited කියන සමාගමට. ඒකත් හොර සමාගමක්. ඒ සමාගමත් ප්‍රමිතිගත දළ තාප අගය 5,900 kcal/kgට ඉහළ ගල් අඟුරු කවදාවත් ගෙන්වලා නැහැ. දිගටම හොරෙන් කටයුතු කරන්නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ රට දිගටම ඇද වැටෙමින් පවතිනවා. *[බාධා කිරීමක්]* World Happiness Index එකේ තොරතුරු ඇතුළත් ලේඛනය මා ළඟ තිබෙනවා. ජනාධිපතිතුමාට තමයි දැන් කියවන්න කොළ නැත්තේ. World Happiness Index එකේ මොකක්ද තිබෙන්නේ? අපි 134වැනි තැන ඉන්නේ. ඒ කියන්නේ, අපි ඉන්නේ World Happiness Index එකේ පහළම තැනක. මේක තමයි ඔබතුමන්ලාගේ කෙරුවාව.

අපේ සභානායකතුමාගේ නෝනා හිනා වෙනවා. නමුත්, හිනා වෙන්න නොවෙයි දැන් තිබෙන්නේ. ඔබතුමියලා කරපු මේ විනාශය බලන්න. දැන් හිනා වෙන්න පුළුවන්; සශ්‍රීකයි. මහත් වෙලා තිබෙනවා. ඒ වුණාට අපේ රටේ මිනිස්සුන්ට හිනා වෙන්න බැහැ. ඔබතුමන්ලා ලස්සන වෙලා, ඔක්කෝම දේවල් වෙලා. ඇමතිවරු ටික දැන් පිඹුරෝ වාගේ ඉන්නේ. හිටියේ නම් හාල්මැස්සෝ වාගේ. ඔබතුමන්ලා නම් දැන් දියුණු වෙලා. ඔබතුමන්ලා කිව්වේ, "දියුණු රටක්, සශ්‍රීක රටක්" කියායි. සමහර ඇමතිවරු, මන්ත්‍රීවරු අවුරුද්දකට කලින් හිටිය විධිය දැක්කාම හඳුනා ගන්නත් බැහැ. හැබැයි, අපට ඔබතුමන්ලා ගැන සන්තෝෂයි. මොකද, අපි ඊර්ෂ්‍යා කරන්නේ නැහැ. ඔයගොල්ලන් ලස්සනට ඉන්නවාට අපි කැමතියි. ගරු මන්ත්‍රීතුමියනි, හැබැයි රටේ මිනිස්සුත් ලස්සන වෙන්න ඕනෑ කියන එකයි අපි කියන්නේ. මේක විශාල විනාශයක්. World Happiness Index එකේ දත්ත ඔබතුමිය බලන්න. ඔබතුමියට ඕනෑ නම් මම ඒ තොරතුරු එවන්නම්. අපි 2022 අවුරුද්දේ එහි 112වැනි ස්ථානයේ හිටියේ.

ඒ වාගේම ඔබතුමියලා දැන් ලොකුවට මේ corruption ගැන කථා කරනවා. Corruption Perceptions Index එක අරගෙන බලන්න, ගරු මන්ත්‍රීතුමියනි. Corruption Perceptions Index එකේ 107වැනි ස්ථානයේ අපි ඉන්නේ. කලින් අපි හිටියේ කී වැනි ස්ථානයේද? *[බාධා කිරීම්]* අහගන්න. 2014 අවුරුද්දේ අපි හිටියේ 85වැනි ස්ථානයේ. මම කියන දේ ඇහෙනවාද? මගේ යාළුවා, කොහොමද? *[බාධා කිරීම්]* Corruption Perceptions Index එක අඩු වෙන්න, අඩු වෙන්න හොඳයි. Corruption Perceptions Index එක වැඩි වෙන්න, වැඩි වෙන්න හොඳ නැහැ. ඒකවත් තේරෙන්නේ නැති

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීම්]* 140වැනි ස්ථානයේ ඉන්නවා කියන්නේ ඒක හොඳ නැහැ. *[බාධා කිරීම්]* 1වැනි ස්ථානයේ ඉන්නවා කියන්නේ හොඳයි. *[බාධා කිරීම්]* ලංකාවේ නියම බඩු ටික පත් කළේ. මම එක කාරණයක් කියන්නම්. ජනාධිපතිතුමා එක ඇත්තක් කිව්වා. ඒ සම්බන්ධයෙන් අනුර කුමාර මහත්තයාට මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මේ රටේ දැනුමක් නැති මිනිස්සුන්ට අපි කියන්නේ ආපසු ජනාධිපතිවරයෙක් පත් කරනකොට ටොන් පවයෙක් මේ රටේ ජනාධිපති වශයෙන් පත් කරන්න එපා කියන එකයි. තාත්තාට ගල් අඟුරු ආකරයක් තිබෙන, ආච්චිට තෙල් නිධියක් තිබෙන, බෙහෙත් ගෙන්වන සීයා කෙනෙක් ඉන්න මනුෂ්‍යයෙක් ජනාධිපති වශයෙන් පත් කරන්න එතුමා කියන විධියට. ගරු කථානායකතුමනි, ඔබතුමන්ලාගේ දැනගැනීම සඳහා Corruption Perceptions Index එක ගැන මම පොඩ්ඩක් කියවන්නම්. ඒ අනුව, 2013දී 91; 2014දී 85; 2015දී 83; 2016දී 95; 2017දී 91; 2018දී 89 ආදී ස්ථානවල අපේ රට තිබුණා. දැන් 107වැනි ස්ථානයේ අපි ඉන්නේ. මගේ මිත්‍ර නීතිඥතුමා, 107වැනි ස්ථානයේ අපි ඉන්නේ Corruption Perceptions Index එකේ. *[බාධා කිරීම්]* මොකක්ද ඔබතුමා කියන්නේ? *[බාධා කිරීම්]* 2023 අවුරුද්දේද? 2023 අවුරුද්ද වනකොට හිටියේ රාජපක්ෂලාගේ කට්ටිය නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හිටියේ රාජපක්ෂගේ ඔඩොක්කුවේ නේ. *[බාධා කිරීම්]* 2023දී

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හිටියේ රාජපක්ෂගේ ඔඩොක්කුවේ නේ. ඒ ගැන ඔබතුමා කථා කරන්න එපා. ඒක තමයි ලංකාවේ මිනිස්සු බංකොලොත් කරපු රටට මොකක් හරි කරන්න කියලා ඡන්දය දුන්නේ. එහෙම නැතුව Corruption Perceptions Index එකේ 107වැනි ස්ථානයට අපේ රට ගෙනෙන්න නොවෙයි. මේක ගෙනෙන්න ඕනෑ, 80වැනි, 85වැනි ස්ථානයට. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, අපේ රට විශාල විනාශයක් කරා යන්නේ. බලන්න, ඉදිරියේදී මොකද වෙන්නේ කියලා. දැන් හෝමුස් සමුද්‍ර සන්ධිය විවෘත කළා නේ. අප්‍රේල් වෙනකම් පෙට්‍රල් තිබුණා නේ. එහෙනම් දැන් පෙට්‍රල් මිල අඩු කරන්න කෝ. අප්‍රේල් වෙනකම් පෙට්‍රල් තිබුණා නම්, ඩීසල් තිබුණා නම් ඒ මිලටම දෙන්න තිබුණා. මොකද, හෝමුස් සමුද්‍ර සන්ධිය අද විවෘත කළා. තව සුමාන දෙකකට පසුව තෙල් ගත්තාට පසුව මිල සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ. ගරු කථානායකතුමනි, විශාල අර්බුදයක් ඇති වනවා, මේ හොරකම නිසා. සියයට 50කට වැඩි විදුලි අර්බුදයක් එනවා, ඉදිරි අනාගතයේදී අපේ රටට. මේ යුදමය තත්ත්වය නිසා කිසිම රටක විදුලි බිල වැඩි කළේ නැහැ. නමුත්, අපේ රටේ විදුලි බිල වැඩි කරලා, ජනතාවගේ බෙල්ල මිරිකලා. අපේ ගොවීන්ට ඊළඟ කන්නයේ වගා කරන්න බැහැ. රුපියල් 65ට, 70ට වී කිලෝවක් ගොවීන්ට නිෂ්පාදනය කරන්න බැහැ. ගරු කථානායකතුමනි, ඒ අය කථා කරලා කියනවා, වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 120ක්, 130ක් වැය වෙනවා, ඒ නිසා බෙල්ල වැල ලා ගන්න තමයි වෙන්නේ කියලා. වතුර නැහැ. ඒ වාගේම "දිට්වා" ව්‍යසනයට ලක් වූවන්ට ශත පහක් දුන්නේ නැහැ. හොර වැඩ කරන්නේ. මුළු රටේම ජනතාව අන්දනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා විශාල අවදානමකට අපේ රටේ ජනතාවට මුහුණ පාන්න සිදු වනවා. මේ කටයුතු හරියට කළමනාකරණය කරන්න එතුමන්ලාට හැකියාව නැති නිසා තව මාසයක් දෙකක් ගත වනකොට අනිවාර්යයෙන්ම මේ රට බංකොලොත් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Wasantha Piyathissa. You have 11 minutes.

[පූ.භා. 10.55]

**ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, අද දවසේ සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක්. මොකද, ඉතිහාසයට එක් වන මෙම අවස්ථාව මුළු රටේම ජනතාවට යම්කිසි පීඩාවක්, යම්කිසි අර්බුදයක් නිර්මාණය වුණු අවස්ථාවක්. එවැනි අවස්ථාවක ආණ්ඩුවක් විධියට, රජයක් විධියට කටයුතු කළ යුත්තේ කෙසේද, කටයුතු කරලා තිබෙන්නේ කොහොමද කියන එක පිළිබඳව මේ අවස්ථාවේදී සාකච්ඡා වෙනවා.

අපි දන්නවා, මේ වෙලාවේ ලෝකයේ මතු වී තිබෙන යුදමය තත්ත්වය නිසා බලශක්තියට ප්‍රශ්නයක් වෙලා තිබෙන බව. ලෝකය පුරාම බලශක්ති අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඛනිජ තෙල් වර්ග, ගෑස් වාගේම ගල් අඟුරු ආනයනය කරන රටක් විධියට අනිවාර්යයෙන්ම අපේ රටටත් මේ අර්බුදයට මුහුණපාන්න සිද්ධ වෙනවා. ඒ අනුව ඩීසල්වල මිල වැඩි වුණා. පෙට්‍රල්වල මිල වැඩි වුණා. ගෑස්වල මිල වැඩි වුණා. වැඩි ප්‍රමාණයක් විදුලිය නිෂ්පාදනය කරන්නේ ගල්අඟුරු සහ ඉන්ධනවලින් නිසාම විදුලි බිලටත් යම්කිසි බලපෑමක් සිද්ධ වෙලා තිබෙනවා. ප්‍රවාහන ගාස්තු යම් ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. එම නිසා භාණ්ඩ හා සේවා මිල යම් ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. මෙවැනි වෙලාවකදී රජයක් විධියට, ආණ්ඩුවක් විධියට අපි ජනතාවට සහන ලබා දිය යුතුව තිබෙනවා. ඒ සහන ලබා දුන් ආකාරය තමයි ඊයේ දවසේදී ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේදී රටට ඉදිරිපත් කළේ.

අපි විශ්වාස කරනවා, මේ රටේ ජනතාව අපට බලය දුන්නේ අවුරුදු 76ක් තිස්සේ ආපු ඒ සමාජ, ආර්ථික, දේශපාලන ගමන තවදුරටත් මේ රටට ගැළපෙන්නේ නැති නිසා කියලා. හොරකම, වංචාව, දූෂණය, නාස්තිය, බඩගෝස්තරවාදී දේශපාලනය, පවුල්වාදය මත පදනම් වෙච්ච ඒ දූෂිත පාලනය එළවා දැමීම සඳහා තමයි ජනතාව එවැනි ආකාරයෙන් ඡන්දය පාවිච්චි කරලා මෙවැනි ආණ්ඩුවක් බලයට පත් කළේ. විපක්ෂයේ උගත්, බුද්ධිමත් යැයි කියා ගන්නා වූ මේ මහත්වරුන්ට තමන්ගේ 76 වසරක පාලනය අමතක වෙලා තිබෙනවා. ඒ 76 වසරක පාලන කාලය තුළ පසුගිය ආර්ථික අර්බුදය නිර්මාණය වෙච්ච වෙලාවේ තමුන්නාන්සේලා ඒකට හේතු දැක්වූවේ කොහොමද කියලා අපි දැක්කා. එදා තෙල් මිල වැඩි වුණේ ඇයි, ගෑස් මිල වැඩි වුණේ ඇයි, දවසට පැය 14ක් විදුලිය කැපුවේ ඇයි කියලා අපි තමුන්නාන්සේලාගෙන් අහනවා. එහෙම කළේ ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වෙලාද, ලෝක යුද්ධයක් ඇති වෙලාද? නැහැ, තමුන්නාන්සේලාගේ හපන්කම නිසා. ඒ තමයි, උගත්, බුද්ධිමත් මහත්වරු මේ රටේ ආර්ථිකය කළමනාකරණය කරපු ආකාරය. ඒ නිසා මේ රටේ ජනතාව අතිවිශාල පීඩාවකට පත් වුණා, දුෂ්කරතාවකට පත් වුණා. කිලෝමීටර ගණන් දුර පෝලිම්වල සති ගණන් හිටියා. තමුන්නාන්සේලාගේ ආකර්යක්ෂමතාව, දූෂිත පාලනයේ ස්වභාවය, බඩගෝස්තරවාදී දේශපාලනයේ ස්වභාවය නිසා තමයි එහෙම සිද්ධ වුණේ. එදා තෙල් තිබුණාට තමුන්නාන්සේලාට ඩොලර් තිබුණේ නැහැ. අද ඩොලර් තිබෙනවා, තෙල් නැහැ. ඒ නිසා මේ ආණ්ඩුව කිසිසේත්ම වගකියන්න අවශ්‍ය වෙන්නේ නැහැ, මේ ආර්ථික අර්බුදය ලංකාව තුළ ඇති වීම සම්බන්ධව. එහෙම නැත්නම් තෙල් මිල, ගෑස් මිල, විදුලි මිල, භාණ්ඩ හා සේවාවල මිල වැඩිවීම සම්බන්ධව අපි කිසිසේත්ම වගකිව යුතු නැහැ.

මහ බැංකුව, IMF එක සහ ලෝක බැංකුව කියනවා, ඉතිහාසයේ ප්‍රථම වතාවට ඉතා වේගවත් ආර්ථික සංවර්ධනයක් ලංකාව අත්පත්කරගෙන තිබෙනවා කියලා. හොරකම නවත්වලා තිබෙනවා. වංචාව, දූෂණය නවත්වලා තිබෙනවා. නාස්තිකාර වියදම් සියල්ලම නවත්වලා තිබෙනවා. අපේ ආණ්ඩුව බලයට ඇවිල්ලා තවම ගතවෙලා තිබෙන්නේ, අවුරුද්දයි මාස තුනක් පමණයි ගරු කථානායකතුමනි. අපි ඒ අවුරුද්දයි මාස තුනට කොච්චර මුදලක් භාණ්ඩාගාරයේ ඉතුරු කළාද? ට්‍රිලියන 1.2ක් ඉතුරු කරලා තිබෙනවා. අන්න ඒ ඉතුරු කරපු මුදලින් ට්‍රිලියන 0.5ක් අරගෙන තමයි "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වෙච්ච ජනතාවට ඉතිහාසයේ කවදාවත් නැති තරම් විශාල සේවාවක් ඉෂ්ට කළේ; ඔවුන්ට සහන ප්‍රමාණයක් ලබාදෙමින් ඉන්නේ. මුදල් අච්චු ගැහුවේ නැහැ, ණයට ගත්තේ නැහැ, රටේ දේපොළ විකුණුවේ නැහැ. ඒ ආර්ථික ක්‍රියාවලියෙන් ජනාධිපතිතුමා ඇතුළු මේ ආණ්ඩුව ඉතා ඉහළින් සමත් වෙලා තිබෙනවා. ඒ නිසා කිසිවක් කරකියා ගන්න බැරි, ඉතිහාසයේදී සියලු සැප සම්පත් ලබාගෙන හිටපු, හොරකම්, වංචා දූෂණ සියල්ලක්ම කරපු, කිසිදාක කඩා වැටෙයි, පරදියි කියලා හිතපු නැති මහත්වරුන්ට දැන් හිරේ විලංගුවේ වැටෙන්න වෙලා තිබෙනවා. හිටපු මැති ඇමතිවරු ගණනාවක් අද හිර බත්කමින් ඉන්නවා. තවත් විශාල පිරිසකට වංචා දූෂණවලට අදාළ විමර්ශන කටයුතු සිද්ධ වෙමින් පවතිනවා. ඒ නිසා අපි මේ රටේ ජනතාවට

[ගරු වසන්ත පියතිස්ස මහතා]

කියනවා, මේ යන ගමන් මඟ ඉතාම නිවැරදියි කියලා. හොරකම නැති, වංචාව දූෂණය නැති, වරප්‍රසාද හා දීමනා කප්පාදු කරගත් පාලක පන්තියක්, දේශපාලන අධිකාරියක් විධියට අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ දෙය ජනතාව තේරුම් ගනීවි කියලා අපි විශ්වාස කරනවා.

දැන් විපක්ෂයට හරි වුවමනාවක් තිබෙනවා මේ රට ඉක්මනින් සංවර්ධනය කරන්න. විපතක් වුණාම වේගවත් සංවර්ධනයක් කරන්න හරි වුවමනාවක් තිබෙනවා; වේගයෙන් සහන දෙන්න හරි වුවමනාවක් තිබෙනවා. වසර 76ක් කියන්නේ පරම්පරා දෙකක්. එච්චර කාලයක් තිස්සේ මේ රට ගොඩ නඟන්න, ජන ජීවිත උසස් තැනකට ගෙනෙන්න ඒ පාලකයින් අසමත් වුණා. හැබැයි, අවුරුද්දයි මාස තුනක් ඇතුළතදී මේ රට ආපු සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතිකමය ගමන් මඟ අපි නිවැරදි දිශාවට හරවා තිබෙනවා. ඒක ඈත එපිට ගම්මානවල ඉන්න ගොවි අම්මා, තාත්තා දන්නවා; ඒ දුප්පත් අම්මා තාත්තා දන්නවා; රාජ්‍ය සේවකයින් දන්නවා. අපේ පළමුවෙනි අය වැයෙන්ම රුපියල් කෝටි එකොළොස්දහසක මුදලක් වෙන් කරලා රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩි කිරීමක් කළා. දෙවැනි අය වැයෙනුත් තවත් රුපියල් කෝටි එකොළොස්දහසක් වෙන් කරලා රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කළා.

රාජ්‍ය සේවයට බඳවා ගැනීම් තමුන්නාන්සේලා නවත්වලායි තිබුණේ. මේ වසරේ විතරක් 73,000ක් රාජ්‍ය සේවයට බඳවා ගන්න අපට කැබිනට් අනුමැතිය ලැබී තිබෙනවා. හැම තැනම පුරප්පාඩු. ඇයි ඒ? බඳවා ගැනීම් සිද්ධ කළේ නැති නිසා. ගුරු පුරප්පාඩු විතරක් අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒකෙන් 23,000ක් මේ වසරේ බඳවා ගන්නවා. සල්ලි නේද මේවා? මේ සඳහාත් අපි විශාල මුදලක් වර්ෂයකට වැය කළ යුතුයි. මේ රට ඉදිරියට ගමන් කරමින් තිබෙන බව හරි පැහැදිලියි. රාජ්‍ය සේවය බිඳ වට්ටලායි තිබුණේ. රාජ්‍ය ආයතනවල, ඒ කාර්යාලවල ප්‍රධාන නිලධාරි මහත්ම මහත්මීන්ට ගමන් කරන්න වාහන පවා නැහැ. පාර සුද්ද කරන්න, කුණු ටික ඇදගන්න පළාත් පාලන ආයතනවල යන්ත්‍ර සූත්‍ර නැහැ. ඒ අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා අනෙකුත් රථ වාහන - නිල රථ- ජපානයෙන් ආනයනය කරන්න පසුගිය අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. රාජ්‍ය සේවය ශක්තිමත් කරන්නත් ඒ විධියට මැදිහත් වෙමින් ඉන්න අතරතුර තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. මේක රජයක් විධියට අපි කිසිසේත්ම වගකිව යුතු ප්‍රශ්නයක් නොවෙයි.

විපක්ෂයේ අය කියනවා, මෙවැනි ප්‍රශ්නයක් එන බව දැනගත්තා නම් කලින් තෙල් ගෙනැල්ලා තියාගන්න තිබුණා කියලා. තෙල් ගෙනැවිත් තියා ගන්නේ කොහේද? සුජීව සේනසිංහ මහත්තයාගේ ගෙදර තමයි පෙට්‍රල්, ඩීසල් පුරවන්න වෙලා තිබෙන්නේ. එහෙම නැත්නම් සජිත් ප්‍රේමදාස මහත්තයාගේ ගෙදරද බොර තෙල්, ඩීසල්, ගල් අඟුරු ගෙනැල්ලා තියා ගන්නේ? අවුරුදු 76ක් තමුන්නාන්සේලා බලයේ හිටියා. මාසයකට, මාස දෙකකට, මාස තුනකට, මාස හයකට තෙල් ගබඩා කරන්න තැනක් හදපු නැති පාලකයෝ තමයි මෙහෙම කියන්නේ. අපි බලයට ඇවිල්ලා පළමුවෙනි මාසයේ ඉඳලාම අන්න, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ප්‍රතිසංස්කරණය කරනවා. එවැනි දැක්මක් සහිතව අපි කටයුතු කරනවා. ඒ වාගේම මුතුරාජවෙල සිට කටුනායක දක්වා නව නළ මාර්ගයක් සහ තෙල් ගබඩා සංකීර්ණයක් ඉදි කිරීම ආරම්භ කර තිබෙනවා, අනාගතයේ ඇති විය හැකි මෙවැනි අර්බුදවලට මුහුණ දීම සඳහා. එවැනි ගමන් මඟක යන අතරතුර ඈත එපිට දුෂ්කර ගම්මානවල ඉන්න අම්මලාට තාත්තලාට, රාජ්‍ය සේවකයන්ට, ධීවරයන්ට, වතු ජනතාවට -ඒ හැමෝටම- සහන ලබා දීම අපේ යුතුකමක් නිසා තමයි ඉතිරි වෙලා තිබුණු රුපියල් ට්‍රිලියන දශම හතෙන් තවත් රුපියල් ට්‍රිලියන දශම එකක් - රුපියල් කෝටි දසදහසක් - ඊයේ වෙන් කළේ. එවැනි මැදිහත්වීමක් කරමින් අපි ජනතාවට සහන දෙනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. "අස්වැසුම" ප්‍රතිලාභී කණ්ඩායම නිවැරදි නැහැ කියලා අපි දන්නවා. එහි අඩුපාඩුකම් තිබෙනවා. එය නිවැරදි කළ යුතුයි. 1,750,000ක් වූ පවුල් ප්‍රමාණයකට අපි දැනට එම මුදල ලබා දෙමින් ඉන්නවා. ඒ තුළ නුසුදුසුකම් තිබෙන අය ලක්ෂයක්, එකහමාරක් හෝ දෙකක් ඉන්න බව අපි දන්නවා. අවස්ථා කිහිපයක නිවැරදි කිරීම් කළත් තවම එය සම්පූර්ණ වෙලා නැහැ. නමුත්, රජයේ අපේක්ෂාව වන්නේ, නුසුදුස්සා ඉවත් කරමින් එය ලැබිය යුත්තාට ලැබෙන්න සලස්වමින්, ඉතා පැහැදිලි වූ "අස්වැසුම" ප්‍රතිලාභී කණ්ඩායමක් මෙම වර්ෂය තුළදී තෝරාගෙන ඔවුන්ගේ ජීවිත උසස් කිරීමට මැදිහත් වීමයි. මීටත් වඩා සහන ලබා දීම අපේ අපේක්ෂාව බව ප්‍රකාශ කරමින්, දැනට අප ඉතා හොඳින් මේ ගැටලුව කළමනාකරණය කර තිබෙනවා කියන කාරණයත් මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The next speaker is the Hon. K. Sujith Sanjaya Perera. You have 10 minutes.

Before he starts, will an Hon. Member propose the Hon. Lakshman Nipuna Arachchi to the Chair?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

Sir, I propose that the Hon. Lakshman Nipuna Arachchi do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. LAKSHMAN NIPUNA ARACHCHI took the Chair.*

[පූ.භා. 11.07]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ වත්මන් තත්ත්වය පිළිබඳව අද දින සභාව කල් තබන අවස්ථාවේ ගෙනෙන ලද යෝජනාව පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම අපි දැක්කා, මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමා මේ රටේ ආර්ථික තත්ත්වය ගැනත්, මේ රටේ ජනතාව ගැනත් කිසිම ගැටලුවක් නැති ආකාරයට අදහස් ප්‍රකාශ කළ ආකාරයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න අවශ්‍ය වන්නේ මේකයි. ගමට ගිහිල්ලා බැලුවොත්, නගරයට ගිහිල්ලා බැලුවොත්, අද මේ රටේ ජනතාවට මුහුණ පාන්න සිදු වෙලා තිබෙන දුෂ්කරතා ගැන තමුන්නාන්සේලාට අත්දැකීමක් ලබන්න පුළුවන්කම ලැබෙයි. අපි ගම්වලට ගියාම නම් අපේ රටේ ජනතාව නොයෙකුත් ආකාරයේ මැසිවිලි නඟනවා, "අද තෙල් මිල ඉහළ ගිහින් තිබෙනවා, විදුලි බිල ඉහළ ගිහින් තිබෙනවා, අපට ජීවත් වෙන්න පුළුවන්කමක් නැහැ, දවසින් දවස බඩු මිල ඉහළ යනවා, ඒ වාගේම සිංහල අලුත් අවුරුද්දත් එනවා, ආර්ථික වශයෙන් අපි මේවාට මුහුණ දෙන්නේ කොයි ආකාරයෙන්ද?" කියා අසමින්. ඒ අනුව, අද මේ රටේ ජනතාවට ලොකු ගැටලුවක් තිබෙන බව අපි මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අපේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා, මේ තත්ත්වය සම්බන්ධව මුලින්ම අවධානය යොමු කළ නායකයෙක්. මේ ලෝක අර්බුදයේ, එහෙම නැත්නම් මේ යුද තත්ත්වයේ ආරම්භක අවස්ථාවේදී එතුමා පැහැදිලිවම තමුන්නාන්සේලාට ප්‍රකාශ කළා, මේ සඳහා කල් වේලා ඇතිව සූදානම් වෙන්න ඕනෑ කියලා; ඉන්ධන හිඟයක් එන්න පුළුවන්කම තිබෙනවා, විදුලි බිල වැඩි වීමේ අවදානමක් තිබෙනවා, ගල් අඟුරුවල ප්‍රශ්නයක් එන්න ඉඩ තිබෙනවා කියලා. කල් වේලා ඇතිව සූදානම් වෙලා රටක් හැටියට, පක්ෂ, පාට භේදයෙන් තොරව සියලුදෙනා මේ අර්බුදයට මුහුණ දෙන්න ඕනෑ කියන කාරණය සම්බන්ධව එතුමා අදහස් ඉදිරිපත් කළා. ඒ අදහස් ඉදිරිපත් කරන කොට ඔබතුමන්ලා මොනවාද කිව්වේ? ඔබතුමන්ලා යම් යම් අවස්ථාවලදී එතුමාගේ අදහස් සමච්චලයට ලක් කළා. තමුන්නාන්සේලා විපක්ෂයට කියනවා සහයෝගය ලබා දෙන්න කියලා. සහයෝගය ලබා දෙමින් එතුමා අදහස් උදහස් ඉදිරිපත් කරන කොට ඔබතුමන්ලා මොකක්ද කළේ? එතුමා පල්ලෙහාට දාන්න කටයුතු කළා. "අනේ, please! ඔබතුමාගේ උදවු අපට අවශ්‍ය නැහැ" කිව්වා. නමුත් මම ඔබතුමන්ලාට කියන්න ඕනෑ, අවසානයේදී අද තමුන්නාන්සේලාට ඉදිරිපත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ එතුමා යෝජනා කළ කාරණා ටිකම බව. එතුමා කිව්වා මේ අර්බුදය එනවා කියලා; මේ රටේ ජනතාවට සහන පැකේජයක් හඳුන්වා දෙන්න කියලා. "දිට්වා" සුළි කුණාටු ආපදා කාල සීමාවේදීත් එතුමා ඒ අදහසම ඉදිරිපත් කළා. ඒ වාගේම, ඊට පසුව ආරම්භ වුණු ලෝක යුද්ධය අවස්ථාවේදීත් කිව්වා සහන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. ඔබතුමන්ලාටත් ඒක මතක ඇති. "දිට්වා" සුළි කුණාටුව එන අවස්ථාවේදී එතුමා ආණ්ඩුවට කල් වේලා ඇතිව කිව්වා, "කාලගුණ වාර්තා අරගෙන, ජාත්‍යන්තර වශයෙන් නිකුත් කළ වාර්තා ටික අරගෙන ඔබතුමන්ලා ඒකට සූදානම් වෙන්න" කියලා. ඒ වෙලාවේත් ඔබතුමන්ලා මොකක්ද කළේ? එතුමාගේ ඒ අදහස් උදහස් ඔක්කෝම පහළට දාලා කථා කළා. එතුමා කියපු දේවල් ටිකයි මම දැන් ඔබතුමන්ලාට කිව්වේ. ඔබතුමන්ලාට මතක ඇති, ඒ සුළි කුණාටුවෙන් පස්සේ, ඒ විනාශය වුණාට පස්සේ, "දිට්වා" ආපදාව නිසා මේ රටේ ලක්ෂ 10ක් ජනතාවට ගැටලුසහගත තත්ත්වයක් ආවාට පස්සේ ජනාධිපතිතුමා ඇවිල්ලා මොනවාද කිව්වේ කියලා. එදාත් ජනාධිපතිතුමා ඇවිල්ලා කිව්වේ, "අපේ රටේ ජනතාව දැන් ව්‍යසනයට පත් වෙලා ඉන්නවා. කිසි දෙයකට බය වෙන්න එපා. අපේ රටේ ජනතාව ආරක්ෂා කරන්න අපි කටයුතු කරනවා" කියලායි. ඒ වාගේම, නිවසක තහඩුවක් ගියත් ලක්ෂ 10ක් දෙනවා, ඉඩමක් නැති වුණොත් ඉඩමට ලක්ෂ 50ක් දෙනවා, ගෙයක් හදන්න ලක්ෂ 50ක් දෙනවා වාගේ නොයෙකුත් ආකාරයේ දේවල් ද එදා තමුන්නාන්සේලා පොරොන්දු වුණු බව මතක් කර දෙන්න ඕනෑ. මම ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගෙන් අහන්න කැමැතියි, තමුන්නාන්සේලා ගමට ගිහින් අධිඅවදානම් තත්ත්වයට පත් වෙච්ච කොයි නිවාසය වෙනුවටද අලුත් නිවාසයක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙන්නේ, ඉඩමක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව පසුගිය දවස්වල වතු කම්කරුවන් ගැන මහා ලොකුවට කිඹුල් කඳුළු හෙළුවා, අපටත් නොයෙකුත් ආකාරයේ විවේචන එල්ල කරමින්. රුපියල් 200ක්, 300ක් පඩිය වැඩි කරලා නොයෙකුත් ආකාරයේ කථා කිව්වා. පැවැති ආණ්ඩු වතු කම්කරුවන් ගැන බැලුවේ නැහැ කිව්වා. ඉතින් දැන් බලන්නකෝ, වතු කම්කරුවන් ගැන. ඔබතුමන්ලා ඒ ප්‍රදේශවලට ගිහිල්ලා බලන්න. යන්න අපේ යටියන්තොට ප්‍රදේශයට, යන්න නුවරඑළියට, යන්න වැවන්ඩන් වත්තට, යන්න අනෙකුත් වතුවලට. ගිහිල්ලා බලන්න, ඒ මිනිස්සු කොච්චර නම් අසරණ වෙලාද කියලා. ඒ මිනිස්සු අන්ත අසරණ වෙලා. ඒ මිනිසුන්ට අද කූඩාරම්වල ඉන්න කියනවා. ආපදාව වෙලා දැනට මාස 4යි, තවම තමුන්නාන්සේලාට බැරි වෙලා තිබෙනවා ඒ අයට නිවාස හදලා දෙන්න. මහා ලොකුවට, වතු කම්කරුවන් නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියලා ආණ්ඩුව පැත්තේ ඉන්නවා. ඔබතුමන්ලා ගිහින් ඒ දුගී දුප්පත් ජනතාවට කථා කරන්නකෝ, ඒ අයට සාධාරණය ඉෂ්ට කරන්නකෝ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අයට කියනවාලු, පිටින් ඉඩම් දෙන්න බැහැ කියලා; ඒ අයට කියනවාලු, වත්තෙන්ම ඉඩම සොයා ගන්න කියලා. වතු අධිකාරිවරු කියනවා, වත්තේ ඉඩම් නැහැ කියලා. ගමේ මිනිහාට පිටින් ඉඩම් දෙනවා නම් වත්තේ කම්කරුවාටත් දෙන්නකෝ. තමුන්නාන්සේලාගේ සමාජ සාධාරණත්වය කොහේද තිබෙන්නේ? ඒගොල්ලන්ටත් දෙන්නකෝ ගම් පළාතකින් ඉඩමක්. ඔබතුමන්ලා ඒ ප්‍රශ්න එකක්වත් විසඳන්න කටයුතු කරලා නැහැ.

මේ තිබෙන ලෝක අර්බුදය ආවාම මොකක්ද කළේ? ඒ වෙලාවේ සජිත් ප්‍රේමදාස මහත්මයා කිව්වා මේ වාගේ අර්බුදකාරී තත්ත්වයක් එනවා, සහන පැකේජයක් හඳුන්වා දෙන්න කියලා. ඒක කියලා සුමානයක් විතර ගියාට පස්සේ තමයි ජනාධිපතිතුමා ඊයේ දුවගෙන ආවේ මේ සභාවට. ඇවිල්ලා ප්‍රකාශයක් කරලා එතුමා කියනවා, අරවා දෙනවා, මේවා දෙනවා, අරහෙම දෙනවා කියලා. අපි දන්නවා නේ එතුමාම කියලා තිබෙන දේ. එතුමාම කියලා තිබෙනවා නේ, "පාර්ලිමේන්තුවේ කියන ඒවා ගණන් ගන්න එපා" කියලා. එතුමා කියන්නේ ඒවා ගණන් ගන්න එපා කියලා. මොකද, "දිට්වා" සුළි කුණාටුව වෙලාවේ එතුමා කියපු දේවල් එකක්වත් ඉෂ්ට කරන්න කටයුතු කරලාත් නැහැ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම තමයි මේ කියපු ඒවාත්. මේවා ගැනත් අප කාටවත් විශ්වාසයක් නැහැ. එතුමා දැන් කියනවා නේ. පොහොර සහනාධාරය මෙච්චරක් දෙනවා, ධීවරයා වෙනුවෙන් මෙච්චරක් දෙනවා, තේ පොහොර සඳහා සහනයක් ලබා දෙනවා කියලා. එතුමා නොයෙකුත් ආකාරයේ දේවල් ඇතුළත් සහන පැකේජයක් හඳුන්වා දීලා තිබෙනවා. නමුත් අපට ඒවා පිළිගන්න පුළුවන්කමක් නැහැ. එතුමාගේ අනෙක් කථා වාගේම තමයි අපට හිතන්න වෙන්නේ, මේ වැඩ පිළිවෙළ ගැනත්. මේවායින් අපේ දරුවන්ට, අපේ ජනතාවට ක්ෂණික විසඳුමක් ලැබෙන්නේ නැහැ. ජනතාව බලාපොරොත්තු වෙන්නේ, ක්ෂණිකව සියලු දෙනාටම සහනයක්, කොටසකට විතරක් නොවෙයි. අස්වැසුම තිබෙන්නේ මේ රටේ ජනගහනයෙන් සියයට 20කට, 25කට වාගේ පිරිසකට විතරයි. අනෙක් ජනතාව සම්බන්ධව මොකක්ද කරන්නේ? මේ රටේ මහන්සි වෙලා වැඩ කරන මිනිස්සු, ඒ වාගේම රජයේ රැකියා කරන කොටස්, වෙළෙඳ ව්‍යාපාර කරන අය, පෞද්ගලික අංශයේ සේවය කරන අය කොයි ආකාරයෙන්ද මේකට මුහුණ දෙන්නේ?

අද තිබෙන්නේ, ලංකා ඉතිහාසයේ වැඩිම ඉන්ධන මිල. ඩීසල් ලීටරයක මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා, රුපියල් 600කට ආසන්න ගණනක් දක්වා. පෞද්ගලික ඉන්ධන සමාගම්වලින් තමයි දැන් මේ මිල වැඩි කරලා තිබෙන්නේ. ඒකෙන් අපට කියන්නේ මොකක්ද? දැන් පෙරහැරේ කසකාරයෝ ටික එනවා. ඒ කියන්නේ, ඊළඟට එන්නේ ආණ්ඩුවේ මිල වැඩිවීම. CEYPETCO එකෙන් තමයි, සිංහල අලුත් අවුරුද්දෙන් පස්සේ තෙල් මිල වැඩි කරන්න පටන් ගන්නේ. දැන් ඒවා මොකවත් ගැන කියන්නේ

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

නැහැ. දැන් නොනිල වශයෙන් විදුලිය කපන්න සූදානම් කරලා තිබෙනවා. අප දන්නේ නැති වුණාට, අපට කියලා නැති වුණාට දැන් විදුලිය කපනවා. අනිවාර්යයෙන් පැයක් හෝ පැය භාගයක් විදුලිය කපනවා. මේවා තමයි තමුන්නාන්සේලාගේ වැඩ. තමුන්නාන්සේලා බලයට එනකල් ජනතාවට එකක් කියලා, ජනතාවට සුරපුරයක් මවා පාලා, හොරට කථා කරලා, හොර වැඩම කරනවා. තමුන්නාන්සේලා මහා ලොකු මිනිස්සු නේ. ජනතාවට කියන්නකෝ, "අපට විදුලිය කපන්න සිද්ධ වෙනවා" කියලා. විදුලිය කපන්න සිද්ධ වෙලා තිබෙන්නේ යුද්ධය නිසා නොවෙයි. ඒකට යුද්ධයේ බලපෑමක් නැහැ. ඒක සිද්ධ වුණේ තනිකරම ගල් අඟුරු හොරකම නිසා. යුද්ධය පිට දමමින් යුද්ධයට ලඝු කරන්න එපා හැම එකක්ම. මේක, තමුන්නාන්සේලාගේ නොහැකියාව. තමුන්නාන්සේලාගේ නොහැකියාව වසා ගන්න හොඳ පලිහක් වෙලා තිබෙනවා, යුද්ධය. මෙතැනදී කියවන්න වෙලාවක් නැත්නම් මේ විගණකාධිපති වාර්තාව ගෙදර ගිහිල්ලා හොඳට කියවලා බලන්න. මේක අපි දීපු එකක් නොවෙයි. මේක තමුන්නාන්සේලාගේම විගණන වාර්තාව. මේකේ කියලා තිබෙනවා, පාඩුව රුපියල් කෝටි 224ක් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුද මේවා ගෙවන්නේ? ආණ්ඩුවේ ඉන්න 159දෙනාද, පැලවත්තෙන්ද? මේවා ගෙවන්නේ කවුද? මේවා ගෙවන්නේ මේ රටේ අහිංසක ජනතාව, දුක් විඳින ජනතාව. මේක, මේ කුමාරවරුන් දෙන්නා මේ රටට කරපු අපරාධය. ඒකෙන් තමයි මේ විදුලි බිල වැඩි වුණේ. වෙනත් කිසිම හේතුවක් නිසා නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකයි අප කියන්නේ, මේවා වෙනුවෙන් කථා කරන්න කියලා; මේ ඇත්ත කථා කරන්න කියලා.

මම මේ ඉල්ලා සිටින්නේ, මධ්‍යස්ථ පිරිසක්ය කියලා "මාලිමාව" නියෝජනය කරමින් ආපු මන්ත්‍රීවරුන්ගෙන්. එහෙම පිරිසක් ආවා නේ. මේ අධිකරණ ඇමතිතුමාත් එහෙම කෙනෙක් නේ. ගරු ඇමතිතුමා, ඔබතුමා පොඩ්ඩක් මධ්‍යස්ථව කල්පනා කරලා බලන්නකෝ. මේවා සම්බන්ධයෙන් බලපෑමක් කරන්න. දැන් ජනාධිපතිතුමා කියන්නේ මොකක්ද? මේ පාඩුව අපි දරා ගන්නවාලු, ආණ්ඩුව දරා ගන්නවාලු. යකෝ, ආණ්ඩුව දරා ගන්නවා කියන්නේ මොකක්ද? මිනිසුන්ටම නේ දරාගන්න වෙන්නේ; වෙන කවුරුත් නැහැ නේ. එය දරාගන්නේ තමුන්නාන්සේලා නොවෙයි නේ. තමුන්නාන්සේලා ගෙදරින් ගෙනැල්ලා දෙන්නේ නැහැ නේ. තමුන්නාන්සේලා සත පහක්වත් දෙනවාද, ජනතාවට? තමුන්නාන්සේලා කිසි කෙනෙක් ජනතාවට රුපියල් දහයක්වත් දීලා තිබෙනවාද? මළ ගෙදරකට ගියත් කරන්නේ මොකක්ද? අපි දන්නවා නේ, එහෙම කියලා බලයට ආපු මිනිසුන්ගේ දැන් තත්ත්වය මොකක්ද කියලා. දැන් ගෙවල් දොරවල් හදනවා; පින්කම් කරනවා. සමාජ ප්‍රාග්ධනයලු. බලන්න එපා යැ, ඒ බංගලා දිහා. අන්න, AC පවා දාලා තිබෙනවා. දැන් කියනවා, අරහෙන් ගත්තාලු, මෙහෙන් ගත්තාලු, අර වත්ත විකුණලා ගත්තාලු. අනෙක් මිනිස්සු ඔහොම කළොත් ඉඳලා ඉවරයි. දැන් විපක්ෂයේ දිලිත් ජයවීර මහත්මයලා එහෙම, මේ මන්ත්‍රීතුමන්ලා එහෙම ගෙයක් හැදුවොත්, වෙනත් මොකක් හරි හැදුවොත්, "අන්න, උන් හොරකම් කරලා. උන් හොරු!" කියනවා. නමුත් තමුන්නාන්සේලා ගෙවල් හැදුවොත්, තමුන්නාන්සේලාගේ දරුවන් පිට රට යැව්වොත්, ඒවා සමාජ ප්‍රාග්ධනය. අර ඇමතිවරයෙකුත් කිව්වේ, "මම කිව්වොත් එහෙම, විනාඩි දෙකෙන් රුපියල් ලක්ෂ 5,000 ගණනේ දමන්න 100ක් ඉන්නවා" කියලා කිව්වා. ඔව්, ඔබතුමන්ලාට පුළුවන්. දැන් ඉතින් බලය තිබෙනවා නේ, ඇමතිකම් තිබෙනවා නේ. ඒ ප්‍රකාශයත් බරපතළ ප්‍රකාශයක්. ඒක ඇමතිතුමාගේ බලතල පාවිච්චි කරලා ජනතාවගෙන් අල්ලස් ගන්නවා වාගේ වැඩක් නේ. ඔව් ඉතින්, සමහර මිනිස්සු නම් දෙයි. ඇමතිතුමා ලවා මොනවා හරි දෙයක් කරවා ගන්න, පොහොර ටිකක් ගෙන්වා ගන්න, කෘෂිකාර්මික ඉඩමක් ගන්න, මොනවා හරි දෙයක් කර ගන්න දෙයි. එහෙම වෙනවා දැන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හාල් ගෙන්වන්නේ නැහැ කියලා නේ කිව්වේ. ගිය අවුරුද්දේ සමරසිංහ මහත්මයා එහෙම කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමාත් දකින්න ඇති, නිවේදකයෙකු ඉදිරියේ සමරසිංහ මහත්මයා එදා කියපු දේ. එදා ඒ ඇමතිතුමා කිව්වේ මොකක්ද? ආයෙත් හාල් ගෙන්වන්නේ නැහැ කියලායි. ඒ නිවේදකයාගේ නම මොකක්ද කියලා මම දන්නේ නැහැ. "මේ කථාව record කරලා දමන්න" කිව්වා. "මම ලබන අවුරුද්දේත් මේ වෙලාවටම එනවා" කිව්වා. එදාට පුළුවන් නම් කියන්න කිව්වා, හාල් ගෙන්නුවා කියලා. හාල් ගෙන්වනවාද කියලා බලන්න කිව්වා. දිලිත් ජයවීර මන්ත්‍රීතුමනි, එහෙම කියලා වැඩි දවසක් ගියේ නැහැ. හාල් ගෙන්වන්නේ නැහැ කිව්වත්, මෙන්න සතියෙන් බඩු එනවා. කොහොමද වැඩේ! ඔක්කෝම plan කරලායි, මිනිසුන්ට එහෙම කියන්නේ. නැවත් ඇවිල්ලා ඉවරයි. ඒකයි ක්‍රමය. අර ගෑස් නැවටත් කළේ එහෙම තමයි. ලාෆ් ගෑස් සමාගමේ ගෑස් නැව ආවා, කෙළින්ම රුපියල් 1,000ක් 1,100ක් වැඩි කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔන්න ඔහොමයි මේගොල්ලන් මේ රටේ ජනතාවගෙන් ගසා කන්නේ, ලෝකයට වෙනත් දෙයක් පෙන්නලා. එහෙම කරන්න එපා, මේ රටේ ජනතාවට. ඔබතුමන්ලා බලයට ආවේ කොහොමද? මේ රටේ ජනතාව ආරක්ෂා කරනවා, දුගී දුප්පත් ජනතාව ආරක්ෂා කරනවා කියලා නේ බලයට ආවේ. ඉතින් ඇයි මෙහෙම කරන්නේ, මේ දුගී දුප්පත් ජනතාවට? තමුන්නාන්සේලාට තව වැඩි කල් යන්නේ නැතිව මේ අපරාධවලට වග කියන්න වෙනවා.

මට කාලය ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 11.17]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාදයට ගනු ලබන්නේ, පසුගිය මාස එකහමාරකට ආසන්න කාලය පුරා මැද පෙරදිග ඇති වුණු යුද්මය වාතාවරණය හමුවේ, අපේ රටේ ඇති වුණු තත්ත්වයට රජය විධියට අප මුහුණ දෙන්නේ කොහොමද කියන එක පිළිබඳවයි. විශේෂයෙන්ම මේ වාගේ අවස්ථාවකදී ජන ජීවිතයට ඇති වන බලපෑම අවම කර ගැනීම සඳහා කුමන

ආකාරයේ ක්‍රියාමාර්ග ගත යුතුද කියන කාරණය පිළිබඳව අපේ විශේෂ අවධානය යොමු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ වුණු දේවල් අපේ රටේ ජනතාවට අමතක වෙලා කියා හිතා ගෙන සමහර අය කියන දේවල් අපට ඇහෙනවා. ඒ අය මේ පවතින තත්ත්වය උපයෝගි කරගෙන ජනතාවගේ ජීවිත විහිළුවට ලක් කරන්න උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මෙහෙම ජන ජීවිත විහිළුවට ලක් කරමින් හිනා වෙවී කථා කරන මේ දෙගොල්ලන්ම එකතු වෙලා 2015 අවුරුද්දේ රටේ ආර්ථිකය භාර ගත්තා. මේ රට පාලනය කරන්න ගත්තා ඔය කට්ටිය එකතු වෙලා. 2015දී ආර්ථික වර්ධනය සියයට පහයි. 2019දී මේගොල්ලන් බැහැලා යන කොට ඒ අගය සෘණ දෙකයි. අපි 2022 අවුරුද්දේ බරපතළ ආර්ථික අර්බුදයකට මුහුණ දුන්නා. රට බංකොලොත් කියලා ප්‍රකාශයට පත් කළා. ඒකට හේතු වුණේ මොකක්ද? ඩොලර් බිලියන 38ක, 39ක ණය ගෙවා ගන්න බැරි වුණා. ඒ ණයවලින් බහුතරයක් ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර. ඩොලර් බිලියන 15ක් වටිනා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර තිබුණා. ආර්ථිකය බංකොලොත් කරපු ඒ කාලයේ තමයි ඒ ඩොලර් බිලියන 15න් ඩොලර් බිලියන 12.5ක් ගත්තේ. මේගොල්ලෝ එහෙමයි ආර්ථිකය හැදුවේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම කරලා මේ රට බංකොලොත් කරන්න පාර කපලා, මේ රටේ ජනතාවගේ ජීවිත අගාධයට ඇද දැම්මා. එහෙම කරපු අය අද ජාත්‍යන්තර වශයෙන්, ලෝක පරිමාණයෙන් ඇති වී තිබෙන මේ අර්බුදය ඉතාම මැනවින් කළමනාකරණය කරන ආණ්ඩුවක් සම්බන්ධයෙන් අද ප්‍රකාශ කරන අදහස් මොනවාද කියලා අපේ රටේ බුද්ධිමත් ජනතාව නිවැරදිව තේරුම් ගනියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ අර්බුදය කුමක්ද? මේගොල්ලන් මේ අර්බුදය ගැන කියන්න උත්සාහ කරන්නේ මොකක්ද? මේ යුද්ධය 2026 පෙබරවාරි 28වන දා ඇති වුණත්, මේගොල්ලන් කිව්වා, නැහැ මේක ජූනිවල ඇති වුණේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් පර්සියාව විධියට තිබුණු ඉරානය, 1935දී ඉරානය ලෙස නම් කළ කාලය දක්වාත් මෙවැනි තත්ත්වයක් තිබුණා තමයි. පනස් ගණන්වලත් මෙවැනි අර්බුද ඇති වුණා තමයි. 1979දී ඉස්ලාමීය විප්ලවය - Islamic Revolution - ඇති වෙනකොටත් යුද්ධ තිබුණා තමයි. එහෙම නම් මේගොල්ලන් රට පාලනය කළ කාලයේත් ඒවාට සැලසුම් හදන්න තිබුණා නේ. 1979 වසරේ ඉඳලා මේ යුද්ධ තිබුණා. ඊට පස්සේ 1980 ගණන්වලත් යුද්ධ තිබුණා. නමුත් ඒ කාලයේ අපේ රටේ බලශක්ති ස්වෛරීත්වය පිළිබඳව මොනවාද මේගොල්ලන් කරලා තිබුණේ? මාසයකට අවශ්‍ය ඉන්ධන අපේ රටේ ගබඩා කර ගන්න බැහැ. සතියකට අවශ්‍ය ගෑස් ගබඩා කර ගන්න බැහැ. එහෙම ආර්ථිකයක් තමයි මේගොල්ලන් හදලා තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි 99ක් තිබෙනවා. ඒ එකක මෙට්‍රික් ටොන් 10,000ක්, 12,000ක් ගබඩා කරන්න පුළුවන්. නමුත් ඒවා ප්‍රතිසංස්කරණය කරලා භාවිත කළේ නැහැ. සමහර තෙල් නළ අවුරුදු අනූගණනක් තිස්සේ ප්‍රතිසංස්කරණය කළේ නැහැ. ඒ විධියට මේ රට පාලනය කරලා ජනතාවගේ ජීවිතවලට අදූරදර්ශී විධියට බලපෑම් කළ කට්ටිය අද මේ විධියට කථා කරන එක ගැන මම අතිශයින් කනගාටු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් අපි ආණ්ඩුවක් විධියට ගත්ත ක්‍රියාමාර්ග මොනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෙබරවාරි 28වන දා මේ ගැටලුව ඇති වෙන කොට, ඒක දිගු කාලයක් පැවතුණොත් අපි ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද කියන එක පිළිබඳව අපි දැනගෙන හිටියා. ජනාධිපතිතුමා විශේෂයෙන්ම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා මේ තත්ත්වය සමනය කර ගෙන ජන ජීවිතවලට ඇති වෙන බලපෑම අවම කිරීම සඳහා වැඩසටහන් ගණනාවක් හැදුවා. ඒ යටතේ අපි ප්‍රධාන කමිටු හතරක් ස්ථාපනය කරලා මේ තත්ත්වය ඉතා විමසිල්ලෙන් අධ්‍යයනය කරලා මේ සඳහා ගත යුතු නිසි ක්‍රියාමාර්ග ගනිමින් පවතිනවා. අපි ඒ එක කමිටුවක් ස්ථාපනය කළා, අපේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන්.

මේ බලශක්ති අර්බුදය, ජාත්‍යන්තර මට්ටමින් ඇති වෙලා තිබෙන මේ තත්ත්වය පාලනය කරගෙන අඛණ්ඩ බලශක්ති සැපයුමක් අපේ රටේ ජනතාවට ලබා දෙන්න අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අඛණ්ඩ බලශක්ති සැපයුමක් ඇති කරගත්තේ නැත්නම් ජනතාවගේ ජීවිතයට ඒක බලපානවා. ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ යනවා, ගෑස් මිල ඉහළ යනවා. අපේ බලශක්තිය ගත්තාම, සැලකිය යුතු ප්‍රමාණයකින් - දළ වශයෙන් මෙට්‍රික් ටොන් 500කින්, 600කින් - ඩීසල්වලිනුත් විදුලි බලය උත්පාදනය කරනවා. අපට ඒ සඳහාත් තෙල් අවශ්‍යයි. අපේ ප්‍රවාහන ක්ෂේත්‍රයත් සියයට 40ක් විතර තෙල් මත තමයි රැඳිලා තිබෙන්නේ. සමස්ත තෙල්වලින් ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා අපි ඒ ප්‍රමාණය භාවිත කරනවා. අපි ඒ ක්ෂේත්‍රයත් කළමනාකරණය කරගන්න අවශ්‍යයි. ජනතාවට හරියට තෙල් ලබා දෙන්න අපට බැරි වුණොත්, අඛණ්ඩ තෙල් සැපයුමක් ඇති වුණේ නැත්නම් ඒක ජන ජීවිතයට බලපානවා. අන්න ඒ නිසා අඛණ්ඩ බලශක්ති සැපයුම තහවුරු කිරීම සඳහා නිරන්තරයෙන් මැදිහත් වෙන විශේෂ කැබිනට් මණ්ඩල අනුකමිටුවක් පත් කරලා අපි අඛණ්ඩව ජනතාවට බලශක්ති සැපයුම ලබා දෙමින් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද වෙනකොට අපි එක දිනයක්වත් විදුලිය කැපුවේ නැහැ. මෙතුමන්ලාගේ කාලයේ සමහර වෙලාවට දවසකට පැය 16ක power cut එකක් තිබුණා. අපි එහෙම නොකර, ලෝකය පුරා ඇති වෙච්ච මේ අර්බුදය හමුවේත් ජනතාවට අඛණ්ඩව බලශක්තිය ලබා දෙමින් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පෙබරවාරි 28වන දා මේ ප්‍රශ්නය ඇති වෙනකොට කලබල වෙච්ච ජනතාව - අපි ජනතාවට දොස් කියන්නේ නැහැ - ගිහිල්ලා වැඩිපුර ඉන්ධන ලබාගත්ත නිසා යම්කිසි ප්‍රශ්නයක් ඇති වුණත්, දවස් 2ක්, 3ක් ඇතුළත අපි ඒ ප්‍රශ්නය විසඳුවා. අද වෙනකොට අපි ජනතාවගේ බලශක්ති සැපයුම තහවුරු කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට අපි තවත් කමිටුවක් පත් කළා, අපේ ගරු බිමල් රත්නායක ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන්. ඒ හරහා අපි මොකක් ගැනද බැලුවේ? ජනතාවගේ අත්‍යවශ්‍ය භාණ්ඩ සහ අනෙකුත් සේවා බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යෑම සඳහා කටයුතු කරනවා. අමාත්‍යවරු, අමාත්‍යාංශ ලේකම්වරු, අදාළ රාජ්‍ය නිලධාරින්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න දැනුම තිබෙන අය එකතු කරගෙන වැඩ කරලා අත්‍යවශ්‍ය භාණ්ඩ, ආහාර, ප්‍රවාහන සේවා ඇතුළු සියල්ල ජනතාවට අඛණ්ඩව සැපයීම තුළින් ජන ජීවිතයට ඇති වන බලපෑම අවම කළා. අපි කිසිම ආකාරයකින් ඒ සේවා බිඳ වැටෙන්න දුන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජනතාවට අවශ්‍ය ආහාර ඒ විධියටම අපි සැපයුවා. ඔවුන්ට අවශ්‍ය ප්‍රවාහන සේවය කඩා වැටෙන්න දුන්නේ නැහැ. දුම්රිය වෙන්න පුළුවන්, බස් රිය වෙන්න පුළුවන්, පෞද්ගලික ප්‍රවාහන සේවය වෙන්න පුළුවන් ඒ සියල්ල හොඳින් කළමනාකරණය කරගෙන පොදු ප්‍රවාහන සේවා ඒ විධියටම ලබා දුන්නා. ජාත්‍යන්තර මට්ටමින් ඇති වෙච්ච මේ සා විශාල අර්බුදයක් වුණත්, අපි ඉතා මැනවින් ඒක කළමනාකරණය කරගෙන භාණ්ඩ සහ ප්‍රවාහනය ඇතුළු සේවා නිසි පරිදි කළමනාකරණය කරමින් ජනතාවට ඒ සේවා ලබා දුන්නා. අදටත් ලබා දෙමින් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තුන්වෙනුව අපි තවත් කමිටුවක් පත් කළා, ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන්. එහි අවශ්‍යතාව වෙලා තිබුණේ මොකක්ද? අපි රාජ්‍ය සේවය නිසි පරිදි ජනතාවට ලබා

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

දෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වාගේ අර්බුදයක් ඇති වුණාට පස්සේ ජනතාවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන්, ප්‍රාදේශීය සභාවෙන්, නගර සභාවෙන්, මහ නගර සභාවෙන් විතරක් නොවෙයි, අමාත්‍යාංශවලින් ලබා දෙන සේවාවත් අපි අඛණ්ඩව ලබා දෙන්න ඕනෑ. බලශක්ති අර්බුදය හමුවේ මේවාට යම් බලපෑම් ඇති වෙන්න පුළුවන්. අන්න ඒවා අවම කරගෙන ජනතාවට නිසි පරිදි රාජ්‍ය සේවය ලබා දීම සඳහා ඒ කමිටුව මැදිහත් වෙලා නිරන්තරයෙන් උපදෙස් ලබා ගනිමින්, අවශ්‍ය අධ්‍යයන කරමින්, අවශ්‍ය නිර්දේශ ලබා දෙමින්, තත්ත්ව පිළිබඳව විශ්ලේෂණය කරමින් කටයුතු කළා. ඒ අනුව අපි ජනතාවට ලබා දෙන රාජ්‍ය සේවය කිසිදු ආකාරයක බිඳ වැටීමකින් තොරව අඛණ්ඩව ලබා දීම සඳහා කටයුතු කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා දන්නවා, බලශක්තිය ඉතුරු කිරීම සඳහා අපි රජයේ සේවකයන්ට සතියකට එක් දිනක් පමණක් නිවාඩු ලබා දුන් බව. නමුත් අපි ඉතාම කෙටි කාලයකින් - දවස් කිහිපයයි ඒක තිබුණේ - ඒක අහෝසි කරලා සතියේ දවස් පහේම ජනතාවට අඛණ්ඩව රාජ්‍ය සේවය ලබා දෙනවා. ඒ ඔස්සේ බලශක්තිය යම් ප්‍රමාණයකින් ඉතුරු කර ගැනීම සඳහා අපි යම් යම් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. එවැනි ක්‍රියාමාර්ග ගත්තත් රාජ්‍ය සේවය, විශ්වවිද්‍යාල, පාසල් ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රය, අනෙකුත් සේවා සියල්ල එම කමිටුව නිරන්තරයෙන් අධ්‍යයනය කළා. අදටත් එම කමිටුව එම සේවා සියල්ල නිරන්තරයෙන් අධ්‍යයනය කරමින්, අවශ්‍ය නිර්දේශ ලබා දෙනවා. අපි ජනතාවට අඛණ්ඩව එම සේවය ලබා දෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට තිබෙනවා, ජනාධිපතිතුමා පත් කළ හතරවැනි කමිටුව. එම කමිටුව තමයි මේ ඇති වෙලා තිබෙන ජාත්‍යන්තර අර්බුදය හරහා මේ රටේ යම් සමාජ කණ්ඩායමකට, මේ රටේ යම් සමාජ ස්තරයක ජීවත් වන ප්‍රජාවට බලපෑමක් ඇති වනවාද කියලා බලලා, එම කණ්ඩායම් හඳුනාගෙන ඒ සඳහා මැදිහත් වෙන්නේ. මම එම කමිටුවේ සභාපතිත්වය දරනවා. මමත්, අපේ තව ගරු අමාත්‍යවරු දෙදෙනෙකුත්, ඒ වාගේම අමාත්‍යාංශ ලේකම්වරු ගණනාවකුත් එකතු වෙලා නිරන්තරයෙන් ඒ පිළිබඳව අධ්‍යයනය කළා. මම විශ්වවිද්‍යාල දෙකකට මේ පිළිබඳව අධ්‍යයනය කරන්න කියලා, ඔවුන්ගෙන් තොරතුරු ලබා ගත්තා. ඒ වාගේම බුද්ධිමතුන්ගේ දායකත්වය අරගෙන, විද්වතුන්ගේ දායකත්වය අරගෙන, රාජ්‍ය නිලධාරින්ගේ දායකත්වය අරගෙන අපි නිරන්තරයෙන් ඒ පිළිබඳව අධ්‍යයනය කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර වෙලාවට වෙලාවක් අවේලාවක් නොබලා, නිදිවරාගෙන අපි කටයුතු කළා. අපේ රාජ්‍ය නිලධාරින්, එම කමිටුවල නිලධාරින් සියලුදෙනා මැදිහත් වෙලා මේ අර්බුදය කළමනාකරණය කර ගැනීම සඳහා තත්ත්වය හොඳින් අධ්‍යයනය කළා. ඒ අධ්‍යයනය හරහා, විවිධ සමාජ ස්තරවලට මොන වාගේ බලපෑමක් ඇති වෙන්න පුළුවන්ද කියන එක පිළිබඳව අපි හොඳින් තේරුම් අරගෙන, පළමුවෙන්ම මැදිහත් විය යුතු කණ්ඩායම් ගණනාවක් අප හඳුනා ගත්තා. ඒ කණ්ඩායම්වලට තමයි ගරු ජනාධිපතිතුමා ඊයේ ඒ සහන පැකේජය ඉදිරිපත් කළේ. ඒ අධ්‍යයනය ඔස්සේ අපි හඳුනා ගත් කණ්ඩායම් ගණනාවක් තිබුණා. අන්න ඒ සමහර අයට ඉන්ධන ලබා ගැනීමේ ප්‍රශ්නයක් තිබුණා. අපි ඒ ප්‍රශ්නය QR code ක්‍රමය යටතේ ඉතා කෙටි කාලයකදී විසඳුවා. සමහර අයට QR code එක ලබා ගන්න බැරි වුණා. යම් යම් යාන්ත්‍රික කුඩා මෝටර් රථ පාවිච්චි කරන අයට වෙන්න පුළුවන්, ආබාධ සහිත පුද්ගලයන් පාවිච්චි කරන ලියාපදිංචිය නැති රථ වෙන්න පුළුවන්, තණකොළ කපන මැෂිමක් වාගේ කුඩා යන්ත්‍රයක් ක්‍රියාත්මක කරන ව්‍යවසායකයෙක් වෙන්න පුළුවන්, ඒ සියලු අයට ඉන්ධන ලබා දීමේ ක්‍රමවේදයක් ප්‍රාදේශීය ලේකම්වරු හරහා ඒ අදාළ නිලධාරින්ගේ මැදිහත් වීම හරහා අපි ලබා දුන්නා. දෙවනුව, අපි ඒ අයට ඒ විධියට ඉන්ධන ලබා දුන්නා.

ඊළඟට, ආර්ථික අර්බුදයක් ඇති වුණොත් ජාත්‍යන්තරව ඇති වන තත්ත්වය හරහා ජන ජීවිතයට ඇති වන තත්ත්වය සලකා බලා තමයි දැන් මේ රුපියල් බිලියන 100ක සහන ජනතාව වෙනුවෙන් අපි ලබා දෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමාජයේ පහළම කණ්ඩායම තෝරා ගැනීමේ දත්ත පද්ධතියේ ප්‍රශ්න තිබෙන බව අපි දන්නවා. දැනට තිබෙන Social Registry එකේ, එහෙම නැත්නම් අස්වැසුම ප්‍රතිලාභ ලබා දීමේ ගැටලු තිබෙන බව අපි දන්නවා. නමුත්, ඒ දත්ත පද්ධතියේ සියයට 70ක්වත් නිවැරදි දත්ත තිබෙන්න පුළුවන්. තව අඩුපාඩු තිබෙන්න පුළුවන්. නමුත්, එම දත්ත පද්ධතිය තමයි දැනට ජාතික මට්ටමේ තිබෙන්නේ. අන්ත දිළිඳු, දිළිඳු හා සංක්‍රාන්ති කණ්ඩායම කියලා ඒකේ ප්‍රධාන කණ්ඩායම් තුනක් ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න. මේ කාරණය කියලා මම කථාව අවසන් කරන්නම්.

රුපියල් 17,500ක් ලබා දුන් අන්ත දිළිඳු අයට අපි මේ වෙලාවේ, මේ අවුරුදු සමයේ රුපියල් 25,000ක සහනාධාරයක් ලබා දෙනවා. දිළිඳුයි කියලා හඳුනා ගත් අයගේ රුපියල් 5,000ක සහනාධාරය රුපියල් 15,000 දක්වාත්, රුපියල් 10,000ක සහනාධාරය රුපියල් 15,000 දක්වාත් වැඩි කරනවා. ඒ වාගේම රුපියල් 5,000ක සහනාධාරය ලැබෙන සංක්‍රාන්ති කණ්ඩායමට රුපියල් 7,500 දක්වාත් වැඩි කරලා දෙනවා. සමාජයේ ඒ පහළ ස්තරයන්ට අවශ්‍ය සහන දෙන එක තමයි අපේ කාර්යභාරය. ඒ වාගේම ඒකක 90ට වඩා අඩුවෙන් විදුලිය පරිභෝජනය කරන පහළ ස්තරයේ ඉන්න ජනතාවගේ විදුලි බිලට යම් සහනයක් ලබා දෙනවා. ධීවරයන්ට, ගොවීන්ට ඉන්ධන අර්බුදය හරහා යම් බලපෑමක් ඇති වනවා නම් ඔවුන්ට අවශ්‍ය සහන ලබා දීමට කටයුතු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැද පෙරදිග ඇති වුණු අර්බුදයෙන් අපට හොඳ පණිවුඩයක් ලැබෙනවා. මේ වන විට තාවකාලික සටන් විරාමයක් ඇති වෙලා තිබෙනවා. ඒ ඔස්සේ මේ තත්ත්වය ඉතා ඉක්මනින් සමනය වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. ඒ අපේක්ෂාව දල්වා ගෙන, නරකම දෙයට වුවත් මුහුණ දෙන්න අපි ආණ්ඩුවක් වශයෙන් සූදානම් කියලා මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා. මට කාලය ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 11.32]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
நன்றி! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று சர்வதேச அளவில் ஏற்பட்டுள்ள போர்ச் சூழ்நிலை காரணமாக வலுசக்தி நெருக்கடி ஏற்பட்டிருக்கின்றது. இது இலங்கையையும் வேகமாகப் பாதித்துக்கொண்டு இருக்கின்றது. இந்த நெருக்கடியானது எமது நாட்டிலுள்ள

விவசாயத்துறை, போக்குவரத்துத்துறை, மின்சாரத்துறை, கல்வித்துறை, சுகாதாரத்துறை என எல்லாத்துறைகளையும் பாதித்துக்கொண்டு இருக்கின்றது.

இன்று எங்களுடைய விவசாயிகள் திக்குமுக்காடிக் கொண்டு இருக்கின்றார்கள். குறிப்பாக, உரம், கிருமிநாசினி என்பவற்றைப் பெறமுடியாமலும் போக்குவரத்து மற்றும் நிலத்தைப் பண்படுத்துவதற்குத் தேவையான எரிபொருளைப் பெற முடியாமலும் அவர்கள் திண்டாடிக்கொண்டு இருக்கின்றார்கள். எனவே, அரசாங்கமானது விவசாயிகளுக்கு ஓர் உத்தரவாதத்தை அளிக்க வேண்டிய தேவை காணப்படு கின்றது. ஏனெனில், எமது நாட்டின் பிரதான உற்பத்தித் துறையாக விவசாயத்துறையே காணப்படுகின்றது. விவசாயி களும் விவசாயத்துறையில் ஈடுபடுகின்றவர்களும் சோர்ந்து போகாமல் பாதுகாக்கவேண்டிய பொறுப்பு அரசுக்கு இருக்கின்றது. இந்தச் சூழ்நிலையில் விவசாயிகள் அரசாங்கத்தை மிகவும் எதிர்பார்த்துக்கொண்டு இருக்கின் றார்கள். எரிபொருள் விலை ஏற்றமானது உற்பத்தித்துறையை அதிகமாகப் பாதிக்கக்கூடியதாக இருப்பதால், அவர்கள் நிவாரணங்களையும் மானியங்களையும் எதிர்பார்க் கின்றார்கள்.

மின் கட்டண உயர்வு, எரிவாயு விலை உயர்வு என்பன ஒவ்வொரு குடும்பத்தையும் பாதித்துக்கொண்டு இருக்கின்றது. குறிப்பாக, ஏழை மற்றும் நடுத்தர வர்க்கக் குடும்பங்களை இவை அதிகமாகப் பாதித்துக்கொண்டு இருக்கின்றன. எனவே, இந்த மக்களுக்கு என்ன செய்ய வேண்டும் என்பது பற்றியும் அரசு கூடுதலாகச் சிந்திக்கவேண்டிய தேவை காணப்படுகின்றது. இந்த வலுசக்தி நெருக்கடியானது, கல்வித்துறை சார்ந்த அரச உத்தியோகத்தர்களுக்கும் மாணவர்களுக்கும் பாதிப்பை ஏற்படுத்துகின்றது. இந்த யுத்தம் எவ்வளவு காலம் நீடிக்கப் போகின்றது என்பது எமக்குத் தெரியாது. வல்லரசு ஒன்றின் இறுமாப்புக் காரணமாகவே இந்த யுத்தம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. எனவே, அரசாங்கமானது, இந்த நெருக்கடியைச் சிறந்த முறையில் முகாமைத்துவம் செய்து, இதன் பாதிப்பிலிருந்து மக்கள் மீள்வதற்குரிய வழிவகைகளைச் செய்ய வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அண்மையில் GCE (A/L) - க.பொ.த. உயர் தர - பரீட்சை முடிவுகள் வெளிவந்தன. இந்தப் பரீட்சை முடிவுகள் பற்றியும் அடுத்து வெளிவரப்போகின்ற பரீட்சை முடிவுகள் எப்படி இருக்கப்போகின்றன என்பது பற்றியும் நாங்கள் சிந்திக்க வேண்டும். வெளிவந்துள்ள க.பொ.த. உயர் தரப் பரீட்சை முடிவுகளின்படி, மாவட்ட அடிப்படையில் முதலாவது இடத்தில் கொழும்பு மாவட்டமும், இரண்டாவது இடத்தில் மன்னார் மாவட்டமும், மூன்றாவது இடத்தில் புத்தளம் மாவட்டமும், நான்காவது இடத்தில் களுத்துறை மாவட்டமும், ஐந்தாவது இடத்தில் மட்டக்களப்பு மாவட்டமும், ஆறாவது இடத்தில் யாழ்ப்பாண மாவட்டமும் காணப்படுகின்றது. சிறுபான்மை இன மக்கள் பெரும்பான்மையாக வாழுகின்ற மூன்று மாவட்டங்கள் முதல் ஆறு இடங்களுக்குள் வந்திருக்கின்றன. அதற்காக உழைத்த அதிகாரிகள், ஆசிரியர்கள், அதிபர்கள் மற்றும் மாணவர்களை நாங்கள் பாராட்டுகின்றோம்.

கிராமங்களில் வாழுகின்ற எங்களுடைய சாதாரண மக்கள் எரிபொருள் நெருக்கடி காரணமாகத் தங்களுடைய அன்றாட வேலைகளை ஆற்ற முடியால் திணறிக்கொண்டு இருக்கின் றார்கள் என்பதை இந்த இடத்தில் அரசுக்குச் சுட்டிக்காட்ட வேண்டிய தேவை எனக்கு இருக்கின்றது. எங்களுடைய விவசாயிகள் எதிர்நோக்குகின்ற பல்வேறு பிரச்சினைகளில் யானைத் தாக்கம் என்பது மிகவும் முக்கியமானது. தற்போதைய எரிபொருள் நெருக்கடியோடு நேரடியாகச் சம்பந்தப்படாது விட்டாலும்கூட, இது எங்களுடைய விவசாயிகளை அதிகமாகப் பாதிக்கின்றது.

செங்கலடி நகரத்தில் யானைகளின் அட்டகாசம் அதிகமாக இருந்ததன் காரணமாக, கறுப்புப் பாலம் என்ற இடத்தில் அண்மையில் விவசாயி ஒருவர் யானையால் தாக்கப்பட்டு கொல்லப்பட்டிருக்கிறார். அதேபோன்று, புதுமண்டபத்தடியில் சின்னவன் என்ற நபர் யானையால் தாக்கப்பட்டு கொல்லப்பட்டிருக்கிறார். இருட்டாக இருக்கின்ற பிரதேசங் களில் யானைத் தாக்குதல்கள் அதிகமாகக் காணப்படுகின்றன. இதுவும் ஓர் உப பிரச்சினையாக உருவெடுத்திருக்கின்றது என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். அந்த வகையில், மின்சார மற்றும் எரிபொருள் நெருக்கடிகளிலிருந்து மக்களைப் பாதுகாப்பதற்கு புதிய உத்திகள், உபாயங்களோடு அரசு பயணிக்க வேண்டிய தேவை இருக்கின்றது. அதை மக்கள் எதிர்பார்த்துக்கொண்டு இருக்கின்றார்கள் என்பதை நான் இந்த இடத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

கிளிநொச்சி மாவட்டம் கல்வி அடைவு மட்டத்தில் மோசமான பல பிரச்சினைகளை எதிர்நோக்கினாலும், கிளிநொச்சி மகா வித்தியாலயத்தில் கல்வி பயின்ற திருக்குமரன் என்ற மாணவன் அகில இலங்கை ரீதியில் கணிதப் பிரிவில் முதலிடம் பெற்றிருக்கிறார். காத்தான்குடியைச் சேர்ந்த பர்ஹான் என்ற மாணவன் வர்த்தகப் பிரிவில் முதலாவது இடத்தைப் பெற்றிருக்கிறார். இவர்கள் உட்பட ஏனைய பிரிவுகளில் முதலாவது இடத்தைப் பெற்ற மாணவர்களையும் நான் பாராட்டுகின்றேன். ஏழைப் பெற்றோர்கள் பல சவால்களுக்கு மத்தியில் தமது பிள்ளைகளைக் கல்வி கற்க வைத்து, சாதனை படைக்கச் செய்திருக்கிறார்கள். அதற்காக அவர்கள் அனைவருக்கும் நான் இந்த இடத்தில் பாராட்டுக்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று எரிபொருள் நெருக்கடி காரணமாக அதனைப் பதுக்குகின்றார்கள். அதுமாத்திரமன்றி, உரம் மற்றும் கிருமிநாசினிகளைப் பதுக்குகின்ற செயற்பாடுகளும் இடம்பெறுவதை அவதானிக்க முடிகின்றது. இவற்றைத் தடுப்பதற்கான நடவடிக்கைகளைத் துரிதமாக மேற்கொண்டு, அவற்றின் பாதிப்பிலிருந்து மக்களைப் பாதுகாக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

போதைப்பொருளால் ஏற்படுகின்ற விளைவுகளும் பாரிய நெருக்கடியாக இன்று மாறிக்கொண்டு இருக்கின்றது. நாவற்குடா கிராமத்தில் போதைப்பொருள் வியாபாரம் நடைபெறுவதாக எனக்கு அறிவிக்கப்பட்டு இருக்கின்றது. கௌரவ பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் ஆனந்த விஜேபால அவர்களிடம் நான் அது தொடர்பான கடிதத்தை வழங்கியிருக்கிறேன். தயவுசெய்து, இதற்குரிய நடவடிக்கை களைத் துரிதமாக எடுக்கும்படி அன்பாகக் கேட்டுக் கொள்கிறேன்.

யுத்தம் காரணமாக கனகர் கிராமத்திலிருந்து கிட்டத்தட்ட 202 பேர் இடம்பெயர்ந்து இருக்கிறார்கள். அவர்களில் 73 பேருக்கு மீளக்குடியேறுவதற்கு அனுமதி வழங்கப்பட்டுள்ள போதிலும், மிகுதி 129 பேருக்கு அனுமதி வழங்கப்படவில்லை.

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

தங்களுக்கும் அதற்கான அனுமதி வழங்கப்பட வேண்டுமென அந்த ஏழை மக்கள் கண்ணீர் சிந்திக் கேட்டுக்கொண்டு இருக்கின்றார்கள். எனவே, இந்த அரசாங்கம் அவர்களுக்கும் அங்கு மீளக் குடியேறுவதற்கான அனுமதியை வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இன்று உயிர்த்த ஞாயிறு தின தாக்குதல் விவகாரம் மீண்டும் பிரச்சினையாக மாறியிருக்கின்றது. இத்தாக்குதல் சம்பந்தமான புத்தகம் ஒன்றை உதய கம்மன்பில அவர்கள் அண்மையில் வெளியிட்டிருந்தார். நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புவது என்னவெனில், கடந்த மூன்று சனாதிபதிகளின் ஆட்சியின்போது உயிர்த்த ஞாயிறு தின தாக்குதல் சம்பந்தமான உண்மைகள் வெளிவரவில்லை என்பதைத்தான். அண்மையில் மூன்றாம், இரண்டாம் மட்டங்களிலுள்ள சந்தேக நபர்கள் கைதுசெய்யப்பட்டு, சில உண்மைகள் வெளிவருவதாக நாங்கள் அறிகின்றோம். இதன் முதலாம் மட்டத்திலுள்ள சந்தேக நபர் யார்? அவர் கைது செய்யப்படுவாரா? என்ற கேள்விகள் இப்பொழுது எழுகின்றன.

உயிர்த்த ஞாயிறு தின தாக்குதல் தொடர்பில் புத்தகம் எழுதுவதனூடாக அதன் உண்மைகளைப் புதைத்து விடக் கூடாது. அந்தப் புத்தகத்தில் சஹ்ரான் ஹாஷீம்தான் இதன் முக்கிய சூத்திரதாரி என்று குறிப்பிட்டு, அதன் உண்மைகளை மூடிமறைக்க முற்படுகின்றார்கள். அவரும் மூன்றாம், நான்காம் மட்டக் குற்றவாளியாக இருக்கின்றார். ஆனால், இதைத் திட்டமிட்டு நடத்திய குற்றவாளிகள் இருக்கின்றார்கள். அதில், இரண்டாம் மட்டத்திலுள்ள சிலரை அரசாங்கம் கைதுசெய்து இருக்கின்றது. ஆட்சி மாற்றத்துக்காக இந்தத் தாக்குதலை நிகழ்த்திய முதலாம் மட்ட சூத்திரதாரி யார் என்பது கண்டுபிடிக்கப்பட வேண்டும்; அவர் கைது செய்யப்பட வேண்டும். ஏனெனில், உயிர்த்த ஞாயிறு தின தாக்குதலில் கொல்லப்பட்ட 269 அப்பாவி மக்களுக்கும் காயமடைந்த பல நூற்றுக்கணக்கானோருக்கும் நீதி வேண்டும். பேராயர் மெல்கம் ரஞ்சித் ஆண்டகை அவர்கள் உண்மையைத் தேடிக்கொண்டு இருக்கிறார். சஹ்ரான் ஹாஷிம்மீது முழுக் குற்றத்தையும் சுமத்திவிட்டு, இதனை இயக்கிய இயக்குநர்கள் தப்பித்துச் செல்வதற்கு இமளிக்கக் கூடாது என்பதை நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். சஹ்ரான் ஹாஷிம் பலிக்கடாவாக்கப்பட்டு இருக்கிறார். எனினும், அவரை இயக்கிய இயக்குநர்கள் இன்றும் இருக்கின்றார்கள். மேற்குறித்த புத்தக வெளியீட்டு விழாவில் அவர்கள் பிரசன்னமாகி இருந்தார்களா? என்ற கேள்வி எழுகின்றது.

தற்போது ஏற்பட்டிருக்கின்ற எரிபொருள் நெருக்கடி நிலையைச் சிறந்த முறையில் முகாமைத்துவம் செய்து, மக்களைப் பாதுகாக்க வேண்டும். மத்திய கிழக்கில் நிலவும் யுத்தம் எப்போது முடியுமெனத் தெரியவில்லை. ஆனால், அந்த யுத்தம் முடியும் வரை மக்களைப் பாதுகாக்க வேண்டுமெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.42]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක දේශපාලන තත්ත්වයත් එක්ක යුදමය තත්ත්වයක් ඇති වෙලා තිබෙන වෙලාවක අපේ රටේ ආර්ථිකය ස්ථාවරව පවත්වාගෙන යන්නේ කොහොමද කියන කාරණය පිළිබඳවත්, අපි මුහුණ දීලා තිබෙන අභියෝග මොනවාද කියන කාරණය පිළිබඳවත්, ඒ වාගේම රටක් හැටියට අපට ඉස්සරහට කරන්න තිබෙන දේවල් පිළිබඳවත් බොහෝ සාකච්ඡා අවශ්‍ය වෙලාවක තමයි අද දවසේ විශේෂයෙන්ම මේ විවාදය පැවැත්වෙන්නේ. පසුගිය සඳුදා කැබිනට් මණ්ඩලය තුළදී අපි තීරණය කළා, බදාදා දින නිවාඩුව අවලංගු කරලා නැවත වැඩ පටන්ගැනීමට. මේ හම්බ වෙච්ච දවස අපි වඩාත් හොඳින් ප්‍රයෝජනයට ගන්න ඕනෑ. රට තුළ සිදු වෙලා තිබෙන වෙනස්කම්, ආණ්ඩුව සිදු කර තිබෙන දේවල් පිළිබඳව රටේ ජනතාවට දැනගන්න තමයි මේ පාර්ලිමේන්තුව හරහා ඒ දේවල් අපි කියන්නේ. මේ වෙලාවේ විපක්ෂය ඔවුන්ගේ කාර්යභාරය ඉටු කරන්න උත්සාහ කරන ආකාරය අපි දකිනවා. හැබැයි, ඒ වාගේම විපක්ෂය ඇත්ත වෙනුවට බොරු ගොඩක් කියන්න හදනවා.

මැද පෙරදිග කලාපයේ ඇති වෙලා තිබෙන යුදමය තත්ත්වය අපේ රටේ ආර්ථිකයට බලපා තිබෙන්නේ කොහොමද, ඒ බලපෑ තත්ත්වයත් එක්ක අපි එයට සාර්ථකව මුහුණ දෙන්නේ කොහොමද, ඒ තත්ත්වය කළමනාකරණය කරන්නේ කොහොමද, ඒකට අරගෙන තිබෙන තීරණ මොනවාද කියලා ඊයේ දවසේ ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා. ගරු උපාලි පන්නිලගේ ඇමතිතුමාත් දැන් ටිකකට කලින් ඒ ගැන කිව්වා. ඒ වාගේම රටක් හැටියට අපි මුහුණ දීපු තත්ත්වය ගැනත් එතුමන්ලා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නරි බිරුවා කියලා සිංහයෝ භය වෙන්නේ නැහැ. ජනාධිපතිතුමා රටට කියන්න ඕනෑ කරුණු පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා. ගරු මන්ත්‍රීවරයෙකුත් කිව්වා, සමහරු එක එක පොත් ගහනවා කියලා, එක එක කාලයට. කරන්න දෙයක් නැති වුණාම සමහරු එහෙම කරනවා. මොකද, අපේ රටේ බැඳුම්කර වංචාවක් තිබිලාත් සමහරු පොත් ගැහුවා.

2024දී ජාතික ජන බලවේග ආණ්ඩුව අපේ රට භාර ගන්න වෙලාව වනකොට අපේ ආර්ථිකය කොතැනද තිබුණේ? ඒ ආර්ථිකය එතැනට වැට්ටුවේ කවුද? 2022 අප්‍රේල් මාසයේ 10වන දා ඉඳන් අපේ රට බංකොලොත් රටක් ලෙස ප්‍රකාශයට පත් කරලා, වාහන ගෙනෙන එක නවත්වලා, පෞද්ගලික අංශයේ සමාගම්වලින් පවා ඩොලර් ඉල්ලා ගෙන තෙල් ගෙනෙන තත්ත්වයකට රට පත් කරලා, අපේ රටේ රාජ්‍ය සේවයට බඳවා ගැනීම නවත්වලා, රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කිරීම් නවත්වලා, පෞද්ගලික අංශය එහෙම පිටින්ම අතහැරලා ආර්ථික කළමනාකරණය වෙනුවට මුළු රටම බංකොලොත් කරලා තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අන්න එහෙම රටක් තමයි මේ විධියට ගොඩනහන්න පසුගිය අවුරුද්ද තුළ අපි කටයුතු කළේ. ඒකේ ප්‍රතිඵල හැමෝටම පේන්න තිබෙනවා. ගරු ජනාධිපතිතුමා 2025 අවුරුද්දේ අය වැය කථාව ඉදිරිපත් කරද්දී ජාතික ආදායමට සාපේක්ෂව අපට අය වැය හිඟය ලෙස තිබුණේ සියයට 5කට ආසන්න ප්‍රමාණයක්. හැබැයි, අය වැය අවසන් වනකොට අපි අලුත් බදු හඳුන්වා දුන්නේ නැහැ. අපි

බදු ප්‍රතිපත්තිය ප්‍රතිසංවිධානය කළා. ඒ තුළින් බදු ෆයිල් සංඛ්‍යාවත් වැඩි වුණා, බදු අය කිරීමත් ක්‍රමවත් වුණා, හොරෙන් බදු පන්නන එකත් අඩු වුණා. අපි කියන්නේ නැහැ, දැනුත් සම්පූර්ණයෙන්ම නැවතුණා කියලා. හැබැයි, අපේ රටේ බදු ආදායම වේගයෙන් වැඩි වුණා. ඒ හා සාපේක්ෂව රාජ්‍ය වියදම අඩු වුණා. ඒ නිසා දැන් රාජ්‍ය ආදායම වැඩි වනවා, වියදම අඩු වනවා, නාස්තිය අවම වනවා. වියදම් කප්පාදු කරමින් ජනාධිපතිතුමාගේ සිට ආණ්ඩුව දෙන ආදර්ශ හරහා රටේ භාණ්ඩාගාරයට මුදල් එකතු වුණා. ඒ නිසා තමයි අය වැය හිඟය සියයට 2.5 දක්වා අඩු වුණේ. ඒ නිසා මූල්‍ය කළමනාකරණය පිළිබඳව වහසි බස් දොඩවමින් හිටපු විපක්ෂයට කියාගන්න දෙයක් නැති වුණා. ඒ නිසා තමයි මූල්‍ය කළමනාකරණයේ වඩා හොඳම තැන විධියට අපි අය වැය කළමනාකරණය කරලා පෙන්නුවේ; අය වැය හිඟය සියයට 2.5ක මට්ටමට අඩු කරලා පෙන්නුවේ. ඒක තමයි ආර්ථික කළමනාකරණය කියන්නේ. ඒකේ ප්‍රතිඵලය විධියට භාණ්ඩාගාරයට රුපියල් ට්‍රිලියන 1.4කට සාපේක්ෂ මුදලක් එකතු වුණා. ඒ විධියට මුදල් එකතු වුණත් විපක්ෂය හැම තිස්සේම කියන්න උත්සාහ කරනවා, රුපියල් බිලියන 100යි දුන්නේ, ඒ ගණන මදි නේ කියලා. රුපියල් බිලියන 100ක් කියන්නේ, රුපියල් කෝටි 10,000ක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉදිරි මාස දෙක තුන තුළ ධීවරයාට, අස්වැසුම ලබන අයට වාගේම ඒකක 90 දක්වා විදුලි බිලක් ලැබෙන අයට සිදු වන අපහසුතා මඟ හැරීම වෙනුවෙන් තමයි අපි ඒ මුදල වෙන් කර තිබෙන්නේ. ඒ නිසා තමයි රජය ආර්ථිකමය ලෙස තීරණ අරගෙන, මහා භාණ්ඩාගාරයේ තිබෙන මුදල් අවභාවිත නොකර ඒවා විධිමත් ලෙස රටේ ජනතාවට ලබා දෙන්න කටයුතු කරන්නේ. හැබැයි, අපි මීට කලිනුත් මේ විධියට කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 මාර්තු මාසයේ අය වැය සම්මත වුණා. 2025 මැයි මාසයේ 06වැනි දා පළාත් පාලන මැතිවරණය පැවැත්වුණා. මැතිවරණයෙන් පසුව තමයි රජය රට තුළ වැඩ කරන්න පටන් ගත්තේ. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා දන්නවා, අපි පත් වෙලා මාස හයයි අපට වැඩ කරන්න පුළුවන් වුණේ කියන එක. "දිට්වා" සුළි කුණාටුව ආපු නිසා නොවැම්බර් මාසයේ අවසානයේ ඉඳලා අපට ඒ ආපදාවට මුහුණ දෙන්න සිදු වුණා. ඒ අවුරුද්දේ රුපියල් බිලියන 270ක් මේ ආපදාවට පත් ජනතාව වෙනුවෙන් අපි වියදම් කළා. ඊට අමතරව මේ අවුරුද්දේත් රුපියල් බිලියන 500ක් - රුපියල් කෝටි 50,000ක් - "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් වූ ජනතාව වෙනුවෙන් සහන දෙන්න මහා භාණ්ඩාගාරයේ එකතු කළා. එහෙම කටයුතු කළේ කවුද? ආර්ථික කළමනාකරණය හොඳටම කරපු අපේ මුදල් ඇමති, ගරු ජනාධිපති අනුර දිසානායක සහෝදරයා ඇතුළු ආණ්ඩුව. ඒ විධියට මුදල් එකතු කරලා තිබුණේ නැත්නම් "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් වුණු ජනතාවට අපි සහන ලබා දෙන්නේ කොහොමද? ඒ නිසා Budget එකේ ණය සීමාව නැවතත් වැඩි වෙනවා. ඒ විතරක් නොවෙයි, අපට වැඩිපුර ණය ගන්නත් වෙනවා. එතකොට නැවතත් ප්‍රශ්න එනවා. හැබැයි, ඒ වෙනුවට ආර්ථික ස්ථාවරත්වය හදන්න අවශ්‍ය තීන්දු තීරණ ගත් නිසා තමයි ආර්ථිකය තුළ අපට එවැනි අවස්ථාවක් තිබුණේ. ඒ නිසා තමයි අත දිග හැරලා වියදම් කරන්න පුළුවන් මුදලක් ජනාධිපතිතුමා ලබා දුන්නේ. වෙනදා ගෙයක් කැඩුණාම රුපියල් ලක්ෂ 50ක් දුන්නාද? දුන්නේ නැහැ. නිවස සුද්ද කර ගන්න රුපියල් 25,000ක්, නැති වුණු බඩු ටික ගන්න රුපියල් 50,000ක්, අර්ධ හානිවලට ලක් වූ නිවසක් සඳහා රුපියල් ලක්ෂ 5ක් ජනාධිපතිතුමා ලබා දුන්නා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එහෙම දීලා නැහැ නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
කවුද, එහෙම දීලා නැහැ කියන්නේ? එහෙම දීලා නැති තැන් තිබෙනවා නම් ඒ තැන්වල පොඩි ප්‍රශ්නයක් ඇති. මේ වෙනකොට ආපදාවට ලක් වුවන්ගෙන් සියයට 98කට ඒ වන්දි මුදල් ගෙවා තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියයට 99ක් ගෙවලා තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
රුපියල් ලක්ෂ 50ක වන්දිය දීලා නැහැ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
රුපියල් ලක්ෂ 50 එකවර දෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමියනි. රුපියල් ලක්ෂ 50 දෙන්නේ නිවස හදා ගන්න. ආපදාවට ලක් වූ පුද්ගලයාට නිවසක් තිබුණා නම් නිවසක් දෙනවා; ඉඩම දෙනවා. නිවස අර්ධ හානියට පත් වුණා නම් රුපියල් ලක්ෂ 5කුත්, සම්පූර්ණයෙන් හානියට පත් වුණා නම් රුපියල් ලක්ෂ 50කුත් ලබා දෙනවා. රුපියල් ලක්ෂ 50 දෙන්න ඉස්සෙල්ලා රුපියල් ලක්ෂ 20ක් දෙනවා. නිවස හදන පිළිවෙළ අනුව ඉතුරු මුදල් ටික දෙනවා. ඔබතුමන්ලාගේ දිස්ත්‍රික්කවල වන්දි මුදල් දීලා නැති ජනතාව ඉන්නවා නම් අපට වාර්තා කරන්න. ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමාත් දැන් මේ සභාවේ හිටියා. වන්දි දීලා නැත්නම් ඔබතුමිය ඒ ගැන කියන්න. අපි ඒ ගැන හොයා බලා කියන්නම්. අපේ දිස්ත්‍රික්කවල ජනතාවට අපි වන්දි ගෙවලා ඊට අනුව වැඩත් ක්‍රියාත්මක වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙවර සිංහල අලුත් අවුරුද්දට ඒ නිවාස කිහිපයක් විවෘත කරන්නත් අපි සැලසුම් කරනවා. මොකද, ඒ ජනතාව පදිංචි කරවීම සඳහා අපි ඉක්මනින් වැඩ කටයුතු කරනවා. නිවස හදනකොට පියවරෙන් පියවර අපි ඒ මුදල් ලබා දෙනවා. එම නිසා නිකම් පොඩි කෑලි අල්ලාගෙන බොරු කියන්න ලැහැස්ති වෙන්න එපා. අපි වන්දි ලබා දෙනවා. එහෙම වන්දි ලබා දීලා නැත්නම් කියන්න. ඒක තාක්ෂණික ප්‍රශ්නයක් නම්, නිලධාරින්ගේ ප්‍රශ්නයක් නම් එහෙම නැත්නම් පරිපාලනමය ප්‍රශ්නයක් නම් අපි ඒවාට මැදිහත් වෙලා නිශ්චිතවම ඒ වන්දි ලබා දෙනවා. අදාළ දිස්ත්‍රික් ලේකම්වරු එක්ක මේ පිළිබඳව පසු විපරම් කරමින්, විශේෂයෙන්ම ජනාධිපතිතුමාත් මැදිහත් වෙමින්, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාත් මැදිහත් කර ගනිමින් අපි ඒ කටයුතු කරනවා. සමහර තීන්දු තීරණ ගන්න ඕනෑ අවස්ථාවලදී වාගේම ඉඩම් සම්බන්ධයෙන් ප්‍රශ්න ආපු අවස්ථාවලදී ඒවාට මැදිහත් වෙලා අපි ඒ ප්‍රශ්න විසඳුවා. සමහර තැන්වල ඉඩම් සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති වුණාම අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා මැදිහත් වෙලා ඒ ප්‍රශ්න විසඳුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ආර්ථිකය ස්ථාවරව පවත්වාගෙන ආපු නිසා තමයි එවැනි දේවල් අපට දෙන්න පුළුවන් වුණේ.

"දිට්වා" සුළි කුණාටුව ඇවිල්ලා කුකුළු කොටු, හරක් ටික, එළුවෝ ටික නැති වුණු, බෝට්ටු සහ දැල් ටික ගහගෙන ගිය ඒ හැමෝටම අපි උදවු කළා. ඒ විතරක් නොවෙයි, පාර අයිනේ කඩයක් දමාගෙන එදිනෙදා ව්‍යාපාර කරගෙන හිටපු කෙනෙකුගේ කඩය විනාශ වුණා නම්, පොඩි මැස්සක් නැත්නම් පොඩි බාර් එකක් දමාගෙන හිටපු කෙනාගේ ඒ මැස්ස හෝ බාර් එක විනාශ වුණා නම් අපි ඒ අයටත් වන්දි ලබා දුන්නා. වන්දි ලැබී නැති කවුරුන් හෝ ඉන්නවාය කියා විපක්ෂය අපට කිව්වොත් ඒ සම්බන්ධයෙන් සලකා බලන්න පුළුවන්. එහෙම නැතුව ජනතාවට වන්දි ලබා දුන්නේ නැහැ කියන බොරුව කීම සාධාරණ නැහැ

[ගරු වසන්ත සමරසිංහ මහතා]

කියන එකයි අපි කියන්නේ. මේ අය දැනුත් කියන්න උත්සාහ කරනවා, අපි දුන්නේ රුපියල් මිලියන 100යි කියන්න. එහෙම කියන එක වැරදියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025දී ලබා දුන් රුපියල් බිලියන 270 - රුපියල් කෝටි 27,000 - හැරුණාම මේ අවුරුද්දේ මේ දක්වා විතරක් ජනතා සහන වෙනුවෙන්, විශේෂයෙන් "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් වුවන්ටත් එක්ක රුපියල් බිලියන 500ක් - රුපියල් කෝටි 50,000ක් - ලබා දුන්නා. ඒ වාගේම මේ ආර්ථික පැකේජය හරහා රුපියල් කෝටි 10,000ක් - රුපියල් බිලියන 100ක් - අපි මේ වෙනකොට ලබා දීලා තිබෙනවා. මහා භාණ්ඩාගාරයේ මුදල් තිබුණු නිසා තමයි අපිට එහෙම කරන්න පුළුවන් වුණේ. එහෙම නැතුව වෙන හේතුවක් නිසා නොවෙයි. එම නිසා රටට මුදල් එන ආදායම් මාර්ග ආර්ථිකය තුළ සකස් කරලා, භාණ්ඩාගාරයට මුදල් එකතු වුණාම තමයි අපි ඒ සහන දුන්නේ. නමුත්, විපක්ෂය ඒ සහන දුන්නේ නැහැ කියන්න උත්සාහ කරනවා. ඒ වාගේම ජනතාව තුළ භයක් ඇති කරන්න උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික කළමනාකරණයක් නොකළා නම් මේ වෙනකොට ජනතාවගේ තත්ත්වය මොකක්ද කියා අපි අහනවා. දැන් දුප්පත්කම වැඩි වෙලාලු, ජනතාව කන්න නැතුව ඉන්නවාලු. මට හිතෙන්නේ හොරා කන්න නැති වුණාම ඕක තමයි දැනෙන විදිය. ඒක තමයි මේ ප්‍රශ්නය. මොකද, අපි හොරකම් නවත්වා තිබෙන්නේ. එම නිසා මේ රටේ ආර්ථිකය තිබුණු තැනින් ඉහළට අරගෙන එන්න ආර්ථික කළමනාකරණය විධිමත් ලෙස සිදු කරමින් තිබෙන රටක ජනතාවට දෙන්න පුළුවන් සියලු සහන දෙන එක අපේ වගකීම, ආණ්ඩුවේ වගකීම කියා හිතලා තමයි අපි මේ වැඩ කරමින් ඉන්නේ.

ඒ විතරක් නොවෙයි, 2024 අවුරුද්ද වනකොට තිබුණු රට 2025 අවුරුද්ද වනකොට ගෙනාපු තැනින් එහාට අරගෙන යද්දී ඔන්න අපට නැවත ප්‍රශ්නයක් ආවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වුණු පීඩාව යන්තම් පිළිසකර කරගෙන ජනතාවත් එක්ක වැඩ කරන්න පටන් ගන්න කොටම ඔන්න තව ප්‍රශ්නයක් පටන් ගත්තා. දැන් ලෝකයේ රටවල් ගහ ගන්න එක හරියට පිස්සෝ ෆුට්බෝල් ගහනවා වාගේ කියලා තමයි අපේ සමහර හිතවතුන් අපට කිව්වේ. අහු වෙච්ච පැත්තට ගහනවා. මැද පෙරදිග කලාපයේ තිබෙන ඉරානයට එල්ල කරපු ප්‍රහාර නිසා අද ඇති වෙලා තිබෙන තත්ත්වය බලන්න. ඊශ්‍රායලය සහ ඇමෙරිකානු මැදිහත් වීම තුළ මැද පෙරදිග කලාපයම දැන් යුද්ධයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා සැපයුම් මාර්ග ගණනාවක් ඇනහිට තිබෙනවා. විශේෂයෙන් හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා ලෝකයේ තෙල් ප්‍රවාහනයෙන් සියයට 40ක් සිදු වනකොට සියයට 20ක් මේ යුද්ධමය තත්ත්වය නිසා එහෙමපිටින්ම බිඳ වැටුණා. හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා සමහර රටවලට තෙල් ප්‍රවාහනය කරන්න ඉඩ දුන්නාට, සමහර රටවලට ඒ ඉඩ දුන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, මැද පෙරදිග කලාපයට ගුවනින් ගිය බොහෝ දේවල් ගුවනින් යන්නේ නැති වුණා. එලෙස ඒවා ගුවනින් යන්නේ නැති වුණාට පසුව අපනයනවලට යම් බාධාවක් ඇති වුණා. ඒ විතරක් නොවෙයි, මේ හේතුවෙන් රැකියා කරන ජනතාවට පවා යම් ප්‍රශ්නයක් ඇති වුණා; නව ආයෝජන ඒමට බාධා ඇති වුණා. පෙබරවාරි මාසයේ 27වන දා, 28වන දා වෙනකොට ආරම්භ වුණු මේ යුද්ධමය තත්ත්වයට දැන් මාසයකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. මේ තත්ත්වය ගෝලීය උණුසුම් තත්ත්වයක්, නැත්නම් ගෝලීය යුද්ධමය තත්ත්වයක් දක්වා වර්ධනය වෙද්දී අපේ ආර්ථිකය කළමනාකරණය කරන්න රටක් හැටියට ගත යුතු තීන්දු තීරණ ටික අපි ගත්තා. ඒ අනුව තමයි අපි ආහාර බෙදා හැරීමේ යාන්ත්‍රණය කොහොමද ක්‍රියාත්මක කරන්නේ, තෙල් ටික බෙදා හැරීමේ යාන්ත්‍රණය කොහොමද ක්‍රියාත්මක කරන්නේ, ධීවර බෝට්ටු ටිකට තෙල් ටික දෙන්නේ කොහොමද කියලා සොයා බැලුවේ.

ගොවියා මහ කන්නයේ අස්වැන්න නෙළාගෙන ඉවර වුණු ගමන් යල කන්නය පටන් ගන්න ඕනෑ. ගොවියාට තෙල් ටික දෙන්නේ කොහොමද, නිෂ්පාදකයන්ගේ, කර්මාන්තකරුවන්ගේ භාණ්ඩ ටික බෙදා හරින්නේ කොහොමද, නිෂ්පාදනයට බාධාවක් නොවන විදියට සේවකයන් ප්‍රවාහනය කරන්නේ කොහොමද, පිටකොටුවට එන බඩු ටික රට පුරා තිබෙන වෙළෙඳ සැල්වලට බෙදා හරින්නේ කොහොමද, ඒකට අවශ්‍ය කරන තෙල් ටික බෙදා දෙන්නේ කොහොමද, ඒවාට අවශ්‍ය කරන යාන්ත්‍රණය සකස් කරන්නේ කොහොමද කියන කටයුතුවලට පළමුවැනි මොහොතේ සිට ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය සහ මේ ආණ්ඩුව නිලධාරින් සමඟ එක්ව මැදිහත් වුණා. එහෙම මැදිහත් වෙලා ඒ කටයුතු කළමනාකරණය කරගෙන ආපු නිසා තමයි මේ වනවිට රට මේ විදියට පවත්වාගෙන යන්නේ. ඒ නිසා තමයි අපට බදාදා දින නිවාඩු දීපු එක නවත්වන්න පුළුවන් වුණේ. ඒ වාගේම, පටන් ගත්ත තෙල් කෝටාව වැඩි කරන්න අපට පුළුවන් වුණේත් ඒ නිසායි. ඒවා කළේ නිකම් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආර්ථික කළමනාකරණය කියන්නේ ඒක තමයි. එහෙම කරලා තමයි මේවා හැදුවේ.

දැන් අපේ මන්ත්‍රීතුමෙක් කිව්වා, සහල් ගෙනෙන්නේ නැහැ කියලා. ඔව්, අපි අදත් කියනවා, අපේ රටේ සහල් නිෂ්පාදනයේ අතිරික්තයක් තිබෙනවාය කියලා. මාස තුනකට ප්‍රමාණවත් සහල් අපේ රටේ තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සාමාන්‍යයෙන් අපි දවසකට සහල් මෙට්‍රික් ටොන් 6,500-7,000 අතර ප්‍රමාණයක බත් කනවා. ඒ අනුව අපේ මාසික සහල් අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 210,000යි. හැබැයි, අපේ සහල් නිෂ්පාදනයේ උපරිමය ගත්තොත් මෙට්‍රික් ටොන් මිලියන 2.5යි; මෙට්‍රික් ටොන් ලක්ෂ 25යි, 26යි. හැබැයි, අපි ළඟ සහල් මෙට්‍රික් ටොන් ලක්ෂ 30කට වැඩිය තිබෙනවා. නමුත්, ප්‍රශ්නයක් තිබෙනවා. මොකක්ද තිබෙන ප්‍රශ්නය? කීරි සම්බා සහ සම්බා සහල් සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය. පසුගිය අවුරුද්දේ ඇති වුණු මේ ප්‍රශ්නයට උත්තරයක් ලෙස මෙවර මහ කන්නය ඉලක්ක කරලා, සියයට 12.5කට ආසන්න ප්‍රමාණයක කීරි සම්බා වවන්න අවශ්‍ය කරන ඉඩ සකසා ගත්තා. ඒ සියයට 12.5කට ආසන්න ප්‍රමාණයක වගාව හැදීගෙන එනකොට "දිට්වා" සුළි කුණාටුව නිසා එයින් විශාල ප්‍රමාණයක් විනාශයට පත් වුණා. කීරි සම්බා ආපසු වතාවක් වගා කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, වගාවට මාස තුනහමාරක්, නැත්නම් හතරක් ගත වෙනවා. ඒ නිසා හානි වුණු ප්‍රමාණයත් එක්ක අපි අපේක්ෂා කරපු අස්වැන්න අපට ලබා ගන්න බැරි වුණා. පසුගිය අවුරුද්දේ අපට තිබුණේ සියයට හයක කීරි සම්බා වී අස්වැන්නක්. මේ අවුරුද්දේ සියයට අටක් දක්වා කීරි සම්බා වී අස්වැන්න අපි වැඩි කරගෙන තිබෙනවා. සියයට 12ක් බලාපොරොත්තු වුණු අස්වැන්න පහත වැටුණා. එසේ අස්වැන්න පහත බහිනකොට ආපහු මෝල් හිමියන් ටික රජයේ බැංකුවලින් ලබා දෙන ණය පහසුකම් පාවිච්චි කරලා වී ටික මිලදී ගත්තා. අපි වී මිලදී ගන්නකොට කිව්වා, නාඩු කිලෝවක් රුපියල් 120යි, සම්බා කිලෝවක් 130යි, කීරි සම්බා කිලෝවක් 140යි කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කිරි සම්බා කිලෝවක මිල රුපියල් 140 සිට රුපියල් 160, 170, 180 දක්වා ඉහළට ගෙනාවා. ඒ නිසා ගොවියාට හොඳ ගාණක් ලැබුණා. හැබැයි, පාරිභෝගිකයාට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා රජයට තීරණයක් ගන්න වුණා. ඒ අනුව පසුගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ යල කන්නය ඉවර වෙනකොට අපි දැක්කා, කිරි සම්බාවල අඩුවක් තිබෙනවාය කියලා. ඒ නිසා අපි සහල් ගෙනෙන්න දවස් 12ක් දුන්නා. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාට මතක ඇති, දවස් 12ට ආවේ මෙට්‍රික් ටොන් 64,000ක් බව. එතකොට විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු ඇහුවා, කොහේද සහල් එන්නේ, කොටාගෙන ඇවිත් ගාල් කරලා තිබෙනවාද කියලා. ඒ වාගේම සහල් මෙට්‍රික් ටොන් 20,000ක්වත් එන්නේ නැහැ කිව්වා. නමුත්, සහල් මෙට්‍රික් ටොන් 64,000ක් ආවා. මේ තත්ත්වයත් එක්ක අපි මේ අවුරුද්දේ ඇස්තමේන්තු කරලා තිබෙන ප්‍රමාණයට අනුව කිරි සම්බා ආදේශක මෙට්‍රික් ටොන් ලක්ෂ එකහමාරක් විතර මදි වෙනවා. මොකද, දැන් අපි ඇස්තමේන්තු හදලා තිබෙන්නේ. යල කන්නයේ වගාවත් එක්ක ගත්තාම මේ අවුරුද්දට,-

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ගරු ඇමතිතුමනි, කිරි සම්බා වී රජය මිලදී ගන්නේ කීයටද දැන්?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
රජය රුපියල් 140ට ගන්නවා.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
රුපියල් 400ට විකුණනවා නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක තමයි මන්ත්‍රීතුමා, මේ කියන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
රුපියල් 400ටවත් ගන්න නැහැ නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඊයේ ආවා. කිරි සම්බා ආදේශන වන GR 11 සහ කිරි පොන්නි සහල් අද සිට අපි ආනයනය කරනවා. අපි අපේක්ෂා කරනවා, මෙට්‍රික්ටොන් ලක්ෂයත්, එකහමාරත් අතර ප්‍රමාණයක් ගෙනෙන්න වෙයි කියලා. ඔබතුමන්ලා ඔය කියන විධියේ ජාවාරමක් කෙරෙනවා. ඊයෙත් අපි දඹුල්ලේ වැටලීම් කළා. වැඩි මිලට විකුණන අය අල්ලනවා. මොකද, පාරිභෝගිකයා සූරා කෑම සඳහා දැන් මේක පාවිච්චි කරනවා. ඔබතුමන්ලාට මතක ඇති, 2024දී නාඩු හාල් අඩු වුණා. ඒ වෙලාවේ මෝල්වල කිරි සම්බා සහල් වැඩිපුර තිබුණා. එතකොට ඒගොල්ලන් කිව්වා, කිරි සම්බා ගත්තොත් නාඩු දෙනවා කියලා. එදා රුපියල් 260ට දුන්නා, ඒගොල්ලන්. හැබැයි, කිරි සම්බා ටික ඉවර කරගත්තා. සාමාන්‍යයෙන් මේගොල්ලන් කිරි සම්බා ගෙනැල්ලා මාස 6ක් ගොඩගසාගෙන ඉඳලා තමයි කොටන්නේ. එහෙම තමයි සාමාන්‍යයෙන් කිරි සම්බාවල ඒ රසය සහ සුවඳ එන්නේ. ඒ නිසා දැන් ඒගොල්ලන් ආපසු try කරනවා, මෙවර වී ටිකත් අරගෙන ලබන යල කන්නය වෙනකොට කොටලා මේ හිඟය ඇතුළේ මිල තබාගෙන යන්න. අන්න ඒ නිසා තමයි, අපි කිරි සම්බා ආදේශන වන GR 11 සහ කිරි පොන්නි ගෙනෙන්න අවශ්‍ය කරන අනුමැතිය දුන්නේ. අප්‍රේල් මාසයේ 01වැනි දා සිට අප්‍රේල් මාසයේ 30වැනි දා දක්වා කිරි පොන්නි, GR 11 සහල් ආනයනය කරන්න පුළුවන්, ඕනෑම කෙනෙකුට. ඒ වාගේම, මැයි මාසයේ 31වැනි දා වෙනකොට නිදහස් කර අවසන් කරන්න ඕනෑ, ඒ මාස 2ක ඇතුළේ. ආනයනකරුවන් ඊයේ දවසේ මෙට්‍රික් ටොන් 600ක් ගෙනැල්ලා තිබෙනවා. අද නැවේ මෙට්‍රික් ටොන් 3,000කට ආසන්න ප්‍රමාණයක් එනවා කියලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලබා දුන් අමතර විනාඩි 2ක කාලයත් අවසන්, ගරු ඇමතිතුමනි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
සහල් නැවත ගෙනෙන්නේ නැහැ කියලා නේ ආවේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගෙනෙන්නේ නැහැ කියලා කිව්වේ මොකද කියලා, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති. අරගෙන ගිහිල්ලා බලන්න. අවශ්‍යතාවක්, දුෂ්කරතාවක්, ප්‍රශ්නයක් ආවොත් අවශ්‍ය හාල් වර්ග ගෙනෙන්න වෙනවා. දැන් මේ ගෙනෙන්නේ පොදුවේ හාල් නොවෙයි. මේ ගෙනෙන්නේ කිරි සම්බා ආදේශන. ඒ කිරි සම්බා ආදේශන ගෙනෙන්න වෙන්නේ කිරි සම්බා,-

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම හොඳයි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක තමයි කියන්නේ. ඉතින්, ඒක ගයන්ත මන්ත්‍රීතුමාට කියන්නකෝ. ළඟ ඉන්න ගයන්ත මන්ත්‍රීතුමාට කියන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවශ්‍යතාව අනුව පාරිභෝගිකයාගේ ආරක්ෂාවත්, ගොවියාගේ මිලත්, රටේ ආර්ථිකයත් කළමනාකරණය කරමින් යන වෙලාවක විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිව්වා, ජනාධිපතිතුමා බයෙන් ඉන්නවා කියලා. මම ඒකයි කියන්නේ, නරින්ට සිංහයෝ බය වෙන්නේ නැහැ කියලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කොහොමත් නරි උඩු බුරනවා. සිංහයෝ සිංහයින්ගේ වැඩේ කරගෙන යනවා. මේ ආණ්ඩුවත් ඒ වාගෙයි කියා ප්‍රකාශ කරමින් මම නවතිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 11.59]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බොහොම සතුටු වෙනවා, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාගෙන් පසුව මට කථා කරන්නට ලැබීම ගැන.

මෙන්න බලන්න, system change එක කියන්නේ මොකක්ද කියලා. එක්සත් ජාතික පක්ෂය අනුගමනය කරපු ඒ system එකට බැණලා, අද එතුමා විශිෂ්ට මට්ටමට, ඒ කියන්නේ අපටත් වඩා හොඳට ඒක අනුගමනය කරන එක අපි අගය කරනවා. අන්න ඒක තමයි ප්‍රගතියක් කියන්නේ. අපි ඒ ගැන කිසිසේත්ම කුහක වශයෙන් හිතන්නේ නැහැ. අපි බොහොම සතුටින් පිළිගන්නවා, ඔබතුමන්ලා නිවැරදි මාර්ගයේ යන එක. හාල් පිළිබඳ එදා ආණ්ඩුවට තිබුණු ප්‍රශ්නය තමයි අද තිබෙන්නේත්, ඇමතිතුමනි. ඉතින්, ඒක ප්‍රශ්නයක් නොවෙයි. එදා commission ගත්තාය කියලා කිව්වා. දැන් ඔබතුමන්ලා ගන්නේ නැහැ නේ. ඉතින්, අපි එහෙම කියන්නේ නැහැ. ඔන්න, එදා ගත්තෙත් නැති එක තමයි තිබෙන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, නැහැ. බාධා කිරීමක් කරන්න-

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. එපා, එපා. ඕනෑ නැහැ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
එදා හාල් ගෙනැල්ලා කළේ වී අලෙවි මණ්ඩලයටත්, -

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කමක් නැහැ, කමක් නැහැ. මම කියන්නේ එදාත් ප්‍රශ්නයක් තිබුණේ නැහැ, අදත් ප්‍රශ්නයක් නැහැ කියලා. මම කියන්නේ, එදා කුහක ලෙස පෙන්නුවා මෙන්න මේ වාගේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. දැන් ඔබතුමාට අපි එහෙම කියන්නේ නැහැ. මෙතැන ඉන්න විපක්ෂයේ කවුරුත් එහෙම කියන්නේ නැහැ. මොකද, ඔබතුමන්ලා අනුගමනය කරන්නේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඇති කරපු, ඩී.එස්. සේනානායක මැතිතුමා ගෙනාපු විවෘත ආර්ථිකය. ඒක බොහොම හොඳට කරනවා. අපටත් වඩා හොඳට කරනවා. ඒක නම් මම කියන්න ඕනෑ. අපි සාමාන්‍ය vehicle එකේ යනවා. ඔබතුමන්ලා V8 එකේ යනවා, ජොලියේ. අන්න එහෙම තමයි වෙලා තිබෙන්නේ. හැබැයි, අද ලංකාව ජොලියක් නැති රටක්ලු. ඒ කියන්නේ මේ system change එකේදී, ජොලියක් නැති රටවල් ලැයිස්තුවේ අපි 137වන තැනට ගිහිල්ලා තිබෙනවා. ඒක භයානකයි, වසන්ත ඇමතිතුමනි. මම දන්නේ නැහැ, මේ "අරුණ" පත්තරයේ තිබෙනවා, "ලංකාව ජොලියක් නැති රටක්" කියලා. *[බාධා කිරීමක්]* කමක් නැහැ. අපි ජොලිය ඇති කරන්න ඕනෑ නේ. *[බාධා කිරීමක්]* මම මේ කියන්නේ ජොලියක් නැති රටක් කියා සඳහන් වෙනවා කියලා.

මම මේ අවස්ථාවේදී ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමාගේ ගෝලයෙක් වශයෙන් මේ කාරණය අහනවා. අද වෙනකොට මාස 3ක් මහපොළ ශිෂ්‍යාධාර ගෙවලා නැහැ. යම් විධියකින් පරිත්‍යාගයක් ලබා තිබෙන මේ අයට තවම මහපොළ,-

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
පෙබරවාරි මාසයේ මුදල් දාලා ඉවරයි. ඔබතුමාට ඔය ලැබී තිබෙන්නේ සත්‍ය තොරතුරු නොවෙයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක check කරන්න, ඇමතිතුමනි. මොකද, මම ඒ කථාව නිකම් කියන්නේ නැහැ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, නැහැ. පෙබරවාරි මාසයේත් සල්ලි දාලා ඉවරයි. Trust Fund එකේ member කෙනෙක් හැටියට මේ කියන්නේ. පෙබරවාරි මාසයේ සල්ලි දාලා ඉවරයි. මාර්තු මාසයේ සල්ලිත් අපි අවුරුද්දට කලින් දාන්න එකඟ වුණා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සල්ලි දාන්න. ඒක තවම ලැබිලා නැහැ කියලායි කියන්නේ. කරුණාකර ඒක check කරන්න. මම මේවා කියන්නේ වෙන මුකුත් නිසා නොවෙයි. ඔබතුමන්ලාට අර UNP එක කළ කාර්යය හොඳට කරන්න තමයි මම මේ උදවු කරන්න හදන්නේ. අපි උදවු කරනවා, ඒ සඳහා.

දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවට ලෝක බැංකුවෙන් වාර්තාවක් නිකුත් කර තිබෙනවා. අවශ්‍ය නම් ඒක සභාගත කරන්නත් පුළුවන්. ලෝක බැංකුවෙන් ලංකාවට භය හිතෙන වාර්තාවක් තමයි ඉදිරිපත් කර තිබෙන්නේ. ආසියාවේ වැඩිම විදුලි බිල හැටියට ලංකාවේ විදුලි බිල සියයට 33කින් වැඩි වෙලා ලු. තරුණයන්ට රැකියා නැහැ ලු. මම කියන්නේ මේකයි. පිටරට ඉඳන් එන ආයතනවල හැමදේම බදා ගන්න එපා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන දේවල් බදා ගන්න එපා. ලෝක බැංකුවෙන් ඔබතුමන්ලාට ඕනෑ වෙලාවට හොඳ එකක් ගන්න. මේ වාගේ ඒවා ආවාම ඒ අය කියන්නේ නැහැ, ඇයි මේ වාගේ තත්ත්වයක් ඇති වන්නේ කියලා. මම මේක මතක් කරන්නේ මෙන්න මේ නිසා. අපට විවෘත වෙළෙඳාමක් තුළින්, විවෘත ආර්ථිකයක් ඉදිරියට ගෙනියන්න තිබෙනකොට මේ වාගේ සාධක එනවා. දැන් ඔබතුමන්ලා දන්නවා, විපක්ෂයේ ඉඳලා ආණ්ඩු පක්ෂයට ගියාම, විපක්ෂයේ සිටියදී කියපු සුන්දර දේවල් ආණ්ඩුවක් කරද්දී ක්‍රියාත්මක කරන්න අමාරුයි කියලා. හැබැයි, මේ දේවල් එදා තිබුණු ආණ්ඩුවල වැරදි නොවෙයි. ඔබතුමන්ලාට දැන් තේරිලා තිබෙනවා, අපේ කාලයේත් මේ වාගේ අසීරු ගමනක් තිබුණා කියලා. අපි ඒක කිසිසේත්ම නැහැයි කියන්නේ නැහැ. ඔබතුමන්ලා අපටත් වැඩිය හොඳින් යම් යම් දේවල් කරනවා. නමුත්, මේකෙදි කරන්න තිබෙන එක දෙයක් තමයි අපේ ආයෝජන වැඩි කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කරන එක. ඔබතුමන්ලා දැන් ගිහිල්ලා බලන්න ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ,-

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා, මාස 3ක් මහපොළ ශිෂ්‍යාධාර ගෙවා නැහැ කියලා. ගරු මන්ත්‍රීතුමනි, පෙබරවාරි මාසය දක්වා සියලු විශ්වවිද්‍යාලවල ගෙවලා ඉවරයි. මේ මාසයේ 10වැනි දාට මාර්තු මාසයේ සියලු දේවල් ගෙවනවා. එක විශ්වවිද්‍යාලයක් අපට තවම

තොරතුරු සම්පූර්ණ කරලා නැහැ. ඒ තොරතුරු ආවොත් සියලු විශ්වවිද්‍යාලවල මාර්තු මාසයට අදාළව ගෙවා අවසන් වෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා කිව්වේ මාර්තු මාසය ගැන නේ. මේ අප්‍රේල් මාසය නේ. මම කිව්වේ මේකයි.පෙබරවාරි අගටත්, මාර්තු මාසයේත් ගෙවලා නැහැයි කියන එක,-*[බාධා කිරීමක්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

නැහැ, නැහැ. ඔබතුමා හොඳටම දන්නවා නේ. මාර්තු මාසයේ ගෙවීම් කරන්න විශ්වවිද්‍යාල ලේඛනය හදලා එවන්න ඕනෑ. එහෙම නැතිව ගෙවන්න බැහැ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දැන් අපේ නීතිපති දෙපාර්තමේන්තුව සුප්‍රිම් උසාවිය දැනුවත් කර තිබෙනවා, ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය, ශ්‍රී ලංකා ටෙලිකොම් එක, Sri Lanka Insurance Corporation එක, Lanka Hospitals පෞද්ගලීකරණයට හෝ වාණිජකරණයට යොමු කරන්නේ නැහැ කියලා. හැබැයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියා තිබෙනවා, ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය වාණිජකරණය කරන්න කියලා. මෙවැනි අවස්ථාවකදී කරුණාකරලා ආණ්ඩුව වමට සිග්නල් දාලා දකුණට හැරෙන්න එපා. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට භයෙන් කටයුතු කරන්න ඕනෑ නැහැ. නමුත් යම් වැඩ පිළිවෙළක් කරගෙන යනකොට, වාණිජකරණයක් කරනකොට පෙන්වන්න අවශ්‍යයි, ඍජු ප්‍රතිපත්තියක් අනුව අපි කටයුතු කරනවා කියලා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පොඩ්ඩක් ඉන්න, වසන්ත සමරසිංහ ඇමතිතුමා. මේ ජීවන වියදම ගැන ඊයේ ජනාධිපතිතුමා බොහොම හොඳට සාකච්ඡා කළා. නමුත්, එක කොටසකට නේ වැඩි අවධානයක් යොමු කරලා තිබෙන්නේ. මිලියන 22ක විතර ජනගහනයක් ඉන්න රටක අපි ආමන්ත්‍රණය කරලා තිබෙන්නේ මිලියන 6ක විතර ප්‍රමාණයකටයි. ඉතිරි අයගේ ජීවන වියදමේ බර වැඩි වෙලා නැද්ද? ඒක අනිවාර්යයෙන්ම නිවැරදි කරන්න ඕනෑ. ජීවන වියදම තුළ බෙහෙත්, විදුලිය, වතුර, ප්‍රවාහන ගාස්තු, ගෙවල් ගාස්තු ආදී ඔක්කෝම වැඩි වෙලා තිබෙනවා. එක කොටසකට විතරක් සහන දීලා මේක කරන්න බැහැ.

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, ඔබතුමා යටතේ තිබෙන සතොස ආයතනය හරහා සියයට 3කට නේ ආමන්ත්‍රණය කරන්න පුළුවන් වන්නේ. රට පුරා outlets 653ක් තිබෙනවා. ඔබතුමා කියා තිබෙනවා, ඒ outlets 653ට අදාළව, "Lanka Sathosa launches nationwide new year discount drive with up to 40 per cent...." කියලා. බොහොම හොඳයි. සියයට 40ක් discount දෙන්න පුළුවන් නම් ඔබතුමන්ලා සියයට 60ක විතර profit හදනවා නේ. බොහොම හොඳයි. අන්න ඒක තමයි විය යුතු වන්නේ. ඒක හොඳයි. හැබැයි, තව මාසයකින් ඇවිල්ලා කියන්න එපා, මේ අලුත් අවුරුද්ද නිසා සියයට 50ක පාඩුවක් තිබුණා කියලා. මම දන්නවා, ඔබතුමා හරි ගමනක් යන්නයි හදන්නේ කියලා. මම මතක් කරන්නේ ඔබතුමා ඊට පස්සේ ඇවිල්ලා වෙනත් උත්තර දෙන්න එපා කියන එකයි. අපි අගය කරනවා. මේ ජීවන වියදම සම්බන්ධයෙන් කථා කරද්දී අනිවාර්යයෙන්ම සියලු දෙනාටම ඒ සහනය ලබා දෙන්න ඕනෑ. සිංහල-හින්දු අලුත් අවුරුද්ද සමරන්නේ "අස්වැසුම" ප්‍රතිලාභය ලබන උදවිය විතරක් නොවෙයි නේ. අපේ කොළඹ දිස්ත්‍රික්කය ඇතුළු අනෙකුත් ප්‍රදේශවල ඉන්න උදවියටත් යම්කිසි සහනයක් ලබා දෙන්න. ඔබතුමා කරුණාකරලා මේ සම්බන්ධයෙන් උත්තර ලබා දෙන්න කියලා මම ඉතාම ඕනෑකමින් කියනවා.

දැන් ඔබතුමා සහල් ආනයනය කරනවා. 2025 දෙසැම්බර් 18වැනි දා ඔබතුමාම කිව්වා මට මතකයි, හාල් ඇටයක්වත් ගෙන්වන්නේ නැහැ, මෙන්න මේක record කරලා තියා ගන්න කියලා. ඒක record කරලා තිබුණා. ඒකට කමක් නැහැ. ඊට පස්සේ මොකක්ද වෙන්නේ කියන එක නොවෙයි,- *[බාධා කිරීමක්]* ඔහොම ඉන්න, ඔහොම ඉන්න, ගරු ඇමතිතුමා. ඒක නොවෙයි. දැන් ඔබතුමා කිරි සම්බා ආනයනය කරනවා. මාර්තු මාසයේ 28වැනි දා කිරි සම්බා ආනයනය කරන්න යනකොට, ඒ සහල් සුමාන දෙකකින් අපේ රටට එන්න බැහැ නේ, ගරු ඇමතිතුමා. මේ සම්බන්ධයෙන් මීට කලින් ඒ අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. ආනයනය කරන්න එපා කියලා අපි කියන්නේ නැහැ. අපි කියන්නේ, දේශගුණික තත්ත්වය, මැදපෙරදිග තත්ත්වය ඇතුළු සියලු කාරණා එක්ක මෙවැනි තත්ත්වයක් අනිවාර්යයෙන්ම ඇති වෙන්න පුළුවන් කියන එකයි. - *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, ඔබතුමා ටිකක් අහගෙන ඉන්නකෝ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වාගේම එදා පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලාගේ විපක්ෂ මන්ත්‍රී කෙනෙක් කිව්වා, ඔක්තෝබර් මාසයේත් සහල් එන්නේ නැහැ කියලා. අපේ රටේ ආනයනකරුවා ආනයනය කරන්නේ දෙවැනි දා. දෙවැනි දා තමයි ගැසට් එක එළියට දාන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

එතැන point of Order එකක් නැහැ, ගරු ඇමතිතුමා. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒකට කමක් නැහැ. මම වැරදි කියන්නේ නැහැ. මම කියන්නේ මේකයි. මීට පෙර හිටපු වෙළෙඳ ඇමතිවරුන්ටත්, මීට පෙර හිටපු මුදල් ඇමතිවරුන්ටත් මේ වාගේම ප්‍රශ්න තිබුණා. හැබැයි, ඒ කාලයේ කරපු දේවල් දැන් වැරැදියි කියන්න එපා.

[ගරු රවි කරුණානායක මහතා]

එච්චරයි මට කියන්න ඕනෑ වන්නේ. මොකද, ඒ කාලයේත් මේ වාගේම යුද්ධ තිබුණා. *[බාධා කිරීමක්]* දැන් තිබෙන ඒවා ගැනත් මම දන්නවා. අපි ඒවා ගැනත් කථා කරමු. ඒක හොඳයි. ඒ කාලයේ යුක්රේනයට එරෙහිව යුද්ධයක් තිබුණා. ඒ කාලයේ ඉරානයට එරෙහිව යුද්ධයක් තිබුණා. ඒ කාලයේ ඉරාකයට එරෙහිවත් යුද්ධයක් තිබුණා. දැන් මැද පෙරදිග යුද්ධයක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ඒක තමයි. ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්න අපටත් තිබුණා. අපේ කාලයේ පැවැති එවැනි අර්බුද නිසා ප්‍රශ්න ඇති වුණාම ඒවා දේශපාලනඥයන් නිසා ඇති වෙච්ච ප්‍රශ්න බව කිව්වා, "මුන් හොරු ටිකක්" කිව්වා. දැන් ඔබතුමන්ලාට රජයේ නිලධාරින් හොරු වෙනවා. ඒ කාරණය සම්බන්ධයෙන් අප අනිවාර්යයෙන්ම ඒ නිවැරැදි කිරීම කරන්න අවශ්‍යයි. මේ තුළින් අපි යන්න ඕනෑ කොහේටද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුවේ system change එක ගැන නේ මම ඇවිල්ලා මේ කථා කරමින් ඉන්නේ. මම මේක සතුටින් කියන්නේ. මේ ආණ්ඩුව කරන දේවල් දිහා බලාගෙන ඉන්න ගමන් මම මේ මෑතකදී සංසන්දනය කිරීමක් කළා, අවුරුදු 76කට පසුව system change එකක් වෙච්ච මේ අවුරුදු එකහමාර තුළ මොනවාද වෙලා තිබෙන්නේ කියලා. එදා බැන්නා, "බාල බෙහෙත් ගේනවා" කියලා. අදත් ඒකම වෙනවා කියලා ආණ්ඩුවම කියනවා. එදා කිව්වා, "ඇමතිවරු සැප වාහනවල යනවා" කියලා. අදත් ඒකම වෙනවා; දැන් මේ අය V8වල යනවා. බොහොම හොඳයි. මොකද, අලුතින් අරගෙන නැහැ නේ. තිබිච්ච ඒවාම පාවිච්චි කරනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් ආවාම මන්ත්‍රීවරුන්ට වාහන දෙන්නේ නැහැ කියලා එදා කිව්වා. හැබැයි, කැබ් 1,700ක් එනවා කියලා දැන් කියාගෙන යනවා. "බාල ගල් අඟුරු ගෙනාවා" කියලා එදා බැන්නා. තවමත් එහෙමම වෙනවා කියලා දැන් කියනවා. දැන් තමන් ගෙනාපු ඒවාත් හොඳ තත්ත්වයේ ඒවා නොවෙයි කියලා පිළිගන්නවා, පාර්ලිමේන්තුව ඇතුළේ.

එදා පොලීසිය මිනීමරුවෝ අල්ලලා කරපු දේවල් ගැනත් ඔබතුමන්ලා කිව්වා. දැන් නේපාලයේ ඉඳලා අල්ලාගෙන ආපු සෙව්වන්දිට කේක් කවනවා, පොලීසිය ඇතුළේ. ඒ කාලයේ ප්‍රශ්නයක් වුණාම දේශපාලනඥයන්ට බණිනවා; දැන් රජයේ නිලධාරියාට බණිනවා. එදා QR code එක ගෙනාවාම, "මේක මොන විහිළුවක්ද?" කියලා ඇහුවා. නමුත් QR code ක්‍රමයෙන් තමයි මේ වතාවේ බේරුණේ. එදා පැවැති ආණ්ඩු හාල් ආනයනය කළා කිව්වා. "අපි හාල් ආනයනය කරන්නේ නැහැ" කියලා දෙසැම්බර් 18වෙනි දාත් කිව්වා. දැන් හාල් ආනයනය කරනවා. මේ ආණ්ඩුව ආවාට පස්සේ කන්න හතරක් ආවා. දැනට පස්වතාවක් හාල් ආනයනය කරලා තිබෙනවා. දැන් මුදලාලිලා අවශ්‍යද, වෙළඳාමක් කරන්න? ඒ වාගේම තමයි, එදා පළාත් සභා මැතිවරණය තිබ්බේ නැහැ කියලා ලොකු සද්දයක් කළා. නමුත්, දැනුත් - තවමත් - පළාත් සභා ඡන්දය නැහැ නේද? ඉතින්, මොකක්ද මේ වෙමින් තිබෙන්නේ? දැන් ඔබතුමන්ලාටත් පෙනෙනවා, ආණ්ඩුවක් කරගෙන යනකොට තිබෙන අපහසුව. මොකද, හැම දේකම ප්‍රශ්න තිබෙනවා. ඒ හැම දේටම "හොරු, හොරු" කිව්වාට වැඩක් නැහැ. මොකද, ප්‍රායෝගික ප්‍රශ්න ඇති වෙනවා.

මම මතක් කර දෙන්න හදන්නේ මේකයි. දැන් ඔබතුමන්ලා එකක් නම් කරනවා, හොඳට. අපට පාලනය කරන්න බැරි වුණු CEB එකේ වෘත්තීය සමිතිය, GMOA එක ඔබතුමන්ලා අද ලස්සනට පාලනය කරනවා. අද CEB එකේ වෘත්තීය සමිතිය කුඩුපට්ටම් කරලා. ඒ වාගේම, GMOA එකටත් ඒකම කරගෙන යනවා කියලා මට පෙනෙනවා. ඒකත් ඉක්මනට කරන්නකෝ.

ළඟදී අපොස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල ආවා. එම විභාගයට සිසුන් 281,000ක් ඉඳගත්තා. ඒ අයගෙන් 176,000ක් සමත් වුණා, විශ්වවිද්‍යාලයට යන්න. හැබැයි, රජයේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉඩ කඩ තිබෙන්නේ සිසුන් 56,000කටයි. සිසුන් 56,000කට විතරක් ඉඩ කඩ තිබෙනවා කියන්නේ සිසුන් 120,000කට ඌනතාවක් තිබෙනවා කියන එකයි. මානව අයිතිවාසිකම් අනුව කවුරු හරි උසාවි ගියොත්, "අපි මේ විභාගය සමත් වෙලා තිබෙනවා; නමුත් විශ්වවිද්‍යාලයට යන්න බැහැ" කියලා, ප්‍රශ්නයක් ඇති වෙනවා නේ. මේ system change එකේදී අපව අනුගමනය කරන ඔබතුමන්ලාට බැරි ඇයි, පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කරන්න? UNP එකේ ජේ.ආර්. ජයවර්ධනලා, ඩී.එස්. සේනානායකලා ඇතුළු අපි ඔක්කෝම කරපු ඒවා හොඳයි කියලා ඔබතුමන්ලා දැන් ඒවා ඒ ආකාරයෙන්ම පිළිගෙන තිබෙනවා; ඒවායෙන් සියයට 99ක් පිළිගෙන තිබෙනවා.

එදා ජේ.ආර්. ජයවර්ධන ඇති කරපු NCMC එක යටතේ කරුණාකරලා දොස්තරවරු 5,000ක් අවුරුද්දකට බිහි කර ගන්න. මොකද, අපි බිලියන 35ක්, ඒ කියන්නේ කෝටි 3,500ක් වැය කරනවා. ඊයේ ජනාධිපති ඇවිල්ලා කිව්වා කෝටි 3,000ක සහනාධාරයක් දෙනවා කියලා, මාස තුනකට. මම අර කියපු දේ කළා නම් අවුරුද්දකට කෝටි 3,500ක ආදායමක් සොයා ගන්න අපට පුළුවන්. මම මේ කියපු විධියට පෞද්ගලික විශ්වවිද්‍යාල ඇති කළොත්, අපේ විදේශ විනිමය ආරක්ෂා වෙනවා. ඒ වාගේම රැකී රක්ෂා ඇති කරන්න පුළුවන් වෙනවා; කම්කරුවන් පිටරට යවන්නේ නැතුව අපේ දොස්තරලා පිටරට යවන්න අපට පුළුවන් වෙනවා. ඒ සඳහා පෞද්ගලික විශ්වවිද්‍යාල ඇති කරන්න පුළුවන් නේද? ඉතින්, මේ system change එක තුළ කරුණාකරලා ඒවා කරන්න. ඔබතුමන්ලා කරනවා කියලා කියන්න එපා. කරුණාකරලා අපි කියන නිසා කරන්න. ඒක තමයි මා හිතන විධියට කළ යුතු හරි දේ. ඉතින් කරුණාකරලා පෞද්ගලික විශ්වවිද්‍යාල ඇති කරන්න. මොකද, මා හිතන විධියට ඒකෙන් තමයි අර කියපු ඌනතාව නැති කරලා ඉදිරියට කටයුතු කරගෙන යන්න පුළුවන් වන්නේ.

ඊළඟට මම මේ කාරණයත් මතක් කරන්න අවශ්‍යයි. මම ඔබතුමන්ලාට හැම අවස්ථාවේදීම මතක් කරනවා, මහ බැංකුවේ කටයුතු සම්බන්ධයෙන්, මේ ඇති කරලා තිබෙන credit creation සම්බන්ධයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිය අවුරුද්දේ මිලියන 2,600ක් credit creation තිබුණා කියලා දැනුවත් කරලා තිබෙනවා. ඒකෙන් සියයට 63ක් බැංකු ක්ෂේත්‍රයේ; සියයට 22ක් බැංකු නොවන ක්ෂේත්‍රයේ. ඒ කියන්නේ, non-banking financial institutions. ඒකෙන් පුදුමාකාර දෙයක් වෙනවා. අපි යම් ප්‍රමාණයක් මුදල් සංසරණයට එකතු කරන කොට ඒකෙන් ලීසිංවලට බිලියන 2,000ක්, ඒ කියන්නේ ට්‍රිලියන 2ක් යනවා. ඒ වාගේම අපේ උකස් කිරීම්වලට, බිලියන 356ක්; credit cardsවලට බිලියන 240ක්. මේ ඔක්කෝම එකතු කළාම අපේ සමස්ත මුදල් සංසරණය තුළ අපට ඉදිරි අනාගතයේ ප්‍රතිලාභ එන ආයෝජන බිහි කරන දේවල් නොවෙයි ඇති කරලා තිබෙන්නේ. එදිනෙදා ජීවිතය ගත කරන්න අවශ්‍ය ණයක් ඇති කිරීමයි මේ කරලා තිබෙන්නේ. බිලියන 434ක තමයි අපි දීර්ඝ කාලීන ණය ඇති කරන්නේ. අපි මේක වෙනස් කරන්න ඕනෑ නේද? මොකද, හෙට ආදායමක් උපයන්න පුළුවන් වන්නේ අද ආයෝජනයක් කළොත් විතරයි. ආයෝජනයක් නොකළොත් ආදායම් ඉපයීමක් වෙන්නේ නැහැ නේ. අපට පෙනෙන විධියට, මේ බිලියන 434 යොදවා තිබෙන්නේ ඉදිරි අනාගතයේ ගෙවල් හදන්නයි, projects කරන්නයි. ඒ ඔක්කෝම යොදවා තිබෙන්නේ එවැනි දේවල් සඳහායි. මෙහි වෙනසක් ඇති කරන්න ඕනෑ.

දැන් බලන්න, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මේ රටට ඇවිල්ලා අවධාරණය කරලා ඔබතුමන්ලා සියලුදෙනාටම කියනවා, කරුණාකර ආදායම වැඩි කර ගන්න කියලා. ඒගොල්ලන්ගේ ලංකාවේ ශාඛාව විධියට පාවිච්චි කරන්නේ මොකක්ද? මහ බැංකුව කියනවා, "කරුණාකරලා පොලී අනුපාතය වැඩි කරන්න" වාගේ කාරණා. කවුද දෙයියනේ, මේ රටේ ආර්ථික වර්ධන වේගය ගැන කථා කරන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ රටේ ආයෝජනය කරන්න අවශ්‍යයි. මේ රටේ රැකී රක්ෂා ඇති කරන්න අවශ්‍යයි. සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් වැඩි පිරිසක් බිහි කරන්න අවශ්‍යයි. ඉතින් මේවා සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරලා අපේ රටේ වර්ධන වේගයක් ඇති කරන්න කටයුතු කළේ නැත්නම්, ඉතාම භයානකකාරී තත්ත්වයක් තමයි ඇති වන්නේ. මම ඉතාම ඕනෑකමින් කියන්නේ, කරුණාකරලා නියමිත ආර්ථික වර්ධන වේගය ඇති කිරීමේ වගකීම ආණ්ඩුව අතට ගන්න කියලායි. මොකද, නැත්නම් වෙන්නේ Public Financial Management Act එක අනුව ඉදිරියට ගමන් කරන්න අපට කිසිසේත්ම බැරි වෙන එකයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිත පිරිසක් ලංකාවට ආවා. ඒ අය ආපු අවස්ථාවේදී අපි ඇහුවා, ඔබතුමන්ලා මේ රටට, අපේ ජනතාවට තවත් බරක් දාන්න යනවාද කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි. කථාව අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තව මිනිත්තුවක් ගන්නවා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත් උදවු කරයි මට ඒ කාලය ලබා දෙන්න.

ඉල්ලුම අනුව සැපයුමේ ප්‍රශ්නයක් ඇති වෙලා උද්ධමනයක් ඇති වුණොත්, එය පාලනය කරන්න කටයුතු කරනවාය කිව්වා. හැබැයි, අපට ආනයනය කිරීමට අදාළ cost-push inflation එකක් ආවොත්, ඒ කියන්නේ ආනයන වියදමක් ආවොත්, එතකොට මොකද වෙන්නේ? එහෙම නම් ඉල්ලුම අනුව නොවෙයි මේ වැඩි වීම වෙලා තිබෙන්නේ. එතකොට, ඒ සම්බන්ධයෙන් උත්තරයක් දෙන්නේ කොහොමද කියලා ඇහුවාම, ඒකට උත්තරයක් දුන්නේ නැහැ. අපේ රජයේ සේවකයන්ට තිබෙන ප්‍රශ්න නිවැරැදි කරන්න කටයුතු කිරීම ගැන ඇහුවාම ඒගොල්ලෝ කියනවා, ලංකාවේ රජයේ සේවකයන් වැඩියි කියලා. හැබැයි එහෙම කියද්දී, මේ ආණ්ඩුව අනිවාර්යයෙන් රාජ්‍ය සේවකයන් තවත් වැඩි කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්. ඔය වැඩිපුර ගන්නා කාලය විපක්ෂයේ කාලයෙන් අඩු වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි කියනවා, මේ රට ඉදිරියට ගෙන යන්න අවශ්‍ය ස්ථිර වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියලා. රජයට බිස්නස් කරන්න බැහැ. දැන් බලන්න, ඇමතිවරුන්ගේ බංගලා 25ක් අවුරුදු එකහමාරක් තිස්සේ වසා දමලායි තිබෙන්නේ. මෙසේ කිරීමෙන් කිසිසේත්ම වටිනාකමක් ඇති වන්නේ නැහැ. අපේ කථානායකතුමාගේ නිල නිවසත් - එය, මගේ අසල්වැසි ගෙදර - වසා දමලායි තිබෙන්නේ. ඊට පස්සේ ගිහිල්ලා පිටතින් ගන්නවා. ඒක අපරාධයක් නේද? ඉතින් මේ system change එකද? අර අනුගමනය කරන මාර්ගය වැරැදි නැහැ. කරුණාකරලා රටේ ආර්ථිකයට ඔරොත්තු දෙන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් ගෙන යන්න.

NDB එක ගැනත් මම කියන්න ඕනෑ. ඒ අය ඊයේ දැනුවත් කළේ මොකක් ගැනද? 2023 වර්ෂයේ තමන්ගේ ගිණුම්වල මිලියන 3,100ක් තිබුණා, 2024දී ඒක මිලියන 12,100කට වැඩි වුණා කියලා කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විනාඩි 2ක් වැඩිපුර අරගෙන තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 80 (2) යටතේ සඳහන් විධියට ඒ සඳහා ගන්නා සල්ලි ටික නිවැරැදි මාර්ගයේ ගිහිල්ලා තිබුණා කියලා Central Bank එකේ Bank Supervision Department එකට පෙන්වන්න බැරි වුණේ ඇයි? මේවා රටින් පිට ගිහිල්ලා තිබෙනවා. අපේ අහිංසක මනුස්සයෙක් රටෙන් පිටට රුපියල් 100ක් යවන්න හැදුවොත් පිටු 4කින්, 5කින් අහනවා, මොනවාද කළේ කියලා. හැබැයි, මේගොල්ලන් බිලියන 12,800ක් රටෙන් පිටට යවලා තිබෙනවා. මේ ගැන කාගෙන්ද අහලා තිබුණේ? මහ බැංකුවෙන්ද අහලා තිබුණේ? මෙන්න මේ වාගේ වෙනකොට NDB එකේ internal control එක, internal audit එක, rotational principle එක කොයි ආකාරයෙන්ද තිබෙන්නේ? අහිංසක මනුස්සයෙක් ගිහිල්ලා රුපියල් ලක්ෂ 10ක් අරගෙන CRIB එකට ගියොත් ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. මම ඉතාම ඕනෑකමින් කියන්නේ ඒ සම්බන්ධයෙන් අපි වෙනසක් ඇති කරන්න ඕනෑ බවයි. නමුත්, ඒ වෙනස රටට ඔරොත්තු දෙන්න පුළුවන් වන විධියට කරන්න ඕනෑ කියමින් මම මේ අවස්ථාවේ නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා.

[අ.භා. 12.15]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දවසේ ආණ්ඩු පක්ෂය විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳ විවාදයේදී විශේෂයෙන්ම මැද පෙරදිග ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වය සහ ඒක ලංකාවට බලපා තිබෙන විධිය ගැන අපි සාකච්ඡා කරනවා. එහි බලපෑම, එම අර්බුදය ආර්ථික වශයෙන් සහ සමාජයීය වශයෙන් බලශක්තිය ඇතුළු විවිධ ක්ෂේත්‍රවලින් අපට දැනෙමින් තිබෙනවා. ඒකට ආණ්ඩුව මුහුණ දෙන විධිය සහ රජය විධියට මුහුණ දෙන විධිය සම්බන්ධයෙන් තමයි අද අපි කථා කරන්නේ.

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

මැද පෙරදිග පවත්නා මේ යුද්ධයට මාසයක් ඉක්මවන කොට ඊයේ දවසේ ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ උත්සව සමය ඉලක්ක කරලා ජනතාවගේ පැත්තෙන් හිතලා ලබා දෙන සහන පැකේජයක් ඉදිරිපත් කළා. අපේ රටේ බොහෝ ජනතාව - බොහෝ දිළිඳු ජන කොටස් - ආවරණය වන ආකාරයට, ඔවුන්ට මේකෙන් ඔළුව උස්සාගන්න උදවුවක් වන විශාල සහන පැකේජයක් - රුපියල් කෝටි 10,000ක පමණ සහන පැකේජයක් - එතුමා ඉදිරිපත් කළා.

මැද පෙරදිග යුද්ධය ගත්තොත්, අපි දන්නවා, පෙබරවාරි 28වන දා ඉරානයට පහර දීමෙන් අනතුරුව දවස් 40කට ආසන්න කාලයක් මේ යුද්ධය ඇදී ඇදී ගිය බව. විශාල වශයෙන් තෙල් මිල ඉහළ යෑම්, තෙල් සැපයුම් මාර්ග අවහිර වීම් ආදි සියල්ලත් එක්ක තමයි පසුගිය මාසයේ මේ අර්බුදය අප ඉදිරියට එන්නේ. අද උදෑසන වෙද්දී පාකිස්තානයේ මැදිහත්වීමෙන් සති දෙකක සටන් විරාමයකට යෑමේ ලකුණු පහළ වෙලා තිබෙනවා. අපි ආණ්ඩුවක් විධියට ඒකේ ඉතා හොඳ අවසානයක් අපේක්ෂා කරනවා. මොකද, මේක මුළු ලෝකයටම බලපාන ප්‍රශ්නයක්. ඒ නිසා මේ යුද්ධය හැකි ඉක්මනින් අවසන් වීම තමයි පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරු ඇතුළු මේ රටේ සියලු ජනතාවගේ ප්‍රාර්ථනය. හොඳම දෙයක් වෙයි. ජනාධිපතිතුමා කිව්වා වාගේ නරකම දේට සූදානම් වන ගමන්, හොඳම දෙයක්, යහපත් දෙයක් වෙයි කියලා අපේක්ෂා කරමින් අපි මේ වැඩකටයුතු ඉස්සරහට අරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න ඕනෑ වුණේ මෙයයි. මීට කලින් කථා කළ ඇමතිවරු දෙදෙනාම ආර්ථික තත්ත්වය ගැන පැහැදිලි කළා. එවැනි තත්ත්වයක් තුළ මේ අර්බුදයට මුහුණ දීමට ඊයේ සඳහන් කළ කෝටි 10,000ක සහන පැකේජයත්, ඉන්ධන වෙනුවෙන් ඉදිරි මාස 3 සඳහා තවත් රුපියල් බිලියන 60ක් - ආණ්ඩුව, භාණ්ඩාගාරය දරා ගන්නා කොටස - වෙන් කරන්නත් පුළුවන් වුණේ මේ ආණ්ඩුව පත්වෙලා ගත වෙච්ච වසර එකහමාරක කාලයක් තුළ මේ රටේ ආර්ථිකය, මේ රටේ මුදල් සංචිත, මේ රටේ ආදායම් ඉපයීම, මේ රටේ රාජ්‍ය වියදම් කළමනාකරණය වාගේ සියලු දේවල් යහපත් ආකාරයට කරපු නිසායි. අන්න ඒකයි මෙතැන තිබෙන ප්‍රධානම දේ. එහෙම නැතුව මේක පසුගිය කාලයේ වාගේ සල්ලි අච්චු ගහලා රුපියල් 5,000 කොළ ගෙවල් ගාණේ බෙදනවා වාගේ දෙයක් නොවෙයි. මේ තිබෙන්නේ, පසුගිය අවුරුදු එකහමාරක කාලය තුළ මේ ආණ්ඩුවේ යහපත් ආර්ථික කළමනාකරණයේ, ආදායම් ඉපයීමේ, භාණ්ඩාගාරය ශක්තිමත් කිරීමේ ප්‍රතිඵලයි. එහෙම නැතුව සල්ලි අච්චු ගහලා බෙදලා මේ අර්බුදය තවත් ඉස්සරහට ගෙනයන්න කටයුතු කරනවා නොවෙයි. ඒක තමයි පළමුවෙන්ම තේරුම් ගන්න ඕනෑ කාරණය. අපි ආර්ථිකයක් යහපත් කියලා කියන්නේ, ඒ ආර්ථිකයට අභ්‍යන්තර කම්පන - internal shocks - සහ බාහිර කම්පන - external shocks - දරාගන්න පුළුවන් වීම මතයි. ඒක කොයිතරම් දුරට දරාගන්න පුළුවන්ද කියන එක මත තමයි රටක ආර්ථිකයක් කොයිතරම් ශක්තිමත් ද කියලා අපි තීරණය කරන්නේ. ලංකාව 2024දී "රෝලෙන්" ගිය රටක් නේ. 2022දී බංකොලොත්භාවය ප්‍රකාශ කරලා, IMF Programme එකට ඇතුළු වුණා. 2024 වෙද්දිත්, අපි ආණ්ඩුව ලබා ගනිද්දිත් "රෝල" තමයි ගියේ. එහෙම රටක් අවුරුදු එකහමාරක් ඇතුළත අපට ගේන්න පුළුවන් වෙච්ච තැනක් තිබෙනවා. ඩොලර් බිලියන 7.3ක සංචිතයක් මේ අවුරුද්ද අවසානයේ සලකුණු කළේ, ඩොලර් බිලියන 2.2ක වාහන ගෙන්වලා, ඩොලර් බිලියන තුනකට වඩා විදෙස් ණය පොලී ගෙවීම් කරලා බව මතක තබාගන්න. එවැනි තත්ත්වයක් තුළ සංචිත ප්‍රමාණය වැඩි කරගන්න අපට පුළුවන් වුණා.

පසුගිය අය වැයේදී, 'දිට්වා" සුළි කුණාටුව ඇතිවෙන්න ඔන්න මෙන්න තිබියදී විපක්ෂය දිගටම ප්‍රශ්න කළා, භාණ්ඩාගාරයේ රුපියල් ට්‍රිලියනයක් තියාගෙන ඉන්නේ ඇයි, ඒවා ජනතාවට දෙන්නේ නැද්ද, සල්ලි ගොඩ ගසාගෙන ඉන්නේ ඇයි කියලා. අපට එක පැත්තකින් රුපියල් සංචිතය ශක්තිමත් කරගන්න පුළුවන් වුණා, අනෙක් පැත්තෙන් ඩොලර් සංචිතය ශක්තිමත් කර ගන්න පුළුවන් වුණා. පසුගිය අවුරුද්දේ නොවැම්බර් මාසය අන්තිමේ ආපු "දිට්වා" ආපදාව නිසා සිදු වූ හානිය - ලංකා ඉතිහාසයේ වැඩිම දේපොළ හානියක් කරපු ස්වාභාවික ආපදාව - ලෝක බැංකු ඇස්තමේන්තුව අනුව ඩොලර් බිලියන 4.1ක්. ඒකට මුහුණ දෙන්නත්, ඉතිහාසයේ විශාලම සහන පැකේජයක් ජනතාවට ලබා දෙන්නත්, එතැනින් මාස 2ක් ගියාට පස්සේ මේ external shock එක යටතේ, මේ ලෝක යුද තත්ත්වය හමුවේ ඉන්ධන මිල ඉහළ යෑම, සැපයුම් අවහිර වීම ඇතුළු බාධාවලට මුහුණ දෙන්න අපට හැකිවෙලා තිබෙන්නේ අපේ සංචිත ශක්තිමත් කර ගැනීමේ ප්‍රතිඵලයක් විධියට. ඒක හරියට තේරුම් ගන්න ඕනෑ. මේ, එන එන ප්‍රශ්නයට ප්ලාස්ටර් ගහනවා නොවෙයි.

පසුගිය අවුරුදු එකහමාර තුළ විධිමත් සැලසුමක් ඇතුව අපි ලංකාවේ ආර්ථිකය වර්ධනය කළා; ඉතිහාසයේ හොඳම දත්ත වාර්තා කළා. අය වැය හිඟය සියයට 2.4 දක්වා පහළ දැම්මා. ඒක, 1956න් පස්සේ වැඩිම අගය. ඒ වාගේම ජංගම ගිණුමේ අතිරික්තය ඩොලර් බිලියන 1.8කට ගෙනාවා. මුළු ඉතිහාසයේම එවැනි අවස්ථා 4යි තිබෙන්නේ. මේක තමයි වැඩිම අගය. ඒ වාගේම රජයේ බදු ආදායම සියයට 17.5ක් දක්වා වැඩි කළා. ඒක 1996න් පස්සේ වැඩිම අගය. ඒ වාගේම උද්ධමනය පාලනය කළා. බැංකු පොලී අනුපාතය අඩු අගයකින් ස්ථාවර කළා. මේ සියල්ලම කරන ගමන් තමයි අපි මේ අර්බුදවලට මුහුණ දෙන්නේ. මේ ආණ්ඩුවේ මුදල් කළමනාකරණය කරපු ඇමතිවරුන්ට, මහ බැංකුව ඇතුළු අනෙකුත් ආයතනවල නිලධාරීන්ට ඒ සඳහා ගෞරවය සහ ස්තුතිය හිමිවිය යුතුයි.

මේක ලෝක අර්බුදයක්. යුද්ධය ඇති වෙද්දී ඩොලර් 64කට, 70කට තිබුණු බොර තෙල් බැරලයක මිල ඩොලර් 110 දක්වා - ආසන්න වශයෙන් දෙගුණයකට - පසුගිය කාලය තුළ වැඩි වුණා. මේ තත්ත්වය තුළ මේ මට්ටමින් මේ අර්බුදය කළමනාකරණය කර තිබීම, මේ රටේ බලශක්ති සැපයුම ස්ථාවර කර තිබීම, ඒවා ජනතාවට ලබා ගන්න පුළුවන් තත්ත්වයට ගෙනැල්ලා තිබීම තමයි මෙහි වැදගත්ම දේ. ඒක මේ ආණ්ඩුව කරලා තිබෙනවා. මේක ලේසි වැඩක් නොවෙයි. මේක, විපක්ෂ නායකතුමා සබ්මරීන් වර්ග සොයනවා වාගේ, ටෝපිඩෝ වර්ග සොයනවා වාගේ සරල වැඩක් නොවෙයි. මේක ඊට වඩා ගොඩක් වෙහෙස වෙලා, සැලසුම් සහගතව කරන්න ඕනෑ වැඩක්.

මම කථා කරන්න කලින් සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ඉතා ආවේගයෙන්, ලේ රත්වෙන කථාවක් කළා නේ. 2015දී සියයට 5ක ආර්ථික වර්ධන වේගයක් එක්ක ආණ්ඩුවක් භාරගෙන, අවුරුදු 4කට පසුව ඒක සෘණ අගයකට ගෙනියපු මිනිස්සු මේ වෙලාවේ ආණ්ඩුවක් කළා නම් කොහොම තියෙයිද? හොම්බෙන් යන්න වෙන්නේ. එහෙම නම්, තෙල් මිල, තෙල් සැපයුම් ගැන නොවෙයි අද කථා කරන්න වෙන්නේ. එහෙම වුණා නම් ඒක කළමනාකරණය කරගන්න බැරි වෙලා මේ රටේ සිවිල් කලකෝලාහල ඇතිවෙන තත්ත්වයකට පත් වෙනවා. ඒගොල්ලන් ඉතිහාසයේදී පෙන්වා තිබෙනවා තමන්ගේ හැකියාව තොතැනද තිබෙන්නේ කියලා. ඒ නිසා මේ වෙලාවේ විහිළු කරන්නේ නැතිව මේ serious තත්ත්වයට අපි serious විධියට මුහුණ දෙන්න ඕනෑ. එතුමා ගොඩක් දේවල් කියපු හින්දා මම ටිකක් අවධානය යොමු කරනවා, එතුමාගේ කථාවට.

එතුමා Corruption Perceptions Index එකක් ගැන කිව්වා. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා අපට දත්ත වගයක් පෙන්වමින් කිව්වා, Corruption Perceptions Index එක අනුව ලංකාව 107වැනි තැනට ඇවිල්ලා තිබෙනවා කියලා. දූෂණය - corruption - නැති කරනවා කියලා ආණ්ඩුවක් අරගෙන අද 107වැනි තැනට ඇවිල්ලා තිබෙනවා කිව්වා. හැබැයි එතුමා කිව්වේ නැහැ කීයේ ඉඳන්ද 107ට ආවේ කියලා. 2025දී හිටියේ 107වැනි තැන. 2024දී කී වැනි තැන ද හිටියේ? ඒක කිව්වේ නැහැ. 2024දී අපි හිටියේ 121වන තැන. මේ ආණ්ඩුව පත් වෙලා අවුරුද්දක් ඇතුළත ඒක ස්ථාන 14කින් ඉහළට අරගෙන තිබෙනවා; හොඳ තත්ත්වයට අරගෙන තිබෙනවා. එතුමා ඉලක්කම්වලින් වංගු ගහනවා නේ තවම. ඕනෑම දරුවෙකුට මේ තොරතුර ෆෝන් එකෙන් හොයාගන්න පුළුවන් කියලා දැනගෙනත් තවම ඉලක්කම්වලින් වංගු ගහන්න, බොරු කියන්න ලැස්ති වෙනවා. හැබැයි, Corruption Perceptions Index ගැන එතුමන්ලාට තිබෙනවා, වාර්තාවක්. අපි ඒක අඩු කළා තමයි. එතුමන්ලාට තිබෙනවා, Corruption Perceptions Index ගැන හොඳ වාර්තාවක්. ඒ කියන්නේ, 2015 ජනවාරි 08වන දා ඡන්දයෙන් දිනලා මාස 2ක් ගියේ නැහැ, පෙබරවාරි 27වන දා මහ බැංකු බැඳුම්කර වංචාව කරලා රජයට රුපියල් මිලියන දසදහස් ගණනක් පාඩු කළා. ඒ, සෘජු පාඩු. ඊට පස්සේ පොලී අනුපාත වැඩි වුණා. අධික පොලියට ණය ගන්න වුණා. මේ රට 2022දී බංකොලොත් වෙන තත්ත්වයටත් ලොකු භූමිකාවක් කළා. ඒ ඔක්කොම කරලා ඒගොල්ලන්ගේ Corruption Perceptions Index වාර්තාවකුත් තිබෙනවා. 2015දී යහ පාලන ආණ්ඩුව ගන්නකොට 95ට තිබ්බ Corruption Perceptions Index එක අවුරුදු 3කින් මහ බැංකු බැඳුම්කර වංචාව ඇතුළු දූෂණ ක්‍රියා හින්දා 115ට ඉහළ යනවා. දැන් ඇවිල්ලා මේ ආණ්ඩුවේ Corruption Perceptions Index එක ගැන බොරු කියනවා. ලජ්ජා වෙන්න ඕනෑ. දූෂණ, වංචා කළා විතරක් නොවෙයි. බැඳුම්කර වංචාව කළා; ඒකට ෆුට්නෝට් දැම්මා; පොතකුත් ලිව්වා. මොකක්ද පොතේ නම? "මහ බැංකු බැඳුම්කර වංචාව ඇත්ත නැත්ත" වාගේ මොකක් හරි පොතක් ලිව්වා. ඒ පොත ගැන මම හොයලා බැලුවා. කලිනුත් හොයලා බැලුවා. ඒ පොත හොයා ගන්න නැහැ. පාර්ලිමේන්තු Library එකේවත් නැහැ. පුළුවන් නම් අපට ඒ පොතක් දෙන්න. ඒ ලියපු පොතුත් දැන් අතුරුදහන්. මහ බැංකු බැඳුම්කර වංචාවක් වුණේ නැහැ, ඔය කියන තරම් එකක් වුණේ නැහැ, ඒ බොරු ඉලක්කම් කියලා තමයි ඒ පොත් ලිව්වේ. හැබැයි, මෙතැනට ඇවිල්ලා corruption ගැන කථා කරනවා, සුජීව සේනසිංහ. ඒ විහිළු සපයන්න හොඳ නැහැ. හොර සහ බොරු දෙකම තිබෙනවා.

ඊට පස්සේ ආපදා කළමනාකරණය ගැන කියනවා, හරියට කළේ නැහැ, අරක දුන්නේ නැහැ, මේක දුන්නේ නැහැ කියලා. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කොහොමද ආපදා කළමනාකරණය ගැන කථා කරන්නේ? ආපදා කළමනාකරණය කියන්නේ, ඔරුවේ ගිහිල්ලා කෙහෙල් ගෙඩිය ගෙඩිය බෙදන එක නම්, ඒක කරන්න ලේසියි. ලංකාවේ ලොකුම ආපදාව ඇවිල්ලා, ඒකට ලොකුම සහන පැකේජය දීලා රටේ ආර්ථිකය වැටෙන්න දෙන්නේ නැතුව මාසයක් ඇතුළත ඉදිරියට අරගෙන ගියා. එහෙම කරපු ආණ්ඩුවක් මේක. කෙහෙල් ගෙඩිය, ගෙඩිය බෙදපු මිනිස්සු ආපදා කළමනාකරණය ගැන කියලා දෙනවා, අපට.

2014දී තමයි මීරියබැද්ද නාය යෑම වුණේ. අවුරුදු 4ක් ගියා යහ පාලන ආණ්ඩුවෙන් ගෙවල් 75ක් හදලා දෙන්න. ඉතිරි ගෙවල් 135 දැන් හදන්නේ. ඔන්න, ආපදා කළමනාකරණය කළ හැටි! දැන් පූර්ණ හානි නිවාස 15,000කට වඩා තිබෙන තත්ත්වයක් යටතේයි මේ ආණ්ඩුව මුදල් වෙන් කරලා ඒකට මුහුණ දෙන්නේ. දැන් අහනවා, මාස තුනෙන් ගේ හැදුවද කියලා. කට්න්ද දන්නේ නැහැ කථා කරන්නේ. මේ තත්ත්වයට අපි මුහුණ දෙනවා නම් නිරවුල්ව මුහුණ දෙන්න ඕනෑ. එහෙම නැතුව මේ වාගේ බයිලා ගහන, වංගු ගහන මිනිස්සුන්ගේ කථා අහන්න ගියොත් මේ වැඩේ කරන්න හම්බ වෙන්නේ නැහැ.

අවසාන වශයෙන් මට මේ කාරණයත් කියන්න ඕනෑ. "කාලා බලන්නේ නැහැ" කියලා ජනාධිපතිතුමා ඊයේ කියපු කථාවක් ගැන කිව්වා නේ. අර අසූචි පොහොර නැව ගැනත් කාලා බලලාද කිව්වේ කියලා ඇහුවා නේ. නැහැ, කාල බලලා නොවෙයි, labsවලින් ඒවා තමයි කියන්නේ. විද්‍යාගාර පරීක්ෂණවලින් තමයි ඒක හොඳ නැති එකක් කියලා කියන්නේ. ගල් අඟුරුත් එහෙමයි; පොහොර නැවත් එහෙමයි; ඖෂධත් එහෙමයි. 2021දී අසූචි නැව ගෙනෙනකොට ඒක quality නැහැ කියලා තහවුරු කළේ National Plant Quarantine Service - NPQS - එකේ lab එකෙන්. ඒ වාර්තා අනුව තමයි තීරණ ගත්තේ. ඒවා කවුරුවත් කාලා බැලුවේ නැහැ. ඒක තමයි රටක තීරණ ගන්න විධිය. ඒක තමයි ජනාධිපතිතුමා කිව්වේ. ඖෂධ බාලයි, ඖෂධවල quality එක අඩුයි කියලා තීරණය කරන්නේ NMRA එකෙන්. ඒ විද්‍යාගාරවලින්. දොස්තරලා හරි, හෙද හෙදියන් හරි, ඇමතිතුමා හරි ඖෂධ කාලා බලන්නේ නැහැ. ඒ නිසා මේ බාලාංශ පන්තියේ කථා තමයි කියන්නේ. කාලා බලන්නේ නැහැ තමයි. ලෝකය පිළිගත්ත විද්‍යාගාරවලින් හරියට පරීක්ෂා කර බලලායි තීරණ මේ ගන්නේ. "කාලා බලලා" කියන වචනයට හරි ආසා ඇති. ඔක්කොම කාලා බලලා, රස බලලා, පොත් ලියලා, ගිලලා, හොරකමුත් කරලා, හොරකම් ගැන පොතුත් ලියලා, ජරාවත් කාපු මිනිස්සු. ඒ නිසා විකාර කථා කියන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා. උපදෙස් දෙන්න; විපක්ෂයේ භූමිකාව කරන්න. හැබැයි රෙදි ඇඳගෙන කථා කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! දිවා ආහාර විවේකය සඳහා ගරු සභාවේ කටයුතු පස්වරු 1.00 දක්වා අත්හිටවනු ලැබේ.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. T.B. Sarath. You have 11 minutes.

[අ.භා. 1.00]

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ අපේ ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා වත්මන් දේශපාලන තත්ත්වය සහ ආර්ථික ප්‍රශ්න සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන සභාව කල් තැබීමේ යෝජනාවට අදාළව අද දවසේ සිද්ධ වන මෙම විවාදයේදී, විපක්ෂයෙන් කරුණු ඉදිරිපත් කළ බොහෝ අය ඔවුන්ගේ පාලන කාලය තුළදී මේ රට පාලනය කරපු විධිය පිළිබඳව අනවබෝධයෙන් සහ ඒවා සම්පූර්ණයෙන් අමතක කරලා වාගේයි කථා කළේ. අපි භාර ගත්තේ ආර්ථික වශයෙන්

[ගරු ටී.බී. සරත් මහතා]

විශාල බිඳ වැටීමකට ලක් වෙච්ච රාජ්‍යයක්. ඒ විතරක් නොවෙයි. දූෂණ, වංචා, අක්‍රමිකතාවලින් පිරුණු රටක්. ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විතරක් නොවෙයි, ලෝකය පුරා අපි වංචාවෙන්, දූෂණයෙන් පිරුණු රාජ්‍යයක් ලෙස හංවඩු ගැහුවා විතරක් නොවෙයි, එවැනි තත්ත්වයකට වැටුණු රටක් බවටත් අප පත් වුණා. ඒ අනුව පසුගිය කාල වකවානුව තුළ ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් සහ දේශපාලන වශයෙන් බිඳ වැටී තිබුණු රටක් තමයි අපි භාර ගත්තේ. අපි භාර ගන්නකොට අපේ රටට වාහන ඇතුළු භාණ්ඩ 900කට ආසන්න ප්‍රමාණයක් ගෙන්වන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. 2015 වර්ෂයේ ඉඳලා රාජ්‍ය සේවකයින් බඳවා ගැනීමත් නතර කරලා තිබුණා. රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩි කිරීම් නතර කරලා තිබුණා. සහනාධාර ලබා දීමත් සම්පූර්ණයෙන් කප්පාදුවකට ලක් කරලා තිබුණා. විශේෂයෙන් ගොවි ජනතාවට ලබා දෙන සහනාධාර කප්පාදු කරලා තිබුණා. ඒ වාගේම අඩු ආදායම්ලාභී ජනතාවගේ සහනාධාර කප්පාදු කර තිබුණා.

විශේෂයෙන්ම 2015 වර්ෂයේ ඉඳලා එක දිගටම විවිධ වකවානුවල ජනතාවගේ ඉල්ලීම් තිබුණත්, රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීමක් කළේ නැහැ. ඒ නිසා සේවක හිඟය, සේවක කාර්යක්ෂමතාව අඩු වීම, සේවකයින්ගේ වැඩ බර වැඩිවීම, තරුණයින්ගේ රැකියා අහිමි වීම වැනි විශාල බිඳ වැටීම් ගණනාවකට අපේ රට ලක්ව තිබුණා. එවැනි තත්ත්වයක් තුළ තමයි අපි මේ රට භාර ගත්තේ. මේ රට භාර අරගෙන අපි ඉදිරිපත් කළ පළමු අය වැයෙන්ම - විපක්ෂයට අමතක වෙලා තිබෙන දේ - රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීමක් කළා. ඒක මෙතෙක් කාලයක් රාජ්‍ය සේවයේ කරපු ආකාරයේ වැටුප් වැඩිවීමක් නොවෙයි. මෙතෙක් කල් රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම් කළේ මූලික වැටුපට සාපේක්ෂව යම් දීමනාවක් එල්ලමින්. හැබැයි, අපි රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කිරීමේදී මූලික වැටුපට එල්ලීමක් නොවෙයි කළේ, මූලික වැටුපට සෘජුව අදාළව වැටුප් වැඩි කිරීමක් තමයි කළේ. ඒ අනුව ලබන ජනවාරි මාසය වනකොට පහළම තලයේ සිටින රාජ්‍ය සේවකයකුගේ වැටුප් වැඩිවීමත් රුපියල් 40,000කට වඩා වැඩි වනවා. එතකොට අපි මූලික වැටුපට එල්ලලා නොවෙයි වැටුප් වැඩිවීම කළේ. මූලික වැටුපට සෘජුව අදාළ වන පරිදි තමයි අපි ඒ වැටුප් වැඩිවීම කළේ. ඒ විතරක් නොවෙයි. මෙතෙක් කාලයක් බොහෝ සහනාධාරත් කප්පාදු කර තිබුණා.

අපි මුල් අය වැය ලේඛනයේදීම මේ රටේ අඩු ආදායම්ලාභී ජනතාවට සහනාධාර ලබා දීම නැවත ආරම්භ කළා. ආබාධිත දරුවෙකු සිටින අඩු ආදායම්ලාභී පවුලකට රුපියල් 10,000ක දීමනාවක් ලබා දුන්නා. ඒ වාගේම මන්ද මානසික දරුවෙකු සිටින අඩු ආදායම්ලාභී පවුලකට රුපියල් 5,000ක දීමනාවක් දෙන්න අපි අය වැයෙන් මුදල් වෙන් කළා. ඒ වාගේම ගොවි ජනතාවට ලබා දෙන පොහොර සහනාධාරය රුපියල් 10,000කින් වැඩි කළා.

ඒ විතරක් නොවෙයි. අපි මහපොළ ශිෂ්‍යාධාරයත් වැඩි කළා. රුපියල් 5,000ට තිබුණු මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 10,000 දක්වා වැඩි කළා. ඒ වාගේම වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනාවත් අපි වැඩි කළා. මේ විධියට සහනාධාර විශාල ප්‍රමාණයක් පළමුවෙනි අය වැයෙන්ම අපි වැඩි කළා. ජනතාවට මීට වඩා සහන දෙන්න ඕනෑ, ජනතාවගේ ප්‍රශ්න දිහා මීට වඩා බලන්න ඕනෑ. නමුත් අපි මුහුණ දීලා තිබෙන ආර්ථික අර්බුදයත් එක්ක තමයි අපි ඒ ප්‍රශ්නවලට මැදිහත් වුණේ. ඒ විතරක් නොවෙයි.

දරුවන් 300කට අඩුවෙන් ඉන්න පාසල්වල සෑම දරුවකුටම පොත්පත් ගන්න රුපියල් 6,000 ගාණේ දෙන්න අපි මුදල් වෙන් කළා. ඒ වාගේම මේ අවුරුද්දේ පාසල් දරුවන්ට ඇඳුම් කට්ටල 2ක් ලබා දෙනවා. ඒ විතරක් නොවෙයි. ගැහැනු දරුවන්ට සනීපාරක්ෂක තුවා මුළු අවුරුද්දටම ලබා දෙන්න අවශ්‍ය මුදලත් අපි වෙන් කරලා තිබෙන්නේ. අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස හදන්නත් අපි මුදල් වෙන් කළා. එතෙක් ලබා දී තිබුණේ රුපියල් ලක්ෂ 5යි, අපි ඇවිල්ලා එම මුදල රුපියල් ලක්ෂ 10 දක්වා වැඩි කළා. උතුරු-නැගෙනහිර පළාත්වල යළි පදිංචි කිරීමේදී එම නිවාසවලට දීලා තිබුණේ රුපියල් ලක්ෂ 9යි, අපි ඇවිල්ලා එම මුදල රුපියල් ලක්ෂ 20 දක්වා වැඩි කළා. ඒ අනුව ආර්ථික සහන විශාල ප්‍රමාණයක් පළමුවෙනි අවුරුද්ද ඇතුළතම අපි ලබා දුන්නා.

විශේෂයෙන්ම විපක්ෂයේ අඳෝනාව තිබෙන්නේ, රටේ ජනතාවට සහන දීපු එක ගැන නොවෙයි. අපි රටේ ජනතාවට සහන දීලා තිබෙනවා. හැබැයි, අපි ලබා දුන් මේ සහන නිසා ගමට යන්න බැරි ප්‍රශ්නයක් විපක්ෂයට ඇති වෙලා තිබෙනවා. ඔබතුමන්ලා මේ අවුරුදු එකහමාර ඇතුළත මේ පාර්ලිමේන්තුව ඇතුළේ කෑ ගැහුවා. අපි සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට කියනවා, ගත වුණු අවුරුදු එකහමාරක කාලය ඇතුළත ඔබතුමා ගිහිල්ලා ගමක රැස්වීමක් කරපු තැනක් අපට කියන්න කියලා. ඔයගොල්ලන්ට අද ගමට යන්න බැහැ. මොකද, කෙසෙල් ගෙඩිය බෙදපු අය නේ, මේ ඉන්නේ. කෙසෙල් ගෙඩියේ නමත් ගැහුවා නේ. ඒ විතරක් නොවෙයි. ගිනි පෙට්ටියේත් නම ගැහුවා නේ. ගිනි තියන ගිනි කූරේ නම ලියපු මිනිස්සු නේ, මේ. එවැනි අය තමයි දැන් ආර්ථික සහන ගැන මහා ලොකුවට කයිවාරු ගහන්නේ.

මේ ආණ්ඩුව බලය අරගෙන අවුරුදු එකහමාරක් ඇතුළත මහා සහන මල්ලක් දීලා තිබෙනවා. පසුගිය මැයි මාසයේ තමයි අපි අය වැය යෝජනා ක්‍රියාත්මක කළේ. මාර්තු මාසයේ අය වැය ඉදිරිපත් කළා, මැයි මාසය වනකොට ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. ඒ වාගේම අය වැයෙන් පස්සේ මාස තුනක් හතරක් යනකොට - නොවැම්බර් මාසය වනකොට - "දිට්වා" සුළි කුණාටුව කියන ස්වාභාවික විපත ආවා. ඒ ස්වාභාවික විපතේදී ආණ්ඩුව කර ඇරියාද? ආණ්ඩුව කර ඇරියේ නැහැ. ආර්ථිකමය වශයෙන් කඩා වැටුණු රටක් අපි අරගත්තේ. රාජ්‍ය සේවකයින් බඳවා ගැනීම නතර කරලා තිබුණා, සහනාධාර කප්පාදු කරලා තිබුණා, රටේ ආර්ථිකය කඩා වට්ටලා තිබුණා. හැබැයි, අපි අර ස්වාභාවික විපත සිද්ධ වන වෙලාවේ ආර්ථිකය කඩා වැටුණා කියලා නිකම් හිටියේ නැහැ. ඒ ස්වාභාවික විපත නිසා මැටි ගෙයක් කැඩුණා නම්, විනාශ වුණා නම් - ඒ ගෙදර වටිනාකම රුපියල් 10,000ක් වෙන්න පුළුවන්, රුපියල් 15,000ක් වෙන්න පුළුවන් - නැවත ගේ හදාගන්න රුපියල් ලක්ෂ 50ක් දෙනවා. එක්කෝ මීට් කෑලි 5ක්, 6ක් ගිහිල්ලා, නැත්නම් බිත්තියක් කඩාගෙන වැටිලා රුපියල් 25,000ක විතර විනාශයක් ගෙදරට වෙලා තිබුණත්, රුපියල් 50,000ක විතර විනාශයක් ගෙදරට වෙලා තිබුණත්, අපි රුපියල් ලක්ෂ 5ක් දෙනවා. ඒ විතරක් නොවෙයි. ගේ පදිංචියට යන්න රුපියල් 50,000ක් දුන්නා, ගේ හෝදාගන්න රුපියල් 25,000ක් දුන්නා. ආර්ථිකය කඩා වැටුණු රටක තමයි අපි මේවා කරන්නේ. මේ, මහ ලොකුවට ගොඩ දාගත්ත රටක් නොවෙයි, කඩා වැටුණු රටක්. එවන් රටට ස්වාභාවික විපතක් ආවාට පස්සේ ඒකෙන් ආණ්ඩුව පැනලා ගියේ නැහැ. ආණ්ඩුව ඒ ස්වාභාවික විපතින් විනාශ වුණු සුළු කර්මාන්තවලට රුපියල් ලක්ෂ 2ක් දුන්නා, ආම්පන්න විනාශ වුණු ධීවරයින්ට ගෙවීම් කටයුතු කළා. ඒ වාගේම ගෙවල් විනාශ වෙලා, ඉඩම් විනාශ වුණු අයට ඉඩමටත් වන්දි ගෙවනවා, ගෙවල්වලටත් වන්දි ගෙවනවා. අපි "දිට්වා" සුළි කුණාටුවෙන් වුණු විනාශයේ ප්‍රමාණයට වඩා ජනතාවට ගෙව්වා, ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළට ගන්න.

ඒ විතරක් නොවෙයි, දැන් ලෝකයේ ඇති වෙලා තිබෙන්නේ නව තත්ත්වයක්. මේක ලෝකයේ වෙනත් රටවල් දෙක තුනක් අතර ඇති වුණු ප්‍රශ්නයක්. නමුත්, දැන් අපිට ඒ ප්‍රශ්නය බලපා තිබෙනවා. හැබැයි, අපි ඒකෙන් පීඩාවට පත් වන ජනතාව බේරා ගැනීම වෙනුවෙන් කටයුතු කරනවා. විශේෂයෙන්ම ගොවි ජනතාවට දැන් අලුතින් පොහොර මිටියක් ගැනීමේදී රුපියල් 4,500කට වැඩි මුදලක් දරන්න සිදු වෙනවා. හැබැයි, අපි මේ කන්නයේදීත් කිසිදු වැඩිවීමක් නැතුව රුපියල් 10,200ට මේ රටේ

ගොවි ජනතාවට පොහොර ටික ලබා දෙනවා. ඒ විතරක් නොවෙයි, මෙතෙක් අපි ලබා දීපු පොහොර සහනාධාරය තව රුපියල් 5,000කින් වැඩි කරනවා. අස්වැසුම ප්‍රතිලාභී පවුල්වලට ලබා දෙන දීමනාව රුපියල් 7,500කින් වැඩි කළා. ඒ වාගේම ධීවර රැකියාව කරන අයට තෙල් සඳහා රුපියල් ලක්ෂ එකහමාරක සහනාධාරයක් ලබා දෙනවා. රුපියල් කෝටි 6,000කට වඩා ඒ සඳහා වෙන් කර තිබෙනවා. ඒ විධියට ස්වාභාවික විපත්වලදී ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කරනවා වාගේම අනෙක් පැත්තෙන් අපි මේ ව්‍යසනයටත් ඒ හා සමාන මට්ටමකින් මැදිහත් වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. T.B. Sarath, your time is up.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් රවී කරුණානායක මහත්මයා කියනවා, එතුමාගේ UNP එක වාගේමයි මේ ආණ්ඩුවත් කියලා. එහෙම නැහැ. එතුමන්ලාගේ UNP එක බදු සහන දුන්නේ ව්‍යාපාරිකයන්ට. Daya Apparel Export (Pvt.) Limited එකට බදු සහන ලබා දුන්නා. වයඹ අරක්කු සමාගම්වලට බදු සහන දුන්නා. අපි බදු සහන දෙන්නේ කාටද? අපි බදු සහන දෙන්නේ පීඩාවට පත් වන ජනතාවට. අපි සහ ඒගොල්ලන් අතර වෙනසක් තිබෙනවා. ඒගොල්ලන් ව්‍යාපාරික ප්‍රජාව පෝෂණය කළා; අපි පොදු ජනතාව පෝෂණය කරනවා. මේ දෙක අතර වෙනසක් තිබෙනවා. මේ අයට ඒ වෙනස තේරෙන්නේ නැහැ. ඒ වෙනස තේරෙන්නේ නැතුව ආර්ථිකයේ model එකේ විධිය පමණක් පෙන්වමින් කටයුතු කරනවා. Model එක විතරක් පෙන්වන්න සූදානම් වෙන්න එපා. මේ ආණ්ඩුව බලයට පත් වුණු දවසේ ඉඳලා ආර්ථික සහන ලබා දුන්නේ පොදු ජනතාවට, පොඩි මිනිස්සුන්ට. නමුත්, ඒගොල්ලන් ආර්ථික සහන ලබා දුන්නේ ප්‍රාග්ධනය හිමි පන්තියට. ඒකයි මේ දෙක අතර තිබෙන වෙනස. ඒ නිසා සුජීවලා, රවී කරුණානායකලා ඇතුළු විපක්ෂය මේ භය වෙලා තිබෙන්නේ වෙන කිසිවකට නොවෙයි. විපක්ෂය මේ අවුරුදු එකහමාර තුළ පොදු ජනතාව ළඟට ගියේ නැහැ. පොදු ජනතාව ළඟට යන්නේ ආණ්ඩුව. අපි අද වනකොට මේ රටේ පොදු ජනතාව රැස් කරමින් මේ ව්‍යසනය ගැන ඔවුන් එක්ක සාකච්ඡා කරමින් ඉන්නවා. විපක්ෂය කොහේවත් ඒ ගැන සාකච්ඡා කරන්නේ නැහැ. ඔවුන් කථා කරන්නේ පාර්ලිමේන්තුව තුළ විතරයි. පාර්ලිමේන්තුව තුළ මහ ලොකුවට හයියෙන් කෑ ගහනවා. නමුත්, ගමට එන්නේ නැහැ. අපි ඔවුන්ට කියනවා, ගමට එන්න කියලා. අපි ගමේ රැස්වීම් පවත්වනවා. අපි ගමේ රැස්වීම් පවත්වලා ජනතාවට ව්‍යසනය ගැන කියනවා. *[බාධා කිරීමක්]* ඔව්, හොඳට මතකයි. ගම අවුළුවන්න එපා; ගිනි තියන්න එපා මේ සභාවේ ඉඳන්. ඒ නිසා මේ ව්‍යසනයෙන් මේ රට මුදා ගැනීම වෙනුවෙන් රජය කටයුතු කරනවා. පොදු ජනතාවගේ අවශ්‍යතා අපි ඉෂ්ට කරනවා. පොදු ජනතාවට සහන දෙනවා. තවදුරටත් මේ ව්‍යසනය වැඩි වෙනවා නම් ජනතාවට සහන දෙන්න රජය සූදානම් බව කියමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Namal Rajapaksa. You have 10 minutes.

[අ.භා. 1.13]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් ගමට එන්න කියනවා. දැන් ගමට කවුද යන්නේ? මමත් ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ නිතරම ගමට යන්න කියායි. ඒක හොඳයි. ඔබතුමන්ලා නිතරම ගමට යන්න. එතකොට නිතරම ජනතාවගෙන් උත්තරය ලැබෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් සහන ගැන කථා කළා නේ. ඔය විධියටම පසුගිය පළාත් පාලන මැතිවරණයට කලින් සිංහල අලුත් අවුරුද්දට රුපියල් 20,000ක බඩු මල්ලක් දෙනවාය කිව්වා. මැතිවරණය ඉවර වුණා, බඩු මල්ලත් දෙන එක ඉවර වුණා. Budget එකේත් එවැනි යෝජනාවක් තිබුණා. නමුත්, දීපු බඩු මල්ලක් නැහැ. ඔය විධියටම තමයි ඔබතුමන්ලා "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේදීත් කිව්වේ. ජනාධිපතිතුමා මේ සභාවේ ඉඳගෙන මොකක්ද කිව්වේ? ටකරමක් ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවාය කිව්වා. ඒ වාගේම ඉඩමක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 50කුත්, පූර්ණ හානි වූ නිවාස නැවත ඉදිකිරීමට රුපියල් ලක්ෂ 50කුත් දෙනවාය කිව්වා. උත්සවයකුත් තියලා පොඩි ප්‍රමාණයකට චෙක් එකක් දුන්නා. ඒ චෙක් එකත් සල්ලි නැහැ කියලා return වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පව්, ආණ්ඩුව. මේ කාවද රවටන්න හදන්නේ?

ජනාධිපතිවරයා ඊයේ මේ සභාවට ඇවිල්ලා කථා කළා. ඒක හොඳයි. එතුමා සහන දෙනවාය කියනවා. හැබැයි, ඒ සහන ප්‍රායෝගිකව ජනතාවට ලැබෙනවාද? දැන් ඒ කාලයේ ව්‍යාපාරිකයන්ට දුන්නු සහන ගැන කථා කළා නේ. ඒ කාලයේ අපේ ආණ්ඩුවෙන් VAT එක අඩු කරනකොට මොකක්ද කිව්වේ? ඒකට පුළුවන් තරම් ගැරහුවා. VAT එක අඩු කළාම, වක්‍ර බද්ද අඩු කළාම මොකක්ද වෙන්නේ? පොඩි මනුස්සයාට තමයි ඒකේ ලාභය ලැබෙන්නේ.

හැබැයි, අද ආණ්ඩුව මොකක්ද කරන්නේ? බදු පිට බදු ගහනවා. ඔබතුමන්ලා බදු සහන දෙනවා කිව්වාට පොඩි මනුස්සයාට හම්බ වුණු බදු සහනයක් නම් නැහැ. අන්න දැන් සෙස් බද්දත් අයින් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෙස් බද්ද අයින් කළාට පසුව මේ රටේ සිටින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයෝ ඉවරයි. ඇයි, සෙස් බද්ද ගෙනාවේ? කුඩා ව්‍යාපාරිකයා රකින්න. කුඩා ව්‍යාපාරිකයා රකින්න ගෙනා බදු ප්‍රතිපත්තිය වෙනස් කරලා ආණ්ඩුවට හිතවත් ව්‍යාපාරිකයන්ගේ අවශ්‍යතා රකින්න විතරක් බදු ප්‍රතිපත්තියක් ගෙනාවාම මොකද වෙන්නේ? ඔබතුමන්ලා මෙතැන කියවන්න පුළුවන්. හැබැයි ගරු ඇමතිතුමනි, යථාර්ථය තේරුම් ගන්න. ඔබේ බදු ප්‍රතිපත්තිය මත ලාභ ලබන්නේ මහ පරිමාණයේ කෝටිපති ව්‍යාපාරිකයෝ විතරයි. සුළු පරිමාණ ධීවරයාට, ගොවියාට සහනයක් නැහැ. ඒක ඒ අයට ලැබෙන්නේ නැහැ. මේක තමයි යථාර්ථය. ගම්වලට ගියාම මිනිස්සු ඔබතුමන්ලාට උත්තර දෙන්නේ ඒ නිසායි. ගමේ මිනිස්සුන්ට අමාරුයි. මේක තමයි ඇත්ත කථාව. ගම්වල ලොකු ආර්ථික ප්‍රශ්නයක් තිබෙනවා. Inflation වැඩි වෙනවා; ජීවන වියදම වැඩි වෙනවා. සමහර භාණ්ඩවල මිල සියයට 300කින් වැඩි වෙලා තිබෙනවා. සියයට 300කින්! හාල් මිල සියයට 300කින් වැඩි වෙලා ගොවියාගේ ආදායම සියයට සියයකින් වැඩි වෙනවා නම් හිත හදා ගන්න පුළුවන්. නමුත්, ඒක වෙන්නේත් නැහැ.

අනෙක් කාරණය මේකයි. මේ අය කියන පරස්පර විරෝධී කථා දිහා බලන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එක වෙලාවකට ඇවිල්ලා කියනවා, හාල් පිට රටින් ගෙනෙන්න ඕනෑ

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

නැහැ, ඔක්කෝම තිබෙනවාය කියලා. හැබැයි, දැන් මොකක්ද කියන්නේ? 2025 වසරින් පසුව හාල් ගෙනෙන්නේ නැහැ කිව්වා. දැන් හාලුත් ගෙනෙනවා. ලංකාවේ නිෂ්පාදනය කරන්න පුළුවන් - කෘෂි කර්මාන්තය වෙන්න පුළුවන්, කුඩා ව්‍යාපාරිකයෝ වෙන්න පුළුවන් - දේවල්වලට අවශ්‍ය සහනයක් දෙන්නේ නැතුව, වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැතුව, බදු පිට බදු ගහලා පිටින් ගෙනෙන භාණ්ඩවලට අදාළ බද්ද අයින් කර තිබෙනවා. සෙස් බද්ද අයින් කළා. ඒ කියන්නේ, පිට රටින් ගෙනෙන භාණ්ඩවලට අදාළ බදු අයින් කළාම හරි. අපේ ගම්වල සිටින අහිංසක නැන්දලා ගෙවල්වල මැෂින් තියාගෙන මහලා පොළේ විකුණන රෙදි ටිකට එතකොට වැඩේ හරි. ඔබතුමන්ලාගේ ගම හදන බදු ප්‍රතිපත්තිය එතකොට හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කාවද මේ රවටන්න හදන්නේ?

සමහර සහන දෙන්නේ මැයි මාසයේ ඉඳලා. මිනිස්සු සතුටින් සිංහල අවුරුද්ද සමරන එක වැරැද්දක්ද? සහන දෙනවා නම් දෙන්නකෝ, සිංහල-හින්දු අලුත් අවුරුද්ද සමරන කාලයේ. ඇයි, ඒ වෙලාවේදී සහන දෙන්න බැරි? ඇයි, අවුරුද්දට සහන දෙන්න බැරි? ඇයි, මැයි මාසය වෙනකම් ඉන්නේ? ඔබතුමන්ලාගේ නැකැත් සීට්ටුවේ ප්‍රශ්නයක් තිබෙනවාද, ඒක පිළිගන්නවාද, නැද්ද කියන එක ඔබතුමන්ලාගේ ප්‍රශ්නයක්. හැබැයි, මේ රටේ මිනිස්සු සිංහල-හින්දු අලුත් අවුරුද්ද සමරනවා. ඇයි, ඒ කාලයේදී සහන දෙන්න බැරි? මේ කාරණා සම්බන්ධයෙන්, මැද පෙරදිග අර්බුදයක් ඇති වෙනකොට විපක්ෂය, රටේ ජනතාව, විද්වතුන් නිරන්තරයෙන් කථා කළා. ආණ්ඩුව මොකක්ද කිව්වේ? ඒවාට ඇහුම්කන් දුන්නාද? නැහැ. ආණ්ඩුව ඒ වෙලාවේදී කිව්වා, අපට දවස් 45කට තෙල් තිබෙනවා, ඒ නිසා භය වෙන්න එපා කියලා. අගෝස්තු වෙනකම් තෙල් තිබෙනවාය කියලා එක් කෙනෙක් කිව්වා. ඊට පස්සේ කෙඳිරි ගානවා. අපිට ඔබතුමන්ලා වාගේ මිනිස්සු බඩගින්නේ තියලා, ඒ අය පාරට ගෙනැල්ලා, විදුලිය කප්පාදු කරලා ඡන්ද ගන්න වුවමනාවක් නැහැ. ඒ, ඔයගොල්ලන්ගේ දේශපාලනය. පෙරේදාත් හොරාට විදුලිය කැපුවා. හැබැයි, මොකක්ද කියන්නේ? අර රිළවා පැන්නා වාගේ කථාවක් තමයි කිව්වේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලා සැලසුම් සහගතව මේ රටේ මිනිස්සු පුනර්ජනනීය බලශක්තියෙන් ඈත් කරලා ඩීසල් බලාගාරවලට ළං කළා.

ජනාධිපතිතුමාම ගල් අඟුරු සම්බන්ධව කථා දෙකක් කියා තිබෙනවා. ඒ, මොකක්ද? පසුගිය කාලයේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, එම ටෙන්ඩරයේ වංචාවක් වෙලා තිබෙනවා, ප්‍රශ්නයක් තිබෙනවා කියලා එතුමාට නම් තේරෙන්නේ නැහැ කියලා. ඊයේ ඇවිල්ලා කියනවා, ටෙන්ඩර් එකේ පොඩි ප්‍රශ්නයක් තිබෙනවාලු, හැබැයි ගල් අඟුරු නම් කාලා බැලුවේ නැහැය කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගල් අඟුරු ගන්න කොට ගරු ජනාධිපතිතුමා කාලා බැලුවේ නැති වුණත් ගල් අඟුරු නැව එනකොට නම් හොඳටම කාපු බවක් පෙනෙනවා; හොඳටම කාලා තිබෙනවා.

ජනාධිපතිවරයා විසින් විගණකාධිපතිතුමිය - Auditor-General - පත් කළා. මතක නේ, මේ පාර්ලිමේන්තුවේ වාර ගණනක් ඇදුණා, එතුමියගේ නම දමා පත් කර ගැනීමේ කටයුත්ත. එතුමිය පත් කරන්න මාස ගණනක් පරක්කු වුණා. මම දන්නේ නැහැ, අයින් කරලා, අස් කරලා අන්තිමට මොකක් හරි හුටපටයක් වෙලා එතුමිය පත් කර ගත්තා. දැන් විගණකාධිපති වාර්තාව - Audit Report එක - බලන්න. සමාගම ලියාපදිංචි නැහැ. එහෙම නේද? පව්. ගල් අඟුරු ගෙනාපු සමාගම ලියාපදිංචි නැහැ. Laboratory report එක වැරදියි. ඒක හොර වාර්තාවක්. ලියාපදිංචි වෙලා නැති laboratory එකකින් ඒ report එක අරගෙන තිබෙන්නේ. ඔහොමත් හොර කරනවාද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඒ විතරක් නොවෙයි, ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේක ආරක්ෂා කරනවා. ඇයි, ඒ? ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේක ආරක්ෂා කරනවා. එහෙම නේද? ඉතින්, දැන් හිනා වෙන්න. මොකද, කාපු අය හිනා වෙන්න එපායැ. මොකද, ගල් අඟුරු ගේනකොට කාලා බැලුවේ නැති වුණාට- *[බාධා කිරීම්]* ඔව්, ඔව්. හිනා වෙන ඔක්කෝම අය ගෙනාවාට පස්සේ කාපු බවක් පේනවා. හිනා වෙන්නකෝ. හිනා වෙන ඔක්කෝම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගේනකොට කාපු අය තමයි. එක්කෙනා එක්කෙනා එළියට එන්නේ. *[බාධා කිරීමක්]*

අවසානයේ මොකක්ද වුණේ? මේ පාඩුව ජනතාවගේ පිට දැම්මා. මේක නවත්වන්න බැහැ කිව්වා. මොකක්ද හේතුව? නැවැත්වුවොත් ගෙනාපු සමාගම බංකොලොත් වෙනවා කිව්වා. ඇමතිවරු එහෙම කියන්නේ. ඩී.වී. චානක හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 2025දී පාර්ලිමේන්තුවේදී කිව්වා, "ගල් අඟුරු ටෙන්ඩරය කල් දානවා, හිතාමතා කල් දානවා, මේකේ වංචාවක් තිබෙනවා, වංචාවකට ලැහැස්ති වෙනවා" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක ඇහුවේ නැහැ. ඇහුවේ නැහැ නොවෙයි, ඇහුණා. මෙතුමන්ලා දන්නවා බාල ගල් අඟුරු තමයි එන්නේ කියලා, මෙතුමන්ලා දන්නවා මේ සමාගම ලියාපදිංචි නැහැ කියලා. ඒ හින්දා තමයි plan කරලා, accredited නැති laboratory එකකින්, නැත්නම් ලියාපදිංචි නැති laboratory එකකින් හොර වාර්තාවක් ගත්තේ. ඒ හින්දා තමයි පාර්ලිමේන්තුවේදීත්, පිටතදීත් මේක ආරක්ෂා කළේ. ඒ හින්දා තමයි කිව්වේ මේ ටෙන්ඩරය නැවැත්වුවොත් මේ සමාගම බංකොලොත් වෙනවා කියලා. සමාගම බංකොලොත් වෙනවාද, රටේ ජනතාව බංකොලොත් වෙනවාද කියලා ආණ්ඩුව තීන්දුවක් ගන්න ඕනෑ. අවසානයේ මොකක්ද කළේ? අගෝස්තු වෙනකම් තෙල් තිබෙනවා කියපු ආණ්ඩුවට විදුලි බිල වැඩි කරන්න සිද්ධ වුණා, තෙල් මිල වැඩි කරන්න සිද්ධ වුණා. ඒකට මේ ගල් අඟුරු වංචාව සෘජුවම සම්බන්ධයි. හැබැයි සමාගම බංකොලොත් කරගන්න දුක හිතෙන, කනගාටු වෙන ආණ්ඩුව මොකක්ද කළේ? ඒ පීඩාව මේ රටේ ජනතාවට දැම්මා. ඒ හින්දා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ගරු ජනාධිපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලන්නේ, දැන්වත් මේ සමාගම් රකින එක නවත්වන්න කියලායි. ඔබ කිව්වා නේ, ඔබේ පක්ෂයේ පාපිසි කැලි ආවා කියලා. ඉතින් මේකෙදි පාපිස්ස මොකක්ද කියන එක ජනාධිපතිතුමාටම තීන්දු කරගන්න වෙනවා. එහෙම නැත්නම් ජනාධිපතිතුමාත් පාපිස්සක්ද කියන එක එතුමාට තීන්දු කරගන්න වෙනවා.

දැන් තෙල් මිල වැඩි වෙනවා. රජයේ සේවකයන්ගේ මාර්තු මාසයේ දීමනාව තමයි තවමත් යන්නේ. ඒ අයගේ දීමනාව වැඩි කරලා දෙනවාද, නැද්ද? එහෙම නැත්නම් වැඩි කරපු තෙල් මිලට අතේ තිබෙන මුදලින් තෙල් ගහගෙන යන්න ඕනෑද? මැතිවරණ කාලයේදී කිව්වා, මාස හයෙන් හයට රජයේ සේවකයන්ගේ පඩි වැඩි කරනවා කියලා. දැන් ජීවන වියදම සියයට 300කින් වැඩි වෙලා තිබෙනවා. ඉතින්, ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව රජයේ සේවකයන්ගේ පඩිය වැඩි කරන්න කටයුතු කරනවාද? පෞද්ගලික අංශයේ සේවකයන්ට යම් දීමනාවක් ලබා දෙන්න ආණ්ඩුව මැදිහත් වෙනවාද? කයිවාරු ගහලා හරියන්නේ නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟ කාරණය මේකයි. ගොවියා මහ පාරට ඇදලා දාන තැනට මේ ආණ්ඩුව කටයුතු කළා. පොහොර සහනාධාරය දෙනවා කියලා කියනවා. කොහේද දෙන්නේ? වී මිල කීයද? වී මිලදී ගන්නවාද? නැහැ. ඇයි? ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුව තමන්ට හිතවත් ව්‍යාපාරිකයෝ කිහිපදෙනෙක් තර කරනවා මිස

මේ රටේ පොදු මහජනතාව වෙනුවෙන් තීන්දු තීරණ ගන්නේ නැහැ. ඒ හින්දා අපි පැහැදිලිවම ආණ්ඩුවට කියන්නේ කරුණාකරලා තවදුරටත් මේ වංචා වහගන්න කටයුතු කරන්න ලැහැස්ති වෙන්න එපා කියලායි. මොකද, අද මුළු රටම, ලෝකයම මේවා දන්නවා. අර හැමදාම වාගේ මේ ආණ්ඩුව පික්පොකට් න්‍යාය තමයි ක්‍රියාත්මක කරන්නේ. එක්කෙනෙකුට ඇඟිල්ල දිගු කරලා "හොරා, හොරා" කියලා ඔහු පස්සේ දුවනවා. බලනකොට පික්පොකට් ගහපු කෙනා තමයි "හොරා, හොරා" කියලා තිබෙන්නේ. ඔබ - මේ ආණ්ඩුව - සැලසුම්සහගතව මේ රටේ රාජ්‍ය දේපළ විනාශ කරන ගමන් - ඉතිහාසයේ වැඩියෙන්ම රාජ්‍ය දේපළ විනාශ කරලා තිබෙන්නේ ඔබතුමන්ලා - තමන්ගේ නොහැකියාව, තමන්ගේ වැඩ බැරිකම, තමන්ගේ වංචා, හොරකම් මේ රටේ ජනතාවගේ පිට පටවනවා. අවසානයේ මොකක්ද වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
Sir, give me just 30 seconds, please.

එක පැත්තකින් මේ රටේ අහිංසක ජනතාව ආර්ථික ප්‍රශ්නයක ඉන්නවා. අසීමිත බදු ප්‍රතිපත්තියක් තිබෙනවා. ජනතාවට දරාගන්න බැරි ආර්ථික පීඩනයක් තුළ ඉන්න අතරේ ආණ්ඩුව; ආණ්ඩුවේ මැති, ඇමතිවරු සමාජ ප්‍රාග්ධනය උපයමින් ඉන්නවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ravindra Bandara. You have eight minutes.

[අ.භා. 1.24]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මේ වන කොට විපක්ෂයේ අය ගල් අඟුරු ගැන කථා කරනවා; බොහොම වේදනාවෙන් කථා කරනවා. කථා කරලා සමහර අය දැන් මෙතැනින් යන්න යනවා. සුපුරුදු පරිදි එහෙම නේ වෙන්නේ. මෙතැනට එනවා, යනවා. අහගෙන ඉන්න ශක්තියක් නැහැ.

මේ ටෙන්ඩර් පටිපාටිය හරියට ක්‍රියාත්මක වෙලා ඉතිහාසයේ වැඩිම ලංසු ප්‍රමාණයක් ඉදිරිපත් වෙච්ච අවුරුද්දේ ඒ procurement එක හරියට යන එක තමයි මෙතුමන්ලාට ගැටලුව වුණේ. අපේ ජනාධිපතිතුමා කිව්වා වාගේ ඒ කාටල කඩනකොට ඒ කාටලවල අධිපති වුණු අයට, ඒවාට උඩගෙඩි දුන්න හොර කණ්ඩායම්වලට තමයි රිදෙන්නේ. ඒක තමයි මේ වෙලාවේත් වෙලා තිබෙන්නේ. ඒ කාලයේ ටෙන්ඩර් පටිපාටියක් නැතුව, ටෙන්ඩරයෙන් ඒක දෙන්නේ නැතුව කැබිනට් පත්‍රිකා දාලා තමන්ට හිතවත් කණ්ඩායමකට දීපු අය තමයි දැන් මේ හරි වේදනාවෙන් කෑ ගහන්නේ. ඒ ඉතිහාසය අපි දන්නවා.

දැන් බලන්න, ජනාධිපතිතුමා කියපු දේ එතුමන්ලාට තේරෙන්නේ නැහැ. හුණ්ඩු වාගේ ආණ්ඩු තිබුණා කිව්වාම ඒක තේරුම් ගන්න බැහැ; ඒකේ තිබුණු පණිවුඩය තේරෙන්නේ නැහැ. මොකද, හුනු බිකක් තරම්වත් මොළයක් නැහැ නේ, ඔය සාටකය පොරවාගෙන හිටියාට. ඒ නිසා ඒක තේරෙන්නේ නැහැ. ඊයේත් "කාලා බලලා නොවෙයි මේවා තීරණය කරන්නේ. ඒවා load port එකේදී check කරනවා. ඊට පස්සේ discharge port එකේදී check කරනවා. ඊට පසුව බලාගාරයේදී check කරනවා. අන්න ඒ විධියට තමයි වෙන්නේ" කිව්වාම, ඒගොල්ලන්ට ඇහෙන්නේ, "කාලා බලලා නොවෙයි" කියන කථාව විතරයි. ඒ නිසා තමයි මම කියන්නේ, සාටකය දාගෙන හිටියාට හුනු බිකක් තරම්වත් මොළයක් නැහැ කියලා. ඒ නිසා තව කෙනෙකු කියන දෙයක් අහගෙන ඉන්න ශක්තියකුත් නැහැ.

දැන් මේ මාතෘකාව ගැන කථා කරද්දි අද උදේ ඉඳන් කියපු කාරණා අපි දැක්කා. ඔය footnotes දාපු කට්ටිය ඉන්නවා නේ. Footnote No.1, අර කෙහෙල් ගෙඩියේ නම ගහලා බෙදපු භාදයා පොතක් ලිව්වා. දැන් ඒ පොත හොයා ගන්නත් නැහැ. මොකද, මහ බැංකු හොරු නිදහස් කරන්න, එහෙම හොරකමක් වුණේ නැහැ කියලායි පොත ලිව්වේ. එම පොත දැන් එයාලාම අතුරුදහන් කරලා තිබෙනවා. දැන් එයාලා කියන්න එනවා, ආපදා කළමනාකරණය ගැන. මෙතුමන්ලා බලයේ ඉන්න කාලයේ 2014දී මීරියබැද්දේ නාය ගියා. ගෙවල් 75ක් හදන්න ගියා අවුරුදු හතරක්. දැන් ඉතිරි ගෙවල් 135 හදන්නේ අපේ ආණ්ඩුව ඇවිල්ලායි. අන්න ඒ අය - කෙහෙල් ගෙඩියේ නම ගහලා බෙදපු අය, ඒ වාගේම ගෙවල් ටික හදා ගන්න බැරිව හිටපු අය - දැන් කථා කරනවා, ආපදා කළමනාකරණය ගැන. තවත් මහත්තයෙක් ඇහුවා නේ, වතු කම්කරුවන්ට දැන් කොහොමද කියලා. පුළුවන් නම් රුපියල් 10කින් වැටුප් වැඩි කරලා දෙන්නය කිව්වා. අපි වතු කම්කරුවන්ගේ වැටුප් රුපියල් 400කින් වැඩි කළා. ඒ වාගේම මලෙයහම් ජනතාවට ගෙයක් හදා ගන්න ලක්ෂ 50ක් දෙනවාය කියන පණිවුඩයත් එක්ක දැන් ඒගොල්ලෝ හරි වේදනාවෙන් කියනවා, "මාස තුනක් වනවා, තවම අවතැන් වුවන් කඳවුරුවල ඉන්නේ" කියලා. මතක තබා ගන්න, අපේ රජය එනකොටත් අවතැන් වූ අය කඳවුරුවල හිටියා. මම ඉන්න හපුතලේ, හල්දුම්මුල්ලේ තිබෙනවා අතහැර දමපු tea factory එකක්. අවතැන් වූ අය ඒකේ අවුරුදු දෙකක් හිටියා. ගෙවල් හදා දෙනවා තියා ගෙවල් හදන්න ඉඩමවත් හොයාගෙන තිබුණේ නැහැ. ඒ, මේ මහත්වරුන්ගේ කාලයේ. දැන් මොකද වෙන්නේ? අපි බලයට ආවාට පස්සේ ඒ ගෙවල් ටික හදලා දැන් අවසාන අදියරේ තිබෙන්නේ. ඒවා තමයි දැන් සිදු වන්නේ.

දැන් මේ ගල් අඟුරු සම්බන්ධ කාරණයේදී ඔබතුමන්ලා කියන්නේ, ගල් අඟුරු වංචාව කියලා නේ. වංචා ගැන මම කියන්නම්. වංචා සිදු වුණු ඒවා තිබෙනවා. දැන් පාර්ලිමේන්තුවේ නැති භාදයෙකුත් අපි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පිහිටුවන්න යනකොට බඩගාගෙන ඇවිල්ලා එකතු වෙන්න ට්‍රයි කළා; බිම පෙරළි පෙරළි ඇවිල්ලා එකතු වෙන්න ට්‍රයි කළා. ඉතිහාසයේ පක්ෂයෙන් පක්ෂයට පැනලා, ජාතිවාදය අවුස්සලා, කුජීත ඉතිහාසයක් තිබෙන භාදයින්ට ජාතික ජන බලවේගයට එකතු වෙන්න බැහැ නේ. එයාලාගේ ආණ්ඩුව කාලයේ 2011න් පසුව 2014දි මොකද වෙන්නේ? ගල් අඟුරු නැව් 7ක් reject වනවා. පස්සේ ඒගොල්ලන්ට නැව් 3ක් දෙන්න වනවා. දඩ ගහනකොට මොකක්ද කරලා තිබෙන්නේ? ඩොලර් ලක්ෂ තුනහමාරයි දඩය ගහලා තිබෙන්නේ. එතැන ගේම් එකක් ගහලා තිබෙනවා. එතකොට අර කිලෝ කැලරි ප්‍රමාණය 5,800ට අඩු නම් ඒක ප්‍රශ්නයක් නැහැ. ඒ කාලයේ එයා ඒක නිවැරදි කරනවා. "ඒක ප්‍රශ්නයක් නැහැ. ඒකෙන් කිසිම හානියක් වෙන්නේ නැහැ. කවුද එහෙම කියන්නේ? අපි නැව බලන්න යනවාද?" කියලා. එදා එහෙමයි. දැන් මේ tender procedure එක හරහා කටයුතු කෙරෙන අවස්ථාවේ තමයි මේ විධියට කථා කරන්නේ.

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

ඊළඟට ඉන්නවා, Footnote No.2. එතුමා තමයි ඊයේ ලේඛන උස්සගෙන ඇවිල්ලා මෙතැන කථා කළේ. එතුමන්ලාගේ කාලයේ මොකද වුණේ? එතුමන්ලාගේ කාලයේත් එහෙමයි. දඩ අය කරන්න සූත්‍රයක් තිබුණා. එම සූත්‍රයේදී 0.1න් බෙදන්න ඕනෑ වුණත් ඒක 1 විධියට ගත්තා. 0.1න් බෙදෙනවා නම් 10න් වැඩි වෙන්න ඕනෑ නේ. ඒගොල්ලන් 0.1 අගය 1 කළා. සූත්‍රයක 1න් බෙදන්නේ නැහැ නේ. x ÷ 1 නම් x වනවා. 5 ÷ 1 නම් 5යි. හැබැයි 5 ÷ 0.1 නම් 50 වනවා. ඒ විධියට නිර්ලජ්ජිත වැඩ කරලා පාඩු කළා. ඒවාට දැන් නඩු ක්‍රියාත්මක වනවා. ඒවා තමයි අය කර ගන්න ඕනෑ.

ඊයේ පාර්ලිමේන්තුවේදී ජනාධිපතිවරයා පැහැදිලිව කිව්වා, tender procedure එක අනුව නිවැරදි ක්‍රමයට යනවා නම් සැපයුම්කරු ගිවිසුම උල්ලංඝනය කර තිබෙනවා නම්, ප්‍රමිතියෙන් අඩු ගල් අඟුරු එවා තිබෙනවා නම්, එතැනදී කරන්න ඕනෑ දේ තමයි, අදාළ දඩ අය කිරීම කියලා. ඊළඟට ඔබතුමන්ලා කිව්වා, නැව් ප්‍රමාද වුණා කියලා. නැව් ප්‍රමාද වෙලා තිබෙනවා. අපි දැන් නැව් ප්‍රමාද ගාස්තු අය කරනවා. අපි SOC එකේදී ප්‍රශ්න කළා, අතීතයේ නැව් ප්‍රමාද වෙලා තිබෙනවාද කියලා. අසීමිතව සිදු වෙලා තිබෙනවා. ප්‍රමාද ගාස්තු කොච්චර අය කරලා තිබෙනවාද කියලා ප්‍රශ්න කළා. කිසිවක් අය කර නැත. අපි ජනතාවට කියනවා, එතුමන්ලාගේ කාලයේ ප්‍රමාද ගාස්තු අය කරලා නැහැ කියලා. ඒ වාගේම ප්‍රමිතියෙන් අඩු ගල් අඟුරු ලැබුණාම අය කළ යුතු දඩ මුදල් නිසි ප්‍රමාණයෙන් අය කරගෙන නැහැ. සූත්‍ර වෙනස් කර තිබෙනවා. ඒවා තමයි ගේම්. ඒ ගේම් ගහපු අය තමයි දැන් කාටල කඩනකොට කලබල වෙලා තිබෙන්නේ. ගැටලු මතු වෙයි. ගල් අඟුරුවල ප්‍රමිතිය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා නම්, කිලෝ කැලරි ප්‍රමාණය අඩු නම් ඩීසල්වලින් විදුලිය උත්පාදනය කරන විධියට තමයි දඩ අය කරන්නේ. නැව් තුනකින් විතරක් මිලියන 8.4ක දඩයක් ඒ අයගේ රඳවා තබා ගැනීමේ මුදලින් අය කර තිබෙනවා. ඉස්සර මොකද වුණේ? 2019ට කලින් කළේ, පටවන තැනදී විතරයි check කරන්නේ. ඒකට සියයට සියයම ගෙව්වා. එහෙම තමයි අතීතයේ වුණේ. නමුත් දැන් discharge port එකෙන් check කරලා තමයි වැඩ කටයුතු වෙන්නේ. හැබැයි, ඒකෙදි අපි දන්නවා ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව කිව්වා, ප්‍රමිතිය පිළිබඳව යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවා කියලා.

ඒකට අදාළව කළ යුතු දේ කරනවා. නමුත්, දැන් ඔබතුමන්ලා මොකක්ද කියන්නේ? විදුලි බිල වැඩිවීමත් දැන් ඒකට ගළපනවා. පෙබරවාරි දක්වා තිබෙන නිර්ණායක මත තමයි විදුලි බිල වැඩි වෙලා තිබෙන්නේ. මහජන උපයෝගිතා කොමිසමෙන් අහලා බලන්න. ඒකට මේක අදාළ කරගෙන නැහැ; ඉදිරියට අදාළ කර ගන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔය එළියේ ඉන්න තවත් මහත්තුරු දැන් විදුලි බිල ගැනත් කථා කරනවා නේ. සමහරු දැන් කියනවා, 'කංචනගේ කාලයේ තමයි සුපිරියටම කළේ' කියලා. ඒ කාලයේ තමයි සුපිරියටම ඇනුවේ. මම ඒ ගැනත් කියන්නම්. සූර්ය බලයෙන් විදුලිය ජනනය කිරීම සම්බන්ධයෙන් වන 'සූර්යබල සංග්‍රාමය' වාගේ වැඩසටහන් කීපයක් ඒ කාලයේ පටන් ගත්තා නේ.

ඔබතුමන්ලා කියනවා rooftop solar systemsවලින් solar power නිපදවන එක දුර්වල කරන්නේ මේ ආණ්ඩුවෙන් කියලා. ඒක එහෙම නොවෙයි කියන එක මම ප්‍රස්තාර සටහනකින් පෙන්වන්නම්. Ground-mounted solar systems විතරක් නොවෙයි, වහලය මත සවි කරන solar systems කියන ක්‍රම දෙකම ඉතිහාසයේ වැඩිම ප්‍රමාණයක් එකතු කළේ මේ ආණ්ඩුව කාලයේයි. මේ ආණ්ඩුව කාලයේ තමයි ඒ වැඩි කිරීම කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒගොල්ලන්ගේ ආණ්ඩු කාලවල ඉතාම අවිධිමත්ව වැඩ කළා. සූර්ය විදුලිය ජනනය වන කොට system එකේදී පෙනෙන්නේ නැහැ, කොච්චර ජනනය වෙනවාද කියලා. ඒකට විසඳුම් තිබෙනවා. එකක් තමයි, grid එක smart කරන එක. නමුත්, එදා ඒක කළේ නැහැ. ඒ හැර වෙනත් තාක්ෂණික ක්‍රමත් තිබෙනවා. අපි දැන් ඒවාත් පාවිච්චි කරනවා. ඒවායෙන් තමයි තීරණය කරන්නේ, විදුලිය කොච්චරක් ජනනය වෙනවාද කියලා. ඒ වාගේම, කැරකෙන මැෂින් වාගේ නොවෙයි, solar power එනකොට system එක unbalance වනවා. System එක unbalance වනකොට ඒක balance කර ගන්න ඕනෑ. System එක balance කර ගන්න තාක්ෂණය ලෝකයේ තිබෙනවා. ඒකට battery systems හඳුන්වා දෙන්න ඕනෑ. තමුන්නාන්සේලා කොච්චර battery systems හඳුන්වා දුන්නාද? මොකවත් හඳුන්වා දුන්නේ නැහැ. Pumped storage වාගේ systems ලෝකයේ තිබෙනවා. තමුන්නාන්සේලා ඒවා හඳුන්වා දුන්නාද? නැහැ. ඔන්න දැන් කැබිනට් අනුමැතිය සහිතව 10 megawatt battery systems 16ක් ක්‍රියාත්මක වෙමින් යනවා. ඒ වාගේම, ඉදිරියේදී 100 megawatt battery systems එනවා; 10 megawatt battery systems තවත් 25ක් එනවා. ඒ වාගේම pumped storage එකක් එනවා. Pumped storage එකක් කියන්නේ දිවා කාලයේදී අපට සූර්ය බලයෙන් විදුලිය අතිරික්තයක් ලැබෙනවා නම් ඒ අතිරික්තය රාත්‍රි කාලයට යොදා ගන්නා ක්‍රමය. ඒක තමයි pumped storage කියලා කියන්නේ. අන්න ඒ ක්‍රමය එනවා. එතකොට මොකද වෙන්නේ කියලා මම කියන්නම්. ඒ වෙනුවෙන් බිලියන 243ක් වෙන් කරලා තිබෙනවා. ඒ, මහ ඔය ආශ්‍රිතවයි. ක්‍රමිකව, ක්‍රමවත්ව වැඩක් කරනවා කියන්නේ, සැලසුම් සහගතව වැඩක් කරනවා කියන්නේ ඒකයි.

දැන් ඔය මහත්තුරුම මේකට උත්තරයක් දෙන්නකෝ. අපි දැන් ආර්ථිකය කළමනාකරණය කර තිබෙනවා. ඔබතුමන්ලාම කියනවා නේ භාණ්ඩාගාරයේ රුපියල් ට්‍රිලියන එකයි දශම ගණනක් තිබෙනවා කියලා. ඒ වාගේම, ඔබතුමන්ලා කිව්වා නේ "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩා විඳි අයට සහන දෙන්න කියලා. ඒ මුදලින් නේ කෝටි 50,000ක සහන පැකේජයක් ගෙනාවේ සහ දැන් කෝටි 10,000ක සහන පැකේජයක් ගෙනැල්ලා තිබෙන්නේ. ඔබතුමන්ලා කිව්වා නේ, භාණ්ඩාගාරයේ තිබෙන ඒ මුදල් ජනතාවට බෙදලා දෙන්න කියලා. අපි දැනගෙන හිටියාද, "දිට්වා" සුළි කුණාටුව එනවා කියලා? කවුරුවත් දැනගෙන හිටියාද, ලෝක යුද්ධයක් ඇවිල්ලා මේ වාගේ තත්ත්වයක් ඇති වෙනවා කියලා? මේ කියන දේවල් ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ ආවා නම් - අර 2022දී කළා වාගේ - සල්ලි අච්චු ගහනවා. සල්ලි අච්චු ගහනවා හැරෙන්න වෙන කිසිම දෙයක් කරන්නේ නැහැ. හැබැයි මේ වෙලාව, එසේ මුදල් අච්චු ගැසීමෙන් තොරව ආර්ථිකය කළමනාකරණය කරලා මේ රටට ඩොලර් එන මාර්ග තුනෙන්ම වාර්තා පිහිටුවලා, බදු ආදායම් හරහා දේශීය වශයෙනුත් ආදායම් ලැබීම සම්බන්ධයෙන් බොහොම ලස්සනට ස්ථායි බවක් ඇති කරගෙන ඉන්න වෙලාවක්. ඕක තමයි අපට කියන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය දැන් විදුලි බිල ගැනත් කියනවා නේ. අපි විදුලි බිල අඩු කරනවා. අපි පැහැදිලිව ඒක කියනවා. විපක්ෂයේ ඔබතුමන්ලාට බැරි වුණා නේ, විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කරන්න. ඒ සම්බන්ධවත් බොහොම ලස්සනට කටයුතු කරමින් තුනෙන් එකකින් විදුලි බිල අඩු කරන එක අපි අනිවාර්යයෙන් සිද්ධ කරනවා. ඒ සියලු කාරණා දැන් ප්‍රශස්ත විධියට, ඉතා ලස්සන විධියට කෙරීගෙන යනවා. අපි ඔබතුමන්ලා වාගේ සේවකයන් 12,500ක් අයින් කරන්න ගියේත් නැහැ. මේ ගරු සභාවේදී කථා කරපු මහත්තුරුන් වාගේ SriLankan Airlines, Sri Lanka Telecom, Milco Private

Limited ආදිය විකුණුවේත් නැහැ. ඒ සියල්ල කළේ නැහැ වාගේම විදුලිබල මණ්ඩලය ඇතුළුව ආණ්ඩුවට තිබෙන ආයතන පෞද්ගලික අංශයට දුන්නේත් නැහැ. අපි ඒ සියල්ල කළමනාකරණය කරගෙන තිබෙනවා. ඒ නිසා ඔය මහත්තුරුන්ට අපි කියනවා අපායේ ඉන්ටර්වල් එක ලැබුණා වාගේ කියලා හිතාගෙන, වෙන දේ බලාගෙන ඉන්න කියලා. ගල් අඟුරු පිළිබඳ කාරණය සම්බන්ධයෙන් ඔබතුමන්ලා විගණකාධිපතිතුමාගේ වාර්තාව ගැනම කියමින් ඉන්නවා. එහි නිසි නිර්දේශ අනුව, කිසිදු වරදක් වුණේ නැහැ කියන එක ඉතා පැහැදිලිව කාලය විසින් ඔප්පු කරාවි. ඒත් එක්කම මේ කියන දේත් හොඳට මතක තියා ගන්න. මේ කාරණාවේදී ඔබතුමන්ලා අසරණ වෙච්ච ප්‍රමාණය අපි තේරුම් අරගෙන ඉන්නවා. ඒ නිසා අපට කියන්න තිබෙන්නේ, විපක්ෂයට හෙණ ගහලා තිබෙනවා කියන එකයි. ඒ බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Leader of the Opposition. You have 10 minutes.

[අ.භා. 1.34]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන්, රටේ ජනතාවත් දැන ගන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. අප්‍රේල් මාසයේදී විදුලි බිල සියයට 11ක් වැඩි කරලා රජය දැන් යෝජනා කරනවා, මැයි මාසයේදී විදුලි බිල සියයට 53කින් වැඩි කරන්න. ඒක ඔබතුමන්ලා දන්නවාද? ඔබතුමන්ලා ඒ ගැන දන්නේ නැතිවයි කථා කරන්නේ. මැයි මාසයේදී සියයට 53කින් විදුලි බිල වැඩි කරන්න යනවා. ඒකෙන් උපයා ගන්න හදන මුදල, ඇත්තටම පාරිභෝගිකයාගෙන් සූරා කන මුදල බිලියන 41.5යි. ඒ බිලියන 41.5න් දළ වශයෙන් අඩක් - බිලියන 20.5ක් - වැය කරන්නේ බාල ගල් අඟුරු වංචාවේ අලාභය පියවා ගන්නයි; ඒ අලාභය මහ හරවා ගන්නයි. මම ඒ බව පැහැදිලිවම කියන්න කැමැතියි. ගල් අඟුරු ප්‍රමිතියෙන් යුක්තව තිබුණා නම් මේ පාඩුව වෙන්නේ නැහැ. බාල ගල් අඟුරු භාවිතය නිසා ගිගාවොට් පැය 250ක් අහිමි වෙලා තිබෙනවා. ඒ අහිමි වුණු ගිගාවොට් පැය 250 සපුරා ගන්න ඩීසල් බලාගාර හරහා විදුලි බලය උත්පාදනය කරන්න බිලියන 20.5ක් යනවා. ඒ බිලියන 20.5 පියවාගන්න මැයි මාසයේ සියයට 53කින් විදුලි බිල වැඩි කරන්න යනවා. ජනාධිපතිවරයා මොනවා කිව්වත්, සැපයුම්කරුවාගෙන්, එහෙමත් නැත්නම් කොම්පැනිකාරයන්ගෙන් ඒවා අය කරනවා කියලා ජනාධිපතිවරයා කිව්වත් බාල ගල් අඟුරු වංචාවේ පාඩුව වෙනුවෙන් ගෙවන්න වෙන්නේ මේ රටේ 7,500,000ක් වන විදුලි පාරිභෝගිකයන්ටයි.

ඇයි මේක රටට හෙළිදරව් කරන්නේ නැත්තේ? ඇයි මේ බොරුව කරන්නේ? ඊයේ දවසේත් මම ඒ ගැන පැහැදිලිව කිව්වා. මොකද, ජනාධිපතිවරයාට ගෑස් පාරිභෝගිකයන් ගැන අමතක වුණා. අපේ රටේ පවුල් හැටඑක්ලක්ෂයක් අතරින් ගෑස් - LPG - පාරිභෝජනයේ නියැළෙන ලක්ෂ 25ක් ඉන්නවා. ඒ අයට කිසිම සහනයක් ලබා දුන්නේ නැහැ. මම ජනාධිපතිවරයාට ආරාධනා කළා, අඩුම ගණනේ අද දවසේවත් ඇවිල්ලා අමතක වුණු අර විසිපන් ලක්ෂයක් වන ගෑස් පාරිභෝගිකයන්ට සහනයක් ලබා දෙන්න කියලා. මම හිතන්නේ නැහැ, අද ඒක සිදු වෙලා තිබෙනවා කියලා. අපි ජනාධිපතිවරයාට කියනවා, වහාම එය නිවැරැදි කරන්න කියලා. මැයි මාසයේ කරන්නට යෙදෙන සියයට 53ක විදුලි බිල වැඩි කිරීම වහා හකුළා ගන්න. මොකද, බාල ගල් අඟුරු භාවිතය තුළ - ඒ වංචාව තුළ - අහිමි වුණු ගිගාවොට් පැය ප්‍රමාණය ඒකකයකට රුපියල් 100 ගණනේ වැය කරමින් ඩීසල්වලින් සපුරා ගන්න යැමෙන් වන පාඩුව විදුලි පාරිභෝගිකයාගෙන් පියවා ගන්න යනවා. මේ රටේ හැත්තෑ පන්ලක්ෂයක් විදුලි පාරිභෝගිකයන් අනාථ කරන්නේ නැතුව ඊයේ දවසේ කියපු ආකාරයට කරුණාකර බාල ගල් අඟුරු සැපයුම්කරුවන්ගෙන් සහ ඒ වැරැදි කරපු කොම්පැනිකාරයන්ගෙන් ඒ පාඩුව අය කර ගන්න කියා මම ඉල්ලා සිටින්න කැමැතියි.

ආණ්ඩු පාර්ශ්වයෙන් විශේෂයෙන්ම ගොවි ජනතාව නියෝජනය කරන බල ප්‍රදේශ ගණනාවක මන්ත්‍රීවරු මෙහිදී කථා කළා. මට කියන්නකෝ බලන්න, මාස් කන්නයේ වී මිල කීයද කියලා. තෙත සහිත වී කිලෝ එකක් රුපියල් 85ට, 95ට ගියේ. ඊට පස්සේ සියයට 14ක තෙතමනය තිබෙන වී රුපියල් 100ට, 103ටයි ගියේ. රජය පොරොන්දු වුණා, වී කිලෝ එකකට රුපියල් 120ක් ලබා දෙන්න. පොරොන්දු වුණු ඒ රුපියල් 120 කෝ? එදා ඔබතුමන්ලා කුඹුරුවලට බැහැලා ගොයම් කකා කිව්වා මතක නැද්ද, වී සඳහා රුපියල් 150ක සහතික මිලක් මේ පාර්ලිමේන්තුවේ නීතිගත කරනවා කියලා? එදා ගොයම් කාපු අයත් දැන් නැහැ; පුන්නක්කු බීපු කට්ටියත් නැහැ. අද මේ ආණ්ඩුව පුන්නක්කු ටික මේ රටේ අහිංසක ජනතාවට සපයනවා. ජනතාව දසලක්ෂ ගණන් ඡන්දය ලබා දුන්නේ ඒ වාගේ තුන්වැනි පන්තියේ සැලකිල්ලක් ලබා ගන්න නොවෙයි. නමුත් අද එක පැත්තකින්, හැත්තෑපන්ලක්ෂයක් විදුලි පාරිභෝගිකයන් අනාථ කර තිබෙනවා. තවත් පැත්තකින්, ගොවි, ධීවර, කම්කරු දුප්පත් ප්‍රජාව, ස්වයං රැකියා, ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය පරිමාණයේ කර්මාන්ත, සේවා ක්ෂේත්‍රය, සංචාරක ක්ෂේත්‍රය ඇතුළු හැම ක්ෂේත්‍රයක්ම අර්බුදයට ලක් වී තිබෙනවා. ඒ, අද පවතින බාල රාජ්‍ය පාලනය නිසායි. ගෙනාපු ගල් අඟුරුත් බාලයි; රාජ්‍ය පාලනයත් බාලයි; ප්‍රමිතියෙන් තොරයි. ඒ නිසා මේ රටේ ජනතාව අද අසහනයට, විපතට පත් වෙලා තිබෙනවා.

අඩුම ගණනේ සති දෙකකවත් සටන් විරාම කවුළුවක් දැන් තිබෙනවාලු. මම ප්‍රාර්ථනා කරනවා, සති දෙකක් නොව යුද්ධයෙන් තොරවම එය ක්‍රියාත්මක වේවා කියලා. හැබැයි, මේ සති දෙකක සටන් විරාම කවුළුව තුළ දෙයියන්ගේ නාමයට අපේ රටට අවශ්‍ය ඉන්ධන, පොහොර, ගෑස්, වෛද්‍ය සහ අනෙකුත් අත්‍යවශ්‍ය සැපයුම්වලට අදාළ සැපයුම් දාම ටික ශක්තිමත් කරන්න කටයුතු කරන්න. දැන්වත් scenario planning කියන එකට අනුව විවිධ අවස්ථාවලට උචිත ආකාරයට රාජ්‍ය සැලසුම් සකස් කිරීම කරන්න. ඒ කාරණාව තමන්ගේ වහලුන්, අතකොළු ලවා සමාජ මාධ්‍ය හරහා විහිළුවට ලක් කරන්නේ නැතුව අඩුම ගණනේ දැන්වත් මේ හදිසි අවස්ථා කේන්ද්‍ර කරගෙන ක්‍රමෝපායික සැලසුම් සකස් කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.

ඊයේ ඇවිල්ලා කිව්වා, පොහොරවලට මෙච්චර මෙච්චර සහන දෙනවා කියලා. අද රටේ TSP, MOP, යූරියා තිබෙනවාද? දේශපාලනඥයන් සහ සමහර නිලධාරින් කියනවා, "කිසි ප්‍රශ්නයක් නැහැ, ඒවා තිබෙනවා" කියලා. හැබැයි ගමට ගියාම, ගොවි බිමට ගියාම ගොවියෝ කියනවා, ඇත්ත වශයෙන්ම පොහොරවල බරපතළ හිඟයක් තිබෙනවා කියන කාරණාව. මේ සටන් විරාමය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ අද තෙල් මිල අඩු වෙලා. ඒ නිසා අපි විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. මොකද, මේ වනකොට Brent crude oil බැරල් එකක මිල ඩොලර් 95ක් දක්වා අඩු වෙලා. ඒ නිසා මැද පෙරදිග යුද්ධය කියලා වැඩි කරපු මිල කරුණාකරලා දැන් අඩු කරන්න. අපි ප්‍රාර්ථනා කරනවා, මැද පෙරදිග ඇති වී තිබෙන මේ තාවකාලික සාමය ස්ථිරසාර සාමයක් වේවා කියලා. මැද පෙරදිග යුද්ධයේ නාමයෙන් වැඩි කරපු මිල

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

හෙට දවසේ හෝ, අද මධ්‍යම රාත්‍රියේ හෝ වහාම අඩු කරන්න කටයුතු කරන්නය කියලා මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා. ඒ ඉල්ලීම කරන අතරතුර මම මේ අවස්ථාවේ විශේෂයෙන් කියන්න කැමැතියි, ජනාධිපතිවරයා දින 39ක් මර නින්දේ ඉඳලා, මහා ලොකු හීනයක් දැකලා හදිසියේ නැඟිටලා ඇවිල්ලා, ඊයේ පොරොන්දු වට්ටෝරුවක් ලබා දුන්නා. "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වූ අයට පොරොන්දු වූ සහන ටික ලබා දෙන්න අදටත් අපොහොසත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මම තව කාරණයක් කියන්න කැමැතියි. අද සෞඛ්‍ය පද්ධතිය කඩාගෙන වැටිලා. මඩකලපුව රෝහලේ oncology unit එකේ linear accelerator යන්ත්‍රය ක්‍රියාවිරහිත වෙලා. ඒක හදාගන්න බැහැ. දැන් මහ ලොකුවට විදුලි බලය ගැන කථා කරනවා. විශේෂයෙන්ම මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් මම එක කාරණයක් අහන්න කැමැතියි. රජරට ප්‍රදේශයේ අහිංසක අම්මා කෙනෙකුට රුපියල් 80,000ක විදුලි බිලක් එවලා තිබෙනවා. ඇයට මෙච්චර කාලයක් ඇවිල්ලා තිබෙන්නේ, රුපියල් 100ක, රුපියල් 150ක බිලක්. ලයිට් කපලා මේ වෙනකොට මාස 4ක් වෙනවා. ඒ අම්මා නිලධාරින් හම්බ වෙන්න මැදවච්චියට ගියාම, අනුරාධපුරයට ගියාම සිංහල අවුරුද්දෙන් පස්සේ බලන්නම් කියලා තිබෙනවා. මෙය එක් අවස්ථාවක් පමණයි. මම මේ අවස්ථාවේ යෝජනාවක් කරන්න ඕනෑ. මේ රටේ දසලක්ෂ ගණනක ජනතාවක් සිටිනවා, හඬක් නොමැතිව, තමන්ගේ දුක කියාගන්න බැරුව. රටේ තිබෙන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සහ උප ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 341ක ඉන්න රාජ්‍ය සේවකයන්ට විශේෂිත පුහුණුවක් ලබා දීලා, කරුණාකරලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ඔම්බුඩ්ස්මන්වරයෙක් - දුක්ගන්නාරාළ කෙනෙක් - පත් කරන්න. රුපියල් 100ක, රුපියල් 150ක මාසික විදුලි බිලක් ලැබුණු අහිංසක අම්මා කෙනෙකුට රුපියල් 80,000 බිලක් යවලා, ඒ අම්මාගේ නිවසේ විදුලිය විසන්ධි කරලා අදට මාස 4යි. ඇයට මේ දුක කියන්න කවුරුවත් නැහැ. කාර්යක්ෂම රජයක් තුළ කවදාවත් මෙහෙම දේවල් වෙන්නේ නැහැ.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වර්ජනය නතර වීම පිළිබඳව අපි සතුටු වෙනවා. හැබැයි, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පැවැති වර්ජනය තුළින් අසහනයට, කම්පනයට, දුකට සහ කනගාටුවට පත් වුණේ මේ රටේ ගිලන් වෙච්ච ජනතාවයි. හැබැයි, අපි මතක තබාගත යුතු කාරණයක් තිබෙනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යවරයාට වගකීමක් තිබෙනවා, ඒ අයට සවන් දෙන්න.

ඔබ දන්නවාද, අද හිටි හැටියේම අපේ රටේ තිබෙන 393ක් වන දුෂ්කර සේවා රෝහල් ප්‍රමාණය අත්තනෝමතික ලෙස 126කින් කප්පාදු කරලා තිබෙනවා කියලා? දුෂ්කර සේවා කාලය සඳහා බොහොම අමාරුවෙන් තමයි වෛද්‍යවරු යවන්නේ. එක අවුරුද්දක් වැඩ කරන්න කිව්වාම තමයි ඒගොල්ලෝ ගිහිල්ලා වැඩ කරන්න උනන්දු වෙන්නේ. අද ඒ කාලය අත්තනෝමතික ලෙස වසර 2ක් දක්වා වැඩි කරලා තිබෙනවා. ඉතින්, මේ කරුණු කාරණා පිළිබඳව ඇමතිවරයා අදාළ වෛද්‍ය අංශත් සමඟ සාකච්ඡා කළ යුතුයි. අපි කිසිම දවසක කියන්නේ නැහැ, වැඩ වර්ජන හරියි කියලා. මොකද, වැඩ වර්ජනවලින් විපතට පත් වෙන්නේ, අසහනයට පත් වෙන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාව. හැබැයි මතක තබා ගන්න, වැඩ වර්ජන නිසා ඇමතිවරයා එක පැත්තකට ඇඹිල්ල දිගු කරනකොට, අනිවාර්යයෙන්ම ඊට වඩා ඇඹිලි ප්‍රමාණයක් ඇමතිවරයාට දිගු වෙනවා කියලා. මේවා සාකච්ඡා මාර්ගයෙන් විසඳන්න ඕනෑ ප්‍රශ්න. කොටින්ම කිව්වොත්, රජය ස්ථාපිත කරන මාරුවීම් මණ්ඩල පැත්තක දමලා, මාරුවීම් මණ්ඩල දේශපාලනීකරණය කරලා, මාරුවීම් මණ්ඩල අද පැලවත්ත පක්ෂ කාර්යාලයට ගෙනයෑම ඉතාම අශෝභනයි, ඉතාම අසික්කිතයි. වෛද්‍යවරුන්ගේ මාරුවීම් මණ්ඩල පැලවත්තට අරගෙන යන එක නතර කරලා, ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාව හරහා විශේෂයෙන්ම ආයතන සංග්‍රහයට අනුකූලව මාරුවීම් මණ්ඩල ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්න.

ඒ වාගේම මම තවත් කාරණයක් කියන්න කැමැතියි. ඩෙංගු මර්දන සහායකයන්ගේ ප්‍රශ්නය විසඳන්න කියලා අපි හැමදාම ඉල්ලීම් කරනවා. ඒ අය 301දෙනෙක් පමණ ඉන්නවා රැකියා ස්ථිරභාවය නොලබා. කරුණාකරලා ඒ අයට යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කරන්න.

අවසාන වශයෙන් මම මේ කාරණාව කියන්නට ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ සේවය කරන කාන්තාවකට යම් කිසි harassment එකක් සිද්ධ වෙලා තිබෙනවා. High Court Judge කෙනෙකුගේ ප්‍රධානත්වයෙන් පත් කරපු කමිටුවකින් පිළිගෙන තිබෙනවා, sexual harassment එකක් නොවෙයි, verbal harassments සිද්ධ වෙලා තිබෙනවා කියලා. ඒ වාර්තාවේ නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා. කරුණාකරලා ඒ නිර්දේශ ටික ක්‍රියාත්මක කරන්න. වාචිකව හිරිහැරයට ලක්වුණු ඒ කාන්තාවට, තවත් කාන්තාවන්ට එවන් හිරිහැර සිදු නොවන ආකාරයට කටයුතු කරන්න. අපි මේ කථා කරන්නේ මේ රටේ සියයට 52ක් වන කාන්තා පරපුර වෙනුවෙන්. ඒ යුතුකම් සම්භාරය ඉෂ්ට කිරීම රජයේ වගකීමයි කියන එක මේ අවස්ථාවේ ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Upali Samarasingha. You have 11 minutes.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Archchuna, what is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, it is under Standing Order No. 141.

සර්, මගේ salary sheet එකේ තිබෙනවා, Entertainment Allowance කියලා රුපියල් 1,000ක්. මට දැනගන්න පුළුවන්ද ඒ රුපියල් 1,000 දෙන්නේ ඇයි, ඒක වැඩි කරන්න පුළුවන්ද කියලා. අපි රටට දෙන entertainment එකට ඒක වැඩි කරන්න පුළුවන්ද කියලා මම අහනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will inquire from the SGP's Office; I will bring it to their notice.

Hon. Upali Samarasingha, you may start your speech and your time starts now.

[අ.භා. 1.47]

**ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ සාකච්ඡාවට බඳුන් වෙන්නේ රටේ පවතින වර්තමාන තත්ත්වය සහ සමාජ ප්‍රශ්න ගැන. අද විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා හැම විටම උත්සාහ දරමින් ඉන්නවා, එතුමන්ලාගේ ඉතිහාසයේ කරන ලද බොහෝ අඩුපාඩුකම්, වැරැදි අපේ දේශපාලන ව්‍යාපාරයටත්, අපේ දේශපාලන ව්‍යාපාරයේ නායකත්වයටත් සමාන කරන්න. ඒකට පොඩි උදාහරණයක් ගන්න මම කැමතියි. විපක්ෂයේ කාර්යභාරය තමයි ආණ්ඩු පක්ෂයේ අඩුපාඩු පෙන්වා දීම, ආණ්ඩු පක්ෂයේ හරි දේවල්වලට උදවු කිරීම, ආණ්ඩු පක්ෂයේ යම් අඩුපාඩුවක් තිබෙනවා නම් ඒවාට විරුද්ධ වීම. අපේ දේශපාලන ව්‍යාපාරය දීර්ඝ කාලයක් විපක්ෂයේ වැඩ කරමින් හිටියා. සුනාමිය ආපු වෙලාවේ අපි විපක්ෂයේ හිටියේ. අපට දේශපාලන වශයෙන් තිබුණු මන්ත්‍රී ධුර සංඛ්‍යාව බොහොම පොඩියි. ඒ මොහොතේ රට විශාල වශයෙන් අස්ථාවර වුණා. ඒවාගේම ජනතාව විපතට පත් වුණා. ඒ අවස්ථාවේ අපි විපක්ෂයේ ඉඳගෙන රටේ ජනතාව වෙනුවෙන් සහ රටේ තිබුණු අස්ථාවරභාවය නැති කිරීම වෙනුවෙන් පක්ෂයක් විධියට දැවැන්ත මැදිහත්වීමක් කළා. අපි විවේචනය කළා වාගේම තවත් වැඩ කටයුතු කළා.

සුනාමියෙන් දකුණු දුම්රිය මාර්ගය විනාශ වුණා. ඒ වෙලාවේ ආණ්ඩුව සැලසුම් කළේ විශාල මුදලකට වෙනත් රටකට දීලා ඒක හදන්නයි. ඒ වෙලාවේ අපට අදාළ වෘත්තීය සමිති මැදිහත් වෙලා ස්වේච්ඡාවෙන් දින 57ක විතර කාලයක් තුළ ඒ රේල් පාර ඉදි කරලා දුන්නා. ඒ කටයුත්තෙන් ආර්ථිකමය වාසියක් ලබා දුන්නේ සහ ජනතාවගේ සුවපහසුව හැදුවේ අපි. නමුත් අපි ඒ වෙලාවේ කල්පනා කළේ නැහැ, අපි කළ ඒ කටයුත්තෙන් ආණ්ඩුවට ලැබෙන වාසි පිළිබඳව. ඒ වාගේම සුනාමිය නිසා ගෙවල් විනාශ වුණා; පාසල් විනාශ වුණා. අපි ඒ හැමතැනකටම ගියා. අපි ස්වේච්ඡාවෙන් ගිහින් ඒ මිනිසුන්ගේ නිවාස ශුද්ධ පවිත්‍ර කරලා දුන්නා. ගාල්ල බස් නැවතුම් පොළ අලුත්වැඩියා කරලා දුන්නා. රට සහ රටේ ජනතාව අමාරුවේ වැටුණාම අපි කල්පනා කළේ නැහැ, පවතින ආණ්ඩුව කාගේද කියලා. අපි හිතුවේ රට ගැන; ජනතාව ගැන.

මෑත කාලය ගත්තොත්, කොරෝනා වසංගතය ආවා. එතකොට අපට හිටියේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු තුන්දෙනායි. හැබැයි, අපි ඒ වෙලාවේ විපක්ෂයක් විධියට කල්පනා කළේ අපේ රට බේරාගන්න ඕනෑ, ජනතාව බේරාගන්න ඕනෑ කියලායි. ඒ අවස්ථාවේ මුහුණු ආවරණ - facemasks - ඕනෑ වුණා. අපි පක්ෂයක් විධියට facemasks ලක්ෂ ගණනක් මහලා බෙදලා දුන්නා.

ඒ වාගේම සමහර රෝහල්වල රෝගීන් දවස් 10, 12 තියාගෙන හිටියා, ඔවුන්ගේ ආරක්ෂාවට. අපි රෝහල් විශාල සංඛ්‍යාවකට මැදිහත් වෙලා - මැදවච්චියේ රෝහලට පවා - කටයුතු කළා. තාවකාලික රෝහල්වලට අවශ්‍ය පහසුකම් සපයලා quarantine කරන්න අවශ්‍ය පහසුකම් සපයන්න අපි මහන්සි වුණා.

ඒ වාගේම සමහර පාසල්වලට උෂ්ණත්වය බලන උපකරණ අවශ්‍ය වුණා. අපි පක්ෂයක් විධියට මැදිහත් වෙලා ඒවා අරගෙන දුන්නා. ඒ වෙලාවේ කොරෝනාව පාවිච්චි කරලා ජනතාව කුපිත කරලා, බලයට එන්නේ කොහොමද කියලා අපි කල්පනා කළේ නැහැ. විපක්ෂයක් වුණාම විවේචනය කරන්න ඕනෑ, අඩුපාඩු පෙන්වා දෙන්න ඕනෑ. හැබැයි, රටට යම් විපතක් වුණාම ඒ විපතේදී රටේ ජනතාව වෙනුවෙන්, රට වෙනුවෙන් වැඩ කරන්න ඕනෑ. අපට මතකයි, අපි ආණ්ඩුව අරගෙන ඉතා කෙටි කාලයක් තුළ "දිට්වා" සුළි කුණාටුව ආවා. ඒ "දිට්වා" නිසා සුනාමිය හා සමාන අස්ථාවරභාවයක්, විනාශයක් රටට සිදු වුණා කියලා. ජනතාව අවතැන් වුණා. තමුන්නාන්සේලාට ඔය ප්‍රධාන බලවේගයක් තිබෙන බවට, ලොකු හැකියාවක් තිබෙන බවට, ලොකු දක්ෂතාවක් තිබෙන බවට කථාබහෙන් පෙන්නුම් කළාට, ඔබතුමන්ලා මොන දිස්ත්‍රික්කයට ගිහිල්ලා මොන පාරද සුද්ද කළේ, මොන පාසලද හදලා දුන්නේ, මොන කැඩුණු පාලමද හදලා දුන්නේ කියලා අපි විපක්ෂයෙන් අහනවා. අපි ආණ්ඩුවේ ඉඳගෙන වැඩ කරන ගමන් අපේ පක්ෂයේ තිබෙන සාමාජිකත්වය, අපේ පක්ෂයේ තිබෙන ස්වේච්ඡා සංවිධාන කැඳවලා, දහස් ගණන් මිනිසුන් අරගෙන ගිහිල්ලා කෙටි කාලයක් තුළ - මාස කිහිපයකින් - මේ රටේ ජනතාවට පිහිට වුණා. මම මේ කියන්නේ විපක්ෂයේ හැමෝම ගැන නොවෙයි. සමහර මන්ත්‍රීවරු උදවු කළා. නමුත්, මම කියන්නේ ඇත්තටම ඒකට මැදිහත් වෙන්න ඕනෑ ක්‍රමයක් තිබුණා කියන එක. මීට වඩා සංවිධානගතව මැදිහත් වෙන්න තිබුණා. අපි එහෙම කරලා තිබෙනවා. බැරි කාලයේ අපි එහෙම කරලා තිබෙනවා. ඒ නිසා සමාවෙන්න ඕනෑ. කවුරු හෝ එහෙම සම්බන්ධ වෙච්ච මන්ත්‍රීවරු ඉන්නවා නම්, ඒ අය පෞද්ගලික මට්ටමින් ඒවා කළ බව අපි පිළිගන්නවා. දේශපාලන ව්‍යාපාරයක් ලෙස, පක්ෂයක් ලෙස කරපු මැදිහත්වීම සම්බන්ධයෙන් මම මේ කියන්නේ.

ඇත්තටම දැන් අපට තේරෙන දේ මේකයි. ලෝක අර්බුදයක් ඇවිල්ලා තිබෙනවා. ඒකත් එක්ක අපේ රටට යම්කිසි විධියක බලපෑමක් ඇති වෙලා තිබෙනවා. හැබැයි, විපක්ෂය හැම වෙලේම කල්පනා කරන්නේ ඒ මතින් බලය ගන්නේ කොහොමද කියන එකයි. අපි ඇත්තටම ඒ ගැන දුක් වෙනවා. උදේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, මේ කට්ටිය එනකොට කෙට්ටුයි, හැබැයි දැන් හඳුනාගන්න බැහැ, සුදුවෙලා, මහත්වෙලා කියලා. මේ කථා ඇතුළේ කියන්නේ මොකක්ද? ඒ කථා ගත්තොත්, ඒ වචන ඇතුළේ තිබෙන්නේ වෙනත් කුහකත්වයක්. අපි අහනවා, කවුද මේ මන්ත්‍රීවරුන්ව මීට පෙර දැකලා තිබෙන්නේ? අපේ මන්ත්‍රීවරුන්ගෙන් ඔයගොල්ලන් මීට කලින් දැක තිබෙන්නේ කාවද? අපි අහනවා, එතුමන්ලාව කවදාද ඔයගොල්ලන් හඳුනාගෙන තිබෙන්නේ කියලා. දැන් වෙනස් වෙලා, සුදු වෙලා කියලා ඔයගොල්ලන් අපට කියන්නේ කොහොමද? මම හිතන විධියට මේ මන්ත්‍රීවරු 159දෙනාගෙන් 10ක්, 15ක්වත් ඔයගොල්ලන් මීට පෙර දන්නේ නැහැ. නමුත්, ඒ වචන ඇතුළේ පාවිච්චි කරන්න උත්සාහ කරනවා, - *[බාධා කිරීමක්]* එහෙම ගෙනෙන්න එපා. මම කියන්නේ, අපි පුද්ගලයෙකුගේ පාට සුදු ද, කළු ද කියලා බලන්නේ නැතිව, ඊට වඩා දේශපාලන විවේචනයක් කර ගනිමු කියන එකයි. *[බාධා කිරීමක්]* ඔව්, අපි එහෙම තැන දෙනවා.

අපි අවුරුදු 30ක්, 35ක් තිස්සේ බොහෝ දේවල් කරලා තිබෙනවා; වැඩ කරලා තිබෙනවා, තමුන්නාන්සේලා දන්නේ නැති වුණාට. නමුත් අපි පාර්ලිමේන්තුවේ හමුවෙලා නැහැ. මම කියන්න උත්සාහ කරන්නේ වෙන කිසිවක් නොවෙයි. අපි දේශපාලනය කරමු. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. තර්ක විතර්ක කරමු, වාද විවාද කරමු. මොනවා හෝ දූෂණ, වංචා තිබෙනවා නම් ඒවාට විරුද්ධව අධිකරණයට යන්න, අල්ලස් කොමිසමට යන්න. අපි ඒවා එහෙම බේරා ගනිමු. නමුත් මම මේ කියන්න උත්සාහ කරන්නේ, රටක් විධියට යම් යම් අවස්ථාවලදී ඇති වන පොදු තත්ත්වවලදී අපි මීට වඩා සාමූහිකව කටයුතු කරන්න ඕනෑ කියන එකයි. මම ඒකයි මුලින් කිව්වේ, අපි විපක්ෂයේ සිටි කාලයේ ඒ වාගේ විශේෂ අවස්ථාවලදී රටේ ජනතාව වෙනුවෙන්, රට වෙනුවෙන් මැදිහත් වෙලා තිබෙනවා කියලා. එහෙම නැතුව

[ගරු උපාලි සමරසිංහ මහතා]

තමුන්නාන්සේලාගේ අඩුපාඩුවක් හෝ පොදු තත්ත්වයක් යටතේ අපි ඇවිල්ලා ඒක පාවිච්චි කරලා, ජනතාව කුපිත කරන්න උත්සාහ කරලා නැහැ. අපි කවුරුත් දන්නවා, අපි මේ රට භාරගන්නකොට පැවැති තත්ත්වය. ඒක තමයි රටේ තිබුණු ඇත්ත තත්ත්වය කියන එක කැමැත්තෙන් හෝ අකමැත්තෙන් අපට හිතන්න වෙනවා. ඒකට එක් පුද්ගලයෙක් වග කියන්න ඕනෑ කියලා අපි කියන්නේ නැහැ. දීර්ඝ කාලයක් තිස්සේ - අවුරුදු ගණනක් තිස්සේ - පවත්වාගෙන ආපු ක්‍රම නිසා තමයි රට එතැනට පත් වුණේ කියලා අපි හිතනවා. ඒ නිසා අපි අවුරුදු 5කට දොස් කියන්නේ නැහැ; අපි අවුරුදු 10කට දොස් කියන්නේ නැහැ; අපි පුද්ගලයෙකුට දොස් කියන්නේ නැහැ. අවුරුදු ගණනක් ගිය ඒ ගමන් මාර්ගය, ආර්ථික උපාය මාර්ගික තත්ත්වය නිසා මේ තත්ත්වය ඇති වුණා කියලා අපි හිතනවා. නමුත්, අපි රට භාරගත්තාට පස්සේ මේ දේවල්වලින් රට ගලවාගන්නේ කොහොමද කියලා ආණ්ඩුවක් විධියට අපි කල්පනා කරනවා. අපේ පැත්තෙන් අපි ආදර්ශ පමණක් දීලා තිබෙනවා. ඒක ජනතාව දන්නවා. මේ සියලු තත්ත්වයන් මධ්‍යයේ මේ වෙනකොට අපි රටේ ජනතාවට දෙන්න පුළුවන් උපරිම සහන දීලා තිබෙනවා. ඒ වාගේම අපට ලැබිච්ච බොහෝ වරප්‍රසාද අපි කප්පාදු කරගෙන තිබෙනවා. අද විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු පවා සමහර අවස්ථාවල pension එක කපන්න එපා, වාහන permit එක cancel කරන්න එපා කියලා කියනවා. ඒ නිසා කවුරු මොනවා කිව්වත් අපේ ක්‍රියාමාර්ග, අපේ ප්‍රතිපත්ති, අපේ වැඩ පිළිවෙළ හරහා ඇත්තටම රටේ ජනතාවට සහනයක් සලසන්නේ කොහොමද කියන එක සම්බන්ධව තමයි අපි කල්පනා කරමින් ඉන්නේ. ඒ වාගේම රට ඉස්සරහට ගන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙනුත් අපි මැදිහත් වෙන්න ඕනෑ.

මේ සියලු තත්ත්වයන් මැද්දේ අපට කළ හැකි ප්‍රමාණය කොච්චර ද, අපි ජනතාවට සලකන්නේ කොහොමද, ජනතාවගේ මේ ප්‍රශ්නවලට උත්තර දෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් ඊයේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා පැහැදිලි කළා. මේ වාගේ අර්බුද එනකොට අපි විතරක් බේරෙන්නේ කොහොමද කියලා අපි කථා කරන්නේ නැහැ. උදාහරණයක් විධියට, දැන් ඉන්ධන අර්බුදයක් තිබෙනවා. ඇත්තටම ගත්තොත්, සියලුම මන්ත්‍රීවරුන්ට, අපට පවා ඉන්ධන දීමනාව අඩු කර තිබෙනවා. අපි වාහනවලට තෙල් ගහගන්න යන්නේ පෝලිමේ. මේ ප්‍රශ්නය වෙලාවේදී අපි ජනතාවට වඩා, - *[බාධා කිරීමක්]*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ඔබතුමන්ලා කොයි ෂෙඩ් එකෙන් ද දන්නේ නැහැ තෙල් ගහගන්නේ?

**ගරු උපාලි සමරසිංහ මහතා**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ)
(The Hon. Upali Samarasingha)
අපි වාහනවලට තෙල් ගහන්නේ පෝලිමේ ගිහිල්ලා. අපි පෝලිමේ ගිහිල්ලා තමයි වවුනියාවේ වාහනවලට තෙල් ගහන්නේ. *[බාධා කිරීමක්]* ඔව්, දැන් තෙල් පෝලිම් නැහැ තමයි. දැන් පෝලිම් නැහැ නේ. ඒ නිසා ගැටලුවක් නැහැ නේ. ඔබතුමන්ලා මොකක් කිව්වත් දැන් පෝලිම් නැහැ; පෝලිම් අඩුයි. අපි ගිහිල්ලා වාහනවලට තෙල් ගහගන්නෙත් special විධියට නොවෙයි. අද නොවෙයි, ඉන්ධන අර්බුදය ආපු වෙලාවේදීත් අපි සාමාන්‍ය විධියට ගිහිල්ලා තමයි වාහනවලට තෙල් ගැහුවේ. ඒ නිසා, මම කියන්නේ මෙකයි. මේ සියලු තත්ත්වයන් හමුවේ ජනතාවගේ පැත්තට බර දෙනවා වෙනුවට, අපි ඇතුළු ඔබතමුන්නාන්සේලාත් කැප කිරීමක් කරලා, මේ තත්ත්වයට මුහුණ දීලා, මේ තත්ත්වයෙන් රට බේරා ගත්තාට පස්සේ අපි දෙගොල්ලන්ට ඕනෑම දේශපාලනයක් කරන්න පුළුවන්. එහෙම නැතිව මේක පාවිච්චි කරලා මේකට මතවාදයන් හදලා Facebook එකේ දාලා, සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය කරලා, මඩ ගහලා අපි කොහොමද බලය ගන්නේ කියලා හිතනවා නම්, ඇත්තටම ඒක හීනයක් විතරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියලු කාරණා මැද්දේ අපි මේ වෙනකොට කෘෂි කර්මාන්තයට අවශ්‍ය පහසුකම් සපයා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Upali Samarasingha, your time is up now.

**ගරු උපාලි සමරසිංහ මහතා**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ)
(The Hon. Upali Samarasingha)
මට තව සුළු කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වැඩ කටයුතු නවත්වලා නැහැ. මේ සියලු අර්බුද මැද අපි යල කන්නය සඳහා අවශ්‍ය සැලසුම් හදලා ඒ වෙනුවෙන් උදව් කර තිබෙනවා. ඒ වාගේම, අපේ රටේ ප්‍රධාන ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වැඩ කටයුතු අපි නවත්වලා නැහැ. ඒ නිසා අපිට මේ අර්බුදය ජය ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. S.M. Marikkar. You have eight minutes.

[අ.භා. 1.58]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කරපු මන්ත්‍රීතුමාගේ නම මම දන්නේ නැහැ. එතුමන්ලා තමයි ඔක්කෝම වැඩ කරලා තිබෙන්නේ. අනෙක් අය නිකම් නේ ඉඳලා තිබෙන්නේ. "දිට්වා" ව්‍යසනය ඇති වෙච්ච වෙලාවේ මම කොලොන්නාව, වැල්ලම්පිටිය විමලාරාම පන්සලේ කුස්සියක්ම දාලා දවස් 5ක් විතර මිනිස්සුන්ට කන්න දුන්නා. බෝට්ටු ගිහින් දැම්මා. ආණ්ඩුව බෝට්ටු 2ක් දානකොට, අපිත් ගිහිල්ලා බෝට්ටු 2ක් දැම්මා. ඒ සම්බන්ධයෙන් කියන්න මම මීට වඩා කාලය ගන්නේ නැහැ.

සාමාන්‍යයෙන් ජනාධිපතිතුමා මාසයකට සැරයක් පාර්ලිමේන්තුවට එනවා, රජයේ වැරදි අඩුපාඩු හෝදන්න. ජනාධිපතිතුමා ඊයේත් මේ පාර්ලිමේන්තුවට ආවා. ඊයේ එතුමා පාර්ලිමේන්තුවට ආවේ එතුමාගේ මිත්‍රයාව බේරා ගන්න. එතුමාගේ මිත්‍රයා පසුගිය මහ මැතිවරණයට ඉදිරිපත් වුණු කෙනෙක් නොවෙයි. එතුමාගේ මිත්‍රයා පසුගිය කාලයේ පොහොර සංස්ථාවේ කටයුතු කරද්දී චෝදනාවට ලක් වෙච්ච කෙනෙක්. එවැනි කෙනෙක් ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා මේ රටේ ආර්ථිකයේ මර්මස්ථානය වෙච්ච

බලශක්තියේ වගකීම එතුමාට බාර දුන්නා. බලශක්ති ක්ෂේත්‍රය භාරගෙන ඇනගෙන ඉන්න යාලුවා බේරා ගන්න තමයි එතුමා ඊයේ පාර්ලිමේන්තුවට ආවේ. යාලුවාට ලේ ඉනුවේ ජනාධිපතිතුමා ඇවිල්ලා කථා කළාට පස්සේ. පොඩි drama එකක් දැම්මා, දවස් 3කට කලින් මෙගාවොට් 270ක් ජාතික විදුලි පද්ධතියට එක්කළා කියලා. අර පරණ රුසියානු ගල් අඟුරු දාලා අරගෙන, පොඩ්ඩක් මෙතැන පොඩි කෑල්ලක් දාලා pick-up එකක් දුන්නා. මොකද, අනෙක් මන්ත්‍රීවරුත් මේක සෝදන්න හයේ ඉන්න නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගල් අඟුරු ටෙන්ඩර් එකේ ඒ ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරපු ක්‍රියාමාර්ගයේ ඉඳලා වැරදියි කියලා අපි කෑ ගහද්දී, දෙසැම්බර් 30වැනි දා ඉඳලා ආපු නැව්වල අඩුපාඩු පෙන්වා දෙද්දී, මේ ඇමතිවරයා මෙතැන කිව්වේ මොකක්ද? "එහෙම ප්‍රශ්නයක් නැහැ, ඔක්කෝම හරි" කියලා එතුමා කිව්වා. ටික දවසක් ගිහිල්ලා, පළමුවැනි නැව ෆේල් කියපුවාම අපි ඩොලර් මිලියන 2.1ක් දඩ ගැහුවා කියලා කිව්වා. ඊට පස්සේ අපි කිව්වා, Cotecna report එක නොවෙයි, ඉන්දියානු report එක නොවෙයි, මේ ලක්විජය බලාගාරයේ real-time report එක අනුව උත්පාදනය වන විදුලි ජනනය තමයි පිළිගන්න ඕනෑ කියලා. ඒක පිළිගත්තේ නැහැ. ඊළඟට, නැව් පරක්කු වුණා. නැව් පරක්කු වෙනකොට, තුන්වැනි නැව විතර ආවාට පස්සේ අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ඇහුවා, මේ ටෙන්ඩර් එක cancel කරන්න පුළුවන් ද කියලා. බැහැ කිව්වා. එක ළඟ නැව් දෙකක් cancel වෙන්න ඕනෑ කියලා කිව්වා. අපි කිව්වා, "නැහැ, නැව් දෙකක් එක ළඟ cancel වෙන්න ඕනෑ නැහැ, නැව් දෙකක් cancel වීම ප්‍රමාණවත්" කියලා. ඒකත් ඇහුවේ නැහැ. ඊළඟට, දිගින් දිගටම ගල් අඟුරු ගෙනාවා. ඊට පස්සේ ප්‍රමාද ගාස්තු අය කළේ නැහැ. ප්‍රමාද ගාස්තු ගහනවා වෙනුවට, අප්‍රේල් 20වැනි දායින් පස්සේත් තව සතියක කාලයකට නැව් reschedule කරලා දුන්නා. අපි දිගින් දිගටම මේ දේවල් කියද්දී ආණ්ඩුව මේවා ඇහුවේ නැහැ.

මට මතකයි, විශේෂයෙන්ම හොරෙන් මේ හදිසි මිලදී ගැනීමක් දමපු එක ගැන අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඇහුවාම මේ ඇමතිවරයා කිව්වා, නැහැ එහෙම වැඩි වෙන ගාණක් කියලා එකක් නැහැ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා දැන් හදිසි මිලදී ගැනීම් නිසා රුපියල් මිලියන 4,200ක් - රුපියල් ලක්ෂ 42,000ක් - පාඩු වනවා. හේතුව, ගල් අඟුරු මෙට්‍රික් ටොන් එකක් ඩොලර් 98.50යි, මේ මෙට්‍රික් ටොන් එකක් දෙන්නේ ඩොලර් 142ට. ඒ වාගේ නැවක තිබෙනවා, ගල් අඟුරු මෙට්‍රික් ටොන් 60,000ක්; නැව් 5ට මෙට්‍රික් ටොන් ලක්ෂ 3යි; ඩොලර් මිලියන 13ක් - රුපියල් බිලියන 4.2ක්; රුපියල් මිලියන 4,200ක්; රුපියල් ලක්ෂ 42,000ක් - පාඩුයි. ඒකම ඇති, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් තව නඩුවක් දාලා හිරේ යවන්න.

ඊයේ රූපවාහිනී සංස්ථාවේ හිටපු සභාපතිවයි, අධ්‍යක්ෂ ජනරාල්වයි හිරේ දාලා තිබෙනවා, රුපියල් මිලියන 14ක case එකකට. ඒ, මුදල් නාස්ති කළා කියලා. නමුත් මේකේ එතැනම විතරක් නාස්ති කරලා තිබෙනවා, රුපියල් මිලියන 4,200ක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ජනවාරි මාසයේදී තුන්වන නැවත් fail වනකොට කිව්වා, මේ ටෙන්ඩර් එක cancel කරලා පුළුවන් නම් දෙවැනි, තුන්වැනි, හතරවෙනි, පස්වෙනි අය එක්ක සාකච්ඡා කරලා බලන්න, මේ ගාණට ගේන්න කියලා. හැබැයි, ඒ වෙලාවේ ඒක කරන්න බැහැ කිව්වා, ගණන් ගත්තේ නැහැ. දැන් බලන්න, ඊළඟ ටෙන්ඩරයේදී එහෙම කරයි. ඊළඟ ටෙන්ඩරයේදී lowest bidderට කෑල්ලක් දීලා ඊට පස්සේ බෙදලා දේවි. උද්ධච්චකමයි, මහන්තත්තකමයි හින්දා ඒක ඇහුවේ නැහැ. එදා මේ වංචාව සිද්ධ වුණු එක නවත්වා ගන්න තිබුණා, මේ අපි කියපු දේ අහලා ඒ යෝජනාව සලකා බලා මේ ටෙන්ඩර් එක නැව් තුනෙන් අහෝසි කරලා ඉතිරි අයට නැව් 5 බැගින් බෙදා දීලා තිබුණා නම්. එහෙම නම් අද වනකොට ප්‍රමිතියෙන් ඉහළ ගල් අඟුරුත් ඇවිල්ලා; විදුලිය කපන්න වෙන්නේත් නැහැ; විදුලි බිල වැඩි කරන්න වෙන්නේත් නැහැ; ඇමතිවරයාට චෝදනා එල්ල වෙන්නේත් නැහැ; ජනාධිපතිතුමාට ඇවිල්ලා හෝදන්නත් බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොච්චර හෝදන්න වුණාද කියනවා නම්, ගල් අඟුරු කාලා බලන්නේ නැහැ කියන කථාවක් ආවේගයත් එක්ක එතුමාගේ කටින් පිට වුණා. සාමාන්‍යයෙන් control එකක් ඇතුව කථා කරන ජනාධිපතිතුමාට වැරදිලා එහෙම දෙයක් කටින් පිට වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක දැක්කාම නම් මට හිතුණේ මේ වෙලාවේ වෙන ආණ්ඩුවක් ඉඳලා ජේවීපී එක විපක්ෂයේ හිටියා නම්, ගල් අඟුරු කාලා බලලා, මඩෙත් කාලා, ගල් අඟුරුවල ඇටයක් තිබෙනවා නම්, ඒ ඇටේ දිග පළලත් බලලා මේගොල්ලන් කියනවා. අර අසූචි නැව ගැන කිව්වේ එහෙම නේ, ගූ නැවක් කියලා. එහෙම නේ කිව්වේ. තෙල්වලදීත් එහෙම නේ කිව්වේ. මම සුල්තාන් කෙනෙක් නොවෙයි කියලා කිව්වා. හැබැයි, විපක්ෂයේ ඉන්නකොට කථා කළේ සුල්තාන්ලා වාගේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේවා අපි කියන ඒවා නොවෙයි. මේ විශේෂ විගණන වාර්තාවේ 6.2.1හි මෙසේ සඳහන් වනවා:

> "...ගල් අඟුරු තොගයෙහි ප්‍රමිතිය පිළිබඳව පාර්ලිමේන්තු අනුකමිටු තුළ හා සමාජය තුළ අභියෝගයට ලක්ව තිබියදී..."

මේ, අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී කියපු කථා ටික. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දිගින් දිගටම කිව්වා, umpire samples check කරන්න කියලා.

ඊළඟට, එම විගණන වාර්තාවේ 6.2.2හි මෙසේ සඳහන් වනවා:

> "මීට අමතරව විකුණුම්කරුගේ සහය ඇතිව ඉහත 5.5.1.1.1(ii) ඡේදයෙහි සඳහන් දෙවන සාම්පලය (Umpire Sample) පරීක්ෂා කිරීමට ලබා දී ඇති අවස්ථාව භාවිතා කිරීම තුළින් පවත්නා තත්ත්වය නිවැරදි කර ගැනීමට තවදුරටත් සමාගමට තිබූ අවස්ථාවද භාවිතා කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය."

කවුද? උත්තර දෙන්න කියන්නකෝ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේවා කිව්වා. මිලියනයක් supply කරලා තියෙන්න ඕනෑ එක ලක්ෂ 5ට අඩු කරලා තිබෙනවා. කිලෝ කැලරි 5,900ට වැඩි ගුණාත්මකභාවයක් තිබිය යුතු බවට වූ අත්දැකීම මෙට්‍රික් ටොන් ලක්ෂයට අඩු කරලා තිබෙනවා. ඒ වාගේම ඉන්දුනීසියානු සමාගමකට භාර දීලා තිබෙනවා, දකුණු අප්‍රිකාවේ වරායෙන් එන ගල් අඟුරුවල සාම්පල් චෙක් කරන්න. විගණන වාර්තාවේ තවදුරටත් මෙහෙම සඳහන් වනවා. මේ, අපි කියන ඒවා නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම විගණන වාර්තාවේ 6.2.3හි මෙසේ සඳහන් වනවා:

> "... Mitra SK South Africa (Pty) Ltd සමාගම මගින් නිකුත් කර ඇති බව නිරීක්ෂණය වූ අතර PT Mitra SK Analisa Testama Samarinda (Indonesia) සමාගම විසින් අත්සන් කරන ලද ගල් අඟුරු පරීක්ෂණ වාර්තා කිසිවක් විගණනයේදී නිරීක්ෂණය නොවිය."

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විගණන වාර්තාවේ 6.2.4හි තවදුරටත් මෙසේ සඳහන් වනවා:

> "...2026 මාර්තු 31 දින වන විටත් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි."

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

මේ මොකක්ද? සමාගමේ ප්‍රතීතන බලපත්‍රය. එහෙම samples check කරන්න ඒගොල්ලන්ට සුදුසුකම් තිබෙනවා කියන licence එකවත් ඉදිරිපත් කරලා නැහැ. මම දන්නේ නැහැ, අනිද්දාට මේ මාලිමාවේ මන්ත්‍රීවරුන්, ජේවීපී එකේ මන්ත්‍රීවරුන් මේ වාගේ පුද්ගලයෙක්ව හෝදන්නේ කොහොමද කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. S.M. Marikkar, you have two more minutes.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මට තව විනාඩි දෙකක් වැඩිපුර දෙනවා කිව්වා, විපක්ෂයේ ගරු සංවිධායකතුමා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම විගණන වාර්තාවේ 6.2.5හි මෙසේ සඳහන් වනවා:

> "...නැව් 12ක් අතුරින් නැව් 09ක (පළමු, නවවන හා දොළොස්වන නැව හැර) ගෙන එන ගල්අඟුරු ගොඩබෑමේ වරායේ දී (Unloading Port) බොහොමයක් පරාමිතීන් නියමිත ප්‍රමිතියට (සම්මත අගයන්ට) අනුකූල නොවුණද.... "

මේ ඔක්කෝම දේවල් අපි මීට මාස තුනකට පෙර කථා කරනකොට අපට හිනා වුණා. අපට කිව්වා, ඔයගොල්ලන් ඔක්කෝම දන්නවා නේ, ඔයගොල්ලන්ගේ ආණ්ඩු කාලයේ කොහොමද කළේ කියලා. එහෙම කියලා නේ ඔක්කෝම දන්න පොරවල් බලයට ආවේ. ඒ විතරක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විශේෂ විගණන වාර්තාවේ 6.3.1හි මෙසේ සඳහන් වනවා:

> "... මෙට්‍රික්ටොන් 500,000ක ප්‍රමාණයෙන් මෙට්‍රික්ටොන් 100,000ක් ප්‍රතික්ෂේපිත මට්ටම වූ 5,900 kcal/kg හෝ ඊට වැඩි ලෙස ඇතුළත් කිරීම හේතුවෙන් දළ තාපජනන අගය ප්‍රතික්ෂේපිත මට්ටම හෝ ඊට ආසන්න මට්ටමෙහි ගල්අඟුරු සපයා පළපුරුද්ද ඇති සැපයුම්කරුවන්ටද මෙම බලාගාරය සඳහා ගල්අඟුරු සැපයීමට අවස්ථාව සලසා දී ඇති බව නිරීක්ෂණය විය."

අපි කිව්වා, මේ 500,000ක ප්‍රමාණය 100,000ට අඩු වුණාම මේ වාගේ හොර කොම්පැනිවලට, තක්කඩි කොම්පැනිවලට මේ සඳහා ඇතුළු වන්න හිතමතාම අවස්ථාව දීමක් වනවා කියලා. අපි කියපු ඒවා තමයි මේ විගණනයේදී ඔප්පු වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. අපි කිව්වා, ටෙන්ඩර් කැඳවීමේ කාල සීමාව දින 42 ඉඳලා 21ට අඩු කළාම පිළිගත්, අත්දැකීම් තිබෙන සහ මීට පෙර supply කරලා තිබෙන සමාගම්වලට මේකට එන්න තිබෙන අවස්ථාව නැති කිරීමක් වෙන්නේ කියලා. දැන් ඒකත් ඔප්පු වෙලා තිබෙන්නේ. මම දන්නේ නැහැ, ටයි කෝට් නොවෙයි, සරමක් හරි දාගෙන මෙතැන ඉන්නේ කොහොමද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නැව් 5ක විතර ප්‍රමාද ගාස්තුව ඩොලර් 445,000යි. නැව් 18ට ඩොලර් මිලියන දෙකක් විතර අය කරගන්න ඕනෑ. තෙල් මිල වැඩි වෙන්න කලින් නැව් 9කින් ගෙනා බාල ගල් අඟුරු නිසා වූ වංචාව රුපියල් මිලියන 8,475යි. තෙල් මිල වැඩි වුණාම ඒකේ ගාණ රුපියල් මිලියන 11,000ක් කියලා අපි හිතනවා. එතකොට නැව් 18 පාඩුව රුපියල් මිලියන 22,000යි; ඩොලර් මිලියන දෙකයි. ඊළඟට, හදිසි මිලදී ගැනීම් නිසා සිදු වන පාඩුව රුපියල් මිලියන 4,000යි. මහ බැංකු බැඳුම්කර මංකොල්ලය වාගේ තුන් ගුණයක් මේකෙන් ගහලා තිබෙන්නේ. තුන් ගුණයකට වැඩියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන ඇවිල්ලා ෂේප් කරලා, අපි එහෙම හොරකම් කරන්නේ නැහැ, අපි එහෙම කරලා නැහැ කියලා කථා කරලා බේරාගන්න පුළුවන් වැඩක් නොවෙයි මේක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම තව එකක් කියන්න ඕනෑ. සුදුසුකම් නොලබපු සමාගමකට දැන් spot tender එකක් දෙන්න යනවා, දකුණු අප්‍රිකාවෙන්ම ගෙනෙන්න.

මේ විශේෂ විගණන වාර්තාවේ පිටු අංක 104, 6.3.4හි මෙසේ සඳහන් වනවා:

> "තවද, මෙම ප්‍රසම්පාදනය සඳහා තෝරා ගන්නා ලද සැපයුම්කරු වූ Trident Chemphar Limited හැරුණු විට 2023 වර්ෂයේ ලියාපදිංචි කරන ලද හා 2025/2026 කාලපරිච්ඡේදය සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලද සැපයුම්කරුවෙකු වූ Taranjot Resource (pvt) Ltd. සමාගම සැපයුම්කරු ලියාපදිංචිය සඳහා සලකා බලන ලද මාස 36ක කාලය තුළ සපයා තිබුණු ගල් අඟුරු මෙ.ටො. 1,115,900ක ප්‍රමාණයෙහිම, දළ තාපජනන අගය (GCV) 5,900 kcal/kg ක ප්‍රතික්ෂේපිත මට්ටමටද පහළ අගයන් ගෙන තිබුණු බව ඉහත 5.4.3.2.1 (v) ඡේදය අනුව නිරීක්ෂණය විය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අලි මදිවට කොටි කිව්වලු නේ. බලන්න, එක හොරකමක් වහගන්න ගියාම තව හොරකමක් එළියට එන විදිය. පැලවත්ත කාර්යාලයෙන් ලියා දෙන කොළය අරගෙන මෙතැනට ඇවිල්ලා සාරාංශගතව "ටෝක්" එක දුන්නාට, වැඩේ කරන්න ගියාම තිබෙන අමාරුව බලන්න. ඒ, නොහැකියාව, පළපුරුද්ද නැතිකම වාගේම වංචාවත් මේකෙන් තහවුරු වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. S.M. Marikkar, you have exhausted your additional two minutes.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අපි පැහැදිලිව කියන්න කැමැතියි, මේ ගල් අඟුරු case එක එන තෙක් ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා යමක් කිව්වාම, මේ රටේ ජනතාවට ජනාධිපතිතුමා ගැන යම් විශ්වාසයක් තිබුණු බව. මේ වැඩෙන් වුණේ ජනාධිපතිතුමාගේ මුහුණට ගල් අඟුරු දැලි ගාලා, චූටිං ගම් එකක් වාගේ බාල ගල් අඟුරු අලවලා, එතුමාව "අඟුරු කුමාර" කියන තැනට පත් කරලා තිබෙන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාලිමාවේ 150දෙනාගෙන් ඉතිරි 149 පව් කියලා හිතෙනවා. මේ එක්කෙනෙක්, දෙන්නෙක් හින්දා තමයි මේ ටොපිය කන්නේ.

කෙහෙළිය රඹුක්වැල්ල කියනවා ඇති, මම විදලා බලලාද ඉන්ජෙක්ෂන් ගෙනාවේ, මම බීලා බලලාද බෙහෙත් ගෙනාවේ කියලා. එතකොට ඒකට දෙන උත්තරය මොකක්ද? කෙහෙළිය රඹුක්වැල්ල බාල බෙහෙත් ගෙනෙනකොට මෙතැන JVP එකේ තුන් දෙනෙක් හිටියා. එක්කෙනෙක්වත් ඉදිරිපත් වුණේ නැහැ, විශ්වාස භංගය ගෙනෙන්න. සමගි ජන බලවේගයේ අපි තමයි එය ගෙනාවේ. ඒ වෙලාවේ හරිනි අමරසූරිය මැතිනිය මොකක්ද කිව්වේ? "හෘදය සාක්ෂිය කියලා දෙයක් පොඩ්ඩක් හරි තිබෙනවා නම් මේ වාගේ බාල බෙහෙත් ගෙනැල්ලා මිනී මරනකොට පක්ෂ දේශපාලනය අමතක කරලා තමන්ගේ ඡන්දය පාවිච්චි කරන එක ගැන හිතලා බලන්න" කිව්වා. මම අහනවා, කෝ, ඒ හෘදය සාක්ෂිය කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Yes, I am going to wind up, Sir.

කෝ, ඒ හෘදය සාක්ෂිය? ඒ හෘදය සාක්ෂිය නැහැ. ඒ හෘදය සාක්ෂිය නැහැ. අපට අනිද්දාට බලාගන්න පුළුවන්, ඒ හෘදය සාක්ෂිය විකුණලා, ඒ හෘදය සාක්ෂිය පාවා දීලා, ඒ හෘදය සාක්ෂිය විනාශ කරලා හැසිරෙන විධිය. රෝහණ විජේවීර මහත්තයා ඉන්න තැනක ඉඳලා බලලා ඉතාම කේන්තියෙන් බණිනවා ඇති, "තොපි, මේ මොකක්ද කරන්නේ?" කියලා. ජනතා විමුක්ති පෙරමුණේ ඉතුරු වෙලා ඉන්න අයගෙන් අපි මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරන්න කැමැතියි. අඩුම ගණනේ ඔබතුමන්ලාගේ නායකයා වන රෝහණ විජේවීර මැතිතුමා ගැන හිතලා හරි මේ පාදඩකමට, තක්කඩිකමට, හොරකමට, වංචාවට එරෙහිව කටයුතු කරන්න කොන්ද පණ තබා ගන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.12]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ හෘදය සාක්ෂිය පිළිබඳව බොහොම හැඟීමකින් කථා කරනවා මට ඇහුණා. අපි හෘදය සාක්ෂියක් තිබෙන පක්ෂයක් තමයි; අපි හෘදය සාක්ෂිය අනුව වැඩ කරන පක්ෂයක් තමයි. ඒ හෘදය සාක්ෂිය උපදින්නේ ජනතාව ජීවත් කරවීමේ වුවමනාවෙන්. ඒ නිසා තමයි ඊයේ ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා රුපියල් කෝටි 10,000ක පැකේජයක් අපේ රටේ ඉතාම පහළ ජීවන තත්ත්වයක් උරුම කරගෙන ඉන්න අඩු ආදායම්ලාභී සහ අස්වැසුම ප්‍රතිලාභය ලබන ජනතාව වෙනුවෙන් නිදහස් කළේ. අපි ජීවන වියදම ඉහළ යෑම පාලනය කරගෙන තිබෙනවා, තවම උද්ධමනය සියයට 5ක වාගේ අඩු මට්ටමක තබාගෙන. මේකයි යථාර්ථය. වෙනත් සංඛ්‍යාලේඛන ගෙනාවාට, බොරු කිව්වාට, ජනතාවට පුණක්කු දෙනවා කිව්වාට ජනතාව පුණක්කු බොන්න සූදානම් නැහැ කියන එක මම කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජනතාවට පුණක්කු පොවන්න ලැහැස්ති වෙච්ච කට්ටියට මොකක්ද වෙලා තිබෙන්නේ? විපක්ෂයේ සමහර පක්ෂ අවලංගු වෙලා තිබෙනවා, සමහර පක්ෂ කුණු කූඩයට ගිහිල්ලා තිබෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ දේශපාලනය කරලා ජනතාව හරක් කියලා හිතාගෙන පුණක්කු පොවන්න ගියපු එකට උත්තරයක් විධියට ඔවුන් කතිරයෙන් වාගේම ස්වකීය පරමාධිපත්‍ය බලය පාවිච්චි කරලා, ජාතික ජන බලවේගය විධියට ජනතා නියෝජිතයන් 159දෙනෙක් පාර්ලිමේන්තුවට එවලා තිබෙනවා. ඒ, පුණක්කු බීපු නිසා නොවෙයි, ඔවුන්ට හෘදය සාක්ෂියක් සහ අපි කරපු කැපවීම් පිළිබඳව අවබෝධයක් සහ හැඟීමක් තිබෙන නිසායි. අපි සියයට 3ක තමයි හිටියේ. ඒක ඇත්ත. ආසන තිබුණේ තුනයි. අපිට කවදාවත් සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ දිනන්න බැහැ කියලා ජේ.ආර්. ජයවර්ධන මහත්මයා කියපු සියලු වාර්තා කඩලා ආසන 159ක් දිනාගෙන අපි ජනාධිපතිවරයෙක් බිහි කර ගත්තා. මේ, මොකක්ද කියන්නේ? මේක තමයි ජනතාවගේ හෘදය සාක්ෂිය එළියට දමපු අවස්ථාව. ඒ අනුව අපි "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ වරින් වර ආධාර ප්‍රමාණයක් මුදා හැරියා. අපි රුපියල් 25,000 ගණනේ, රුපියල් 50,000 ගණනේ සියයට 90කට වඩා ගෙවීම් කරලා තිබෙනවා. ඒක ජනතාව දන්නවා. ජනතාව විපත්තියට පත් සෑම අවස්ථාවකදීම මුදල් අමාත්‍යවරයා විධියට ගරු ජනාධිපතිතුමා - එතුමා අර්බුද කළමනාකරණය කිරීමේ සමතෙක් - සහ එතුමා වටා ඉන්න අමාත්‍ය මණ්ඩලය ඒ වෙනුවෙන් දිවා රෑ නොබලා කැපවීමෙන් යුතුව කටයුතු කරන බව ජනතාව දන්නවා.

අපි බලාපොරොත්තු වෙනවා, මේ දෙසතියක යුද විරාමය තවත් දීර්ඝ වෙයි කියලා. මේ යුද වාතාවරණය නිර්මාණය වෙනකොට, මේ අර්බුදය පැතිරී යනකොට අපි රුසියාව, ඉන්දියාව, චීනය ඇතුළු මිතුරු රටවල් එක්ක ඉන්ධන සැපයුම් දාමය ශක්තිමත් කරන්න කථා කළා. ඒ සාකච්ඡා සාර්ථකයි. කෙටි කාලයක් තුළ රුසියානු නායකයෝ කී දෙනෙක් නම් ලංකාවට ආවාද? ඒ එක්කම ඉන්දියාව, චීනය අපේ සැපයුම් දාම ශක්තිමත් කරන්න සූදානම්. අපි කරගෙන ගිය කිසිම කටයුත්තක් අතරමඟ නතර කළේ නැහැ, මේ ජාත්‍යන්තර අර්බුදයත් එක්ක, ඉන්ධන හිඟයක් ඇති වේ යැයි කියන හුඹස් බියත් එක්ක. අපි සූදානම් වෙන්නේ සියලු කටයුතු ඉදිරියට කරගෙන යමින් ශක්තිමත් ආර්ථික කළමනාකාරිත්වයක් ඇති කරන්න වාගේම ආර්ථිකයට වන බලපෑම අවම කරන්නයි. ඒකට හොඳම සාක්ෂිය තමයි අද දවස. අපි ඉකුත් බදාදා නිවාඩු දුන්නා, ඉන්ධන කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව මත. හැබැයි, අපි මේ බදාදා ඒ නිවාඩුව අවලංගු කළා. අපි දෙමාසයකට ශක්තිමත්ව ඉන්ධන සම්පාදනය කරන්න සූදානම්.

තව කාරණයක් මම මේ අවස්ථාවේදී අවධාරණය කරන්න ඕනෑ. අද අප්‍රේල් මාසයේ 08වැනි දා. පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළ අලුතින් පණ ලබා, නවීකරණය වෙලා අද දිනයේදී ජනතා අයිතියට පත් වනවා. පිටකොටුව බස් ස්ටෑන්ඩ් එක කිව්වාම අපේ ඔළුවේ මැවෙන චිත්‍රයක් තිබෙනවා. ඒ චිත්‍රය කිසිසේත්ම ප්‍රසන්න එකක් නොවෙයි; එය අප්‍රසන්නයි; ප්‍රියමනාප නැහැ. දැන් යන්න, පිටකොටුව බස් සටෑන්ඩ් එකට. දැන් එය ප්‍රියමනාප ස්ථානයක් විතරක් නොවෙයි, අපි වාගේ ආබාධ සහිත ප්‍රජාවට ස්වකීය අවශ්‍යතා ඉෂ්ට කර ගන්නත් යටිතල පහසුකම් නිර්මාණය වෙලා තිබෙන තැනක්. ඒ අනුව බිහිරි ප්‍රජාවට සංඥා භාෂාවෙන් රූපමය ඩිජිටල් තිර හරහා අවශ්‍ය තොරතුරු දැන ගන්න, ටැක්ටයිල් අල්ලලා සුදු සැරයටියෙන් යන අයට පාර හොයා ගන්න, තමන්ගේ ගමන් පහසුව සලසා ගන්න පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ වාගේ විශාල වැඩ පිළිවෙළක් දියත් වෙලා, අද එය ජනතා අයිතියට පත් වන දවස. මේ සම්බන්ධයෙන් කටයුතු කරපු Clean Sri Lanka කණ්ඩායමට අපි ස්තුතිවන්ත වෙනවා. අපි ඒ අයට ස්තුතිවන්ත වෙන්නේ ඇයි? පණ අතේ තියාගෙන තමයි බසයකට ගොඩ වෙන්න කොටුවට අපි ගියේ. ඒ වාගේම මඩ වගුරේ බැහැගෙන තමයි බසයකට ගොඩ වෙන්න අපි කොටුවට ගියේ. ආබාධිත වුණත්, නැතත් ඒ අම්හිරි අත්දැකීම විඳින්න අපට සිද්ධ වුණා.

අපි මේකෙන් බලාපොරොත්තු වෙන්නේ අපේ ප්‍රවාහන පද්ධතිය පියවරෙන් පියවර ඉදිරියට ගෙනියන්න මඟී කේන්ද්‍රීය ප්‍රවාහන පද්ධතියක් ගොඩනැඟීමයි. මඟී කේන්ද්‍රීය වුණාම ඒ මඟියා ආබාධ සහිත පුද්ගලයෙක් වෙන්න පුළුවන්; වැඩිහිටියෙක් වෙන්න පුළුවන්; ගර්භිණී කාන්තාවක් වෙන්න පුළුවන්; තාවකාලික අබල-දුබලතාවකට, ආබාධිත තත්ත්වයකට, රෝගී

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

තත්ත්වයකට පත් වුණු කෙනෙක් වෙන්න පුළුවන්. හැබැයි, ඔවුන්ටත් පුළුවන්කම ලැබෙනවා, තමන්ගේ ප්‍රවාහන අයිතිය තහවුරු කර ගන්න; සංචලනයේ අයිතිය තහවුරු කර ගන්න; තමන්ගේ වුවමනාව ඉෂ්ට සිද්ධ කර ගන්න. මෙවැනි බස් නැවතුම්පොළවල් ඉදි වෙනවා වාගේම පතුල පහත් බස් රථ 10කුත් අපි ගෙන්වලා තිබෙනවා. මේ පතුල පහත් බස් රථ සම්බන්ධයෙන් විශාල අඩ ඇඬියාවක්, කන්දොස්කිරියාවක්, කෙදිරිගෑමක්, ගෙරවිල්ලක් පසුගිය දවසක ජනමාධ්‍ය හරහා අපට අහන්න ලැබුණා. බස්වලට අධිපති ගැමුණු තමයි මේක ප්‍රකාශයට පත් කළේ. ඔහු කියනවා, ලංකාවේ ඉන්නේ ආබාධිතයෝ සියයට එකයි කියලා. සන්තෝෂයි, එහෙම නම්. නැහැ, සියයට 8.7ක් ඉන්නවා ලු. ඔව්, සියයට 8.7ක් ඉන්නවා. පතුල පහත් බස් රථ නැතුව ආබාධිතයන් මෙච්චර කල් ගියේ කොහොමද කියලා ඔහු අහනවා. ඒක ඇත්ත තමයි. අපි මිනිස්සුන්ගේ කරපිටින් ගියා. රෝද පුටුව දමා ගන්න බැරි නිසා ආබාධ සහිත කණ්ඩායම් අත්හැරලා බස් රථ ගිහිල්ලා තිබෙනවා. ඒ මිනිස්සු යන බස් එක දැක දැක රෝද පුටුවට වෙලා හිටියා. රෝද පුටුවෙන් යන දඹුල්ලේ අපි දන්න උගත් සහෝදරයෙක් මේ පාර්ලිමේන්තුවේදීම අඩ අඩ කිව්වා මට මතකයි, "මට ඇස් පේන්නේ නැහැ, මාව දාලා බස් එක ගියා" කියලා. ඒ මනුස්සයා ඒක කිව්වේ ඇස්වල කඳුළු පුරවාගෙන, කඳුළු හළමින්. "මම දැක්කා, ඒ කඳුළු අස්සෙන් මට කෝච්චෝක් කරගෙන බස් එක යනවා" කියලා ඔහු කිව්වා. අන්න ඒ වාගේ ප්‍රවාහන සේවයක් තමයි පසුගිය කාලයේ අපේ රටේ තිබුණේ. ඒ වාගේ ප්‍රවාහන සේවයක් අපි සදාකාලිකව වැළඳ ගත යුතුද? නැහැ. මම විශ්වාස කරනවා, ලක්ෂ 16කට අධික ආබාධිත ජනතාවටත්, වැඩිහිටියන්ටත්, ගර්භිණී මවුවරුන් ඇතුළු කෙටි කාලීන ආබාධ තත්ත්වයන්වලින් පෙළෙන කණ්ඩායම්වලටත් රෝද පුටුවේ සිටිමින් ස්වකීය අභිමානය රැකගෙන මේ පතුල පහත් බස් රථ පාවිච්චි කරලා ඒ හරහා තමන්ගේ ප්‍රවාහන අයිතිය තහවුරු කර ගන්න අපි ඉඩක් දිය යුතුයි කියලා.

ඒ උත්සාහය අගය කරන ගමන්ම, පතුල පහළ බස් රථ ක්‍රමවේදය ආරක්ෂා කරන්න SLTB එකට අනුබද්ධ මෙට්‍රෝ සමාගම ආරක්ෂා කරන්න කියලාත් කියනවා. ඒ සමාගමෙන් ආබාධ සහිත කණ්ඩායම්වලට ලැබෙන ප්‍රවාහන පහසුව ලබා ගන්න ගමන්ම ඒ ක්‍රමය ආරක්ෂා කරන්න. දියුණු ප්‍රවාහන පද්ධතියක් උරුම කර ගන්න තිබෙන අයිතියට විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු කිසිම කෙනෙකු විරුද්ධ වෙයි කියලා මම හිතන්නේ නැහැ. මොකද, ඔවුන් දන්නවා, ආබාධ සහිත කණ්ඩායම් පාරට එන්නේ නැත්තේ ප්‍රවාහන පද්ධතියේ තිබෙන ගැටලු නිසා කියලා. ඒක ගැමුණුට තේරෙන්නේ නැහැ. ලොරි බස්වලින් මිනිස්සු පොල් පටවාගෙන යනවා වාගේ ක්‍රමයකට තමයි ගැමුණු කැමැති. ඔහු ෂයිලොක් ගණයේ බස් නායකයෙක්. ඔහුට ඕනෑ පර්ස් එක විතරයි. ඔහු කොච්චර අකාරුණික සහ ශ්‍රම සූරා කන්නෙක් ද කියන එක පැහැදිලි වනවා, ඔහුගේම සේවකයන් වන බස් රථ රියැදුරන්ට, කොන්දොස්තරවරුන්ට EPF, ETF නොගෙවීමෙන්. ඇයි මේවා හොයා බලන්නේ නැත්තේ කියන ප්‍රශ්නය ගරු සභාව ඉදිරියේ තිබෙනවා.

ඒ ශ්‍රම සූරා කෑම කරන ගමන්ම ඔහු අභියෝග කරමින් කියනවා, පෞද්ගලික සමාගමක් විදියට ගොඩ නඟපු මේ සමාගමට රාජ්‍ය භාණ්ඩාගාරයෙන් සල්ලි දෙන එක වැරදියිලු. ඒ වාගේම මලෙයහම් ජනතාවගේ දෛනික වැටුපට රුපියල් 200ක් ආණ්ඩුව ගාණේ ගෙවන එක වැරදියිලු. ඇත්ත තමයි, ශ්‍රමයේ වටිනාකමක් නොදන්න, මගියාගේ වටිනාකමක් නොදන්න, රුපියල් ශත විතරක් දන්නා, "උම්බෑ" කියන මේ වාගේ බස් හිමියන් නිසා තමයි ප්‍රවාහන පද්ධතිය මස්තබාල්දු වෙලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ඒකෙන් ප්‍රවාහන පද්ධතිය ගලවා ගෙන දියුණු ප්‍රවාහන පද්ධතියකට යැමටත්, එහි අයිතිය සහ වටිනාකම ආබාධ සහිත ජනතාව ඇතුළු ප්‍රවාහන පහසුකම් බුක්ති විඳින සමස්ත ශ්‍රී ලාංකීය කණ්ඩායම්වලට අද හෙටම ලැබේවා කියා ප්‍රාර්ථනා එක් කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Dilip Wedaarachchi. You have 12 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 2.24]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතැන් සිට වෙලාව ගන්න ඔබතුමියගෙන් අවසරයි. අද රටේ වර්තමාන තත්ත්වය පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. රටේ වර්තමාන තත්ත්වය බැලුවොත්, ජනතාවට ජීවත් වෙන්න බැරුව ඉතා අමාරු තත්ත්වයකට වැටිලා තිබෙනවා. තෙල් මිල වැඩි වීම තුළින් මේ රටේ සෑම ක්ෂේත්‍රයකම ජනතාව ජීවත් වෙන්න බැරුව අසරණ තත්ත්වයකට ඇද වැටිලා තිබෙනවා. මිනිසුන් අසරණ තත්ත්වයට වැටුණු නිසා අද ඔවුන් ජීවත් වෙන්නේ කොහොමද කියලා කල්පනා කරනවා.

ඊයේ දවසේ ගරු ජනාධිපතිතුමා මේ සභාවට පැමිණිලා සහන රැසක් ලබා දුන්නා; රුපියල් කෝටි 10,000ක සහන පැකේජයක් ඉදිරිපත් කළා. ගොවියාට පොහොර සහනාධාරය රුපියල් 5,000කින් වැඩි කළා. අස්වැසුම වැඩසටහන යටතේ ලබා දෙන රුපියල් 5,000ක දීමනාව රුපියල් 7,500 දක්වා වැඩි කළා. ඔය ආකාරයෙන් සහන ලබා දීමේ වැඩ පිළිවෙළක් එතුමා ඉදිරිපත් කළා.

ඒ වාගේම ධීවර කර්මාන්තයටත් එතුමා යම් සහන ලබා දුන්නා. ගරු ජනාධිපතිතුමා මගේ නම කියලාම කිව්වා, ධීවර කර්මාන්තයෙහි නියැළෙන බහුදින යාත්‍රා හිමියන්ට රුපියල් ලක්ෂ

එකහමාරක් වැඩි කරනවා කියලා. මට බොහොම සතුටුයි මගේ නම කියලාම කිව්වාට. ඊට පස්සේ පොඩි බෝට්ටු හිමියන්ට ලාම්පු තෙල් ලීටරයකට රුපියල් 50ක සහනාධාරයක් ලබා දුන්නා. බහුදින ධීවර යාත්‍රා හිමියන්ට trip එකකට - මාසයකට යන trip එකකට - රුපියල් ලක්ෂ එකහමාරක තෙල් සහන පැකේජයක් ලබා දෙන බව කිව්වා. ගරු ධීවර ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්න එක හොඳයි. මම මේ වෙලාවේ මේ කාරණයත් අහන්න කැමැතියි. බහුදින ධීවර යාත්‍රා 7,000කට ආසන්න ප්‍රමාණයක් අපේ රටේ ධීවර කර්මාන්තය කරනවා. ඒ 7,000න් 1,600ක් වුනා - කෙලවල්ලෝ - කර්මාන්තය කරන්නේ; export කරන කර්මාන්තය කරන්නේ. අනෙක් බෝට්ටු, coarse කර්මාන්තය සහ දැල් කර්මාන්තය කරන්නේ. මේ coarse කර්මාන්තය සහ දැල් කර්මාන්තය කරන බෝට්ටුවලට එක trip එකකට තෙල් ලීටර් 4,000ක්, 5,000ක්, 6,000ක් යනවා. එතකොට කෙලවල්ලෝ කර්මාන්තය කරන බෝට්ටු මාස එකහමාරක දෙකක trip එකක් යන්නේ. ඒ බෝට්ටුවලට තෙල් ලීටර් 10,000ක් 11,000ක් ගහනවා. හරි නේද ඇමතිතුමා? එතකොට, මම අහන ප්‍රශ්නය මේකයි. එක trip එකකට තෙල් ලීටර් 10,000යි කියමුකෝ. පෙබරවාරි මාසයේ තෙල් ලීටරයක් රුපියල් 272යි. පෙබරවාරි මාසයේ මිල වැඩි කළාම තෙල් ලීටරය රුපියල් 382ට ගියා. පෙබරවාරි මාසයේ ඉඳලා අප්‍රේල් මාසය දක්වා අපට තෙල් සංචිත තිබෙනවා, ඒ තෙල් සංචිතයේ මිල අප්‍රේල් මාසය වෙනකම් වැඩි කරන්නේ නැහැයි කිව්වා. වැඩි කරන්නේ නැහැයි කියපු ඒ තෙල් ලීටරය පෙබරවාරි මාසයේ ඉඳලා අප්‍රේල් මාසය වෙනකොට රුපියල් 110කින් වැඩි වෙනවා. හරි නේද ඇමතිතුමා? බහුදින යාත්‍රාවකට එක trip එකකට යන තෙල් ලීටර් ප්‍රමාණය 10,000යි. එතකොට 110 ඒවා 10,000ක් කීයද? ලක්ෂ 11යි. බහුදින යාත්‍රාවක එක trip එකකින් මේ ආණ්ඩුව ලක්ෂ 11ක් හම්බ කරනවා. එතකොට ඒ ලක්ෂ 11න් ලක්ෂ එකහමාරක තෙල් සහන පැකේජයක් ධීවරයාට දීලා ලක්ෂ නවයහමාරක් ඒ අහිංසක ධීවරයාගෙන් මේ මාස දෙක තුළ හොරකම් කළා කියන එක මම මේ සභාවේදී ප්‍රකාශ කරනවා. ඒක කාටවත් නැහැයි කියන්න බැහැ. මේ පැකේජයෙන් දුන්නු කෝටි 10,000 එක්කහු කරලා තිබෙන්නේ බහුදින ධීවර යාත්‍රා හිමියන් පාවිච්චි කරන තෙල් ලීටර් ප්‍රමාණයෙන්. තෙල් ලීටර් 10,000කින් ලක්ෂ 11ක් හොරකම් කරලා අරගෙන, ඒ වැඩි කළ මුදල අරගෙන ලක්ෂ එකහමාරක් දෙනකොට ලක්ෂ නවයහමාරක් රජයට ලාභයි. රජය මේ විධියට හරි හම්බ කරලා ධීවරයාගේ දහඩිය මහන්සිය හොරා කනවා.

මම ඊයේම point of Order එකක් ආලා ජනාධිපතිතුමාගේ කථාව වෙලාවේ කථා කරනවා, නමුත් ජනාධිපතිවරයාට ගරු කරන්න ඕනෑ නේ. ජනාධිපතිවරයා මගේ නම කිව්ව නිසා මම කථා කළේ නැහැ. මම ජනාධිපතිතුමාට කියනවා මේ රැවටිල්ල කරන්න එපා කියලා. රටේ ධීවර ජනතාවට කියනවා මේක මහා බොරුවක්, මුසාවක්, බොරු රැවටිල්ලක් කියලා. ධීවර කර්මාන්තය කරන ධීවරයාගේ තෙල් මිල රුපියල් 110කින් වැඩි කරලා එයින් බහුදින යාත්‍රා හිමියන්ගේ එක trip එකකට යන තෙල් ලීටර් 10,000න් ලක්ෂ 11ක් හම්බ කරලා, ඒ ධීවරයාට ලක්ෂ එකහමාරක තෙල් පැකේජයක් ලබා දීලා ලක්ෂ නවයහමාරක් හම්බ කරන ආණ්ඩුවක් තමයි මේ. මේ විධියට බෝට්ටු 7,000කින් පෙබරවාරි, මාර්තු, අප්‍රේල් වෙනකම් හම්බ කරනවා. ඒ විධියට හම්බ කරලායි ධීවරයාට මේ සහනය දෙන්නේ. රැවටෙන්න එපා, රැවටුණු කාලය ඉවරයි කියලා රටේ සියලු ධීවර ජනතාවට මම කියන්න කැමැතියි.

ජනාධිපතිතුමා දැන් පොඩි බෝට්ටුවකට ලාම්පු තෙල් ලීටරයකට රුපියල් 50ක සහනාධාරයක් දෙනවා නම් බහුදින යාත්‍රාවලටත් තෙල් ලීටරයකට රුපියල් 50ක සහනාධාරයක් දෙන්න. අන්න ඒක සාධාරණයි. මේකෙදි අසාධාරණ විධියට හොරා කාලා ධීවරයාට සොච්චමක් දෙනවා. ඒක හරි නැහැ, ඒක වැරිදියි. ධීවරයෝ මෝඩයෝ නොවෙයි, අපි මෝඩයෝ නොවෙයි. නම කියනකොට මම හිතුවා වැඩක් දෙන්න තමයි හදන්නේ කියලා. ජනාධිපතිතුමනි, ධීවරයින් රවට්ටන්න එපා. ඇමතිතුමනි, හෙටම ගිහිල්ලා ජනාධිපතිතුමා එක්ක මේ ගැන කථා කරලා ප්‍රශ්නය විසඳන්න. ඔබතුමා ධීවර ඇමතිතුමා හැටියට තෙල් ලීටරයකට රුපියල් 50 බැගින් සහනාධාරයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්න කියන ඉල්ලීම මම කරනවා.

මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. රටේ වර්තමාන තත්ත්වය ගැන, එක එක වංචා, දූෂණ ගැන අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා සහ අනෙකුත් මන්ත්‍රීතුමන්ලා කථා කළා. මම කථා කරන්න කැමැතියි හම්බන්තොට දිස්ත්‍රික්කය ගැන. අද අපේ හම්බන්තොට දිස්ත්‍රික්කය දේශපාලනීකරණය වෙලා තිබෙන්නේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආයතන, ප්‍රාදේශීය සභා, නගර සභා, ප්‍රාදේශීය කාර්යාල, පොලිසිවල ඇතැම් නිලධාරින් දේශපාලනයට ලක් වෙලා තිබෙන්නේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මැති ඇමතිවරු ජේවීපී එකයි, එන්පීපී එකයි ලෙස දෙකට බෙදීම නිසා අද ලොකු ප්‍රශ්නවලට මුහුණ පාන්න සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයේ නගරවල වෙළෙඳ ව්‍යාපාරිකයන් අද අසරණ තත්ත්වයට පත් වෙලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තංගල්ල නගර සභාවට අයත් නගරවල අවුරුදු ප්‍රචාරක කටයුතු කරනවා. ඒ සම්බන්ධයෙන් තිබෙන ලිපි ලේඛන කිහිපයක් මම **සභාගත*** කරනවා.

අවුරුදු එනකොට අප්‍රේල් 01වෙනි දා ඉඳලා අප්‍රේල් 12වෙනි දා විතර වෙනකම් සෑම නගරයකම ප්‍රචාරක කටයුතු කරනවා. නගර සභාවෙන් හෝ ප්‍රාදේශීය සභාවෙන් ඒ කටයුතුවලට බලපත්‍ර ලබා දෙනවා, නගර සභාවට හෝ ප්‍රාදේශීය සභාවට යම් මුදලක් අය කරගෙන.

2021 වර්ෂයේ ඉඳලා මෙතෙක් කල් තංගල්ල නගරයේ අවුරුදු ප්‍රචාරණ කටයුතු තංගල්ල වෙළඳ සංගමයටයි දුන්නේ. තංගල්ල වෙළෙඳ සංගමය කියන්නේ, අවුරුදු 25ක සිට ලියාපදිංචි වෙළෙඳ සංගමයක්. ඒක මම නගරාධිපතිවරයා විධියට හිටපු කාලයේ ආරම්භ කරපු වෙළෙඳ සංගමයක්. ඒ වෙළෙඳ සංගමයට තමයි, 2021 ඉඳලා ඒ අවුරුදු ප්‍රචාරණ කටයුත්ත කරන්න අවස්ථාව ලබා දුන්නේ. නමුත්, මෙදා පාර එය ඒ අයට ලබා නොදෙන්න කටයුතු කළා. එය ඒ අයට නොදෙන්න කටයුතු කරලා තිබෙන්නේ ඇයි? එය ජනතා විමුක්ති පෙරමුණේ පාලනය සහිත නගර සභාවක්. ඒ නගර සභාවෙන් ඉල්ලීම් කළාම, ටෙන්ඩර් දමන්න ඕනෑ කිව්වා. ඒ අනුව ටෙන්ඩර් කළා. ටෙන්ඩර් කළාට පස්සේ ඒ ටෙන්ඩර් එක වැඩි මුදලකට - රුපියල් 610,000කට - තංගල්ල වෙළඳ සංගමය ලබා ගත්තා. ඊට පස්සේ වැඩ බලන නගරාධිපතිවරයා කිව්වා, "නැහැ, මේක ටෙන්ඩර් පටිපාටිය අනුව කරන්න ඕනෑ" කියලා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ බහුතරයක් තංගල්ල වෙළඳ සංගමයට මෙය ලබා දෙන්න කියලා කිව්වා. නමුත්, ඒක නැවත වතාවක් ටෙන්ඩර් කරන්න ඕනෑ කිව්වා. නැවත වතාවක් ටෙන්ඩර් කළාම, තංගල්ල වෙළඳ සංගමය රුපියල් 610,000කට ඒක ගත්තා. ඊට පසුව රුපියල් 610,000ක් තංගල්ල නගර සභාවට බැඳලා තිබෙනවා. ඒ රිසිට්පත් ඔක්කොම මෙතැන තිබෙනවා.

පොලිසියට රුපියල් 10,000ක් බැඳලා ඒ රිසිට්පතත් අරගෙන සහකාර පොලිස් අධිකාරිතුමාට - ASPට - දැනුම් දුන්නාම එතුමා ඒක දෙන්න බැහැ කියලා ප්‍රතික්ෂේප කළා. එසේ ප්‍රතික්ෂේප කරලා තිබෙන්නේ ඇයි? ඒ ටෙන්ඩර් එක ඉල්ලා තිබෙනවා, තවත් දෙන්නෙක්. පී.සී. පැල් කියන සමූහ ව්‍යාපාරයේ අධිපතිවරයා සහ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

හිටපු සභාපති රුවන් කියන දෙන්නා එය ඉල්ලා තිබෙනවා. ඒ දෙන්නා ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් ක්‍රියාශීලීව වැඩ කරපු, තංගල්ල නගර සභාව එම පක්ෂයෙන් ජයග්‍රහණය කරවන්න කටයුතු කරපු පුද්ගලයෝ දෙන්නෙක්. ඒ වාගේම එම නගරයේ තිබෙන, පී.සී. පැල් වෙළෙඳ ව්‍යාපාරය හිමි පුද්ගලයාගේ කඩ කාමරය ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලය දමන්න දීලා තිබෙනවා. අන්න ඒ නිසා, ඒගොල්ලන්ගේ බලපෑමට පොලීසියට බල කරලා අවුරුදු ප්‍රචාරණ බලපත්‍රය අවලංගු කළා. අන්න ඒකයි සිද්ධ වුණේ. 03වැනි දා උදේ පොල්තෙල් පහන පත්තු කරලා ඒක විවෘත කරන්න ප්‍රභූවරු ඇවිල්ලා හිටියා; තංගල්ල වැඩ බලන නගරාධිපතිවරයාත් ඇවිල්ලා හිටියා; මමත් එහි ගියා. ඒ වෙලාව වනකොටත් - උදේ 8.00 වනකොටත් - ඒ බලපත්‍රය දුන්නේ නැහැ. ඊට පස්සේ වෙළෙඳ සංගමයේ සභාපතිතුමා පොලීසියට ගියා. තංගල්ල නගර සභාවේ JVP එකේ නගරාධිපතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති, නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා හමු වෙන්න ගිහිල්ලා මේ කාරණය පැවසුවා. එතුමා ගිහිල්ලා පොලීසියට කථා කළාම ASP මහත්මයා ඒක දෙන්න බැහැ කිව්වා. ඒක ඉහළින් ආපු නියෝගයක් බව කිව්වා. ඒ ඉහළින් ආපු නියෝගය පෙන්වූයේ නැහැ. එතුමා කිව්වා, 2007 උසාවි නියෝගයකට අනුව ඉදිරිපත් කරපු ගැසට් එකක් තිබෙනවා කියලා. ඒ පනත පෙන්නලා කිව්වා, "මේක නිසා මට එය කරන්න බැහැ" කියලා. පොලීසියේ නිලධාරිතුමා එතුමාගේ ජාමේ බේරා ගත්තා, එතුමාගේ රැකියාව බේරා ගත්තා, ඒ පනත ඉදිරිපත් කරලා. පොලීසියට ඉහළින් නියෝගය දුන්නා. පොලීසිය රාජකාරි කරනවා දේශපාලන වශයෙන්. මේ ප්‍රශ්නය නිසා පොලීසිය කරන රාජකාරිය ගැන අපි මොනවත් කියන්නේ නැහැ. නමුත්, එතුමා ඒක ඉදිරිපත් කරලා ජාමේ බේරා ගත්තා. අද ඒ හේතුව නිසා තංගල්ල නගරයේ විතරක් නොවෙයි, හම්බන්තොට දිස්ත්‍රික්කයේම ඒ ප්‍රචාරණ කටයුතු නතර කරලා තිබෙනවා.

ව්‍යාපාරිකයෝ විශාල ප්‍රමාණයක් ලක්ෂ ගණන් සල්ලි වියදම් කරලායි මේ ආණ්ඩුව ගෙන එන්න කටයුතු කළේ. තංගල්ල නගරයේ වෙළෙඳ ව්‍යාපාරිකයෝ 150ක් විතර ඉන්නවා. සූරියවැව, තිස්ස, කටුවන, වලස්මුල්ල ආදි හැම නගරයකම වෙළෙඳ ව්‍යාපාරිකයන් තමන්ගේ වෙළෙඳ ප්‍රචාරණ කටයුතු දැනුම් දෙන්න, අවුරුද්දට ගමෙන් නගරයට එන ජනතාව දිරිමත් කරන්න කරන ඒ අවුරුදු ප්‍රචාරණය අද නතර කරලා තිබෙනවා. ඒ ප්‍රචාරණ කටයුතු නතර කරලා තිබෙන නිසා, අද හම්බන්තොට දිස්ත්‍රික්කය සුසාන භූමියක් බවට පත් වෙලා තිබෙනවා. ලංකාවේ හැම තැනම මේ දේ සිද්ධ වෙනවා. ඇයි, මෙහෙම කටයුතු කරන්නේ? ජනතා විමුක්ති පෙරමුණේ නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමායි, නගර සභාවේ උප සභාපති චින්තක මහත්මයායි එක පැත්තක්. රුවන්චන්ද්‍ර ඇමතිතුමාගේ නියෝගයට -ඉහළින් ආපු නියෝගයට- පොලීසියේ ස්ථානාධිපතිවරයා ඒ අවසරය දෙන්න බැහැ කිව්වා. අන්න ඒකයි ඇත්ත කථාව. ජනතා විමුක්ති පෙරමුණේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් එහෙමයි දේශපාලන කටයුතු කරන්නේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ හැම ව්‍යාපාරිකයෙකුගෙන්ම සල්ලි එකතු කරලා තමයි මේ ආණ්ඩුව ජයග්‍රහණය කරවන්න කටයුතු කළේ. අද ඒ ව්‍යාපාරිකයන්ට තම වෙළෙඳ ප්‍රචාරක කටයුතු කරවාගැනීමේ අවස්ථාව ලබා දීලා නැහැ. අද තංගල්ල නගර සභාවේ දේශපාලන පළිගැනීම් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම කියන්න ඕනෑ, ගුරුවරුන් 800කට එන්න කියලා පැවැති රැස්වීම ගැනත්. අගමැතිතුමියත් පැමිණි, තංගල්ල නගර සභාවේ පැවැති රැස්වීමට 44දෙනෙකු පමණයි ඇවිල්ලා හිටියේ. ඒ, දේශපාලන හැල හැප්පිලි නිසායි. ඒ නොපැමිණි ගුරුවරුන්ට පරීක්ෂණයක් කරන්න කියලා තිබෙනවා. කල්‍යාණි මිස්ට ලිඛිතව එවලා තිබෙනවා, ගුරුවරුන් සහභාගි වුණේ නැත්තේ මොකද කියන එක ගැන වාර්තාවක් එවන්න කියලා.

ඊළඟ කාරණාව 55වැනි අප්‍රේල් විරු සමරුව ගැනයි. ට්‍රාන්ස්ෆෝමර් ගිනි තියපු, බස් පුච්චපු, රාජ්‍ය දේපළ විනාශ කරපු, බෙල්ල කපලා වැටේ ගහපු මිනිසුන්ට "විරුවා" කිව්වා; රට වෙනුවෙන් යුද්ධ කරලා ජීවිතය පූජා කළ කෙනාට "සෙබළා" කිව්වා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට තව තත්පර කීපයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

55වන අප්‍රේල් විරු සමරු උත්සවය පසුගිය දා පැවැත්වූවා. 55දෙනායි ඇවිත් හිටියේ. ඒ උත්සවය රුවන් සෙනරත් නියෝජ්‍ය ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් තංගල්ලේදී පැවැත්වූවා. බෙල්ල කපපු මිනිස්සු තමයි රණ විරුවෝ; යුද්ධ කරපු මිනිස්සු සෙබළු. ඒ පවත්වපු උත්සවයට 54දෙනෙකු පමණයි හිටියේ. මේ ආණ්ඩුවේ කඩා වැටීම සිදු වෙන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් තමයි. මම මේ අවස්ථාවේදී රටට, ජනතාවට කියනවා, මේ විධියට පළි ගන්න දේශපාලනය කරන ජනතා විමුක්ති පෙරමුණට කිසිම කෙනෙකුගේ සහයෝගය දෙන්න එපා කියලා.

මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.37]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! இன்றைக்கு மிகவும் முக்கியமானதொரு விவாதம் இடம் பெற்றுக் கொண்டிருக்கின்றது. அதாவது, தற்போது இந்த நாட்டில் ஏற்பட்டிருக்கின்ற நெருக்கடி நிலைமையில் இருந்து எமது நாட்டை மீட்டெடுத்து நாட்டில் வாழுகின்ற மக்களுக்கு நிவாரணங்களை அல்லது சலுகைகளைப் பெற்றுக்கொடுப்பது தொடர்பில் எங்களுடைய அரசாங்கத்தால் முன்னெடுக்கப் படுகின்ற நடவடிக்கை தொடர்பாக உரையாடுகின்ற ஒரு விவாதமே இன்றைக்கு இடம்பெறுகின்றது. முதலாவதாக நாங்கள் சொல்ல வேண்டிய விடயம் என்னவென்றால், 2024ஆம் ஆண்டு நாங்கள் இந்த நாட்டின் ஆட்சி அதிகாரத்தைக் கைப்பற்றுகின்றபோது, இந்நாடு என்னமோ தேனும், பாலும் வழிந்தோடிய நாடாக இருந்தது போன்றுதான் இன்றைக்கு எதிர்க்கட்சியில் இருந்து பேசுகின்ற எல்லோருடைய கருத்தாகவும் இருக்கின்றது. ஆனால், இந்த நாட்டை நாங்கள் பொறுப்பேற்கின்றபொழுது, இந்நாடு அவ்வாறான நிலைமையில் இருக்கவில்லை என்பது எங்கள் எல்லோருக்குமே தெரியும்.

இந்த நாடு வாங்கிய கடனைத் திருப்பிச் செலுத்த முடியாததன் காரணமாக, 2022ஆம் ஆண்டு ஏப்பிரல் மாதம் 12ஆம் திகதி தற்காலிகமாக வங்குரோத்து அடைந்த நாடு என உத்தியோகபூர்வமாக அறிவிக்கப்பட்டிருந்தது. அந்த நிலைமை யில்தான் எமது நாடு இருந்தது. இப்பொழுது நாங்கள் ஆட்சிபீடத்துக்கு வந்து ஒரு வருடமும் ஐந்து மாதங்களும் ஆகின்றன. இந்தக் காலப்பகுதியில் எங்களுக்கு இருக்கின்ற பிரதானமான சவால் வேறெதுவுமல்ல, அவ்வாறு வீழ்ச்சி யடைந்திருந்த எமது நாட்டின் பொருளாதாரத்தை மீட்டெடுத்து, ஒரு நிலையான இடத்துக்குக் கொண்டுவருவதுதான்! அதுவே பிரதான விடயமாக எங்களுக்கு இருந்தது. இன்றைக்கு நாங்கள் திரும்பிப் பார்க்கின்றபொழுது, இந்த நாட்டின் மக்கள் எல்லோருமே திருப்திப்படக்கூடிய அளவுக்கு, ஓரளவுக்கு நாட்டினுடைய பொருளாதாரத்தை ஸ்திரமான நிலைக்கு நாங்கள் கொண்டுவந்து இருக்கின்றோம்.

அவ்வாறு ஸ்திரமான நிலைக்கு இந்த நாட்டைக் கொண்டுவந்ததன் காரணமாகவே, இப்போது மத்திய கிழக்கில் ஏற்பட்டிருக்கின்ற யுத்தம் காரணமாக நாட்டில் ஏற்பட்டிருக் கின்ற நெருக்கடி நிலையை எம்மால் எதிர்கொள்ளக்கூடியதாக இருந்தது என்பது எங்கள் எல்லோருக்கும் தெரியும். இதற்கு முன்னரும்கூட இந்த நாட்டில் பல்வேறு நெருக்கடிகள் ஏற்பட்டன. அத்தகைய நெருக்கடி நிலைகளிலிருந்து, இந்த நாட்டில் அதுநாள் வரைக்கும் இருந்த அசமந்தப்போக்கான நிலைகளிலிருந்து மற்றும் இலஞ்சம், ஊழல், மோசடி முதலான அனைத்திலும் இருந்து நாட்டை மீட்டெடுக்கின்ற வேலைத் திட்டத்தை எங்களுடைய அரசாங்கம் முன்னெடுத்து வந்தது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இவ்வாறு இந்த நாட்டை முன்னோக்கிக்கொண்டு வருகின்ற பொழுதுதான், 'தித்வா' என்கின்ற புயல் எம்மைத் தாக்கியது. அதனால் முழு நாடுமே பாதிக்கப்பட்டு, ஒரு ஸ்தம்பிமான நிலைக்கு உள்ளானது. இந்த சூழ்நிலையில் கட்சி, ஜாதி, மத, இன பேதங்கள் இன்றி, நாட்டைக் கட்டியெழுப்ப வேண்டிய கடமை எங்களுக்கு இருந்தது. ஆனால், அந்த நேரத்தில் எங்களுடைய எதிர்க்கட்சியினர் நடந்துகொண்ட விதம் மிகவும் கவலைக்குரியது. அன்று முழு நாடுமே ஓர் இருள் மயமான சூழ்நிலையில் இருந்தபோது, ஆட்சி அதிகாரத்தைக் கைப்பற்றுவது எப்படியென்று குழம்பிய குட்டையில் மீன் பிடிப்பது போன்ற செயற்பாடுகளை அவர்கள் முன்னெடுத்தார்களே தவிர, அவ்வாறான ஒரு நெருக்கடியான சூழ்நிலையிலாவது நாட்டு மக்களுக்குச் சரியான, சீரான பாதையைக் காட்டுபவர்களாக அவர்கள் இருக்கவில்லை. அப்படியான ஓர் எதிர்க்கட்சியினர் எங்களுக்குக் கிடைக்க வில்லை. அது ஒரு விடயம்!

விசேடமாக, நான் இந்த இடத்தில் ஒன்றைக் குறிப்பிட்டாக வேண்டும். 'தித்வா' புயலின்பொழுதான அன்றைய சூழ்நிலை யில் நாங்கள் திறம்படச் செயற்பட்டிருந்தோம். 'தித்வா' புயலினால் பெருவாரியாக எங்களுடைய கடற்றொழிலாளர் களும் பாதிக்கப்பட்டார்கள். அவர்களின் பாதிப்புகள் அனைத்துக்குமே நட்டஈடு பெற்றுக்கொடுப்பதற்கு கடற் றொழில் அமைச்சர் என்றவகையில் என்னால் முடியுமாக இருந்தது. அது மாத்திரமல்ல, 'தித்வா' புயலினால் வாவிகள், குளங்களிலிருந்து மீன்பிடிக்கின்ற நன்னீர் மீன்வளர்ப்பாளர் களும் பாதிக்கப்பட்டார்கள். இவ்வாறு பாதிக்கப்பட்ட கடற் றொழிலாளர்கள் மற்றும் நன்னீர் மீன்வளர்ப்பாளர்களுக்கு படகுகள், வள்ளங்கள், வலைகள் போன்ற அனைத்தையும் பெற்றுக்கொடுப்பதற்கும், அவர்களுக்கு நட்டஈடு பெற்றுக் கொடுப்பதற்குமாக NAQDA நிறுவனத்துக்கு 238.8 மில்லியன் ரூபாய் நாங்கள் வழங்கியிருக்கின்றோம். அதேபோன்று, பாதிக்கப்பட்டிருக்கின்ற படகுகளைத் திருத்தி அமைத்துக் கொடுப்பதற்காக மாத்திரம் கடற்றொழில் மற்றும் நீரக வளமூலங்கள் திணைக்களத்திற்கு 139.9 மில்லியன் ரூபாயை நாங்கள் ஒதுக்கீடு செய்தோம். பாதிக்கப்பட்ட அந்த மக்களுக்கு அதனைப் பெற்றுக்கொடுத்து இருக்கின்றோம்.

இப்போது மத்திய கிழக்கில் நடைபெறுகின்ற யுத்தம் என்பது நாங்களோ, நீங்களோ, யாருமோ எதிர்பார்த்த யுத்தமல்ல. எல்லோருடைய பிரார்த்தனையும் இந்த யுத்தம் முடிவுக்கு வந்து நாடும் சரி, உலகும் சரி, ஒரு சுமுகமான நிலைக்கு, அமைதியான நிலைக்குத் திரும்ப வேண்டும் என்பதுதான். இது எங்களுடைய பிரார்த்தனை மாத்திரமல்ல, உலகத்தினுடைய பிரார்த்தனை! ஆனால், உலகத்தில் இருக்கின்ற அராஜக மனங்களைக்கொண்ட ஒருசில நபர்களுடைய தீய குணாதிசயங்களின் விளைவுதான் இன்றைக்கு இந்த யுத்தம் இவ்வாறு தொடர்வதற்குக் காரணமாக இருக்கின்றது. ஆகவே, இந்த நிலைமையிலிருந்து இந்த நாட்டை மீட்பது எவ்வாறு என்கின்ற பார்வை எமக்குத் தேவையாக இருக்கின்றது.

ஒரு சதம், இரண்டு சதமல்ல, பத்தாயிரம் கோடி ரூபாய்க்கான மானியங்களை, நிவாரணங்களை வழங்குகின்ற திட்டத்தை எங்களுடைய ஜனாதிபதி அவர்கள் நேற்று மக்களுக்கு மிகவும் தெளிவாக அறிவித்தார். 'தித்வா' புயலின் போதும்சரி, இந்த யுத்தத்தினால் ஏற்பட்டிருக்கின்ற பொதுவான பாதிப்பின்போதும்சரி, மக்களை நினைத்துப் பார்த்து அவர்களுக்கான நிவாரணங்களை எமது அரசாங்கப் பெற்றுக்கொடுத்தது. மக்களுடைய வாழ்வாதாரத்தை உயர்த்தும் வகையில் செயற்பட்ட அரசாங்கமொன்று இதற்கு முன்னர் இருந்ததா? என்று நாங்கள் தேடிப்பார்க்க வேண்டும். அப்படித் தேடிப் பார்க்கின்றபோது, மக்களுடைய வளங்களைச் சூறையாடிய, மக்களுடைய பணத்தில் குதூகலித்த, சுனாமி நிதியத்தைக் கொள்ளையடித்த, வெள்ளம் மற்றும் இன்னோரன்ன அனர்த்தங்கள் ஏற்படுகின்றபோது மக்களு டைய நிவாரணங்களைக் கொள்ளையடித்த, மக்களுக்கு வழங்குகின்ற கால்நடைகளைக்கூட கொள்ளையடித்த ஆட்சியாளர்கள் இருந்த நாடுதான் இந்த நாடு என்பதை எங்களுடைய வரலாறு சொல்லும். இன்றைக்கு எங்களுடைய அரசாங்கமானது, இந்த நாட்டில் வாழுகின்ற மக்களுக்கான சலுகைகளை நோக்கி நகர்ந்திருக்கின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த இடத்தில் எனக்கும் முக்கியமான ஒரு பொறுப்பு இருக்கின்றது. எங்களுடைய கடற்றொழிலாளர்கள் இந்த நாட்டுக்கு வருமானத்தை ஈட்டிக் கொடுக்கிறார்கள். 10 வருடங்களுக்குப் பிறகு இந்த வருடம் எங்களுடைய கடற்றொழிலாளர்கள் பாரிய வருமானத்தை ஈட்டிக் கொடுத்திருக்கின்றார்கள். அந்த மக்களுடைய தொழிற்றுறை விழுந்துவிடக் கூடாதென்ற நிலைப்பாட்டில்தான் நாங்கள் இருக்கின்றோம்.

இந்த நாட்டிலே 50,000க்கும் அதிகமான சிறிய படகுகள் இருக்கின்றன; 8,000க்கும் அதிகமான பெரிய படகுகள் இருக்கின்றன. இந்தப் படகுகள் பயன்படுத்தப்படாமல் கரையில் கட்டப்பட்டிருந்தன. அன்றைக்கு இருந்த எரிபொருள் விலை அதிகரிப்பு மற்றும் அதிக செலவினம் காரணமாக மீனவர்கள் கடலுக்குச் செல்ல முடியாத நிலை காணப்பட்டது. அதனால் அவர்களுடைய படகுகள் கரையில் கயிற்றால் கட்டப்பட்டிருந்தன. எங்களுடைய அரசாங்கம் ஆட்சிக்கு வந்தவுடனேயே மாண்புமிகு சனாதிபதி அவர்கள் அப்படிக் கரையில் ஒதுக்கி வைக்கப்பட்டிருந்த அனைத்துப் படகுகளும் மீண்டும் கடலுக்குச் சென்று மீன்பிடிப்பதற்கான செயற் பாட்டை முன்னெடுத்தார். அதற்கமைய, கடற்றொழிலாளர் களின் படகுகளுக்கான மண்ணெண்ணெய் மானியத்தை

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

உடனே வழங்கினோம். அதன் விளைவாக, எல்லாப் படகுகளும் கடலுக்குச் சென்றன; மீனவர்களும் தங்களுக்கான வருவாயைத் தேடிக் கொண்டனர். இதன்மூலம் எங்களுடைய நாடு மறுபடியும் கடற்றொழிலில் மறுமலர்ச்சியை நோக்கி நகர்ந்தது என்பதை யாராலும் மறுதலிக்க முடியாது. இருந்தபோதிலும்கூட, இன்று ஏற்பட்டிருக்கின்ற இந்த நிலைமை மிகவும் துரதிருஷ்டவசமானதாகும். இந்த நிலைமை எங்களால் தோற்றுவிக்கப்பட்ட ஒன்றல்ல. கடற்றொழி லாளர்களை எடுத்துக்கொண்டால், சிறிய படகுகளை வைத்திருப்பவர்களாக இருந்தாலும் சரி, பெரிய படகுகளை வைத்திருப்பவர்களாக இருந்தாலும் சரி, அவர்கள் அனைவருக்கும் நல்லதொரு வாழ்வாதாரத்தைப் பெற்றுக் கொடுக்க வேண்டும், இந்தத் தொழில்துறை நவீன தொழில்நுட்பத்தை நோக்கிச் செல்ல வேண்டும் என்பதுதான் எங்களுடைய விருப்பமாகும்.

நேற்றும் அதற்கு முன்னரும் மாண்புமிகு சனாதிபதி அவர்களுடன் தற்போதைய நிலைமை சம்பந்தமாகப் பேசினோம். அதன்போது, சிறிய படகுகளுக்கு ஒரு நாளைக்கு 25 லீற்றர்படி, மாதத்துக்கு 25 நாட்களுக்கு மூன்று மாதங்களுக்கு வழங்குவதற்கும், அதேபோன்று multi-day boatsக்கு எரிபொருள் மானியமாக 150,000 ரூபாய் வழங்கு வதற்குமான திட்டத்தை நாங்கள் முன்மொழிந்திருந்தோம். ஆனால், இன்றைக்கு ஏற்பட்டிருக்கின்ற எரிபொருள்விலை அதிகரிப்பு என்பது மிகவும் கோரமானதாக இருக்கின்றது. கௌரவ திலிப் வெதஆரச்சி அவர்கள் குறிப்பிட்டதுபோன்று, - அவரும் ஒரு படகுக்குச் சொந்தக் காரராக இருக்கின்றார் - multi -day boats உரிமையாளர்கள் சங்கத்தினருடன் நாங்கள் கதைத்தோம்: கருத்துகளைப் பரிமாறிக் கொண்டோம். அந்தக் கருத்துப் பரிமாறலின் விளைவாக, இப்பொழுது அவர்களுக் கான மானியத் திட்டத்தை நாங்கள் முன்னெடுக்கின்றோம். ஆனாலும், மீனவர்கள் கடலுக்குச் சென்று மீன்களைப் பிடிப்பதற்கு இந்த மானியம் போதுமானதாக இல்லை யென்றால் மீண்டும் அந்தச் சங்கத்தினருடன் பேச்சுவார்த்தை நடத்தி, ஆக்கபூர்வமான செயற்பாடுகளை முன்னெடுப்பதற்கு இந்த அரசாங்கம் தயாராக இருக்கின்தென்பதைச் சொல்லிக் கொள்ள விரும்புகின்றோம். அந்த வகையில், இன்றைக்குக் கொண்டு வரப்பட்டு இருக்கின்ற இந்தப் பிரேரணை என்பது மிகவும் முக்கியமானது. இந்த முக்கியமான நாளிலே எனக்கும் இது சம்பந்தமாக ஒருசில கருத்துக்களைத் தெரிவிப்பதற்கான சந்தர்ப்பத்தைக் கொடுத்தமைக்காக நன்றியைத் தெரிவித்துக் கொண்டு விடைபெறு கின்றேன். வணக்கம்.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජාතික වශයෙන් ඉතාම වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා. බලශක්ති ඇමතිතුමා මේ ගරු සභාවේ සිටින අවස්ථාවේදී මම අහන්න කැමැතියි, Taranjot Resources Private Limited කියන ආයතනය -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, point of Order එක මොකක්ද කියලා කියන්න.

මීළඟට, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.50]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊයේ ගරු ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා සහන package එකක් යැයි කියා ප්‍රකාශයක් කළා. ආණ්ඩු පක්ෂය විසින් අද දින ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව විවාදය අවස්ථාවේ මිනිත්තු කිහිපයක් තුළ හෝ ඒ සම්බන්ධව යම් අදහසක් මමත් ප්‍රකාශ කළ යුතුයි කියා මා කල්පනා කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජනාධිපතිතුමාත්, එතුමාට පෙර එම පක්ෂයේ හිටපු නායකයනුත්, තමුන්නාන්සේලා හැම කෙනෙකුත් වාගේ දිගින් දිගටම කියපු කථාවක් තමයි ඉතිහාසය පුරාවටම ලංකාවේ තිබුණේ ධනපති ආණ්ඩු; දැන් තමයි පීඩිත පන්තියේ ආණ්ඩුවක් තිබෙන්නේ කියන කාරණය. තමුන්නාන්සේලා පීඩිත පන්තියට කිව්වා, "නැඟිටපල්ලා, නැඟිටපල්ලා, නුඹලාගේ වාරය ඇවිල්ලා" කියලා. ඒ කථාව අහපු මිනිස්සු ඇඟින් දුටු සංවර්ධනය අමතක කරලා කටින් පතුරවපු වෛරය වැලඳ ගන්න කටයුතු කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නමුත් තමුන්නාන්සේලා ධනපති ආණ්ඩු කියා පෙන්වපු ඒ හැම ආණ්ඩුවක්ම පැවැති කාලවලට වඩා පීඩිත පන්තියේ ජනතාවගේ ආණ්ඩුවක් පිහිටෙව්වාය කියන මේ ආණ්ඩු කාලය තුළ මේ රටේ පීඩිතයින් මත බරපතළ ලෙස ජීවන බර පටවා තිබෙනවා.

මේ තිබෙන්නේ පීඩිත පන්තියේ ආණ්ඩුවක් නිසා, සිංහල අලුත් අවුරුද්ද අප අභියසටම පැමිණ තිබෙන මේ මොහොතේ මම කාරණා කිහිපයක් මතක් කරන්න කැමැතියි. අද කඩවල කිරි සම්බා කිලෝවක මිල රුපියල් 380ක් - 400ක් වෙනවා. රුපියල් 400ටවත් ගන්න දැන් හුඟාක් තැන්වල කිරි සම්බා ඇත්තේත් නැහැ. ඔන්න පීඩිත පන්තියට වෙච්ච වැඩේ. මේ අවුරුදු කටේ මුං ඇට කිලෝවක මිල රුපියල් 1,000 ඉක්මවා ගිහින් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හොඳ වර්ගයේ පරිප්පු දැන් මිලදී ගන්න අපහසුයි. හොඳ වර්ගයේ පරිප්පු කිලෝවක මිල රුපියල් 400 ගණනක් වෙනවා; රුපියල් 500ට ආසන්නයි. ඡන්දය දීපු මිනිස්සු කියන්නේ මෙහෙම පරිප්පුවක් නම් ජීවිතේට කැවේ නැහැ කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බත් පැකට් එකේ ඉඳලා බස් ටිකට් එක දක්වා හැම එකකම මිල අසීමිතව ඉහළ ගිහින් තිබෙනවා. ධනපති කියා හඳුන්වන්න හදපු ආණ්ඩු එකක්වත් කළේ නැති විධියට පීඩිත පන්තිය අමාරුවේ දමන්න තමුන්නාන්සේලාට පුළුවන් වෙලා තිබෙනවා. බලන්න, පාසල් දරුවාට අවශ්‍ය පැන්සල, මකන කැල්ල, කවකටු පෙට්ටිය වැනි සියලුම පාසල් උපකරණවල මිල කීයද කියා. ගුරුවරියක් හැටියට කටයුතු කළ ඔබතුමිය දන්නවා ඇති, මේ ආණ්ඩුව බලයට පත් වෙන කොට තිබුණු එම මිල ගණන් සහ දැන් වෙනකොට පීඩිත පන්තියේ මිනිස්සු ගෙවන මිල ගණන්.

ඉදිකිරීම් ක්ෂේත්‍රය ගත්තත් එහෙමයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව අද සිමෙන්ති කොට්ටෙ ඉඳලා වැලි, ගඩොල් ඇතුළු හැම එකකම මිල සාමාන්‍ය මිනිස්සුන්ට ඔරොත්තු දෙන්නේ නැති මට්ටමට පත් කර තිබෙනවා. පීඩිත පන්තියේ රජයක් කිව්වාට, දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා කිව්වා වාගේ ධීවර ජනතාවට බිලී කටුවේ ඉඳලා භූමිතෙල් ටික දක්වා මිලදී ගැනීම අද ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. සියලු බෙහෙත් වර්ගවල, ඒ වාගේම සෞඛ්‍ය උපකරණවල මිල සාමාන්‍ය මිනිස්සුන්ට දරාගන්න බැරි තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. රජයේ රෝහල්වලින් නොමිලේ දීපු සේවා ටිකවත් අද සපයාගන්න බැරි වෙලා තිබෙනවා. ඒ කාලයේ අක්ෂි කාච දැමීමේ ශල්‍යකර්ම, හෘදයට stents දැමීමේ ශල්‍යකර්ම ඇතුළු අනෙකුත් ශල්‍යකර්ම ඔක්කෝම කරපු රටක්, මේක. ලෝක යුද්ධය පෙන්වලා මේ ඔක්කෝම වහගන්න පුළුවන්කමක් නැහැ. ලෝකයේ යුදමය තත්ත්වයක් ඇවිල්ලා තවම දවස් හතළිස් ගණනක් වාගේ; මාසයක් වාගේ වෙන්නේ. ඒ නිසා මේක ආණ්ඩුවේ නොහැකියාව කියන එක අපිට පිළිගන්න වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊයේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා බඩු මිලට සහනයක් දෙනවා කියලා කිව්වාම අපේ ගම්වල මිනිස්සු අහනවා, මේසේට ගහලා හාල් මිල අඩු කළා වාගේ වෙයිද කියලා. මෝල් හිමියෝ වට කරගෙන හාල් මිල අඩු කරන හැටි මේසෙට ගහලා කියපු හැටි අපිට මතකයි. ජනාධිපතිතුමා සහන package එකක් දෙනවා කියලා කිව්වාම මිනිස්සු අහනවා, තහඩුවක් ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කිව්වා වාගේ වෙයිද කියලා. මහජනතාව අතර විශ්වාසය - මෙතුමන්ලාගේ වචන ගැන තිබුණු විශ්වාසය - ඒ මට්ටමට අද පලුදු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉලක්කම් කියනකොට හරි මිහිරියි. හැබැයි වගකීමක් ඇතිව ඒවා කියන්න ඕනෑ. නැත්නම් ඉලක්කම්වල වටිනාකමත් නැතුව යනවා. වැඩිකල් යන්න ඉස්සෙල්ලා වචනවල වටිනාකම වාගේම ඉලක්කම්වල වටිනකමත් නැතුව යයි.

ඊළඟට, ජනාධිපතිතුමා තවත් කරුණක් ගැන කිව්වා. හැම කථිකයෙකුම ඒ ගැන සඳහන් කළා. "ගල්අඟුරු කාලා බලලා ගන්නේ නැහැ" කියලා එතුමා කිව්වා. හැබැයි එතුමා විපක්ෂයේ හිටියා නම් ඔහොම කියයිද? එතුමා විපක්ෂයේ හිටියා නම් මොනවා නොකියයිද? ගල්අඟුරු හැදෙන හැටි පෙන්වයි, හාරන හැටි කියයි, පටවන හැටි කියයි. බාන හැටිත් කියලා, කාලා බැලුවොත් මෙන්න මෙහෙමයි; කම්කරුවෝ අඳින ඇඳුම මෙන්න මෙහෙමයි කියලාත් කියන්නේ නැතුව ඉන්නේ නැහැ. එතුමා ඒ මට්ටමට තමයි ඒ කාලයේ විපක්ෂයේ සිටිද්දී කථා කළේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මිනිරන්වලින් ග්‍රැෆයිට් හදනවා කියලා ඒ දවස්වල මහජනයාට පෙන්වපු හැටි අපිට මතකයි. මේවා කියලා දූෂණ යටපත් කරන්න නම් පුළුවන්කමක් නැහැ කියලා අපි කියනවා. කිසිම ආණ්ඩුවක් පොහොර කාලා බලලාවත්, කෘමිනාශක බීලා බලලාවත්, ගල්අඟුරු කාලා බලලාවත් ගෙන්වන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ ඒවාට තමයි පර්යේෂණ ආයතන තිබෙන්නේ. ඒ නිසා මේ වාගේ කතන්දර කියලා විතරක් මේ මහා දූෂණවලින් අත පිහදාගන්න මේ ආණ්ඩුවට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ කියන එක අපි රජයට කියනවා.

ගල්අඟුරු කන්න බැහැ වාගේම ගල්අඟුරු වංචාව කොච්චර හේදුවත් සුදු වෙන්නෙත් නැහැ කියන එක අපි ආණ්ඩුවට මතක් කරනවා. හැම රජයකටම අඩු, වැඩි වශයෙන් දූෂණ චෝදනා එල්ල වෙන හැටි අපි අනන්තවත් දැකලා තිබෙනවා. කොළ පාට ආණ්ඩුවලට වේවා; නිල්, රතු ආණ්ඩුවලට වේවා, අපි ඒක දැකලා තිබෙනවා. ඒ සියල්ලත් හරි. මේ පීඩිත පන්තිය යැයි කියාපු ආණ්ඩුව විසින් "හැමදා නියං එකදා වැහි වලාවේ" කිව්වා වාගේ බරපතළම චෝදනාවක් දැන් කරළියට අරන් ඇවිත් තිබෙනවා. ඒකෙන් ගැළවෙන්න පුළුවන්කමක් ලැබෙන එකක් නැහැ. මේ බලශක්ති අර්බුදයට ප්‍රධානම හේතුව හැටියට බාල ගල්අඟුරු වංචාව අද වෙනකොට අපි කවුරුත් හඳුනාගෙන තිබෙනවා. ඒ හැම පවක්ම පීඩිත පන්තිය පිටත්, සමස්ත ජනතාව පිටත් පටවලා ඉවරයි. ගිය සතියේ විදුලි බිල වැඩි කළාට අමතරව තවත් ඉස්සරහට තවත් විශාල ප්‍රමාණයකින් විදුලි බිල වැඩි වෙයි කියලා විපක්ෂ නායකතුමා සඳහන් කළා. මේකේ කුට්ටිය යන්න ඕනෑ තැන්වලට ගිහින් තිබෙන නිසාද කොහේද, බාලයි කියලා දැන දැනත් දිගින් දිගටම මේ ගල්අඟුරු ගෙන්වන එක දෙස අපි බලාගෙන හිටියා. තෙල්වලට සහනාධාරයක් දෙන විධියේ කථාවක් ජනාධිපතිතුමා ඊයේ කිව්වා. මට එතකොට මතක් වුණේ, සමහර උත්සව කාලවලට සාප්පු ඉස්සරහා අමුතු ඇඳුමක් ඇඳගෙන sale price එක ගැන කිය කියා අත වන වනා කථා කරන අයව. මිල වැඩි කරලා, ඊට පස්සේ කීයක් හරි අඩු කරලා, පරණ මිලට කතිරයක් ගහලා අයින් කරලා, sale price එක කියමින්, මෙන්න මේකයි දැන් අලුත් මිල කියලා විකුණන උප්පරවැට්ටි තිබෙනවා, සාප්පුවල. ඊයේ ජනාධිපතිතුමාත් තෙල් සහනාධාරයක් ගැන කියලා ඒ වාගේ වැඩක් තමයි කළේ. අපි අහන්න කැමැතියි, අස්වැසුම ප්‍රතිලාභීන්ට දෙනවාය කියපුවා අවුරුද්දට ඉස්සෙල්ලා ලැබෙනවාද කියලා. මොකද, සිංහල අලුත් අවුරුද්ද කියන්නේ, මිනිසුන්ගේ ජීවිතයේ ඉතාම වැදගත් අවස්ථාවක්. ඉතින්, වෙනදා අවුරුදු ළඟ බව කියන්නේ කොහා කෑ ගහන සද්දෙන්. මේ පාර කොහාට ඉස්සෙල්ලා බඩු මිල එකින් එක තරගයට වැඩි කළා. තෙල් මිල වැඩි වුණා, ගෑස් මිල වැඩි වුණා, ඊට පස්සේ විදුලි බිල වැඩි වුණා. ඒ තුනම වැඩි වුණා. ඒ තුනේම මිල වැඩි වුණාට පස්සේ සකලවිධ භාණ්ඩ හා සේවාවල මිල ගණන් වැඩි වනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මේ කාරණය කියලා මගේ කථාව නවත්වනවා. "කණ කොකාගේ සුද පෙනෙන්නේ ඉගිළෙනකොට කිව්වා වාගේ" මේ ආණ්ඩුවේ කෙරුවාවල් දැන් තමයි ජනතාවට පෙනෙන්න පටන්ගෙන තිබෙන්නේ. මම මීට වඩා කාලය ගන්නේ නැහැ. මගේ වෙලාවෙන් විනාඩි කිහිපයක් ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමාට දෙන්න වුණා. ඔබතුමියට ස්තුති කරමින්, මම නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.00]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතාම වැදගත් මොහොතක තමයි අපි මෙම විවාදය කරන්නේ. මීට කලින් කථා කළ විවිධ අය විවිධ අදහස් ප්‍රකාශ කළා. ඒක එතුමන්ලාගේ අයිතිය. නමුත්, මෙම උත්තරීතර සභාවේ බොරු නම් කියන්න එපා කියලා මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

කථාව පටන් ගන්න කලින් මම යම් කාරණයක් කියන්න කැමැතියි. මේ මොහොත වනකොට මැද පෙරදිග කලාපයේ පවතින යුදමය තත්ත්වය සම්බන්ධව තාවකාලික සටන් විරාමයකට අදාළව යම්කිසි ප්‍රකාශයක් නිකුත් වෙලා තිබෙනවා. අපි එම ප්‍රකාශය අගය කරනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වනවා, මේ තාවකාලික සටන් විරාමය සදාකාලික සාමයක් උදෙසා ගමන් කිරීමට යොදා ගන්න කටයුතු කරයි කියලා. අපේ අවංක චේතනාවත් එයයි. ඒ වාගේම එම කටයුත්තට සම්බන්ධ වුණු සියලුදෙනාට අපේ ස්තුතිය පුද කරනවා. එම ප්‍රකාශය මැද පෙරදිග කලාපයට විතරක් නොවෙයි, සමස්ත ලෝකයටම ඉතාම වැදගත් වන ප්‍රකාශයක් විධියටයි මම දකින්නේ. ඒ වාගේම තව දෙයක් තිබෙනවා. යුද්ධයෙන් තොරව, කිසිම හානියකින් තොරව, එම ප්‍රශ්නවලට උත්තරයක් සොයා ගන්න පුළුවන් කියන එකට අදාළව අපට තිබෙන අවසන් බලාපොරොත්තුවක් විධියට අපි මේ දිහා බලනවා. මේ තුළින් රාජ්‍ය තන්ත්‍රයට තවදුරටත් පාර විවෘත වෙලා තිබෙනවා. එම නිසා යළි වතාවක් එම කටයුත්තට සම්බන්ධ වුණු සියලුදෙනාටම අපි ස්තුතිය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම විවාදයට සම්බන්ධ වුණු විවිධ අය, විවිධ කරුණු මතු කළා. එම නිසා අපි කළ දේවල් සම්බන්ධව මෙතැන යළිත් වතාවක් මතක් කරන්නට ඕනෑ. මගේ ළඟ සංඛ්‍යා ලේඛන තිබෙනවා. ඒවා සභාගත කරන්නත් මම බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුවෙන් පසු කාල වකවානුව තුළ අපි ලබා දුන් වන්දි සම්බන්ධව, සහනාධාර සම්බන්ධව සමහරුන් විභිළුවකට ලක් කළා. අපිත් නිලධාරින් සමඟ වැඩ කරනවා. අපි ඒ හැමෝම එක්ක ඉතා සුහදව කටයුතු කරනවා. ඒ හැමෝගේම පැත්තෙන් ආපු සුබවාදී ප්‍රතිචාරය තමයි, මීට කලින් වාර්තා සකස් කළාට වන්දි ලබා ගන්න පැමිණි ප්‍රමාණය නම් ඉතාම අඩුයි කියන එක. මම හිතන්නේ ඔබතුමියටත් ඒ සම්බන්ධව අදහසක් ඇති. එම නිසා මම මතක් කරන්න කැමැතියි, අපි ලබා දුන් වන්දි පිළිබඳව.

"දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් පීඩාවට පත්වූවන්ගේ නිවාස යථාවත් කිරීම සඳහා රුපියල් 25,000ක් ලබා දෙන බව අපි කිව්වා. ඒ ගැන අපි බැලුවොත්, ප්‍රතිලාභීන් 431,166කට අපි එම දීමනාව ලබා දීලා තිබෙනවා. ගෙවා ඇති සමස්ත මුදල ගත්තොත්, රුපියල් මිලියන 10,710.75යි. ඒ කියන්නේ, සියයට 99.37ක ප්‍රගතියක් එහි තිබෙනවා. ඊළඟට, ඊට අදාළව ලබා දුන් රුපියල් 50,000 දීමනාව ගත්තොත්, ප්‍රතිලාභීන් 157,998කට අපි ගෙවලා තිබෙනවා. ගෙවා ඇති සමස්ත මුදල ගත්තොත්, රුපියල් මිලියන 7,899.9යි. සියයට 95.01ක ප්‍රගතියක් එහි තිබෙනවා. ඒ වාගේම "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් පීඩාවට පත් වූ පාසල් දරුවන්ට අපි අමාත්‍යාංශය හරහා රුපියල් 15,000ක් ද, ජනාධිපති අරමුදල හරහා තවත් රුපියල් 10,000ක් ද විධියට රුපියල් 25,000ක දීමනාවක් ලබා දෙන්න පොරොන්දු වෙලා තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම දීමනාව ගෙවීමට අදාළ ප්‍රගතිය පිළිබඳ වාර්තාව මා ළඟ තිබෙනවා. අපි දරුවන් 178,890කට රුපියල් මිලියන 2,683.35ක මුදලක් ලබා දීලා තිබෙනවා, පාසල් උපකරණ ලබා ගැනීම සඳහා. එම කටයුත්තෙන් සියයට 89.31ක් මේ වන විට නිමා වෙලා තිබෙනවා. තවත් කිහිපයක් ඉතිරිව තිබෙනවා. සංඛ්‍යා ලේඛන සම්බන්ධ ගැටලු නිරාකරණය කර ගැනීමෙන් පසු ඉතාම කෙටි කාලයක් තුළ ඒ ටිකත් ගෙවා අවසන් කරන්න පුළුවන් කියලා මම හිතනවා. ඒ වාගේම කුලී නිවාස දීමනාව කියලා යම් කිසි දීමනාවක් අපි හඳුන්වා දුන්නා. මේ වන විට එම කුලී නිවාස දීමනාව ගෙවා අවසන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව 7,672ක් වන අතර, එම මුදල රුපියල් මිලියන 347.97ක් වනවා. ගෙවීම් ප්‍රතිශතය 80.41යි. ඒ වාගේම ජීවනෝපාය අහිමිවූවන් 882කට රුපියල් මිලියන 113.97ක මුදලක් දීමනා විධියට ගෙවා තිබෙනවා.

ඒ වාගේම මේ ආපදාව හේතුවෙන් සිදු වූ මරණ වෙනුවෙන් වන්දි ගෙවීම් කරන බවට අපි පොරොන්දු වුණා. ඒ අනුව සම්පූර්ණ වන්දි මුදල් ගෙවා අවසන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව 416ක්. ඔවුන්ට ගෙවා ඇති වන්දි මුදල රුපියල් මිලියන 445.41ක්. ඒ වාගේම "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ පූර්ණ හා අර්ධ නිවාස හානි සඳහා වන්දි මුදල් ගෙවීම් කරන බවටත් අපි පොරොන්දු වුණා. පූර්ණ නිවාස හානි සඳහා ගෙවීම් කර ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව විධියට ගත්තොත්, 289කට අපි වන්දි ලබා දීලා තිබෙනවා. ඒ සමස්ත මුදල විධියට ගත්තොත් රුපියල් මිලියන 570යි. අර්ධ නිවාස හානිවලට අදාළව වන්දි ගෙවා ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව ගත්තොත් 5,392ක්. මෙහිදී සමස්තයක් විධියට ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇති වන්දි මුදල් ප්‍රමාණය ගත්තොත් රුපියල් මිලියන 1,364.92යි. මම හිතනවා, ඉතාම වැදගත් කාරණාව වන්නේ දිගින් දිගටම බොරු, ව්‍යාජ, මඩ, අවලාද නඟමින් මෙම උත්තරීතර සභාවේ දිගටම විවිධ ප්‍රකාශ කරන විපක්ෂයට අනිවාර්යයෙන්ම මේ උත්තරය ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ හානි වෙනුවෙන් ගෙවන ලද වන්දි මුදල් සම්බන්ධ විස්තර ඇතුළත් සියලු ලේඛන මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මෙම ලේඛන සකස් කරලා තිබෙන්නේ 2026.03.27ට අදාළවයි. මෙම ලේඛනවලට අදාළ නිලධාරින් අත්සන් කරලා තිබෙනවා. මේවා ඉතා වගකීම් සහගත ලිපි ලේඛන. විශේෂයෙන්ම අපි අප්‍රේල් මාසයේ තමයි දැන් ඉන්නේ. මේ වන විට මේ ගෙවීම්වලට අදාළව යම් කිසි ප්‍රගතියක් තවත් එකතු වෙලා තිබෙනවා කියන එකත් මට විශ්වාසයි.

විශේෂයෙන්ම අපි දන්නවා, මේ රට භාර ගත්ත තත්ත්වයත් එක්ක සමස්තයක් විධියට ගත්තොත්, රටක් විධියට අපි සෑහෙන ඉස්සරහට යමින් ඉන්නකොට තමයි "දිට්වා" සුළි කුණාටුවට මුහුණ දෙන්න සිද්ධ වුණේ කියලා. අපි ඒ සම්බන්ධවත් කටයුතු කළා. ඒ වාගේම ඒ ඒ හානිවලට අදාළවත් දැවැන්ත ව්‍යාපෘති ගණනාවක ප්‍රගතිය අපි අත් විඳිනකොට තමයි මේ මැද පෙරදිග කලාපය සම්බන්ධව ගැටුම්කාරී තත්ත්වය නිර්මාණය වුණේ. එහෙත් වගකීම් සහගත ආණ්ඩුවක් විධියට, ජනතාවට වගකියන ආණ්ඩුවක් විධියට අපේ යුතුකමක් තිබෙනවා, ඕනෑම තත්ත්වයක් මැද්දේ රටේ ජනතාවට ඒ නායකත්වය දෙමින්, රටේ ජනතාවට ඒ සහනාධාර වැඩ පිළිවෙළ සකස් කරන්න. ඒක වගකීමක් ලෙස අපි හිතනවා. ඒක සමස්තයක් විධියට අපි සම්පූර්ණ කරගෙන ඉන්නවා. ඉදිරියේ දී අපට බලාපොරොත්තුවක් තිබෙනවා, ඉතාම වේගයෙන් ඒ කටයුතු ටික කර ගන්න අවශ්‍ය ධෛර්යය හා හයිය අපට තිබෙනවා කියලා.

ඊයේ දිනයේදී ගරු ජනාධිපතිතුමා විශේෂ සහනාධාර පැකේජයක් ඉදිරිපත් කරලා තිබුණා. ඒක ඉතා වැදගත් දෙයක්. එතැනදී ගොවින් ගැනත් සලකා බලා තිබෙනවා. ගොවීන්ටත් විශේෂ තැනක් දීලා තිබෙනවා. ධීවරයින්ටත් විශේෂ තැනක් දීලා තිබෙනවා. අස්වැසුම ලබා ගන්නා අඩු ආදායම්ලාභීන්ටත් අපි යම්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කිසි සහනාධාරයක් දීලා තිබෙනවා. දෙන්න පුළුවන් සියලුම පාර්ශ්වකරුවන්ට විශේෂයෙන්ම මේ අවුරුදු සමයට අදාළ කරන සහනාධාර වැඩ පිළිවෙළක් අපි සකස් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි දන්නවා, මැද පෙරදිග කලාපය ගත්තොත් ඉන්ධන අර්බුදයක් මේ වනකොට නිර්මාණය වෙලා තිබෙන බව. විශේෂයෙන්ම සමහර දේවල් දිහා බැලුවොත් තාවකාලික සටන් විරාමයට විතරක් ඒ වෙච්ච හානියට උත්තර හොයන්න බැහැ. විශේෂයෙන්ම අප සතුව තිබෙන සංඛ්‍යා ලේඛන අනුව මැද පෙරදිග කලාපය විතරක් තෙල් පිරිපහදු මධ්‍යස්ථාන සහ තෙල් ගබඩා කරන ස්ථාන -තෙල් ඩිපෝ- දිහා බැලුවොත් ස්ථාන 19කට පමණ හානි සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම සමස්තයක් විධියට මැද පෙරදිග කලාපයෙන් පිට ගත්තොත්, 12කට අධික ස්ථාන සංඛ්‍යාවකට ප්‍රහාර එල්ල වෙලා තිබෙනවා. මේ විධියට සමස්ත ක්‍රියාවලියටම යම් කිසි බාධාවක් එල්ල කිරීමේ අවදානමක් මේ වනකොට තිබෙනවා. විශේෂයෙන්ම මේ යුද්ධය අද නතර වුණත්, මේ තත්ත්වය යථා තත්ත්වයට පත් වන්න කෙටි කාලයක් ගත වෙයි. දැනටමත් සමහර රටවල් තෙල් ඇණවුම් කරන එක නතර කරලා තිබෙනවා. එහෙම ගැටලු රාශියක් නිර්මාණය වෙලා තිබෙනවා. නමුත්, අපට යුතුකමක් තිබෙනවා, කුමන තත්ත්වයක් මතු වුණත් රටක් විධියට ඊට මුහුණ දෙන්න. අපේ රටේ ජනතාව වෙනුවෙන් සහනාධාර වැඩ පිළිවෙළක් සකස් කරන්න අපි බැඳිලා ඉන්නවා. ඒ වාගේම මේ තත්ත්වයට ඔරොත්තු දෙන ආර්ථිකයකුත් නිර්මාණය කරන්න අපි බැඳිලා ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම ඔබතුමියටත් මම මේ කියන්න යන කාරණය සම්බන්ධයෙන් අදහසක් ඇති. විශේෂයෙන් 2025 අවුරුද්ද කියන්නේ ඉතාම ස්වර්ණමය අවුරුද්දක්; සංචාරකයන් වැඩිපුරම මේ රටට පැමිණි අවුරුද්ද වාගේම අපේ රටට වැඩිම විදේශ විනිමය ලබා ගත් අවුරුද්ද. 2025 අවුරුද්දේදී ඩොලර් බිලියන 8.2ක ආදායමක් විදේශ විනිමය හරහා අපට ලැබුණා. ඒ ආකාරයට ගත්තාම අපේ අපනයන ක්ෂේත්‍රයේ යම්කිසි වැදගත් ස්ථානයක් හිමි කර ගත් අවුරුද්දක් විධියට තමයි අපි 2025 අවුරුද්ද දකින්නේ. ඒ වාගේම අපේ රටේ නිෂ්පාදනය පැත්තෙන් ගත්තොත් 2025 අවුරුද්ද කියන්නේ නිෂ්පාදනය ඉතාම වේගයෙන් වර්ධනය වුණු අවුරුද්දක්; අපේ වරායවල්, ගුවන් තොටුපොළවල් හරහා ඉතාම වේගයෙන් ඒ මෙහෙයුම්වලට - operationsවලට- අදාළව සෑහෙන සුබවාදී ප්‍රතිඵල අත්පත් කර ගන්න පුළුවන් වුණු අවුරුද්දක්.

අපි මේ රට භාර ගන්නකොට තිබුණු තත්ත්වයත් එක්ක බලද්දි මේ වනවිට සෑහෙන ප්‍රගතියක් අප අත්පත් කරගෙන තිබෙනවා. නමුත්, අපි රට භාර ගන්නකොට ආර්ථිකය ඉතා හොඳ මට්ටමක නොවෙයි තිබුණේ. නමුත් අපි සමත් වෙලා තිබෙනවා, ඒ ආර්ථිකයත් ඉතාම ශක්තිමත් විධියට සකස් කරමින් විශේෂයෙන්ම අපේ ජංගම ගිණුම්වල යම්කිසි ප්‍රගතිගාමී ප්‍රතිඵලයක්, ඉතුරු කිරීමක් ඇති කර ගන්න. අපි රටක් විධියට ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි බලයට ආවට පසුව පසුගිය අවුරුද්දක කාලය තුළ මේ රට තුළ සිදු වුණු ඉතාම සුබවාදී, ප්‍රගතිගාමී කටයුතුවලට අදාළව අත්පත් කරගත් ජයග්‍රහණ සම්බන්ධයෙන් වූ කරුණු ඇතුළත් ලේඛනත් මම මීට පෙර මේ උත්තරීතර සභාවට සභාගත කළා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.11]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම මම දන්නේ නැහැ, මොනවා කථා කරන්නද කියලා. මේ උත්තරීතර පාර්ලිමේන්තුව විහිළු සාගරයක් බවට පත් වෙමින් පවතිනවා. විශේෂයෙන්ම ගල් අඟුරු වංචාව සම්බන්ධයෙන් විශ්වාස භංග යෝජනාවකුත් තිබෙනවා. ඇත්තටම ඊයේ ඉඳලා ඒ විශ්වාස භංග යෝජනාව අදාළ වෙන්නේ නැහැ. මම හිතනවා, ඒක අමතක කරලා දාලා අපි නව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න දැන් කටයුතු කරන්න ඕනෑය කියලා. මම එහෙම කියන්නේ මේකයි. බාල ගල් අඟුරු නිසා සිදු වුණු ජාතික අපරාධය ගැන අපි ඔක්කොම දන්නවා. ඒ ගැන මේ සභාවේදී සාකච්ඡා වුණා වාගේම සමාජයේ සංවාදයට ලක් වුණා; මාධ්‍යවල සංවාදයට ලක් වුණා. ඔබතුමන්ලාත් හිටපු යහ පාලන ආණ්ඩුව එකතු වෙලා කරපු මහ බැංකු වංචාවත් ඉක්මවා ගියපු - ඒ වාගේ දෙගුණයක් විතර සෘජු පාඩුවක් ලබපු - මේ ගල් අඟුරු වංචාව ගැන කථා කරද්දී වටේම ගියා - ඒකට කවුද වග කියන්නේ කියලා හොයා ගන්නත් බැහැ. එක වෙලාවක කියනවා, ඔව්, බාල ගල් අඟුරු ගෙනාවා, ඒ බාල ගල් අඟුරුවලින් සිදු වන පාඩුව අපි අය කර ගන්නවා කියලා.

විගණන වාර්තාව ආවට පස්සේ ඒ ඔක්කෝම ඉවරයි. මේ විගණන වාර්තාවේ කියලා තිබෙන්නේ, මේ Trident Chemphar කියන කොම්පැනියත් බොරු කොම්පැනියක්, ගල් අඟුරු සම්බන්ධයෙන් සහතිකය දුන් කොම්පැනියටත් බලපත්‍රයක් නැහැ, කැඳවීමමත් බොරුවක්, වංචාවක් කියා. ඒ නිසා මේ අහිංසක ඇමතිවරයා පමණක් ඒ සම්බන්ධයෙන් ගැට ගහගෙන ඉඳලා හරි යන්නේ නැහැ. ජනාධිපතිවරයා ඊයේ ඒ සම්බන්ධයෙන් වගකීම භාර ගත්තා, මේ පාර්ලිමේන්තුවේදී. එතුමා කිව්වා, "කාලා බැලුවේ නැහැ" - එතුමාට කන්න බැරි වුණා කියලා. කාලා බැලුවා නම් මේක හරියට කර ගන්න තිබුණා වාගේ හැඟීමකින් තමයි එතුමා කථා කළේ. ඒ කියන්නේ, එතුමා ඒ සම්බන්ධයෙන් වගකීම භාර අරගෙන තිබෙනවා. ඒක නිසා මම හිතනවා, මේ ගැන තව සාකච්ඡා කළ යුතු නැහැ කියලා. ස්වාධීන විගණන වාර්තාවකින් සම්පූර්ණයෙන්ම කියා තිබෙනවා, මෙය අතිමහත් දූෂණයක් බව. ඒක නිසා මම ඒ ගැන මේ පාර්ලිමේන්තුවේදී කථා කරන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ, අපරාදේ කාලය නාස්ති වන නිසා.

බුදුරජාණන් වහන්සේගේ උතුම් දේශනාවේ තිබෙනවා, "හිරි ඔත්තප්පියං ධනං" කියලා. ඒ කියන්නේ, පාපයට ඇති ලජ්ජාව සහ භය තමයි ධනය. ලජ්ජාව සහ භය නැති වුණාට පස්සේ ඕනෑම දෙයක් කරන්නට පුළුවන්, ඕනෑම බොරුවක් කියන්නට පුළුවන්. ඒ බොරුව වෙනුවෙන් පෙනී සිටින්නටත් පුළුවන්. ඒක තමයි දැන් මේ ආණ්ඩුවේ ජාතික ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ. හැම එකකටම බොරුවක් කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විදුලිය කපන්නේ නැහැ කියලා ඇමතිතුමාත් කිව්ව බව ඔබතුමිය දන්නවා. නමුත්, දැන් හැම තැනම විදුලිය කපනවා. ඒ වුණාට කියනවා, විදුලිය කපන්නේ නැහැ කියලා. මගේ ළඟ මේ තිබෙන්නේ මෙතුමන්ලාගේම report එක. මේ report එකේ කියන්නේ මොකක්ද? මෙහෙම කියන්නේ ඊයේ දවසේ. "System demand was managed by implementing manual load shedding of 33 kV feeders from 18:31 hours to 22:59 hours due to inadequate generation". නමුත්, දැන් ඒක නැහැ කියනවා. *[බාධා කිරීමක්]* ඔබතුමාට අවශ්‍ය නම් මම මේ report එක දෙන්නම්. එතකොට මේක ඇත්තද, බොරුද කියලා ඔබතුමාට

[ගරු දිලිත් ජයවීර මහතා]

කියන්න පුළුවන්. මෙහෙම බොරු කියනකොට අපි පාර්ලිමේන්තුවේ කථා කරලා වැඩක් තිබෙනවාද? හැම එකකටම කියන්නේ බොරුවක් නම් අපේ කාලය නාස්ති වන එක විතරයි නේද සිදු වෙන්නේ? ඉතින්, අපි ජනතාවට මොකක්ද කියන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මහා ජාතික ව්‍යසනයක් හමුවේ ජනතාවට මොකක් හෝ බලාපොරොත්තුවක් ඇති කරන්නේ කොහොමද?

ගෝලීය අර්බුදයක් තිබෙන බව ඇත්ත. නමුත්, ගෝලීය අර්බුදයක් හමුවේ අපේ රටත් මහා විනාශයකට මුහුණ දීලා තිබෙනවා. පවෝරිස් ඇවිල්ලා කතන්දරයක් කියාගෙන ගියා, අස්වැසුමට මෙච්චරයි, ඉස්වැසුමට මෙච්චරයි, ඇස්වැසුමට මෙච්චරයි කියලා. ඔක්කෝම ඇස්වැසුමෙන්, ඉස්වැසුමෙන් වහන්න පුළුවන්ද? බලාගෙන සිටියදීම මේ රටේ ජාතික ආර්ථිකය කඩාගෙන වැටෙනවා. මේ රටේ ජාතික ධනයෙන් සියයට 85කටත් වැඩි ප්‍රමාණයක් නිර්මාණය වෙන්නේ පෞද්ගලික අංශයෙන්. නමුත්, පෞද්ගලික අංශය සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටෙනවා; කෘෂිකාර්මික ක්ෂේත්‍රය බලාගෙන සිටියදීම කඩාගෙන වැටෙනවා. ධීවර ක්ෂේත්‍රයත් එහෙමයි; සංචාරක ව්‍යාපාරයත් එහෙමයි; කර්මාන්තශාලාත් එහෙමයි.

මේ ජාතික අර්බුදයට මුහුණ දීම සඳහා අද ආණ්ඩුවේ කේන්ද්‍රීය මූලෝපායික උපාය මාර්ගය මොකක්ද? වගකීමක් ඇති ජනාධිපතිවරයෙක් කරන කථාවක්ද එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කළේ? ජනාධිපතිවරයෙක් ජාතිය අමතන ආකාරයේ ප්‍රකාශයක් කරනකොට එහි තිබෙන්නට ඕනෑ මොනවාද? එහි තිබෙන්නට ඕනෑ, උපාය මාර්ග. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ කියන්නේ, ජාතියට බලාපොරොත්තු දෙන උපාය මාර්ග. ජාතියට බලාපොරොත්තු නැති වන ප්‍රකාශයක් පමණයි එතුමා මේ පාර්ලිමේන්තුවේදී කළේ. අපි බොහොම කනගාටු වෙනවා, දැනුවත්කමක් ඇති, අධ්‍යාපනයක් ඇති ජනාධිපතිවරයෙක් මේ වාගේ ජනතාව මුළා කරන ආකාරයේ ප්‍රකාශ සිදු කිරීම ගැන. මොන තරම් පහත් විධියටද එතුමා ඒ කථාව කළේ. ගල් අඟුරු ගත්තේ කාලා බලලාද කියලා ඇහුවා. මේ රටේ ජනතාව කවුරු කියලා හිතා ගෙනද දන්නේ නැහැ එතුමා කථා කළේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? මේ රටේ ජනතාව ඒ තරම් මෝඩද? මේ රටේ ජනතාව දිගටම මේ විධියට රවටන්න පුළුවන්ද? ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ වාගේම මේ කනගාටුදායක හැඟීම් මධ්‍යයේ මම කියන්නට ඕනෑ, අපි වාගේම මේ තත්ත්වයට මුහුණ දෙන තවත් රාජ්‍යයන් ගොඩක් තිබෙන බව. ඒ නිසා අපි මේ රට ගොඩ ගන්නට නම් ඔවුන් එදිනෙදා සාකච්ඡා කරන කරුණු අපි අන්තර්ජාලය හරහා බලන්නට ඕනෑ. ඔවුන්ගේ YouTube channelsවලින් අපට ඒ කරුණු බලා ගන්නට පුළුවන්. ඒ වාගේම ඒ ගැන දන්නා, තේරුම් ඇති අයගෙන් අහලා දැන ගන්නටත් පුළුවන්. ඔවුන් සාකච්ඡා කරන කරුණු ගත්තාම, අපි මේ කථා කරන කරුණු මොන තරම් පහත්ද, මොන තරම් ගොබ්බද කියලා කියන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඉතින්, අපේ රට ඉස්සරහට යයිද?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ව්‍යවසායකත්වය මුසු වුණු නිර්මාණශීලී ආර්ථිකයක් ගොඩනැඟීමකින් තොරව අපේ රටට ස්වදේශික ආර්ථිකයක් ගොඩනඟන්න බැහැ වාගේම අපට දීර්ඝ කාලීන ගමනකුත් නැහැ. මම මෙය නැවත නැවතත් මේ පාර්ලිමේන්තුවේදී කියන්නේ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් අපි ඔක්කෝම දැනගත යුතු කාරණයක් තිබෙන නිසායි. කේන්ද්‍රීය සංකල්පයකින් තොරව අපට මේ රට ආර්ථිකමය වශයෙන් දියුණු කරන්න විධියක් නැහැ කියන එක මම කියන්නට ඕනෑ. එම නිසා බලශක්තිය මෙන්ම අපේ ආහාර සුරක්ෂිතතාව සහ ස්වෛරීත්වය සම්බන්ධයෙන් අපට ස්වදේශීය උපාය මාර්ගයක් නොමැතිව, එවැනි උපාය මාර්ග පිළිබඳව සාකච්ඡා නොකර මේ රට ගොඩ ගන්නට බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම තව කාරණයක් කියන්නට ඕනෑ. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ ආණ්ඩුව කරගෙන ආපු සියලුම වැරැදි වැඩ ඉක්මවා යමින් දැන් අග්‍රවිනිශ්චයකාරතුමාට අල්ලසක් දෙන්නට ලෑස්ති වෙනවා, විධායකයෙන්. එතුමාට අපහාස කරන්නට එපා කියලා තමයි අපට කියන්න තිබෙන්නේ. එතුමාගේ විශ්‍රාම යන කාලය දීර්ඝ කරන්න හදනවා. මමත් නීතිඥවරයෙක්. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් දන්නවා, නීතිඥවරු හැටියට අපි ආඩම්බර වන බව. හැබැයි, මේ රටේ තිබෙන නීතියට මරු පහරක් එල්ල කරන්නට හදන්නේ විධායකයේ අපේක්ෂා ඉෂ්ට කර ගැනීමේ අරමුණින්. මම දන්නවා, මේ රටේ ශ්‍රේෂ්ඨ විනිශ්චයකාරවරු කිසි කෙනෙක් කිසිම හේතුවක් නිසා මේකට කැමති වෙන්නේ නැහැ කියලා. මොකක්ද ඒකට හේතුව? තම අභිලාෂ ඉෂ්ට කර ගැනීම සඳහා මේ රටේ ගෞරවයට ලක් වුණු ශ්‍රේෂ්ඨාධිකරණයේ කීර්තිය විනාශ කිරීමට මේ ආණ්ඩුව අනීතිකව පියවර ගනිමින් සිටිනවා. අපි ඒකට බරපතළ ලෙස විරුද්ධ වෙන්නට ඕනෑ. මෙය අපි ලෝකය ඉදිරියේ විහිළුවට ලක් වන කාරණයක් බවට පත් වනවා නියතයි කියන කාරණයත් පවසමින් මම නිහඬ වෙනවා. මට කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රියාස් ෆාරුක් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.20]

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று நாட்டில் ஏற்பட்டிருக்கின்ற பொருளாதார நிலைமைகள் சம்பந்தமாக உரையாற்றுவதற்கு எனக்கு நேரத்தை ஒதுக்கித் தந்தமைக்கு நன்றி கூறுகின்றேன்.

நாம் ஆட்சியைப் பொறுப்பேற்பதற்கு முன்னர், இந்த நாட்டில் இருந்த நிலைமைகளை மக்கள் அறிவார்கள். ஓர் அனர்த்தம் ஏற்படும்போது அல்லது இன்றுள்ளது போன்று ஒரு யுத்தத்தின்மூலம் எரிபொருள் நெருக்கடி ஏற்படும்போது அப்போதிருந்த ஆட்சியாளர்கள் எப்படி நடந்துகொண்டார்கள், நாடு எப்படி இருந்தது என்பதையும் மக்கள் அறிவார்கள். நாம் ஆட்சியைப் பொறுப்பேற்பதற்கு முன்னர், இந்த நாடு வங்குரோத்து நிலையை அடைந்திருந்தது. வெள்ள அனர்த்தம் ஏற்பட்டால், மக்களுக்கு நட்டஈடு வழங்கக்கூட முடியாத நிலையில்தான் அன்றைய அரசாங்கம் இருந்தது.

கடந்த அரசாங்க காலத்தில் எரிபொருள் பிரச்சினை ஏற்பட்டது. அப்போது, மக்கள் பல நாட்கள் வரிசையில் நின்று தான் எரிபொருளைப் பெற்றுக்கொண்டார்கள். அப்போது

அரசாங்கத்திடம் போதியளவு டொலர் கையிருப்பில் இருக்கவில்லை. நாட்டுக்கு நிறைய எரிபொருள் தேவைப் பட்டிருந்த நிலையில் ஓர் எரிபொருள் கப்பலைக் கொண்டுவந்து, அதனைக் கடலில் நிறுத்தி வைத்துவிட்டு தேவையான டொலரைத் திரட்டுவார்கள். 2-3 வாரங்களுக்குப் பிறகுதான் அதற்கான பணத்தைச் செலுத்தி எரிபொருளை நாட்டுக்குள் கொண்டுவருவார்கள். கப்பலுக்கான demurrageஐச் செலுத்தவேண்டி இருந்ததாலும், டொலரின் பெறுமதி அதிகரித்துச் சென்றதாலும் எரிபொருளைக் கூடுதலான விலைக்கு விற்கவேண்டிய நிலை ஏற்பட்டது. எனினும், எல்லா மக்களுக்கும் எரிபொருளை வழங்கக்கூடிய வகையில், போதுமான அளவு எரிபொருளைக் கொண்டுவர முடியாத நிலைதான் அன்று இருந்தது. நாங்கள் 2024இல் ஆட்சியைப் பொறுப்பேற்றதற்குப் பிறகு, திட்டமிட்டு மிகவும் கவனமாகச் செயற்பட்டு, சரியான முகாமைத்துவத்துடன் இந்த நாட்டை முன்னேற்றிக்கொண்டு வரும்போது, ஓர் இயற்கை அனர்த்தம் ஏற்பட்டது. அதுதான் 'தித்வா' சூறாவளி!

அந்த நேரம் இந்த Parliamentஇல் சில எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள், தித்வா சூறாவளியால் நாடு மிகக் கடுமையாகப் பாதிக்கப்பட்டு இருப்பதாகவும், இந்த அரசாங்கத்தால் அதற்கு முகங்கொடுக்கவோ, பாதிக்கப் பட்டவர்களுக்கு நிவாரணம் வழங்கவோ முடியாது என்றும் குறிப்பிட்டிருந்தார்கள். அதுமாத்திரமல்ல, அந்த நிலைமை யைச் சமாளிப்பதற்காக வேண்டி, "மஹிந்தவைக் கூப்பிடுங்கள்; ரணிலைக் கூப்பிடுங்கள்; சஜித்தைக் கூப்பிடுங்கள்!" என்றும் முழக்கமிட்டார்கள். ஆனால், இந்த நாட்டின் பொருளா தாரத்தை ஒரு systemக்குள் கொண்டுவந்து, அதனை எப்படி மேம்படுத்த வேண்டுமென்பது தெரிந்திருந்ததால், எமது அரசாங்கம் சத்தமில்லாமல் development வேலைகளைச் செய்துகொண்டு போனது. எமது அரசாங்கம் 2025இல் பல பில்லியன் டொலரையும் ஒரு ரில்லியனுக்கும் மேற்பட்ட rupeesஐயும் சேமித்து வைத்திருந்தது. அதனால் பயமில்லாமல் இந்த நிலைமையை முகாமைத்துவம் செய்து, பாதிக்கப்பட்ட மக்களுக்கு எங்களால் நிவாரணங்களை வழங்க முடிந்தது.

குறிப்பாக, வீட்டுக்குள் வெள்ள நீர் வந்தால் 25,000 ரூபாயும் சமையலறை உபகரணங்கள் சேதமடைந்திருந்தால் 50,000 ரூபாயும் மாணவர்களுடைய பாடசாலை புத்தகங்கள் மற்றும் உபகரணங்கள் சேதமடைந்திருந்தால் 25,000 ரூபாயும் வீடு பகுதியளவு பாதிக்கப்பட்டு இருந்தால் 5 இலட்சம் ரூபாயும் வீடு முழுமையாகப் பாதிக்கப்பட்டு இருந்தால் 50 இலட்சம் ரூபாயும் வழங்கப்பட்டது. அதுமாத்திரமன்றி, அனர்த்தத்தால் இறந்தவர்களின் குடும்பத்தினருக்கு 10 இலட்சம் ரூபாயும் வழங்கப்பட்டது. இப்படி நிவாரணங்களைக் கொடுத்து நிலைமையைச் சமாளித்துக்கொண்டு வரும்போது தான் கடந்த பெப்ருவரி மாதம் 28ஆம் திகதி மத்திய கிழக்கில் யுத்த நிலைமை ஏற்பட்டது. இதன்போது உடனடியாக எமது சனாதிபதியும் அரசாங்கமும் செயற்பட்டு, நிலைமையை மிகக் கவனமாகத் திட்டமிட்டு, நாட்டுக்குத் தேவையான பெற்றோல், டீசல், gas போன்றவற்றைப் பெற்று, அவற்றை மக்களுக்கு விநியோகிக்கின்ற ஏற்பாடுகளை மேற்கொண்டார்கள்.

உங்களுக்குத் தெரியும்! எரிபொருள் விலையேற்றம் முழு உலகத்திலும் ஏற்பட்டது. சில நாடுகளில் 30 சதவீதம், 50 சதவீதம் என விலையேற்றம் நடந்தது. மத்திய கிழக்கில் யுத்தம் ஆரம்பிப்பதற்கு முன்னர் 70-75 டொலருக்கு இருந்த ஒரு பீப்பாய் බොරතෙල්, யுத்தம் ஆரம்பித்த பின்னர் 100 டொலருக்கு மேல் சென்றது. அதேமாதிரி, 90-92 டொலருக்கு இருந்த ஒரு பீப்பாய் டீசல் 200 டொலரையும் தாண்டியது. எமது நாட்டுக்கு பெற்றோல் மற்றும் டீசலை import பண்ணுவதில் private companies 43 சதவீத பங்களிப்பைச் செய்கின்றது. அவற்றுடன் அரசாங்கம் பேசி விலை நிர்ணயத்தை மேற்கொண்டது. அரசாங்கம் ஒரு லீற்றர் டீசலில் 100 ரூபாய் நஷ்டத்தையும் ஒரு லீற்றர் பெற்றோலில் 20 ரூபாய் நஷ்டத் தையும் பொறுப்பேற்றுக்கொண்டே மக்களுக்கு அவற்றை விநியோகித்து வருகின்றது. இவ்வாறு எல்லா நிலைமை களிலும் மக்களுக்கு සහන கொடுத்து, எமது அரசாங்கம் வேலைகளைச் செய்துகொண்டு வருகின்றது. இவ்வாறான நிலைமைகள் ஏற்படும்போது, ஆட்சியை எவ்வாறு கைப் பற்றுவது என்பதைத்தான் எதிர்க்கட்சியினர் யோசிப்பார்கள். அதாவது, அடுத்த நாளே இந்த அரசாங்கத்தைத் துரத்திவிட இயலும் அல்லது அரசாங்கத்தைத் தங்களால் பாரமெடுக்க இயலும் என்று சொல்லுகின்ற நிலையில்தான் அவர்கள் இருப்பார்கள்.

மீன்பிடி, விவசாயம் போன்ற தொழில்களை மேற் கொள்பவர்களுக்கு பெற்றோல், டீசல் என்பன நிவாரண அடிப்படையிலே கொடுக்கப்படுகின்றது. இதற்காக கிட்டத் தட்ட 10,000 கோடி ரூபாய் அரசாங்கக் கணக்கிலிருந்து ஒதுக்கப்படுகின்றது. நான் நினைக்கின்றேன், அதில் பெற்றோலுக்கு மட்டும் மாதத்துக்கு 2,000 கோடி ரூபாய் ஒதுக்கப்படுகின்றது என்று. இவ்வாறு அரசாங்கம் திட்டமிட்டு வேலைகளைச் செய்துகொண்டு போகின்றது. ஏற்கெனவே, 2026ஆம் ஆண்டுக்கான நிதி ஒதுக்கீட்டின் ஊடாகச் செய்வதற்குத் திட்டமிட்டுள்ள எல்லா வேலைகளையும் செய்து கொண்டுதான் இதையும் எமது அரசாங்கம் செய்கின்றது.

கண்டி மாவட்டத்தில் கெட்டம்பே மேம்பாலம், Mahaiyawa tunnel ஆகியவற்றின் வேலைகள் ஏற்கனவே ஆரம்பிக்கப்பட்டு, நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. Mahaiyawa tunnelக்கு மட்டும் கிட்டத்தட்ட 600 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. இவ்வாறு எல்லா அபிவிருத்தி வேலைகளையும் செய்துகொண்டுதான் எமது அரசாங்கம் இந்த யுத்த நிலைமையிலும் பொருளாதாரத்தை மிகக் கவனமாகக் கையாண்டு வருகின்றது. தாங்கள் நாட்டை ஆட்சி செய்ததுபோல்தான் இந்த அரசாங்கமும் ஆட்சி செய்வதாக எதிர்க்கட்சியில் இருப்பவர்கள் நினைத்துக்கொண்டு இருக்கின் றார்கள். அவர்களது ஆட்சிக் காலத்தில், தற்போது ஏற்பட்டுள்ள எரிபொருள் பிரச்சினை போன்ற பிரச்சினைகள் ஏற்பட்டிருந்தால் அவர்கள் அவற்றை எப்படிச் சமாளித்திருப் பார்கள் என்பது எங்கள் எல்லோருக்கும் தெரியும்! அதில் பல கோடி ரூபாய் commission அந்தப் பக்கம், இந்தப் பக்கமென கைமாறியிருக்கும். இப்படியான நிலைமைகளைத் திட்ட மிட்டுச் செய்கின்ற நிலையில் அவர்கள் இருக்கவில்லை. இன்றைக்கு மத்திய கிழக்கில் யுத்த நிறுத்தமொன்று ஏற்பட்டிருக்கிறது. அது தொடர்ந்து நீடிக்கும் பட்சத்தில், எமது அரசாங்கம் எரிபொருளின் விலைகளைக் குறைத்து, மக்களுக்கு நிவாரணத்தை வழங்கி, அவர்களின் வாழ்க்கையை மேம்படுத்துமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.29]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நாட்டின் தற்போதைய நிலைமை சம்பந்தமான இன்றைய ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்து கொண்டு ஒருசில விடயங்களைக் கூற விரும்புகின்றேன்.

அத்தியாவசியப் பொருட்களின் விலை அதிகரிப்பால் சாதாரண குடும்பங்களிலுள்ள மக்கள் வாழ முடியாமல் இன்று கஷ்டப்படுகிறார்கள். இன்று காலையில்கூட, நான் கௌரவ அமைச்சர் வசந்த சமரசிங்ஹ அவர்களிடத்தில் சொன்னேன், "இந்தத் தடவை எங்களுடைய பகுதிகளில் நெல் விளைச்சல் நல்ல முறையில் கிடைத்திருக்கின்றது. எனினும், நெல்லுக்கு உரிய விலை கிடைக்காமல் எங்களுடைய விவசாயிகள் கஷ்டப்படுகின்றார்கள்" என்று. எனவே, இது சம்பந்தமாக அரசாங்கம் ஆக்கபூர்வமான நடவடிக்கைகளை முன்னெடுக்க வேண்டுமென வேண்டுகின்றோம்.

இன்று கீரி சம்பாவுக்கு விலைக் கட்டுப்பாடு இல்லாமல் இருக்கின்றது. அதன் விலையை mill ownersதான் தீர்மானிக்கிறார்கள். இன்று ஒரு கிலோகிராம் கீரி சம்பா அரிசி 400 ரூபாய்க்கும் கிடைக்காத துர்ப்பாக்கிய நிலை இருக்கின்றது. இதனால் கீரி சம்பா சாப்பிடுபவர்கள் பெரும் கஷ்டத்துக்குள்ளாகி இருக்கிறார்கள். ஒரு கிலோகிராம் கீரி சம்பா நெல்லின் விலை 140 ரூபாயென அரசாங்கம் நிர்ணயித்தாலும், ஒரு கிலோகிராம் கீரி சம்பா அரிசியின் விலை 400 ரூபாயையும் தாண்டி நிற்கிறது. தற்பொழுது இங்கு கௌரவ பிரதி அமைச்சர் உபாலி சமரசிங்ஹ அவர்கள் இருக்கிறார். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, உங்களுடைய அமைச்சுக்குக் கீழ்தான் Consumer Affairs Authority இருக்கிறது. உங்களுடைய அமைச்சின் ஊடாக இந்த விலைக் கட்டுப்பாட்டைச் சரியாக மேற்கொள்ளா விட்டால், சாதாரண மக்கள் மிகவும் பாதிக்கப்படுவார்கள் என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இதுவரை காலமும் வவுனியா சாலம்பைக்குளத்தில் குப்பை கொட்டப்பட்டு வந்தது. எங்களுடைய DCC Chairmanஆக இருக்கின்ற கௌரவ உபாலி சமரசிங்ஹ அவர்களுடைய தலைமையில் நாங்கள் அண்மையில் அப்பிரதேசத்துக்கு விஜயம் செய்தோம். இந்தப் பிரச்சினைக்கு நேர்மையான முறையில் தீர்வொன்றைக் காண வேண்டும் என்பதில் அவர் அக்கறையாக இருக்கிறார். நான்கு வருடங்களுக்கு முன்னர், இது தொடர்பில் KOICA திட்டத்தின் ஊடாக சில முயற்சிகள் மேற்கொள்ளப்பட்டன. தற்பொழுது அவை கைவிடப்பட்டு இருப்பதனால் நீண்டகாலத் திட்டமொன்றை வகுக்கவேண்டிய தேவை இருக்கிறது. குப்பை கொட்டப்படுகின்ற அந்த இடத்துக்கு அருகில் 5,000க்கும் மேற்பட்ட மாணவர்கள் கல்வி கற்கின்ற பல்கலைக்கழகம் ஒன்று இருக்கின்றது. அதுமாத்திரமன்றி, அதனைச் சூழ 500க்கும் மேற்பட்ட குடும்பங்கள் இருக்கின்றன. மேலும், அதன் அருகில் பல கிராமங்களும் குளங்களும் இருக்கின்றன. அங்கு திட்டமிடல் இல்லாமல் குப்பை கொட்டப்பட்டதனால்தான் சூழல் மாசுபட்டது. எனவே, அதனை மாற்ற வேண்டிய தேவை இருக்கின்றது.

இதனை மாற்றப்போவதாக அறிந்தவுடன், இந்தக் குப்பை கொட்டும் இடம் உலகம் அழியும்வரை சாலம்பைக் குளத்தில்தான் இருக்க வேண்டும் என்ற கருத்துப்பட ஒருசில இனவாதிகள் social mediaஇல் பதிவுகளை இட்டதை நான் பார்த்தேன். அவர்கள் தமிழர்களா, முஸ்லிம்களா, சிங்கள வர்களா என்று நாங்கள் கண்ணாடிகளைப் போட்டுப் பார்க்க வேண்டிய தேவையில்லை. இவ்வாறான இனவாதிகளால்தான் இந்த நாடு குட்டிச்சுவராகியது. இனவாதிகளால்தான் இந்த நாடு நாசமாகி, பொருளாதார ரீதியாக வீழ்ச்சியடைந்து, ஏனைய நாடுகளிடம் கையேந்துகின்ற, பிச்சை எடுக்கின்ற நிலைக்கு வந்தது. வவுனியாவில் ஏற்பட்டுள்ள இந்தக் குப்பைப் பிரச்சினையின்போது மீண்டும் இனவாதம் தலைதூக்கி இருக்கின்றது. தயவுசெய்து, இந்த விடயத்தை இனவாத அடிப்படையில் பார்க்காமல், மனச்சாட்சியோடு பாருங்கள்! எங்கேயோ உள்ள குப்பைகளை அங்கு கொண்டுபோய் போடுகிறார்கள். அதாவது, வைத்தியசாலையிலுள்ள குப்பை, நகரத்திலுள்ள குப்பை எனப் பல இடங்களிலுள்ள குப்பைகளை அங்கு கொண்டுபோய் போடுகிறார்கள். அங்கு 2003இல்தான் குப்பை கொட்டப்பட்டதாகவும் அதன் பின்னர்தான் மக்கள் வந்து குடியேறியதாகவும் சொல்கின்றார்கள்.

உண்மைதான்! அங்குள்ள மக்கள், 1990ஆம் ஆண்டு பலவந்தமாக சாலம்பைக்குளத்திலிருந்து வெளியேற்றப் பட்டவர்கள். அவர்கள் அந்த மண்ணிலிருந்து வெளியேறி யதற்கு என்ன காரணம் என்பது எல்லோருக்கும் தெரியும்! அவர்களை யார் வெளியேற்றினார்கள் என்பதும் தெரியும்! அவ்வாறு வெளியேற்றியவர்களை வைத்து அரசியல் செய்த கூட்டத்தினர்தான் இன்று இனவாதச் சிந்தனையுடன் பேசுகின் றார்கள். அங்கிருந்து வெளியேற்றப்பட்ட அந்த மக்கள் படாத கஷ்டங்களைப் பட்டுவிட்டு, மீண்டும் தமது சொந்த மண்ணுக்கு வரும்பொழுது, அங்கு குப்பை கொட்டுகிறார்கள். அந்த மக்கள் என்ன செய்வதென்று தெரியாத நிலையில் அதற்கு அருகில் தொடர்ந்து வாழ்ந்துகொண்டு இருக்கின் றார்களே ஒழிய, பாகிஸ்தானில் இருந்தோ, ஆப்கானிஸ் தானில் இருந்தோ, இந்தியாவில் இருந்தோ, கொழும்பில் இருந்தோ, மலையகத்தில் இருந்தோ, வேறு எங்கிருந்தோ வந்தவர்கள் அல்லர்.

வவுனியா மாவட்டத்தில் அரசியல் பேசுகின்ற, நியாயமில்லாமல் செயற்படுகின்ற, இந்தக் குப்பை விடயத்தை வைத்து அரசியல் செய்ய நினைக்கின்ற எந்தக் கட்சியைச் சேர்ந்தவராக இருந்தாலும் பரவாயில்லை. அவர்களுக்கு ஒரு விடயத்தைச் சொல்கின்றேன். அதாவது, ஒரு மாத காலத்துக்குள் இதற்கு நியாயமான alternative arrangement ஒன்றைச் செய்துவிட்டு, நிரந்தரத் தீர்வு காண வழிவகுக்க வேண்டுமே ஒழிய, இப்பிரச்சினையைத் தீர்ப்பதற்கு உதவி செய்கின்ற கௌரவ உபாலி சமரசிங்ஹவையோ, அரசாங்க அதிபரையோ, ஏனையவர்களையோ விமர்சிக்கின்ற நிலையில் இருந்து விடுபட வேண்டும். இல்லையென்றால், அந்த மக்களோடு சேர்ந்து நானும் நீதி கோரி ஜனநாயக ரீதியான போராட்டங்களை முன்னெடுப்பேன். இன்று கௌரவ உபாலி சமரசிங்ஹ அவர்கள் இவ்விடயம் சம்பந்தமாக சில முயற்சிகளை எடுத்தார். அதற்காக அவருக்கு வவுனியா மாவட்ட மக்கள் சார்பாக என்னுடைய மனமார்ந்த நன்றியைத் தெரிவிக்கின்றேன்.

'டிரம்ப்' என்கின்ற பைத்தியக்காரனுடைய நடவடிக்கைக்கு இந்த உலகம் எவ்வாறான எதிர்வினையை ஆற்றப் போகின்றதோ என்று நேற்று இரவு நாங்கள் எல்லோரும்

பயந்துகொண்டு இருந்தோம். என்றாலும், நாங்கள் எல்லோரும் இறைவனிடத்தில் பிரார்த்திக்கொண்டு இருந்தோம். ஈரான் விதித்த 10 நிபந்தனைகளை டிரம்பும் அவருடைய அடிவருடிகளும் ஏற்றுக்கொண்டு, பேச்சுவார்த்தையை ஆரம்பிக்க இருப்பதாக நாங்கள் அறிகிறோம். ஈரானுக்குப் பக்கபலமாக இருந்த Russia, China போன்ற முதுகெலும்புள்ள நாடுகளுக்கு நாங்கள் நன்றி சொல்கின்றோம். ஸ்பெயின் போன்ற நாட்டுத் தலைவர்கள் தைரியமாக குரல் கொடுத்ததனால்தான், அச்சமில்லாமல் அறிக்கைகளை விட்டதனால்தான், நேட்டோ அமைப்பிலுள்ள ஏனைய நாடுகளும் அவர்களோடு சேர்ந்து, டிரம்புக்குப் பின்னால் செல்லாமல், 'டிரம்ப் ஒரு மடையன்' என்று சொல்லும் அளவுக்கு கருத்துத் தெரிவித்தார்கள். வயது முதிர்வும் பல நோய்களும் இருப்பதனால்தான் டிரம்ப் இவ்வாறான பிழையான முடிவுகளை எடுப்பதாக பிரான்ஸ் நாட்டுத் தலைவர் உட்பட பலர் சொன்னதை நாங்கள் பார்த்தோம். அமெரிக்க சனாதிபதி சொல்லியிருக்கிறார், "நாங்கள் ஈரான் விதித்துள்ள 10 நிபந்தனைகளைப் படித்துக்கொண்டு இருக்கின்றோம்" என்று. நாங்கள் இதை இரு தரப்பு உடன்படிக்கையாகவே பார்க்கின்றோம். எதிர்வரும் வெள்ளிக்கிழமை பாகிஸ்தானில் பேச்சுவார்த்தை இடம்பெற இருப்பதாக நாங்கள் அறிகிறோம். அந்தப் பேச்சுவார்த்தை நியாயமானதாக, நேர்மையானதாக இருக்க வேண்டுமென நாங்கள் இறைவனிடத்தில் பிரார்த்திக்கின்றோம்.

அமெரிக்காவும் இஸ்ரேலும் பலஸ்தீன் மக்களுக்கு எவ்வாறான அநியாயங்களைச் செய்தன என்பது உலக மக்களுக்குத் தெரியும். நாங்கள் கேட்ட 'துஆக்கள்' வீண்போகாது என்ற நம்பிக்கை எமக்கு இருக்கின்றது. பலஸ்தீன் மக்களுக்குச் செய்த அநியாயத்தைப் பார்த்து உலக மக்கள் கண்ணீர் சிந்தினார்கள்; அந்த மக்களுக்காகப் பிரார்த்தித்தார்கள்; அதற்கெதிராக உலகமெல்லாம் ஜனநாயக ரீதியில் போராட்டங்களை மேற்கொண்டார்கள். இஸ்ரேல் இன்றிருக்கின்ற நிலையிலிருந்து மீண்டு வருவதற்கு இன்னும் 10 வருடங்களுக்கு மேல் செல்லுமெனச் சொல்லப்படுகின்றது. இஸ்ரேலின் எதிர்க்கட்சித் தலைவர் யாயிர் லாபிட் அவர்கள் சொல்லியிருக்கிறார், நேற்றைய உடன்படிக்கை இஸ்ரேலுக்குப் படுதோல்வி என்று. அதாவது, நெதன்யாகுவின் பிழையான முடிவால் இஸ்ரேலுக்கு படுதோல்வி ஏற்பட்டிருப் பதாகச் சொல்லியிருக்கிறார். இஸ்ரேல் தோல்வி அடையும் என்பதில் சந்தேகம் கிடையாது. நெதன்யாகுவின் தேவைக் காகவே டிரம்ப் இந்த ஆட்டத்தை ஆடினார். ஒரு வாரத்துக்கு முன்னர் டிரம்ப் சொன்னார், "ஈரான் மீதான தாக்குதல் நான் எடுத்த முடிவு அல்ல; United States Secretary of Defence Pete Hegseth எடுத்த முடிவு" என்று. உலகமே அதிர்ந்து போகக்கூடிய அளவுக்கு இவ்வாறானதொரு பெரிய முடிவை ஈரானுக்கு எதிராக அமெரிக்க சனாதிபதி எடுத்துவிட்டு, தன்னுடைய பாதுகாப்புச் செயலாளர் சொன்னதனால்தான் இந்த முடிவை எடுத்ததாகச் சொல்கின்றார். இந்தளவுக்கு மோசமான ஒருவரை அமெரிக்க நாட்டு மக்கள் சனாதிபதி ஆக்கியதன் விளைவை இன்று நாங்கள் அனுபவிக்கின்றோம். இந்த விடயத்தால் நமது நாட்டு மக்களும் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். குறிப்பாக, பொருட்களின் விலை அதிகரிப் பால் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். சவூதி அரேபியா, கட்டார், குவைத், ஐக்கிய அரபு அமீரகம் போன்ற நாடுகள் எமக்கு எல்லாக் கஷ்டங்களிலும் உதவியிருக்கின்றன.

இன்று ஈரான் மக்கள் ஆயதுல்லா கொமேனி உட்பட முக்கிய தலைவர்களை இழந்திருக்கிறார்கள். நேற்று இரவு நாங்கள் ஒரு விடயத்தைப் பார்த்தோம். ஈரானிலுள்ள பாலங்களைத் தாக்கப்போவதாக டிரம்ப் அறிவித்தபோது, ஈரானிய மக்கள் ஆண்கள், பெண்களென கூட்டங்கூட்டமாக பாதை ஓரங்களில் நின்று, தாங்கள் டிரம்பின் அச்சுறுத்தலுக்குத் அஞ்சவில்லை, ஷஹீதாக தயாராக இருக்கின்றோம் என்ற செய்தியை உலகுக்குச் சொன்னார்கள். அதுதான் இஸ்லாமியர் களின் பண்பு என்பதையும் அவர்கள் காட்டியிருக்கிறார்கள். எனவே, இந்த விடயத்தில் கட்டார், சவூதி அரேபியா, குவைத், ஐக்கிய அரபு அமீரகம் போன்ற நாடுகள் ஈரானுடன் சேர்ந்து செயற்பட வேண்டும்.

அமெரிக்கப் படையை வெளியேற்றுவது தொடர்பில் கட்டார் எடுத்த முடிவைப்போல, ஏனைய அரபு நாடுகளும் எடுக்க வேண்டும். இந்நாடுகள் தமக்கு இடையில் ஏற்பட்டு இருக்கின்ற மனக்கசப்பை நீக்குவதற்கு முயற்சிக்க வேண்டும்; அதற்காக தமக்கு இடையில் பேச வேண்டும். அமெரிக்காவோடு பேசுவதற்கு ஈரானுக்கு முடியுமாக இருந்தால், ஏன் சவூதி அரேபியாவோடு பேச முடியாது. எனவே, சவூதி அரேபியா, ஐக்கிய அரபு அமீரகம், குவைத், கட்டார் போன்ற நாடுகளோடு பேசி, உடனடியாக அமெரிக்கப் படைகளை வெளியேற்றுகின்ற நடவடிக்கையை எடுக்க வேண்டும். இந்நாடுகள் ஒற்றுமைப்படும்பொழுது, இஸ்ரேல் என்ற கேடுகெட்ட நாட்டை முற்றுமுழுதாக தோற்கடித்து, பலஸ்தீன் மக்களுக்கான விடுதலையைப் பெற்றுக்கொடுக்கலாம் எனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.39]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට පෙනෙන විදියට මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, අපේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට එන එක. ඒක තමයි මේ අයට තිබෙන ලොකුම ප්‍රශ්නය. මොකද දන්නවා ද ඒක ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ? මම මේක දවස් කීපයක් බලාගෙන හිටියා. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට එන්නේ ජාතික වශයෙන් වැදගත්කමක් තිබෙන යම්කිසි දැනුවත් කිරීමක් කරන්නයි. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශයක් කරද්දී විපක්ෂ නායකතුමා ද, විපක්ෂයේ අනෙක් පක්ෂ නායකවරු ද, විපක්ෂයේ අනෙක් මන්ත්‍රීවරු ද ඔක්කෝම පූස් පැටව් වාගේ ඒ වෙලාවේදී අහගෙන ඉන්නවා. "හා ජනාධිපතිතුමනි. ඔව්, ජනාධිපතිතුමනි" කියලා අහගෙන ඉන්න එක තමයි ඒ වෙලාවට කරන්නේ. ජනාධිපතිතුමා නැඟිටලා ගියාට පස්සේ තමයි මෙතැන සිංහයෝ මතු වෙන්නේ. ඒ නිසා තමයි මේ පාර්ලිමේන්තුවේ ජනාධිපති එන එක,- *[බාධා කිරීමක්]* ඔව්, දැන් පූස් පැටව් ටික ඤාව් ගානවා. ඤාව් ගගා ඉන්න. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට එන එක තමයි දැන් විපක්ෂයට තිබෙන ලොකුම ප්‍රශ්නය. ජනාධිපතිතුමාට පාර්ලිමේන්තුවට එන්න සම්පූර්ණ අයිතියක් තිබෙනවා; කථා කරන්න අයිතියක් තිබෙනවා. ජාතික වැදගත්කමක් තිබෙන සියලු දේවල් ගැන ජනතාවට පැහැදිලි කරන්න, පාර්ලිමේන්තුවට පැහැදිලි කරන්න ජනාධිපතිතුමාට අයිතියක් තිබෙනවා. ඒක නිසා මෙතැන වෙන කතන්දර කියන්න ලැස්ති වෙන්න එපා. ඔබතුමන්ලා ඒ වෙලාවට අහගෙන ඉන්නවා වාගේ දැනුත් අහගෙන ඉන්න. ඒක, පළමුවැනි කාරණය.

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය මහතා]

දෙවැනි කාරණය මේකයි. අද උදේ ඉඳන්ම විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා, අර "කාලා බැලුවේ නැහැ" කියන කථාව. ඒකට සම්බන්ධ කථා ගොඩක් කියනවා. නමුත් මේ අයට ඇහිලා තිබෙන්නේ එච්චරයි. මුළු කථාවේම ඇහිලා තිබෙන්නේ කාලා බැලුවේ නැහැ කියන ටික විතරයි. ඉතිරි ටික ඇහිලා නැහැ. ඊයේ මෙතැනදී ජනාධිපතිතුමා මොකක්ද ඇත්තටම කිව්වේ? කිව්වේ, නැවක් ප්‍රතික්ෂේප කරනවා නම් ඒ ප්‍රතික්ෂේප කිරීමට වාර්තා දෙකක් බලපානවා කියලා. එකක් තමයි, load port එකේ වාර්තාව. අනෙක් එක තමයි, discharge port එකේ වාර්තාව. Load port එකේ වාර්තාවට අනුව සියයට 80ක ගෙවීමක් කරනවා. Discharge port එකේ වාර්තාවට අනුව සියයට 20ක ගෙවීමක් කරනවා. ජනාධිපතිතුමා පැහැදිලි කළේ මේකයි. මේ එන ගල් අඟුරුවල ප්‍රමිතිය අඩුද, නැද්ද කියන එක අපේ කැමැත්තට, ආණ්ඩුවේ කැමැත්තට, අපේ තනි කැමැත්තට, අපට තීරණය කරන්න බැහැ කියන එක. යම්කිසි ප්‍රමිතිගත ආයතනයකින් තීරණය කරලා දෙන්නට ඕනෑ මේකේ ප්‍රමිතිය අඩුද, නැද්ද කියලා. ප්‍රමිතිය අඩුයි නම්, අඩුයි. අපි ඒක නැහැ කියන්නේ නැහැ. ප්‍රමිතිය අඩුයි කියන එක තමයි ජනාධිපතිතුමා කිව්වේ. ප්‍රමිතිය අඩුයි කියලා discharge port එකෙන් කියනවා නම්, load port එකෙන් කියනවා නම්, අපේ නොරොච්චෝලේ බලාගාරයේ වාර්තාවකින් හරි කියනවා නම් අපි ඒක පිළිගන්නවා. ප්‍රමිතිය අඩු නම්, අඩුයි. අපි ඊට පස්සේ මොකක්ද කරන්න ඕනෑ කියන එක නේ ගැටලුව. නේද? ඒක තමයි ගැටලුව.

දැන් මේගොල්ලන් මේ ගැන ලොකු කතන්දරයක් හදාගෙන එනවා. මොකටද ඒ කථාව හදාගෙන එන්නේ? අපේ විපක්ෂය කියන්නේ සද්භාවීය විපක්ෂයක් නොවෙයි. මේ විපක්ෂයට අවශ්‍ය රජයේ මොකක් හරි වැරැද්දක් තිබෙනවා නම් ඒක පෙන්වාදීමට නොවෙයි. අපි හැම තිස්සේම ඔබතුමන්ලාට කියන්නේ අපට වඩා ශිෂ්ට වෙන්න කියලා. අපට වඩා ශිෂ්ට වෙන්න නොවෙයි මේ අයට උනන්දුව තිබෙන්නේ. මේගොල්ලන් මොකක්ද මේ කියන්නේ? මොනවාද මේ අය කියන්නේ? මේ අය අහනවා, අර අසූචි නැවත් කාලා බලලා ද තීරණය කළේ කියලා. මීට පෙර අසූචි නැවක් ලංකාවට ආවේ නැද්ද? ආවේ නැද්ද? මොකක්ද ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්නය? අසූචි නැවක් ලංකාවට ආවේ නැද්ද? ආවේ නැද්ද? ඒක ද මේ කියන්නේ? මේ විපක්ෂයේ මන්ත්‍රීවරු අද උදේ ඉඳන් ඒක ද කියන්නේ? සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරු කියනන හදන්නේ, ගෝඨාභය රාජපක්ෂගේ රජය කාලයේ මේ ආකාරයට වංචාසහගත ලෙස ගනුදෙනුවක් සිද්ධ වුණේ නැහැයි කියලා ද? ඒකද මේ කියන්න හදන්නේ? පොහොට්ටුවේ මන්ත්‍රීවරු මෙතැන කියන්න හදන්නේ රනිල් වික්‍රමසිංහ මහ බැංකුව කැඩුවේ නැහැ කියලා ද? ඒකද කියන්න හදන්නේ? මේගොල්ලන් මේ කරන්නේ මොකක්ද? මේ අය ගල් අඟුරු සම්බන්ධ කතන්දරයක් ගොතලා, ඒ කතන්දරය පාවිච්චි කරන්න හදන්නේ මොකක් හරි වංචා දූෂණයක් ගැන කථාවක් ජනතාවට කියන්න නොවෙයි. ඒගොල්ලන් කියන්න හදන්නේ, "නැහැ, ඒ කාලයේත් මේ වාගේ දේවල් වුණේ නැහැ" කියන්නයි. අපේ රටට අසූචි නැවක් ඇවිල්ලාත් නැහැ, කවුරුවත් මහ බැංකුව කඩලාත් නැහැ, මේ රටේ වංචා, දූෂණ සිද්ධ වෙලාත් නැහැ. ඒකයි මේ කියන්න හදන්නේ. අපි ඒක තේරුම් ගන්න ඕනෑ. මම හිතන විධියට මහජනතාවත් ඒක තේරුම් ගනියි.

කවුද මේවා කථා කරන්නේ? විපක්ෂයේ කවුද මේවා කථා කරන්නේ? වංචා, දූෂණවලට නම ගිය, නඩු ගිය, හිරේ ගිය මිනිස්සු ඉන්න පක්ෂවල අය තමයි මේවා කථා කරන්නේ. අපට කියනවා, ආණ්ඩුවට ඇවිත් අපි වංචා, දූෂණ කරනවාලු. එහෙම කියන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරු, විපක්ෂයේ පක්ෂ නායකවරු. අද එක්කෙනෙක් කිව්වා ජනාධිපතිතුමා බොරු කියනවාලු. අර නයි ඇරපු කට්ටිය තමයි මෙතැන කියන්නේ ජනාධිපතිතුමා බොරු කියනවා කියලා. රටකට නයි ඇරියා. රටකට නයි ඇරියා. ජනතාවත් රැවැට්ටුවා. *[බාධා කිරීමක්]* ඔයාද ඇරියේ නයි? ඔයාද නයි ඇරියේ? *[බාධා කිරීමක්]* නැඟිටලා කියන්නකෝ. මයික් එක දෙන්නම්. ඔයාද නයි ඇරියේ? මුහුණ පෙන්වන්නකෝ පොඩ්ඩක් නයි ඇරපු කෙනා බලාගන්න. මෙතැනදී ඔය ගාණට එන්න ලැස්ති වෙන්න එපා. විපක්ෂය ඔය ගාණට එන්න ලැස්ති වෙන්න එපා. අපි රජයක් හැටියට බොහොම පිළිවෙළකට කරුණු කාරණා සහිතව තමයි විවාදවලට සම්බන්ධ වෙන්නේ. මේගොල්ලන්ට ඕනෑ ඕනෑ වාන්ස් ගන්න අපි විවාද හදලා දෙන්නේ නැහැ. ඒක පළමුවැනි කාරණය. වංචා, දූෂණවලට අහුවෙච්ච, මිනීමැරුම්වලට අහුවෙච්ච, හොරකම්වලට අහුවෙච්ච, රටටම බොරු කියපු කට්ටිය වංචා, දූෂණ සහ බොරු ගැන අපට කියලා දෙන්න එනවා. විහිළු කරන්න එපා.

අනෙක් කාරණය තමයි පාස්කු ප්‍රහාරය. මේක හරිම ප්‍රශ්නයක්. පාස්කු ප්‍රහාරය වුණේත් නැද්ද? ඒ ගැන සමගි ජන බලවේගයේ ස්ථාවරය මොකක්ද? එහෙම එකක් වුණේත් නැද්ද? *[බාධා කිරීමක්]* මොකක්ද? *[බාධා කිරීමක්]* මොන රජයද? අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, එදා කාගේ රජයද? කාගේ රජයද පාස්කු ප්‍රහාරය වෙද්දී තිබුණේ? ඔය ඔබතුමාට එහා පැත්තේ ඉන්න කෙනා මොනවාද එතකොට කළේ? එතුමන්ලාගේ පාලන කාලයේ සිද්ධ වෙච්ච පාස්කු ප්‍රහාරයට නිශ්චිත වශයෙන් චෝදනා ලබපු පාර්ශ්වයේ අය ලියපු පොත්වලට අත තියන්න යන්නේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
AI විපක්ෂ නායකතුමා.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ඔව්, AI විපක්ෂ නායකතුමා. මේක තමයි අපේ රටේ විපක්ෂයේ දේශපාලනයේ තත්ත්වය. මේක තමයි තත්ත්වය. පාස්කු ප්‍රහාරය සිද්ධ වෙලා මිනිස්සු තුන්සීයකට වැඩි දෙනෙකුගේ ජීවිත නැති වෙද්දී ඒ වගකීම භාර ගන්න අවශ්‍යතාව තිබුණු රජයේ හිටපු කට්ටියට ලජ්ජාවක් නැහැ. ඒ ප්‍රහාරය කවුද කළේ කියලා පොතක් ලිව්වාම, ඒක බලන්න ඒ පොතේ launch එකට යනවා. මෙතැනට ඇවිල්ලා කථා කරන්නේ කිසිම වංචාවක් වෙලා නැහැ වාගෙයි. මන්ත්‍රීවරු මොනවාද කියන්නේ? අර අසූචි නැව ඇවිල්ලාත් නැහැ. අරක වෙලාත් නැහැ, මේක වෙලාත් නැහැ, අරක කාලා බැලුවාද අහනවා. මොනවාද මේ කතන්දර? මේකද විපක්ෂයේ දේශපාලනය? රට හරි අතට ගන්න හදන විධිය ද මේ තිබෙන්නේ? මේක බොරුවක්. මේක තමයි බොරුව. තඩි බොරුවක් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම ඊයේ රෑ වෙනකොට ඉරානය සහ ඇමෙරිකාව අතර සාම සාකච්ඡා ඇති කිරීමේ යම් සාර්ථකත්වයක් ඇති වෙලා තිබෙනවා. අපි රටක් හැටියට, ලෝකයේ ජනතාව හැටියට, ඒ ගැන සතුටු වෙන්නට අවශ්‍යයි. යුද්ධය නවතින එක අපි හැමෝටම හොඳයි. ඒක තමයි ප්‍රධානම දේ. මේ රටේ මේ ඇති වෙලා තිබෙන තත්ත්වය, බලශක්තිය සම්බන්ධයෙන්, ආහාර සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වය ඇති වෙන්නේ ගෝලීය තත්ත්වයක් තුළ. ගෝලීය තත්ත්වයක් තුළ තමයි මේ තත්ත්වය ඇති වෙන්නේ. රටක් හැටියට අපි යුද්ධයේ පාර්ශ්වකරුවෙක් නොවුණාට, අපි යුද්ධයේ බලපෑමට අහුවෙච්ච රටක්. මුළු

ආසියාවම එහෙම තමයි. ආසියාව විතරක් නොවෙයි, ලෝකයේ හැම රටක්ම මේ වෙලාවේ යුද්ධයේ බලපෑමට අහුවෙච්ච රටක්, ඍජු පාර්ශ්වකරුවෙක් නොවුණාට. අපි බලන්න ඕනෑ රටක් හැටියට අපි කොහොමද මේ තත්ත්වයට මුහුණ දෙන්නේ කියලා. ඒක කියන්න තමයි ඊයේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ආවේ.

මේ රටේ ආර්ථිකය කටයුතුවලදී, විශේෂයෙන් ඉන්ධන මිල ඉහළ යන තත්ත්වයක් තුළ, විදුලි බිල ඉහළ යන තත්ත්වයක් තුළ අපේ රටේ ජනතාවගේ ආර්ථික කටයුතු කරගෙන යන්නට, ජන ජීවිතය පවත්වාගෙන යන්නට අපහසුතාවක්, අමාරුවක් එනවා. අපි ඒක රජයක් හැටියට පිළිගන්නවා. අපි ඒක ඒ ජනතාව මත සම්පූර්ණයෙන් පටවන්නේ නැහැ. ඒක තමයි සහන පැකේජයේ තිබෙන සරල අර්ථය. නිෂ්පාදන සහනාධාර වෙනුවෙන් අපි මුදල් වැය කරලා තිබෙනවා. අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි බලශක්තිය සහ ආහාර සුරක්ෂිතභාවය. ඒවා මේ අර්බුදයත් එක්ක එන ප්‍රධාන ප්‍රශ්න දෙක. බලශක්ති සුරක්ෂිතභාවය වෙනුවෙන් රුපියල් බිලියන 60ක් අපි වෙන් කරනවා, ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබා දීම සඳහා. රටේ සියලු ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබා දීම සඳහා රුපියල් බිලියන 60ක් අපි වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, ධීවර කර්මාන්තයේ යෙදෙන ජනතාවට ඊට අමතර සහනයක් ලබා දෙනවා, රුපියල් 31,250ක සහ බහුදින ධීවර යාත්‍රා සඳහා රුපියල් 150,000ක. ඒක අමතර සහනයක්. මොකද, එය නිෂ්පාදන කාර්යභාරයක් නිසා. ඒ වාගේම තමයි විදුලි බිල සඳහාත්. ඒකක 90කට අඩුවෙන් පරිභෝජනය කරන හැමෝටම සහනයක් ලබා දීම සඳහා අපි රුපියල් බිලියන 15ක් වෙන් කරනවා මේ මාස 03 සඳහා. අතිවිශාල සහන පැකේජ් එකක් මේක, විදුලි බිලට, ඉන්ධන මිලට, ආහාර මිලට අදාළව. අපි ගොවියාට පොහොර සහනාධාරය ලබා දෙන්නේ, ධීවරයාට ඉන්ධන සහනාධාරය ලබා දෙන්නේ,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසන්.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපි මේ සහනාධාර ලබා දෙන්නේ, ගොවියාගේ ආර්ථිකය සහ ධීවරයාගේ ආර්ථිකය ගැන විතරක් හිතලා නොවෙයි. අපේ රටේ ආහාරවල මිල පාලනය කිරීමට නම්, අනාගතයේ ආහාර සුරක්ෂිතභාවය ඇති කිරීමට නම්, අපි පොහොර සඳහා, ඉන්ධන සඳහා වන මේ නිෂ්පාදන සහනාධාර ඒ ජනතාවට ලබා දෙන්නට ඕනෑ.

මේ අවස්ථාවේදී දුගී බවේ සිටින ජනතාව තවත් දුගී බවට යනවා. අපට ඉන්ධන මිලදී ගන්න ඇති වන අමාරුව ඒ ජනතාවට ඊට වඩා දැනෙනවා. අපට විදුලි බිල ගෙවාගන්න තිබෙන අමාරුව ඒ ජනතාවට ඊට වඩා දැනෙනවා. ඒ නිසා තමයි අස්වැසුම සඳහා අපි වෙනම වැඩි කිරීමක් කරන්නේ. රුපියල් 17,500ක අස්වැසුම දීමනාව රුපියල් 25,000 දක්වාත්, රුපියල් 10,000ක අස්වැසුම දීමනාව රුපියල් 15,000 දක්වාත්, රුපියල් 5,000ක අස්වැසුම දීමනාව රුපියල් 7,500 දක්වාත් අප්‍රේල් මාසය සඳහා පමණක් වැඩි කර තිබෙනවා. මොකද, මේක මේ අර්බුදය සඳහා පමණක් කරන දෙයක්. අර්බුද අවස්ථාවකදී රජයකට වගකීමක් තිබෙනවා රටේ ජනතාව රැකබලා ගැනීමට. අපි ඒක තමයි මේ සිද්ධ කරන්නේ. පාස්කු ඉරුදින ප්‍රහාරය සිද්ධ වුණු වෙලාවේ, කොවිඩ් වසංගතය ආපු වෙලාවේ ජනතාව රැකබලා ගන්නා ආණ්ඩුවක් සිටියේ නැහැ, මේ රටේ. අද එහෙම ආණ්ඩුවක් තිබෙනවා. අපි වගකීමෙන් ඒක කියන්නේ. ජනතාව රැකබලා ගන්නා, ජනතාව වෙනුවෙන් වග වන, ජනතාව ආරක්ෂා කරන - ඕනෑම දෙයකින් ආරක්ෂා කරන - ආණ්ඩුවක් දැන් මේ රටේ තිබෙනවා. 2019දී ආර්ථික වර්ධන වේගය සෘණ 2යි, 2020දී ආර්ථික වර්ධන වේගය සෘණ 4.6යි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමියට තව අමතර විනාඩි 2ක කාලයක් ලැබී තිබෙනවා, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මේ අවුරුද්දේ අපි මේ සියලු උත්සාහය දරන්නේ ආර්ථික වර්ධන වේගය කඩා වැටෙන්නේ නැතිව, මේ ආර්ථිකය යහපත් ලෙස, ජන ජීවිතය කඩා වැටෙන්නේ නැති ආකාරයට, හැකිළෙන්නේ නැති ආකාරයට පවත්වාගෙන යන්නයි.

ඉන්ධන කියන්නේ මොකක්ද? අපේ ඇඟේ රුධිරය දුවනවා වාගේ ආර්ථිකය පුරාම දුවන්නේ ඉන්ධන. ඉන්ධනවලින් තමයි ආර්ථිකයක් සක්‍රිය වෙන්නේ. ඉන්ධන මිල ඉහළ ගියාම ඒක ආර්ථිකයට බලපානවා. ඒ නිසායි අපි ඉන්ධන මිලට මැදිහත් වෙන්නේ. ඒ නිසායි හැම පෙට්‍රල් ලීටරයකටම රුපියල් 20ක්, හැම ඩීසල් ලීටරයකටම රුපියල් 100ක් රජයේ භාණ්ඩාගාරයෙන් දාලා මේ ආකාරයට මිල යම්කිසි මට්ටමකට පවත්වාගෙන යෑමට අපි උත්සාහ කරන්නේ. ඒක රජයක වගකීම. ඒ සහන ලබා දීම රජයක වගකීම. අපි ඒ කාර්යභාරය තමයි මේ ඉෂ්ට කරන්නේ. මේ මහත්වරුන්ට කියන්න පුළුවන්ද එහෙම නැහැ කියලා?

පාස්කු ඉරුදින ප්‍රහාරය සිද්ධ වුණා. ඒක නිසා අපේ රටේ සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන් කඩාගෙන වැටුණා. කොවිඩ් අර්බුදය ආවා. ඒකෙන් අපේ රටේ සියලු අංශ සම්පූර්ණයෙන් කඩාගෙන වැටුණා. මේ මහත්වරු නැඟිටලා කියන්නකෝ, තමන්ගේ ආණ්ඩු කාලයේ මොනවාද කළේ කියලා. මෙතැන දැන් දීපු සහන ගැනයි, ඒවා හම්බ වෙන්නේ කවදාද, අප්‍රේල්වලට ඉස්සෙල්ලා හම්බ වෙනවාද, එදාට ඉස්සෙල්ලා හම්බ වෙනවාද, මෙදාට ඉස්සෙල්ලා හම්බ වෙනවාද කිය කියා අහන්නේ නැතිව, තමන්ගේ ආණ්ඩු දීපු සහන ගැන නැඟිටලා කියන්න. අපි වගකිව යුතු රජයක් හැටියටයි වැඩ කරන්නේ. නමුත් වගකිව යුතු විපක්ෂයක් නැති එක ගැන අපි අදටත් දුක් වෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.*

[අ.භා. 3.52]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලශක්ති ඇමතිතුමා සභාවේ ඉන්න මේ වෙලාවේ මම එතුමාගෙන් වැදගත් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. විගණකාධිපති වාර්තාවේ 6.6.3 ඡේදයේ සඳහන් කර තිබෙනවා, Taranjot Resources (Pvt.) Limited කියන ආයතනය ගල් අඟුරු මෙට්‍රික් ටොන් ලක්ෂ 3ක් මිලදී ගැනීමට 2026 මාර්තු මාසයේ 30වෙනි දා රජය සමඟ ගිවිසුමක් අත්සන් කරලා තියෙනවා කියලා. අපට අවශ්‍ය ප්‍රමිතිය, ඒ කියන්නේ 5,900ත්, 6,154ත් වූ කැලරි ප්‍රමාණයක් සහිත ගල් අඟුරු සැපයීම පිළිබඳව එම සමාගමට මීට කලින් කිසිම අත්දැකීමක් නැහැ. ඔවුන්ව ලියාපදිංචි කිරීම දෝෂ සහගතයි. එවැනි දෝෂ සහගත ලියාපදිංචියක් සහිත මේ සමාගමට මෙසේ ගිවිසුම්ගතවීමට ඉඩ දීම වැරදියි කියන කාරණය පාර්ලිමේන්තුවේ කෝප් කමිටුවේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා ජන රජයේ විගණකාධිපති 2026.04.02 දින සකස් කරපු මේ විගණන වාර්තාවේ කියලා තිබෙනවා.

අපි දන්නවා, වර්තමාන සමාගම වන Trident Chemphar Limited ඒ අවශ්‍ය නැව් ප්‍රමාණය රටට ලබා දෙන්නේ නැහැ කියලා. එය ලබා දීමට වේලාවක් නැහැ. ඒ හිඟය පියවන්න තමයි මේ spot tender එකට, emergency tender එකට ගියේ. මේ හදිසි මිලදී ගැනීමට ඇවිල්ලා තිබෙන සමාගමත් මීට කලින් කවදාවත් ප්‍රමිතියට ගල් අඟුරු සපයලා නැහැ. ඒගොල්ලන්ව ලියාපදිංචි කිරීම දෝෂ සහගතයි. ඔබතුමා තමයි සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම භාර ඇමතිවරයා. ඔබතුමා තමයි ප්‍රතිපත්තිමය කාරණාවලදී වගකිව යුතු පුද්ගලයා. ඔබතුමා යටතේ තමයි සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම තිබෙන්නේ. ඔබතුමා තමයි සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ සභාපති පත් කරන්නේ. එතකොට, අමාත්‍යාංශ ලේකම්වරයා හරහා ඔබතුමාට මේ ගල් අඟුරු මිලදී ගැනීම පිළිබඳ විශාල වගකීමක් තිබෙනවා. ඔබතුමා අද කථා කරනවා නේ. දැන් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමාගේ කථාවේදී හෝ මේ කාරණා ගැන පැහැදිලි කරන්න කියලා. මම දන්නේ නැහැ, අද ඔබතුමා ඉල්ලා අස් වෙයිද කියලා. ඔබතුමා හෙට ඉල්ලා අස් වෙන්න පුළුවන්. මම දන්නේ නැහැ, රජයේ විගණකාධිපතිවරයා මේ වාගේ ස්වාධීන වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙන අවස්ථාවක, ප්‍රජාතන්ත්‍රවාදය තුළ සාමාන්‍යයෙන් ලජ්ජා බයක් තිබෙනවා නම් ඔබතුමා මොන වාගේ තීරණයක් ගනීද කියලා. මොකද, මෙතෙක් සිදු වෙලා තිබෙන ක්‍රියාදාමය බරපතළයි.

මෙතෙක් කල් කිව්වේ මේ ප්‍රසම්පාදනය හරි කියලා නේ. එතකොට මේ Trident Chemphar Limited කියන ආයතනය ලියාපදිංචි නොවී තිබියදී, ටෙන්ඩරයට අවකාශය දීලා තිබෙනවා. ඒක වැරැදියි. ඒ වාගේම දෙවැනි හදිසි මිලදී ගැනීම සඳහා වූ සමාගමට සුදුසුකම් නැහැ. ඒකත් වැරැදියි. අපි නොවෙයි මේ කියන්නේ, ජනරජයේ විගණකාධිපතිවරයා. එතකොට, ඒ ක්‍රියාදාමයේ සම්පූර්ණ වගකීම භාර, ඒ පිළිබඳ කැබිනට් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරපු, කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කරපු ඇමතිවරයා ඔබ. මේ විධියටම, බාල බෙහෙත් අරන් ආපු කෙහෙළිය රඹුක්වැල්ල කැබිනට් මණ්ඩලයට වැරදි තොරතුරු ඉදිරිපත් කිරීම, කැබිනට් මණ්ඩලය නොමඟ යැවීම, ඒ වාගේම කැබිනට් මණ්ඩලය නොමඟ යැවීම නිසා රජයට වෙච්ච පාඩුව සම්බන්ධයෙන් දූෂණය නමැති වරදට ඔහුට විරුද්ධව අද මහාධිකරණයේ චෝදනා ගොනු කරලා තිබෙනවා. එතකොට ඔබතුමාත් කරලා තිබෙන්නේ බාල ගල් අඟුරු මිලදී ගැනීම. මම ඔබතුමාගෙන් මේ පිළිබඳව අහනවා, ඔබතුමා උත්තර දෙන්න. මේ විශේෂ හදිසි ප්‍රශ්නයක්. ඔබතුමා ඉල්ලා අස් වුණත් නොවුණත් ඒක වෙන කථාවක්. නමුත් මේ Taranjot Resources (Pvt.) Limited නියමිත සුදුසුකම් සම්පූර්ණ කරලා නැහැයි කියලා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ, මේ ආණ්ඩුව විසින් ඊයේ සභාගත කරපු වාර්තාවේ කියලා තිබෙනකොට, මේ ඇති වෙලා තිබෙන තත්ත්වය තුළ එම සමාගම ඉදිරියේදී රටට ගල් අඟුරු සපයනවාද, නැද්ද? එහෙම සපයන්නේ නැත්නම් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම සැපයුවේ නැත්නම් ප්‍රශ්නයක් තිබෙනවා. රටට ගල් අඟුරු නැති වෙලා මේ බලාගාරත් ක්‍රියාත්මක වීම නතර වෙනවා. මේ රටේ බලශක්තිය පිළිබඳ ගැඹුරු අර්බුදයක් මතු වෙනවා, ඒකයි ප්‍රශ්නය. ඇමතිතුමා තනතුරේ හිටියත්, නැතත්, මේ රටේ බලශක්තිය පිළිබඳ ගැටලුවක් තිබෙනවා. ඒ නිසා ඔබතුමා කරුණාකරලා උත්තර දෙන්න, Taranjot Resources (Pvt.) Limited සමඟ තිබෙන ගිවිසුමේ අනාගතය මොකක්ද? හදිසි මිලදී ගැනීම් පිළිබඳ මේ තත්ත්වය තුළ රජයේ ප්‍රතිපත්තිය මොකක්ද? ඔබතුමාට උත්තර දෙන්න බැරි නම්, මේ කථා කරන ඕනෑම රජයේ වගකිව යුතු ඇමතිවරයෙකුට උත්තර දෙන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.56]

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉරානය, ඊශ්‍රායලය සහ ඇමෙරිකාව අතර පවතින යුද්ධමය තත්ත්වය නිසා ලෝකයේ රටවල් දුබලද, ප්‍රබලද කියන සාධකය නොසලකා දැඩි ලෙස පීඩාවට පත් වී ඇති බව අපි හැමෝම දන්නවා. එහිදී විශේෂයෙන්ම ලෝකය පුරා බලශක්ති අර්බුදයක් හටගෙන තිබෙන අතර, එය ඉතා දරුණු ලෙස රටවල ආර්ථිකයට, ජනයාගේ එදිනෙදා කටයුතුවලට දැඩි බලපෑමක් ඇති කරලා තිබෙනවා. මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව වුණේ ඛනිජ තෙල් ඌනතාවක් නොව ඛනිජ තෙල් නිපදවන කර්මාන්තවලට, ඒවා නැව්ගත කරන වරායවලට, ඒ නැව් ගමන් කරන මාර්ගවලට, ඒ නැව්වලට ඇති වන ප්‍රහාර. ඒක දිගින් දිගටම තවමත් සිදු වෙමින් පවතිනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවට බොර තෙල් සපයන කලාපය මෙම අර්බුදයට මුහුණ දීලා තිබෙනවා. මොකද, ලංකාව

පිරිපහදු කරන ලද ඩීසල්, පෙට්‍රල් ඇතුළු අනෙකුත් ඛනිජ තෙල් වැඩිපුරම සපයා ගන්නේ සිංගප්පූරුව, මැලේසියාව, ඉන්දියාව වාගේ රටවලින්. බොර තෙල් තමයි ගොඩක් වෙලාවට අරාබිකරයේ ඉහළ කොටසින් සපයා ගන්නේ. ඇත්තටම ඒක දැඩි ලෙස බලපා තිබෙනවා, අපේ පිරිපහදුවේ නිෂ්පාදන කටයුතුවලට. මොකද, ලංකාවේ සපුගස්කන්ද තෙල් පිරිපහදුව කියන්නේ අපට විශාල ඉතිරියක් ලබා දෙන කර්මාන්තයක්. එහි පිරිපහදු කරන ඩීසල්, පෙට්‍රල් වාගේම ලංකාව පුරා බෙදා හරින භූමි තෙල් සියයට 100ක්ම එහි නිෂ්පාදන. ඒ නිෂ්පාදන හරහා අපට අපේ වෙළෙඳ පොළේ සිල්ලර මිල පාලනය කරන්න පහසු වෙලා තිබෙනවා. ඒකට බාධා කිහිපයක් පැමිණුනා. විශේෂයෙන්ම අපි ගිවිසුම්ගත නැව් තොග ලබා ගැනීමේත් ප්‍රමාදයක් ඇති වුණා. මොකද, නැව් ගමනාගමනය restrict වෙලා තිබෙන නිසා. එතැනදී බොර තෙල් තිබුණත්, බොර තෙල් මිලටත් වැඩිය නැව්වලට අදාළ marine insurance, ඒ වාගේම නැව් භාණ්ඩවලට අදාළ insurance සමහර වෙලාවට අය කරන්නේම නැහැ. නමුත්, ඒවායේ ගාස්තු විශාල ලෙස ඉහළ ගොස් තිබෙනවා. ඒක මත තමයි නැව් සපයා ගැනීමේ බාධාව ඇති වෙලා තිබෙන්නේ. අපි සමඟ agreement ගහලා තිබෙන සැපයුම්කරුවන් පවා ගොඩක් වෙලාවට එම බාධාවට ලක් වෙලා තිබෙනවා.

අපි හැමෝම දන්නවා, විශේෂයෙන්ම යුද්ධයේ ප්‍රධාන පාර්ශ්වයක් වන ඇමෙරිකාවටත් මේ බලපෑම දැඩි ලෙස බලපා තිබෙන බව. ඒගොල්ලන්ට තෙල් තිබෙනවා, නැව් තිබෙනවා, තමන්ගේම insurance companies තිබෙනවා, ඩොලර් තිබෙනවා. ඒ හැම දෙයම තිබිලාත් ඒ ගොල්ලන්ටත් තෙල් ප්‍රවාහනය කරලා තමන්ගේ රටට සපයා ගැනීමේ ලොකු ගැටලුවක් තිබෙනවා. මොකද කැනඩාව, සවුදි අරාබිය වැනි තෙල් තිබෙන රටවල් පවා තෙල් මිල වැඩි කිරීමේ කටයුතුවල දිගින් දිගටම නිරත වුණු නිසා.

දැන් අපේ රටේ තිබෙන තත්ත්වය පෙර වසරවල වාගේ නොවෙයි. ඒ වසරවල රට උලා කාපු නිසා ඩොලර් නැති වෙලා අපට තෙල් නැති වුණාට, ඒ වනකොට ලෝකයේ හැම තැනම තෙල් තිබුණා. තෙල් ප්‍රවාහනය කරන්න ගමනාගමන පහසුකම්, ඒ කියන්නේ ඇති වෙන්න ප්‍රවාහන පහසුකම් තිබුණා. එහෙම තත්ත්වයක් තිබිලාත් අපට තෙල් නැතිව තිබුණා. වර්තමාන තත්ත්වය තුළ ජනතාව ගැන හිතන, රටේ කර්මාන්ත ගැන හිතන, ජනතාවගේ එදිනෙදා කටයුතු වාගේම ආර්ථිකයේ නොනවතින ක්‍රියාකාරීත්වය ගැන බොහොම දැඩිව අවධානයෙන් සිටින ආණ්ඩුවක් විධියට, රජයක් විධියට ඒවා ඒ ආකාරයෙන් පවත්වාගෙන යෑමේ දැඩි වුවමනාව මත අපට යම් යම් කටයුතුවලට එළඹෙන්න සිදු වුණා.

එතැනදී රජය විධියට අපට තිබුණු ප්‍රමුඛතම අරමුණක් තමයි, අවශ්‍ය ප්‍රමාණයට, අවශ්‍ය වෙලාවට අවශ්‍යතාව අනුව හැමෝටම තෙල් සපයන එක. එහිදී සමහර වෙලාවට අපට මිල ගැන සිතන්න නොහැකි වුණා. මොකද, තෙල් සැපයීම කොහොම හරි කළ යුතුයි කියන ස්ථාවරයේ තමයි ආණ්ඩුව විධියට අපි සිටියේ. අපි ඒකට විවිධ ක්‍රියාමාර්ග, විවිධ උපක්‍රම, උපාය මාර්ග අනුගමනය කළා.

அதேபோன்று, மட்டக்களப்பு மாவட்டத்தில் பொறியியல் பிரிவிலே முதலிடம் பெற்ற மட்/ சிவானந்தா தேசியப் பாடசாலையினுடைய மாணவன் மேவின் ஹரி மீனுஜன் என்பவருக்கும், கலைப் பிரிவில் முதலிடம் பெற்ற மட்/ காத்தான்குடி மத்திய கல்லூரியைச் சேர்ந்த எம்.எல்.எம் ஆதில் என்ற மாணவனுக்கும், பொறியியல் தொழில்நுட்பப் பிரிவிலே முதலிடம் பெற்ற மட்/ காத்தான்குடி மத்திய கல்லூரியைச் சேர்ந்த எம்.ஜே. அத்ஹம் அவர்களுக்கும், உயிர் முறைமை தொழில்நுட்பப் பிரிவிலே முதலிடம் பெற்ற மட்/ ஏறாவூர் அலிகார் தேசிய பாடசாலையைச் சேர்ந்த எம்.எல்.ஜே. ஜெஷா அவர்களுக்கும், மருத்துவப் பிரிவில் முதலிடம் பெற்ற மட்/ புனித மிக்கேல் கல்லூரியினுடைய மாணவர் Judenimal Anusram அவர்களுக்கும் நன்றிகளையும் பாராட்டுகளையும் தெரிவித்துக் கொள்கின்றேன். இந்தச் சாதனையானது உங்கள் குடும்பத்தினருக்கும் ஆசிரியர்களுக்கும் பாடசாலைக்கும் மட்டுமல்லாது, முழு மாவட்டத்திற்குமே பெருமை சேர்க்கும் ஒன்றாகும். ஆகவே, உங்களுடைய கல்விப் பயணம் தொடர்ந்து உயர்ந்து, இந்த நாட்டுக்கும் சமூகத்துக்கும் சேவை செய்யும் திறமையான கல்விமான்களாக நீங்கள் வளர வேண்டுமென்று பிரார்த்திப்பதோடு, எதிர்காலத்தில் மேலும் பல வெற்றிகளைப் பெறவும், உங்களுடைய கனவுகள் நனவாக வேண்டுமெனவும் இறைவனிடத்தில் நாங்கள் பிரார்த்திக் கின்றோம். உங்கள் அனைவருக்கும் எங்களுடைய பாராட்டு களைத் தெரிவிக்கின்றோம்.

கௌரவ பிரதம அமைச்சர் அவர்களும் தற்பொழுது இங்கே இருக்கின்றார். கௌரவ பிரதம அமைச்சர் அவர்களே, நாடளாவிய ரீதியில் இருக்கின்ற தேசிய கல்வியியற் கல்லூரிகளின் - National Colleges of Education - கட்டமைப் புக்களை மீளாய்வு செய்யும் நோக்கில், ஐவர் கொண்ட புதியதொரு குழுவை அண்மையில் நீங்கள் நியமித்திருந்தீர்கள். ஆனால், அந்தக் குழுவில் முஸ்லிம் உறுப்பினர் ஒருவர்கூட நியமிக்கப்படாமல் இருக்கின்ற விடயம் குறித்து இலங்கைக் கல்வி நிருவாக சேவை அதிகாரிகள் சங்கத்தினர் கவலை தெரிவித்துள்ளனர்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Could I intervene?

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Yes, sure.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
In the Committee on National Colleges of Education, there is an academic from the South Eastern University.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Okay. First, you had appointed five people and among them, there was no Muslim. In the list of names, there were only four Sinhalese and one Tamil. There are Colleges of Education in Addalaichenai and Dharga Town. In the initial list, Hon. Prime Minister, there was no Muslim. Since you told me now that there is one appointed, I am thankful to you; I would like to thank you for appointing a Muslim also to the Committee.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.03]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේදී මේ විවාදය ආණ්ඩු පක්ෂය පැත්තෙන් යෝජනා කළේ ලෝක යුද තත්ත්වය හමුවේ ප්‍රධාන වශයෙන්ම රට තුළ මතු වෙලා තිබෙන විශේෂිත වූ තත්ත්වය නිසායි. ඒ වාගේම මේ පවතින යුද තත්ත්වය නිසා ඊයේ ජනාධිපතිතුමා රුපියල් බිලියන 100ක - කෝටි 10,000ක - සහන පැකේජයකුත් ඉදිරිපත් කළා. එම කාරණාත් එක්ක තමයි අද දිනයේදී මේ සභාව කල් තැබීමේ විවාදය පවත්වන්න අපි යෝජනා කළේ, රටේ ජනතාවගේ අවබෝධය සඳහා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අහපු ජපන් සෙන් කතාවක් තිබෙනවා. එම කථාවට අනුව කුඩා සාමණේරයන් වහන්සේලා දෙනමක් ගමනක් යනවා. එසේ යනකොට මහදී හොරු කණ්ඩායමක් පහර දීලා එම සාමණේරයන් වහන්සේලා දෙනමට හිරිහැර කරලා, උන්වහන්සේලා සතුව තිබුණු දේවලුත් පැහැර ගෙන යනවා. ඊට පසුව උන්වහන්සේලා දෙනම නැවත පන්සලට එනවා. එම පන්සලේ නායක ස්වාමීන් වහන්සේ බොහෝ උගත් වාගේම පරිණතයි. උන්වහන්සේ අහනවා, "මේ සිද්ධියෙන් ඔබවහන්සේලා දෙනම ඉගෙන ගත්තේ මොනවාද?" කියලා. එක් සාමණේරයන් වහන්සේනමක් කියනවා, ආයෙත් මේ වාගේ ගමන් යන්න හොඳ නැහැ කියන එක තමයි උන්වහන්සේ

ඉගෙන ගත් පාඩම කියලා. අනෙක් සාමණේරයන් වහන්සේ කියනවා, "මෙහෙම ගමන් යද්දී මෙවැනි අනතුරු වෙන්න පුළුවන්, එම නිසා එවැනි අනතුරුවලටත් සූදානමින් තමයි අපි ගමන් යන්න ඕනෑ" කියලා. "හොඳම දේ දැන් ඔබවහන්සේ ආරාමය අත හැරලා යන එක" කියලා පළමු සාමණේරයන් වහන්සේට නායක ස්වාමීන් වහන්සේ කිව්වා කියලා ඒ සෙන් කතාවේ තිබෙනවා. ඒ කියන්නේ, මෙවැනි ගමන් යන්න හොඳ නැහැ කියපු සාමණේරයන් වහන්සේට නායක ස්වාමීන් වහන්සේ කියනවා, "ඔබවහන්සේ මේ සෙන් ධර්මය ඉගෙන ගන්න තරම් සුදුසු නැහැ. හොඳම දේ තමයි මේ ආරාමය අත හැර යන එක" කියලා. හැබැයි, දෙවැනි සාමණේරයන් වහන්සේ කියපු එක නායක ස්වාමීන් වහන්සේ අගය කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි රටක් පාලනය කරද්දී, අපේ න්‍යාය පත්‍රයේ තිබෙන සැලසුම්වලට අනුව රට පාලනය කරගෙන යනවා වාගේම, හැම විටම අවිනිශ්චිත, පරිබාහිර - අපේ agenda එකෙන් පිට - සිදුවන දේවල්වලටත් මුහුණ දෙන්න වනවාය කියන ඒ යථාර්ථය දැනගෙන කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතුව අපි හදාගත්ත සැලැස්මේම තමයි අපි යන්න ඕනෑ, ඒකේ තමයි ඔක්කෝම දේවල් තිබෙන්නේ කියලා හිතුවොත් අපට වෙන්නේත් අර පළමු සාමණේරයන් වහන්සේට වාගේ අසාර්ථක වෙන්නයි. ඒ නිසා රාජ්‍ය පාලනය සම්බන්ධව අද අපේ විපක්ෂයේ ඉන්න - මීට කලින් රට පාලනය කරපු - අය කියන දේවල් ඇහුවාම අපි හිතනවා, ඒගොල්ලන් අර පළමු සාමණේරයන් වහන්සේ වාගේ තමයි කල්පනා කරන්නේ කියලා. ඒ කියන්නේ, ඒගොල්ලන් රාජ්‍ය පාලනයේදී අසමත් වූ නිසා තමයි ජනතාව සහමුලින්ම ඒ අය ප්‍රතික්ෂේප කරලා තිබෙන්නේ.

මෙතැනදී වැදගත් වන්නේ මෙයයි. වර්තමානයේ අපි මුහුණ දෙන මේ තත්ත්වය ඇති වුණේ කොහොමද කියන එක පිළිබඳව විශ්ලේෂණයක් අවශ්‍යයි. එහෙම නැතුව රාජ්‍ය පාලනය කරන්නත් බැහැ, සාර්ථක රාජ්‍ය පාලනයක් බලාපොරොත්තු වෙන්නත් බැහැ. එතකොට මේක ලංකාවේ දේශපාලන, ආර්ථික, සමාජයීය කළමනාකරණය විසින් ඇති කරපු ගැටලුවක්ද? ඉස්සෙල්ලා ඒක තෝරාගන්න එපායැ. මේක අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ, හරිනි අමරසූරිය අගමැතිතුමිය ඇතුළු ආණ්ඩුවේ කළමනාකරණයේ ගැටලුවක්ද, එය විසින් ඇති කරපු ප්‍රශ්නයක්ද? එය විසින් ඇති කරපු ප්‍රශ්න මේකේ මොනවා හරි තැනක තිබෙනවාද? එහෙම නැත්නම් මේක පරිබාහිරව ආපු ප්‍රශ්නයක්ද? ගමනක් යනකොට බලාපොරොත්තු නොවෙච්ච ප්‍රශ්න එන්න පුළුවන්. අන්න එවැනි බලාපොරොත්තු නොවෙච්ච ප්‍රශ්නයක් මතු වුණාම එය කළමනාකරණය කරන්නේ කොහොමද? ඒ නිසා හරියට තෝරාගන්න ඕනෑකම තිබෙනවා, මේක රට තුළින් ඇති වෙච්ච ප්‍රශ්නයක්ද, රට තුළින් ඇති වෙච්ච ප්‍රශ්නයක් නොවුණත් බාහිරින් ඇති වෙච්ච ප්‍රශ්නයක් නම් මේ බාහිරින් ඇති වෙච්ච ප්‍රශ්නය කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක. ඒ නිසා ආණ්ඩුවකට කියන්න බැහැ, අපි සැලසුම් කරගත්ත ගමන යන්න ගියා, එතකොට කොවිඩ් වසංගතය ආවා, මාර වැඩේ වුණේ කියලා. ආණ්ඩුවකට එහෙම කියන්න බැහැ. ඒ නිසා ආණ්ඩුවක් හැම විටම දෙවැනි සාමණේරයන් වහන්සේ කල්පනා කළ විධියට ගමන යන්නත් ඕනෑ; ගමන නොයා ඉන්නත් බැහැ; ගමන යනකොට අපි බලාපොරොත්තු නොවෙන දේ; මෙහෙම අනතුරු විය හැකියි කියන අවබෝධය මත තමයි අපි ගමන යා යුතු වන්නේ.

ඒ නිසා දැන් අපේ රටේ ජනතාවත් මේ ප්‍රශ්නය ගැන ඒ විධියට බලන්න ඕනෑ. මේක රටේ අභ්‍යන්තරයෙන් ඇති වෙච්ච ප්‍රශ්නයක් නොවන බව ඕනෑම බබෙකුට තේරෙනවා, මේ ඉස්සරහ ඉන්න හතරපස්දෙනාට හැරුණාම. එහෙනම් මේක පරිබාහිරව ඇති වෙච්ච ප්‍රශ්නයක්. ඒක කාටත් තේරෙනවා. ඒක මුළු ලෝකයම අද මුහුණ දී තිබෙන තත්ත්වයක්, යුද්ධය කරන රටටත්, ඒකෙන් අනෙක් හැම රටකටමත් ඇති වෙච්ච ප්‍රශ්නත් එක්ක. ඒ නිසා මේක පරිබාහිර ප්‍රශ්නයක් කියන එක ඉස්සෙල්ලා පිළිගන්න ඕනෑ. එහෙම නැතුව කරන විවේචනවල කිසිම තේරුමක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ කාලය කා දැමීම සහ හැන්සාඩ් වාර්තා පිරවීම විතරයි ඒකෙන් වෙන්නේ. ඒ නිසා මට මූලික වශයෙන්ම කියන්න තිබෙන දේ තමයි, විපක්ෂය අන්න ඒ දේ තේරුම් ගන්න ඕනෑය කියන එක. ඒ කියන්නේ මෙන්න මෙහෙමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කැමැතියි, අපට හරියට දැනෙන්න ගහනවා නම්. එතකොට නේ, අපි වුණත් හොඳට සූදානම් වෙලා මේකට හොඳට උත්තර දෙන්න පෙළඹෙන්නේ. එතකොට තමයි අපි වුණත් තව ගැඹුරෙන් හිතන්නේ, අපේ අඩුපාඩු ගැන. හැබැයි, අපි ෆුට්බෝල් ගහන්න එනකොට මේගොල්ලන් නිකම් වෙන මොනවා හරි ඒවා ගහන්න ආවාම ඒකේ කිසිම අදාළත්වයක් නැහැ.

දැන් ලෝකයේ තෙල් මිල වැඩි වෙච්ච එකම රට ලංකාවද? ලෝකයේ උද්ධමනය වැඩි වෙච්ච එකම රට ලංකාවද? එහෙම නැහැ. අපි වාගේ රටවල් නොවෙයි, අපට වඩා දියුණුයි කියන රටවලත් මේ ප්‍රශ්නයේදී මීට වඩා බරපතළ අමාරුකම්වල වැටිලා තිබෙනවා. මට ලොකුවට වෙලාව ගන්න අවශ්‍යතාවක් නැහැ. අපි කරුණාකරලා විපක්ෂයට කියන්නේ, ප්‍රශ්නය හරියට තේරුම් අරගෙන අපට දැනෙන්න ගහන්න කියලායි. Loose ballsවලට ගහලා අපට ඇති වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම කථාවකටවත් ලැහැස්ති වෙන්න හිතෙන්නේ නැහැ. මම උදේ පොඩ්ඩක් ඒ ගැන හිතුවා. නමුත් මම දැන් මෙන්න මේ ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය එක්කයි, නජිත් ඉන්දික මන්ත්‍රීතුමා එක්කයි ටිකක් කථා කරලා ආවේ, මොනවාද මම කථා කරන්නේ කියන එක ගැන. ඇත්තටම කථාවකට ලැහැස්ති වෙන්න හිතෙන්නේ නැහැ. ඒ නිසා ඇත්තටම මේ තත්ත්වය තේරුම් ගත්ත විපක්ෂයක් අපට අවශ්‍යයි.

අපි අද විවාද කරන මාතෘකාවට කෙළින්ම ආවොත් ඒක බාහිර වශයෙන් ආපු ප්‍රශ්නයක්. නමුත්, ආණ්ඩුවකට ඒ සඳහා සූදානමක් තිබෙන්න ඕනෑ. බාහිර වශයෙන් ප්‍රශ්න එන්න පුළුවන්. "දිට්වා" වැනි සුළි කුණාටු එන්න පුළුවන්. අපි කිව්වා කියලා සුළි කුණාටු එන්නේ නැහැ. නමුත්, ලෝකයේ සුළි කුණාටු ඇති වනවා. එම නිසා natural disaster එකක් ආවාම ඒකට මුහුණ දෙන්න ආණ්ඩුවකට හැම වෙලාවේදීම package එකක් තිබෙන්න ඕනෑ. එහෙම නැතුව සුළි කුණාටු ආවාම "සුළි කුණාටු ආවාද?" කියලා අහලා විතරක් බැහැ. ඒක තමයි ඇත්ත.

ඒ වාගේම තමයි, මැද පෙරදිග පවතින යුද්ධය. එම නිසා මේ කාරණාවලදී බලන්න තිබෙන්නේ ආණ්ඩුවක් වශයෙන් අපි කොයි තරම් දුරට බාහිර වශයෙන් ආපු ඒ ප්‍රශ්නය කළමනාකරණය කරන්නට අර දෙවැනි සාමණේරයන් වහන්සේ වාගේ කොච්චර සැලසුමක් හදා ගෙන තිබුණාද කියන එකයි. දැන් සති දෙකක සටන් විරාමයක් ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ අතරේ අරගෙන් මෙහෙන් පොඩි පොඩි පත්තු වීම් තිබේවි කියලා අපි හිතනවා. මම හිතන්නේ දැනුත් ඉරානයේ refinery එකකට ගහලා තිබෙනවා. මේ තත්ත්වය අනුව අපි හිතනවා, යුද්ධය කරන කෙනාට යුද්දෙන් ගුටි කන කෙනාට වඩා අමාරුයි කියලා. ඒ නිසා අපි හිතනවා, සටන් විරාමය සති දෙකකට වඩා දීර්ඝ වෙන්නත් පුළුවන් කියලා. එය අපි තීන්දු කරන දෙයක් නොවෙයි. මේකෙන් පස්සේ ඇත්තටම ලෝක යුද්ධය පිළිබඳව political audit එකකුත්, ඒ වාගේම ලංකාව මේ ප්‍රශ්නය කළමනාකරණය කිරීම පිළිබඳව දේශපාලන විගණනයකුත් කර ගන්න එක ලංකාවට ඉතා වැදගත් කියලා මම හිතනවා.

[ගරු බිමල් රත්නායක මහතා]

මොකද, ලංකාවේ ජනතාව තමන් පත් කර ගත් ආණ්ඩුව ගැන දැන ගන්න ඕනෑ. මේක මිනිසුන්ගේ ආණ්ඩුවක්. ආණ්ඩුවට නොවෙයි, මිනිසුන්ටයි රට අයිති. මිනිසුන් පත් කර ගත්ත ආණ්ඩුව කොයි තරම් ශක්තිමත්ද, කොයි තරම් සාර්ථකව මේ තත්ත්වය කළමනාකරණය කළාද කියලා ඒ අය දැන ගන්න ඕනෑ. මෙය අහම්බයක් තමයි. නමුත්, එම අහම්බය කෙසේ කළමනාකරණය කළාද කියලා දැන ගන්න ඕනෑ. අන්න ඒ මත තමයි ඊළඟ අභියෝග ගැන තීරණය කළ හැකි වන්නේ. අනුර සහෝදරයාට කළමනාකරණය කරන්න හම්බ වුණේ නැහැ, කොවිඩ් වසංගතයෙන් ඇති වූ බලපෑම; අනුර සහෝදරයාට කළමනාකරණය කරන්න හම්බ වුණේ නැහැ, 2022 දේශපාලන crisis එක නිසා ඇති වුණු බලපෑම. දැන් අනුර සහෝදරයා ඇතුළු අපේ ආණ්ඩුවට කළමනාකරණය කරන්න සිදු වෙලා තිබෙනවා, "දිට්වා" සුළි කුණාටුව සහ මැද පෙරදිග යුද්ධය නිසා අපේ රටට ඇති වන බලපෑම. එතකොට මේ වාගේ පරිබාහිර දේවල් කළමනාකරණය කරන්නේ කොහොමද? ඒකට තමයි දේශපාලන නායකත්වය අවශ්‍ය. එම නිසා ඇත්තටම මම කැමැතියි, මේ ගැන දේශපාලන විශ්ලේෂණයක් කරනවා නම්. අපේ රටේ විද්වතුන්ගෙන් අපි ඉල්ලා සිටිනවා, මේ ගැන හොඳ දේශපාලන විශ්ලේෂණයක් කරලා ඒ ගැන රටේ ජනතාවට දැන ගන්න ලියන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෙබරවාරි 27වැනි දා යුද්ධය පටන් ගත් බව ඔබතුමා දන්නවා. පෙබරවාරි 27වැනි දා යුද්ධය පටන් ගත්තාට පස්සේ ආණ්ඩුව මොකක්ද කළේ? දැන් මා ළඟ තිබෙනවා, පෙබරවාරි 28වැනි දා ඉඳලා ජනාධිපතිතුමා කරන ලද සාකච්ඡා ප්‍රමාණය ගැන විස්තර. මොකද, යුද්ධය ඇති වෙන්නේ මැද පෙරදිග කලාපයේ බව අපි දන්නවා. ඒ අනුව තෙල්වලට බලපෑමක් ඇති වනවා. එම නිසා ජනාධිපතිතුමාගේ පැත්තෙන් සාකච්ඡා රාශියක් කළා. මුල්ම දවස්වල එතුමා ලංකාවේ අපනයනකරුවන් මුණ ගැහිලා සාකච්ඡා කළා. ඊට පසුව බැංකුවල නිලධාරීන් එක්ක සාකච්ඡා කළා. මහ බැංකුවේ නිලධාරීන් එක්ක සාකච්ඡා කළා. ඒ, 28, 29 දිනවල. ඊළඟට, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරීන් එක්ක සාකච්ඡා රාශියක් පැවැත්වූවා. යුද්ධය පටන්ගෙන පළමු දවස් තුන හතරේදී යුද්ධයේ තත්ත්වය තේරුම් ගන්න අපි මොකක්ද කළේ? යුද්ධයේ තත්ත්වය තේරුම් ගැනීම සඳහාත්, යුද්ධය නිසා ඇති වන එකින් එක බලපෑම් තේරුම් ගැනීම සඳහාත් තමයි මූලික වශයෙන් අපි ඒ ගැන අධ්‍යයනය කරන්න පටන් ගත්තේ. අධ්‍යයනය කරන්නේ නැතුව ඒකට මුහුණ දෙන්න බැහැ. මොකද, යුද්ධය ගොඩනැඟෙමින් තිබුණු දෙයක්.

එම නිසා අපි මුලින්ම මොකක්ද කළේ? එය පරිබාහිරව ඇති වුණු තත්ත්වයක්. යුද්ධය කොහොමද වර්ධනය වෙන්නේ කියන කාරණා දිහා බලමින් ඒක එක එක ක්ෂේත්‍රවලට බලපාන්නේ කොහොමද කියන එක ගැන අපි සාකච්ඡා කළා. ජනාධිපතිතුමා පොහොර ආනයනකරුවෝ පවා හමු වුණා. මොකද, ඊළඟට පොහොර ආනයනයටත් මේ යුද්ධය බලපාන බව අපි දන්නවා. ඊළඟට එන්න තිබෙන්නේ යල කන්නය. ඒ වාගේම තේ වගාවටත් මේ යුද්ධය නිසා ඇති වන අර්බුදය බලපානවා. එය අපේ අපනයනවලටත් බලපානවා. අපි හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා අපනයන කරන්න ඕනෑ. ඒ වාගේම හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා තෙල් ගෙනෙනවා. ඒ කලාපයේ යුද්ධය තිබෙන නිසා සුවස් ඇළ හරහා අපට exports කරන්න බැහැ. අපේ අපනයනවලින් සියයට 24ක් යවන්නේ ඇමෙරිකාවට. එම නිසා අපි අපනයනකරුවෝ, බැංකුකරුවෝ එක්ක කථා කරලා හැම සාධකයක් අනුවම යුද්ධය develop වන විධිය බැලුවා. ඒක තමයි ජනාධිපතිවරයෙකුට, ආණ්ඩුවකට කරන්න තිබෙන්නේ. ඊට පස්සේ මොකක්ද කරන්න තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අපි දැක්කා, යුද්ධය වර්ධනය වන බව. එම නිසා අපට තේරුණා, තෙල් සැපයුම දුර්වල වනවා, එම නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට, මහා භාණ්ඩාගාරයට විශාල බාධාවක් ඇති වනවා, ඒකෙන් විශාල ණය බරක් ගොඩගැහෙනවා කියලා. ඒ නිසා අපි මාර්තු 09වැනි දා තෙල් මිල වැඩි කළා. ඒ අනුව තෙල් මිල යම් ප්‍රමාණයකින් වැඩි වුණා; විශාල ප්‍රමාණයකින් නොවෙයි. මේ තත්ත්වයත් එක්ක මම හිතන විධියට ඒ වෙලාවේදී රුපියල් 22කින් වාගේ තමයි තෙල් ලීටරයක මිල වැඩි වුණේ. ඊට පස්සේ මාර්තු 15වැනි දා වනකොට අපට තේරුණා, යුද්ධය ගොඩක් වේගයෙන් සිදු වන බව. එම නිසා අපි QR code එක හඳුන්වා දුන්නා. QR code එක හඳුන්වා දුන්නේ තෙල් භාවිතය අඩු කරන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පස්සේ බදාදා දින ලබා දුන් නිවාඩුව ගත්තොත්, කැබිනට් මණ්ඩලය මේ සම්බන්ධයෙන් සොයා බලන්න කමිටු 4ක් පත් කළා. ඒ, අගමැතිතුමියගේ මූලිකත්වයෙන් බදාදා දින නිවාඩුව රාජ්‍ය සේවයට බලපාන විධිය බලන්නත්, මගේ මූලිකත්වයෙන් අත්‍යවශ්‍ය සේවාවන්වලට තෙල් බෙදා හැරීම පිළිබඳව සොයා බලන්නත්. ඒ අනුව QR ක්‍රමය මාර්තු 15වැනි දා පටන් ගත්තා. මාර්තු මාසයේ 22වැනි දා පමණ වෙනකොට අපි QR එක සියයට 90කට වාගේ ප්‍රමාණයකට ලබා දීම සම්පූර්ණ කළා. දැන් QR එක ගැන කිසිම ප්‍රශ්නයක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය පිළිබඳව තවත් සොයා බලා බදාදා දින නිවාඩු ලබා දෙන්න මට මතක විධියට මාර්තු 16වැනි දා පැවති කැබිනට් මණ්ඩල රැස්වීමේදී තීන්දු කළා. ඒ අනුව මාර්තු 18, මාර්තු 25 සහ අප්‍රේල් 01වැනි දා කියන බදාදා දිනවල නිවාඩුවක් ලබා දුන්නා, තෙල් පරිභෝජනය අඩු කරන්න.

ඒ නිසා ඔබතුමාට මේ කාරණා දිහා බැලුවාම පෙනෙනවා ඇති, මේ යුද්ධය තුළින් ඇති වුණු බාහිර බලපෑම් තුළ අපි කටයුතු කළේ කොහොමද කියලා. යුද්ධය වර්ධනය වුණාට පසුව තෙල් පරිභෝජනය අඩු කරන්නත්, අනෙක් පැත්තෙන් අතිවිශාල ණය කන්දක් එක වතාවට රට මත කඩා පහත් වුණාට පස්සේ නිකම් බිමට වැටෙන්නත් අපිට බැහැ. ඒ නිසා මේ සියල්ල අපි කළමනාකරණය කරනවා. දකුණු ආසියානු කලාපයේ, අග්නිදිග ආසියානු කලාපයේ රටවල්වලට සාපේක්ෂව බැලුවාම තෙල් කළමනාකරණය හොඳට කරපු රටවල් අතරින් අපි ඉස්සරහින් ඉන්නවා. ඒක මම හිතන්නේ අමුතුවෙන් facts ගෙනැල්ලා ඉදිරිපත් කරන්න ඕනෑ නැහැ. එහෙම අපි කටයුතු කළා නම් අපිට එරෙහිව අතිවිශාල උද්ඝෝෂණ ප්‍රමාණයක් ඇති වෙන්න ඕනෑ. අද ලංකාවේ මිනිස්සු තෙල් ගහන්නේ නැද්ද කියලා හිතෙන තරමටම කිසිම ප්‍රශ්නයක් නැතුව ඒ කටයුතු සිදු වනවා. අපි තෙල් සම්බන්ධ ප්‍රශ්නය ගත්තොත්, මෙය දේශපාලන වශයෙන් බාහිර ප්‍රශ්නයක් වුණාට මැද පෙරදිග යුද්ධය පටන් ගත් පෙබරවාරි 27වැනි දා ඉඳලා අපි මේක කළමනාකරණය කරගෙන ඇවිල්ලා තිබෙනවා.

ත්‍රී වීලර් පදවන කට්ටියට සහන දීලා නැහැ කියලා මට දැන් කිව්වා. ත්‍රී වීලර් පදවන අයට විතරක් නොවෙයි, ඔක්කොටම අපි සහන දීලා තිබෙනවා. ත්‍රී වීලර්වලට ඩීසල් ගහන්නේ නැහැ කියලා කියන්න පුළුවන්. නමුත්, සමහර ත්‍රී වීලර්වලට ඩීසල් ගහනවා. හැම ඩීසල් ලීටරයකටම රුපියල් 100 දක්වා සහනයක් දෙන්නේ කොහොමද? ඒක තමයි අර දෙවැනි සාමණේරයන් වහන්සේ කිව්වා වාගේ අපි අනතුරක් වුණාම ඊට අවශ්‍ය කරන අනෙකුත් දේවලුත් සමන්විත කර ගෙන යන්නේ. ඔබතුමා දන්නවා, පසුගිය මාස 16ක් තුළ අපි අමාරුවෙන් මූල්‍ය විනයක් ඇතුව, අරපරිස්සමෙන් යුතුව වැඩ කරලා රුපියල් ට්‍රිලියන එකහමාරකට ආසන්න මුදලක් භාණ්ඩාගාරයේ තබා ගත් බව. එලෙස භාණ්ඩාගාරයේ තබා ගත් රුපියල් ට්‍රිලියන එකහමාරෙන් තමයි "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේදී අපි රුපියල් බිලියන 500ක් දුන්නේ එක රුපියලක්වත් අච්චු ගහන්නේ නැතුව. ඒ, අර දෙවැනි සාමණේරයන් වහන්සේගේ theory එක අනුගමනය කරලා. අපි

ගමන යනවා. ඒ ගමන යද්දී එන්න පුළුවන් හදිසි අනතුරුවලට මුහුණ දෙන්න අවශ්‍ය බඩුත් pack කර ගෙනයි අපි යන්නේ. ඒකත් pack එකේ වෙනම තිබෙනවා, හදිසියකට ගන්න. රාජපක්ෂලා වාගේ රටත් කාලා, pack එකේ තිබෙන ඔක්කෝම කන කට්ටිය නොවෙයි අපි. රනිල්ලා, රාජපක්ෂලා වාගේ pack එකේ තිබෙන දේවල් තමන්ගේ යහළුවන් අතර විතරක් බෙදා ගෙන රටේ මිනිස්සු හිඟමනට දමන කට්ටියත් නොවෙයි අපි. සජිත් ප්‍රේමදාස මහත්තයා නම් සමහර විට මොනවා කරයිද කියලා මම දන්නේ නැහැ. එතුමා ගැන මේ වෙලාවේදී කථා කරන්න අවශ්‍යතාවක් නැහැ.

මම කියන්නේ මේකයි. "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේදී අපේ pack එකේ තිබුණා, optional වශයෙන් හදිසි අවස්ථාවට, in case, ගන්නා බඩු. ඒවායෙන් තමයි අපි "දිට්වා" සුළි කුණාටුව ආපු අවස්ථාවේදී මුහුණ දුන්නේ. ඊයේ අගමැතිතුමියගේ මූලිකත්වයෙන් අපි රැස්වීම පටන් ගත්තා. ආණ්ඩුවක් විධියට දෙන්න පුළුවන් උපරිම සහනාධාර අපි දීලා තිබෙන්නේ. ඒවා පරිපාලන වශයෙන් තවත් ශක්තිමත්ව බෙදන්න තමයි තිබෙන්නේ. අද අපි සහන දීලා තිබෙන්නේ කොහොමද? අර සාමණේරයන් වහන්සේ කිව්වා වාගේ ඒ pack එකේ optional බඩු තිබුණු නිසා තමයි අපිට රුපියල් බිලියන 100ක් ඉන්ධනවලට දෙන්න පුළුවන් වුණේ; ඊයේ දුන් රුපියල් බිලියන 100 නොවෙයි. රුපියල් 550ක්, රුපියල් 600ක් වෙන්න ඕනෑ ඩීසල් ලීටරයකට ඊට කලින් ඉඳලාම රුපියල් 100ක් දක්වා සහනයක් දීලා තිබෙන්නේ optional pack එකෙන්; විකල්ප වශයෙන් හදා ගත්ත එකෙන් දීලා. දැන් තිබෙන ගණනත් වැඩියි කියන එක අපි පිළිගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ විධියට සහන දීලා තමයි මේ තත්ත්වයට මුහුණ දෙන්නේ. ඒ පිළිබඳව තමයි අපට බලන්න තිබෙන්නේ. ආණ්ඩුවක් විධියට නිකම් අත වන වනා ගියා නම් මුකුත් කරන්න බැහැ. ට්‍රම්ප්ට බැණ බැණ ඉන්න පුළුවන්. අපි ට්‍රම්ප් ජනාධිපතිතුමාට බණින්න ගියේ නැහැ. මොකද, එතුමා ලංකාවට සල්ලි දෙන්නේ නැහැ නේ. ඒක තමයි අපි ආණ්ඩුවක් වශයෙන් කරලා තිබෙන්නේ. ඒකයි මම කිව්වේ political audit එකක් කරන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තෙල් මිල පාලනය කිරීමේ කටයුතු කරන අතරේ අපි ජනතාවට හැම වෙලාවේදීම ඇත්ත කිව්වා. කිසිම අවස්ථාවක ජනාධිපතිතුමාවත්, අපිවත් කිව්වේ නැහැ, ඔක්කෝම හරි, අපි ඔයගොල්ලන්ට තෙල් දෙන්නම්, ඔයගොල්ලන් තෙල්වලින් නාන්න කියලා. අපි කිසිම අවස්ථාවක එහෙම කිව්වේ නැහැ. ඊයේත් ජනාධිපතිතුමා කිව්වා, මැයි 31වැනි දා වෙනකල් තෙල් supply එක තිබෙනවාය කියලා.

දැන් කියුබාවේ blockades තිබෙනවා. කියුබාවේ තිබෙනවා, "zero-option" කියලා අවස්ථාවක්. මොන option එකක්වත් නැහැ, ඒත් ජීවිතයට මුහුණ දෙන්න ඕනෑ. අපි ඒක දකිනවා, ඉරානයේ මිනිසුන්ගෙන්. ගිහිල්ලා පාලම්, බලාගාර බදා ගන්නවා. මිනිස්සු තරම් powerful දෙයක් නැහැ. ඒක තමයි කියුබාවේ නායකයෝ කියන්නේ වෙන කිසි දෙයක් කරන්න නැහැ, මුහුණ දෙනවා කියලා. අපි හැම වෙලාවේ ජනතාවට ඇත්ත කියනවා. අපි අවුරුදු උත්සවවලදී පුළුවන් තරම් සීමා කරගෙන කටයුතු කරනවා. නමුත් අවුරුද්ද කන්න ඕනෑ; සතුටු වෙන්න ඕනෑ. හැම දාම ජීවිතය කල්දදා ඉන්න බැහැ නේ. මැයි 31 දක්වා මේක තිබෙනවා, නමුත් අපි ජනතාවට කියනවා, පරිස්සමෙන් යමු කියලා. අපි rosy picture එකක් දීලා නැහැ, "ඔයගොල්ලන් ඕනෑ පිස්සුවක් කෙළින්න, මම රට ගොඩ දාන්නම්" කියලා. ජනාධිපතිතුමා එහෙම කියලා නැහැ. අපි ජනතාව දැනුවත් කරගෙන, ඒගොල්ලන් එකතු කරගෙන මේ ගමන යනවා. දැනට zero-option එකක් නැහැ. අපට options ගොඩක් තිබෙනවා. නමුත් zero-option එකකට වුණත් මුහුණ දෙන්න මිනිස්සු ලැහැස්ති කරන්න ඕනෑ.

ඊළඟට, මේ කටයුත්තේදී අපි ජාත්‍යන්තර සාධකත් එක්ක වැඩ කරලා තිබෙන්නේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය එනකොට අපි චීනය එක්ක, ඉන්දියාව එක්ක, ඉරානය එක්ක ගනුදෙනු කළා. අපට රුසියාව එක්ක ගනුදෙනු කිරීමේ බාධාවක් තිබෙනවා, බැංකුවලට ඇමෙරිකානු මූල්‍ය සම්බාධක තිබෙන නිසා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි.

නමුත් අපි රුසියාවත් එක්කත් අපේ සම්බන්ධතා පුළුල් කරගෙන තිබෙනවා. යුද්ධය තව මාසයකින් හරි, දෙකකින් හරි ඉවර වෙනවා නම් - අපි දැනට මොකක්ද කර තිබෙන්නේ? රුසියාව, චීනය, ඉන්දියාව, ඉරානය වාගේ විශාල බලගතු රටවල් එක්ක අපේ සබඳතා තවත් තහවුරු කරගෙන තිබෙනවා. එක සතියක් ඇතුළත රුසියානු බලශක්ති නියෝජ්‍ය ඇමතිතුමාත් විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමාත් ඇවිල්ලා තිබෙනවා. මොකද මේ dust එක settle වුණාම බලන්න ඕනෑ මොකක්ද ප්‍රතිඵලය කියලා. දේශපාලන සාධකය අවුල් කරගෙන නැතුව අපි හරියට දේශපාලන සාධකය කළමනාකරණය කරලා තිබෙනවා. අපි හිතනවා, අපි රුසියාව එක්ක පටන් ගන්නා සබඳතාවන් අපේ රටේ පොදු ආර්ථිකයට විශාල ප්‍රයෝජනයක් වේවි කියලා. මොකද, ඒගොල්ලන් තෙල්, ගෑස්, පොහොර සම්පාදනය කරන රටක්. අපේ තේ යවන රටක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුන්වැනි කාරණය මෙයයි. අපි සහන පැකේජයක් දීලා තිබෙනවා. අර කමිටු හතරෙන් එකක වගකීම ඒක. අපේ විකල්ප මල්ලේ තිබෙන්නේ මොකක්ද? තෙල් අර්බුදය හේතුවෙන් අමාරු තත්ත්වයක් එනවා. අපට පෙනෙනවා, යුද්ධය යන විධිය. ඒක කාටවත් අවුරුදු ගණනාවක් අල්ලාගෙන යන්න වෙන්නේ නැහැ. ඒ නිසා ඊට අදාළව අපි දැනට බිලියන 100ක ආධාර ජනතාවට දීලා තිබෙනවා. ඒක පිළිගන්න බැරුව බොරු කියනවා. ගයන්ත මන්ත්‍රීතුමා කිව්වා, "සහන පැකේජයක් යැයි" කියලා. එහෙම කියලා එතුමාම කියනවා, පොහොර සහනාධාරය දෙන එක ඉක්මන් කරන්න කියලා. එතුමාම කියනවා, අස්වැසුම අවුරුද්දට කලින් දෙන්න ලු. "යැයි" නම් කොහොමද දෙන්නේ? ඒකයි මම කියන්නේ හිස් පිට්ටනිවල ගහ ගන්න එන්නේ නැතුව මෙතැන හරියට විවේචනයක් කරන්න කියලා. අපි සහන පැකේජයක් දීලා තිබෙනවා. අපි දැනගෙන හිටියා ආණ්ඩුවක් කරද්දී අපි බලාපොරොත්තු නොවන, agenda එකෙන් පිට දේවල් එනවා, ඒවාට අපි මුහුණ දිය යුතුයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාව ඉවරයි කියලා කියන්නයි ඔබතුමා හදන්නේ.

අපි ඔබතුමන්ලාට කියන දේ, ජනතාවට කියන දේ මේකයි. අර්බුදයකදී රටක් කළමනාකරණය කරන්නේ කෙසේද කියන එක තමයි දේශපාලන නායකත්වයක litmus test එක. ඒක තමයි litmus test එක. ඒ litmus test එකෙන් රනිල් ෆේල් වුණා; ගෝඨාභය ෆේල් වුණා; මෛත්‍රීපාල මහත්තයා ෆේල් වුණා, ආරක්ෂක ප්‍රශ්නයත් එක්ක. "දිට්වා" සහ මේ විශාල අර්බුදයේදී අපි මේක කළමනාකරණය කරලා තිබෙනවා.

[ගරු බිමල් රත්නායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් ඔබතුමාට මම මේ කාරණය කියන්න කැමැතියි. අපි මේක one issue කරලා නැහැ. අපට ඕනෑ හැටියේ කියන්න පුළුවන්; මේක තව මවලා දීලා "මේක මාර ප්‍රශ්නයක්. මොකුත් කරන්න බැහැ. වැල් පාලමක් නැහැ" කියලා මිනිස්සු භය කරලා අනෙක් ඔක්කෝම වැඩ නතර කරන්න පුළුවන්. අපි එහෙම කළේ නැහැ. අද උදේ කොටුව බස් නැවතුම්පොළේ කටයුතු පටන් ගත්තා. හෙට උදේ අපි ගරු අගමැතිතුමිය එක්කගෙන ගිහිල්ලා Fort Railway Station modernization පටන් ගන්නවා. අනෙක් අමාත්‍යාංශ ඔක්කෝමත් මේ අස්සේ වැඩ කරනවා. අපි මුළු රටම මේකට හිර කරලාත් නැහැ. මම ඒකයි කියන්නේ, මේ වර්තමාන සිද්ධිය නිසාය කියලා ජනතාවට හම්බ වෙන පොහොර සහනාධාරය, ඉන්ධන සහනාධාරය, අස්වැසුම වැඩිවීම, විශාල බෝට්ටුකරුවන්ට ලැබෙන සහන අපි නවත්ලා නැහැ. ඒවා ලබා දෙනවා.

මම මේ කාරණයත් කියලා කථාව අවසන් කරන්නම්. මේ සභාවේ විපක්ෂය පැත්තේ ඉන්නවා, හිටපු ධීවර රාජ්‍ය ඇමතිතුමා. ඊයේ ජනාධිපතිතුමා කථා කරද්දීත් එතුමා කිව්වා, එතුමාගේ බෝට්ටු තිබෙනවා. එතුමාටත්, එක්ලක්ෂ පනස්දාහක් හම්බ වෙනවා කියලා. ලොකු බෝට්ටු තිබෙන අනෙක් අයටත් හම්බ වෙනවා. එතුමාව ඉස්සරහා තියාගෙන විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියනවා, ධීවරයන්ට මොකුත් ලැබෙන්නේ නැහැ කියලා. පැහැදිලිවම ගත්තොත්, අපි මෙතැනදී හැම දෙයක්ම දේශපාලනමය වශයෙන් කළමනාකරණය කරගෙන නායකත්වය දීලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා අපි කිසිම දෙයක් one issue කරලා, බය කරලා, බිල්ලෝ මවලා ජනතාවගේ පොදු කටයුතු නවත්වලා නැහැ කියලා මම හිතනවා.

ඒ නිසා මම කියන්නේ, මේ අවස්ථාවේ ජනතාව බලන්න ඕනෑ, කොච්චර සහනාධාර දුන්නාද, කොච්චර අරවා දුන්නාද, මේවා දුන්නාද කියන එක නොවෙයි. ආණ්ඩුවක් හදිසි තත්ත්වයකදී; විශේෂයෙන් තමන්ට පාලනය කරන්න බැරි තත්ත්වයකදී, අමාරු තත්ත්වයකදී, මේ මහා විශාල සාගරයේ ජනතාව අරගෙන යන්නේ කොහොමද, navigate කරන්නේ කොහොමද කියන එකයි. අන්න ඒක තමයි අපේ රටේ ජනතාවට කරන්න තිබෙන දේශපාලන විගණනය - political audit එක - කියා මා හිතනවා. ඒ විගණනය තුළින් තමයි ජනතාව තමන්ගේ දේශපාලන නායකත්වයේ සාර්ථක, අසාර්ථකභාවය මනින්න ඕනෑ. මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[පි.ව. 5.26]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அண்மையில் வெளிவந்த க.பொ.த. உயர் தரப் பரீட்சைப் பெறுபேறுகளின் அடிப்படையில், தேசிய ரீதியில் Bio Science பிரிவில் முதலிடம் பெற்றுள்ள Royal College மாணவன் Dilan Karunaratne, கணிதப் பிரிவில் முதலிடம் பெற்றுள்ள Kilinochchi Maha Vidyalaya மாணவன் Thevendran Thirukumaran, Commerce பிரிவில் முதலிடம் பெற்றுள்ள காத்தான்குடி மத்திய கல்லூரி மாணவன் Mohamed Subaideen Mohamed Farhan, கலைப் பிரிவில் முதலிடம் பெற்றுள்ள Wayamba Royal College மாணவன் Achintha Rathnayake, Biosystems Technology இல் முதலிடம் பெற்றுள்ள Veyangoda, Bandaranayake Central College மாணவி Ishani Manodha, முல்லைத்தீவு மாவட்டத்தில் முதலிடம் பெற்று மருத்துவ பீடத்துக்குத் தெரிவு செய்யப்பட்டுள்ள முஸ்லிம் மாணவியான M. Nidha Fathima ஆகியோருக்கும், நாடு பூராவும் பல்கலைக்கழக நுழைவுக்குத் தகுதி பெற்றுள்ள 175,527 மாணவர்களுக்கும் இந்தச் சபையில் பாராட்டுக்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

மேலும், திருக்கோவில் கல்வி வலயமானது மாவட்ட மட்டத்தில் முதலாம் இடத்தையும் கிழக்கு மாகாணத்தில் மூன்றாம் இடத்தையும் பெற்றுள்ளதுடன், 66.32 சதவீதத்தைப் பெற்று கிழக்கு மாகாணம் மாகாண ரீதியில் நான்காவது இடத்தைப் பெற்றுள்ளது. அம்பாறை மாவட்டத்தில் எல்லாத் துறைகளிலும் சித்தி பெற்றுள்ள அனைத்து மாணவர்களுக்கும், அவர்களது பெற்றோர்கள், ஆசிரியர்கள், அதிபர்கள், tutors, வலயக் கல்விப் பணிப்பாளர்கள், கோட்டக் கல்விப் பணிப்பாளர்கள், மாகாணக் கல்விப் பணிப்பாளர் உட்பட உதவிய அனைவருக்கும் எனது மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

மேலும், நான் சார்ந்த பொத்துவில் பிரதேச செயலகப் பிரிவில், Bio Science பிரிவில் 9 மாணவர்களும் கணிதப் பிரிவில் 3 மாணவர்களுமென மொத்தம் 12 பேர் அடங்கலாக சுமார் 40 மாணவர்கள் பல்கலைக்கழகத்துக்குத் தெரிவு செய்யப்பட்டுள்ளார்கள். குறிப்பாக, Fairooz Hanana, Abdul Sukoor Fathima Numa, Mohamed Zeinudeen Zaruth Jahan, Imtiaz Farwish Akthar, Firthouse Fathima Almas, Mohamed Makthoom Fathima Zeema, Alahudeen Abdullah, Mohamed Rizvy Mohamed Rifkhan, Sahabdin Mohamed Sakeeb, Sideek Aaqib Saja, Yazeer Kadafy Mohamed Haznain, Mohamed Anass Fathima Nazeeha ஆகியோருக்கு எமது மக்கள் சார்பாக பாராட்டுக்களைத் தெரிவித்துக் கொள்கின்றேன். இவர்கள் கற்ற பொத்துவில் மத்திய கல்லூரி, Al Israq Vidyalaya, Al-Kalam Vidyalaya, அல்-இர்பான் மகளிர் கல்லூரி, Future Academy, Seiku Thavood Memorial Centre, DEO, ZDE, PD, principals, parentsக்கும், Commerce, Arts பிரிவுகளில் பல்கலைக்கழகத்துக்குத் தெரிவுசெய்யப்பட்டுள்ள அனைத்து மாணவர்களுக்கும், PAC Lanka, Iqrah Tutory போன்றவற்றுக்கும், M.C. Hairath, A.B.M. Ashraf, N.T. Razudeen, M.S. Izzathul Azha உட்பட அனைத்து ஆசிரியர்களுக்கும் எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இம்முறை அம்பாறை மாவட்டத்தில் பல்லாயிரக் கணக்கான ஏக்கரில் நெற்செய்கை பண்ணப்படுகின்றது. அதில் பொத்துவில் பிரதேச செயலகப் பிரிவில் சுமார் 7,000 ஏக்கரில் செய்கை பண்ணப்படுகின்றது. இதற்குச் சுமார் 15,000 அந்தர் யூரியா தேவைப்படுகின்றது. இன்று வரைக்கும் 800 அந்தர் மட்டுமே வழங்கப்பட்டிருக்கின்றது. எனவே, மிகவும் விரைவாக எமது பிரிவுக்கான யூரியா உரத்தை வழங்க அரசு நடவடிக்கை எடுக்க வேண்டும் என்பதுடன், பீடைநாசினி, கிருமிநாசினிகளை வழங்குவதற்கும் நடவடிக்கை எடுக்க வேண்டும். Radella Scheme - anicut அமைக்கப்படுவதுடன், குளம் ஆழமாக்கப்பட்டால் சுமார் 1,300 ஏக்கர் வயல் நிலங்களில் செய்கை பண்ண முடியும் என்பதுடன், கிரான் கோவைப் பிரிவில் சுமார் 1,000 ஏக்கரில்

இரு போகங்கள் செய்கை பண்ண முடியும். எனவே, Radella Scheme இன்கீழ் குளம் ஆழமாக்கப்பட வேண்டும். அதன்மூலம் சுமார் 1,428 ஏக்கரில் நெற்செய்கையை சிறப்பாகவும் இலகுவாகவும் மேற்கொள்ளலாம். இதற்கு அரசானது விரைவில் நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

சம்மாந்துறை வலய வரிப்பத்தான்சேனை அல்-அமீன் மகா வித்தியாலயத்திற்கு விஞ்ஞான கூடம், ஆராதனை மண்டபம் என்பவற்றை அமைத்து வழங்க அரசு நடவடிக்கை எடுக்க வேண்டும். 2019 ஆம் ஆண்டு முன்னைய அரசால் இதற்கான நிதி ஒதுக்கப்பட்டிருந்தபொழுதிலும் வேலைகள் நடைபெற வில்லை என்பதை ஞாபகப்படுத்துவதுடன், அந்தப் பிரதேசத்தினுடைய உதவித் தவிசாளர் ஆசிக் அவர்களுக்கு இந்தச் சபையில் நன்றிகூறக் கடமைப்பட்டிருக்கிறேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொத்துவில் அமைந்துள்ள பிரதான பாடசாலைகளில் க.பொ.த. உயர் தரத்தில் Commerce, Arts பிரிவுகளில் சித்தியடைந்த மாணவர்களான Ms. Fathima Sahra, J. Rammika, Bazeer Ihzana, Maizoor Sanaz, Subuhan Fathima Sana, K. Nilaxy, K. Sabeezan, R. Tharmika, M.R. Sarafath Murthuja, S. Sareez Mohamed, Ashraff Aathil Ahamed ஆகியோருக்கு அப்பகுதி மக்கள் சார்பாக இந்த உயரிய சபையில் மனமார்ந்த பாராட்டுக்களைத் தெரிவித்துக் கொள்கின்றேன். மேலும், பொத்துவில் சிங்கபுர கிராமத்தைச் சேர்ந்த மீனவக் குடும்ப மாணவன் W.B. Keeth Mihiranka மருத்துவ பீடத்துக்குத் தெரிவு செய்யப்பட்டுள்ளார். Bandarawela National School மாணவரான இவருக்கும் பொத்துவில் மக்கள் சார்பாக எனது மனமார்ந்த பாராட்டுக்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මට තව පොඩි වේලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

கல்முனையில் உள்ள பழைய கச்சேரி என்று கூறப்படும் 1000 கால் மண்டபத்தில் CEB, SLTB, Inland Revenue Department, Labour Office, Land Registry, Coconut Development Board, NHDA office உட்பட பல அரச நிறுவனங்கள் இயங்கி வருகின்றன. இது மிகவும் பழமையானதாக இருப்பதனால் உடைந்து விழும் அபாயம் இருக்கின்றது. எனவே, விரைவாக இதனைத் திருத்தம் செய்ய அரசு நடவடிக்கை எடுக்க வேண்டுமென்பதுடன், உடனடியாக பொதுமக்கள் பாவனைக்கான “Toilet Complex”ஐ அமைக்கவும் நடவடிக்கை எடுக்க வேண்டும். பொத்துவில், அறுகம்பை, ஹிதாயாபுரம், திருக்கோவில், மருதமுனை, நிந்தவூர், கல்முனை, சாய்ந்தமருது, அட்டப்பளம், காரைதீவு, மாளிகைக்காடு உட்பட கரையோரப் பிரதேசங்களில் ஏற்பட்டுள்ள கடலரிப்பைத் தடுப்பதற்காக CCD அவசரமாக Geo bags இடுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இறுதியாக, பொத்துவில் பிரிவில் உள்ள புத்திஜீவிகளான M.I.M. Muthalib, M.I.M. Sameen, M.M.A. Gafour, A.L. Lafeer, M.I.M. Jawath, A.K. Mohamed Lebbei, Nafeeza Cawer, S. Meera Lebbei, A.K. Marikkar, S.A. Bawa, M.L.A. Raheem, C.B. Uthuma Lebbei, J. Kalander, N. Joufer Sathiq, N.P.A. Wahab, U.L.A. Haleem, S.L.M.A. Cader, M. M. Lafeer, M.L.M. Farook, M. S. A. Rahamathulla, A.M.A. Hakeem, M.S.A. Hakeem போன்றவர்களுக்கும், Hidayapuram கிராமத்தை உருவாக்கிய S. M. Meerasahibq, S.D.M. Hanifa, M.A. Azanar Lebbei, N.K.N. Joufer, A. Jamaldeen, J. Thajudeen, A.L.A. Manaff, M.H. Nazeer Kaleefa, M.H. Mubarak, S.T. Jamaldeen ஆகியோருக்கும் இந்தச் சபையில் நன்றி கூறி விடைபெற்றுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, අග්‍රාමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි 17ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.32]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මමත් අපේ ගරු සභානායකතුමා මුහුණ දුන්නු ප්‍රශ්නයට මුහුණ දුන්නා. ඒ තමයි, මේ කථාවට ලැහැස්ති වෙන්නේ කොහොමද කියන එක. අද දවස තුළ මේ විවාදයේදී විපක්ෂයෙන් මතු කළ කරුණුවලට පිළිතුරු කථාවක් කරන්න ඕනෑ නිසා මගේ කථාව ඉදිරිපත් කළ යුත්තේ කොහොමද කියන ප්‍රශ්නයට මම මුහුණ දුන්නා. ඒක ගැන හිතමින් විපක්ෂයෙන් ඉදිරිපත් කළ අදහස්, යෝජනා සහ විවේචන සියල්ලම සලකා බලන කොට, අප අද කථා කරන මාතෘකාව පිළිබඳව පැති දෙකකින් විවේචන එන බවක් තමයි මට හිතුණේ. පැති දෙකකින් විවේචන ආවා වාගේම ඒ පැති දෙක පරස්පරයි. කෙසේ වෙතත්, ඒ සම්බන්ධයෙන් පැති දෙකකින් විවේචන එන බවක් තමයි මගේ නිරීක්ෂණය වුණේ. එක අතකින් කියනවා, මේ ලබා දෙන සහන ප්‍රමාණය මදි, තවත් දෙන්න ඕනෑ, මෙහෙම දීලා වැඩක් නැහැ, මේ ප්‍රමාණය මදි, තවත් වැඩි කරන්න ඕනෑ, අර ගොල්ලන්ට දීලා නැහැ, මේ ගොල්ලන්ට දීලා නැහැ, මේක කෙරිලා නැහැ, ඒ නිසා මේ සහන වැඩි කරන්න ඕනෑ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් තැනකින් එනවා මම දැක්කා, "සහනාධාර" කියන සංකල්පයම ප්‍රශ්න කරන ස්වභාවයක්. එනම්, අපේ ආණ්ඩුව සහනාධාර මත යැපෙන ජනතාවක් හදාගෙන යනවා වාගේ එකකුත් කියන බවක් සමහරුන් කරපු කථා තුළින් මම නිරීක්ෂණය කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද අපේ රජයේ ප්‍රතිපත්තිය? ජනතාවට වග විය යුතු ආණ්ඩුවක් හැටියට, ජනතාවට වග විය යුතුයි කියන එක අපේ පරම වගකීමක් ලෙස භාර ගන්නා ආණ්ඩුවක් හැටියට සමාජ ආරක්ෂණය, සහනාධාර කියන එක පිළිබඳව තිබෙන අපේ ප්‍රතිපත්තිය මොකක්ද? පුරවැසියන් හැටියට ගත්තොත්, පුරවැසියා පවුලක සාමාජිකයෙක් වෙන්න පුළුවන්, කර්මාන්තකරුවෙක් වෙන්න පුළුවන්, ව්‍යාපාරිකයෙක් වෙන්නත් පුළුවන්. ඒ කවුරු වුණත් තම ජීවිත පිළිබඳ සුරක්ෂිතභාවය පුරවැසියන්ගේ ප්‍රධාන අවශ්‍යතාවක් කියලා අපි හිතනවා. ඒ සුරක්ෂිතභාවය තහවුරු වෙන්න ඕනෑ. තමන්ගේ ජීවිත ස්ථාවරත්වයෙන් යුතුව ගෙන යන්න පුළුවන් කියන එක ඔවුන්ට දැනෙන්න ඕනෑ; ඔවුන්ට හැඟෙන්න ඕනෑ.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

ඔවුන්ට තමන් ජීවත් වන සමාජය, ආයතනය, පවතින ආණ්ඩුව, නායකයන් පිළිබඳව විශ්වසනීයත්වයක් තිබෙන්න ඕනෑ. මේ සියල්ල අතරේ ඔවුන්ගේ ජීවිත plan කිරීමේදී, ඔවුන්ගේ ව්‍යාපාර, ඔවුන්ගේ අනාගතය, ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය පිළිබඳව තීන්දු තීරණ ගැනීමේදී ප්‍රතිපත්තිවල යම්කිසි අනුකූලතාවක් - policy consistency එකක් - තිබෙන්න ඕනෑ.

මේ සියල්ල සැලකිල්ලට ගනිමින් රජය හැටියට, ආණ්ඩුව හැටියට අප මේ සම්බන්ධයෙන් වග විය යුතුයි කියන එක මනින්නේ කොහොමද කියලා බලද්දී, මෙන්න මේ කාරණා සියල්ලම ජනතාව වෙනුවෙන් තහවුරු කරන එක අපේ ප්‍රධාන වගකීමක් වනවා. ඒක ඉටු කරන්න යනකොට තමයි "දිට්වා" කියන ස්වාභාවික ව්‍යසනය, ජාත්‍යන්තර වශයෙන් ඇති වෙලා තිබෙන යුද්ධය ආදියට මුහුණ දෙන්න අපට සිද්ධ වුණේ. එවැනි විවිධ දේවලට මුහුණ දෙන්න අපට සිද්ධ වෙනවා. ජනතාවට වග කියන රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට යහපත් ආණ්ඩුකරණයක් සිදු කරන කොට මොන කොන්දේසි තුළ වුණත් ජනතාවගේ ජීවිත යහපත් කිරීමට අවශ්‍ය වන විශ්වසනීයත්වය, ස්ථාවරභාවය, සුරක්ෂිතභාවය තහවුරු කිරීම අපේ වගකීමයි. ඒක තහවුරු කරන්න පුළුවන් ආණ්ඩුකරණයක් සහ ආයතනික ව්‍යුහයක් ගොඩ නඟන එක අපේ වගකීමක්. එතැනදී අප සලකන තවත් කාරණයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අප හිතන්නේ, අප පුරවැසියන් දිහා බලන්නේ තනි තනි පුද්ගලයන් හැටියට විතරක් නොවෙයි. මොකද, මිනිස් සමාජය කියන්නේ සාමූහිකයක්. අප සාමූහිකව වගකීම් දරනවා වාගේම සාමූහිකයක් හැටියට තමයි අප සංවිධානය වෙලා ඉන්නේ. අපි පවුලක් විතරකුත් නොවෙයි, අපි ප්‍රජාවක් - community එකක්. සමාජයක් විතරකුත් නොවෙයි, අපි මේ ලෝකයේත් පුරවැසියෝ. ඉතින්, මේ සාමූහිකය ගැනත් අපට හිතන්න වෙනවා. මොකද, අප සමාජයක් තුළ, සාමූහිකයක් තුළ ජීවත් වන බව මේ ඇති වන තත්ත්වයන් හමුවේ අපට නිතරම මතක් කරලා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප ජීවත් වන ලෝකය තුළ අපට තනියෙන් ගොඩ යන්න පුළුවන්, පුද්ගලයන් හැටියට ආරක්ෂා වෙලා අපේ පුද්ගල ජීවිත ගැන විතරක් හිතලා අපට ආරක්ෂා වෙන්න පුළුවන් කියලා හිතනවා නම්, ඒ සිතිවිල්ල කොච්චර වැරැදිද කියන එක අද ලෝකයේ සිද්ධ වෙන දේවල් තුළින් අපට දිනෙන් දින පෙන්නුම් කරලා දෙනවා. වෙනත් රටක යුද්ධයක් ප්‍රකාශ කරන කොට, ඒක අපට බලපානවා. ඒක සම්පූර්ණයෙන් අපේ පාලනයෙන් පිට සිද්ධ වන දෙයක්. වෙනත් රටක ගස් කපන කොට ඒක අපට බලපානවා. වෙනත් රටක පරිසර හානියක් සිද්ධ වන කොටත් ඒක අපට බලපානවා. වෙනත් රටක වැරැදි ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන කොටත් අපට බලපානවා. කොහේ හරි ඈත රටක් වුණත් කොයි වෙලාවක හරි බෝවන රෝගවලට එන්නත් කරන එක නවත්වනවා කියලා තීරණය කළොත්, ඒකෙන් ලෝක වසංගත තත්ත්වයන් ඇති වෙන්න පුළුවන්. අප එවැනි ලෝකයක් තුළ ජීවත් වන නිසා යහපත් ආණ්ඩුකරණයේදී එවැනි ඕනෑම තත්ත්වයකට මුහුණ දෙන්න සිදු වන බව වාගේම සමස්තයක් තුළ, සාමූහිකයක් තුළ ජීවත් වනකොට අප එකිනෙකාට සම්බන්ධයි කියන එක අමතක කරලා කටයුතු කරන්න බැහැ.

එහෙම නම් අපි මොන විධියටද මේ රට ගොඩ නඟන්න ඕනෑ. අපේ මේ රට ගැන විතරක් හිතලා, අපේ මේ දූපත ගැන විතරක් හිතලා නොවෙයි අපට කටයුතු කරන්න වෙන්නේ. Internal conditions අපේ පාලනය යටතේ නේ තිබෙන්නේ. නමුත් ඊට එහා ගිහිල්ලා external conditions තුළ, අපට පිටස්තර, බාහිර කොන්දේසි හෝ තත්ත්වයන් තුළ එන්න පුළුවන් චලනවලට රටක් හැටියට අප ශක්තිමත්ව මුහුණ දෙන්නේ කොහොමද කියන එකත් සැලසුම් කරගෙන, ඒවාට මුහුණ දීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගනිමින් තමයි අපි ආණ්ඩුකරණයේ යෙදෙන්න ඕනෑ. අපේ ආණ්ඩුවට මුහුණ දෙන්න සිද්ධ වුණු අනපේක්ෂිත තත්ත්වයන් දෙකේදීම අපි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ අන්න ඒ අන්දමින්. උදාහරණයක් හැටියට, "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේ රුපියල් බිලියන 500ක් ඒ ආපදාව වෙනුවෙන් වියදම් කරන්න අපට පුළුවන් වුණා. මම මේ සභාවට එන්න කලින් අමාත්‍යාංශ විසිපහේම ගරු ලේකම්වරුන් එක්ක සාකච්ඡාවක් කළා. අපි ඊයේ Presidential Task Force එකේ කථා වුණු පරිදි, අප ඒ ලේකම්වරුන් එක්ක කථා කළේ ඒ රුපියල් බිලියන 500 වියදම් කිරීම පිළිබඳවයි. එතැනදී ඒක වියදම් කිරීමේදී බිමටම යන ක්‍රියාවලිය පිළිබඳ අපි සමාලෝචනයක් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඒක ඉවර කරගෙන, ඒකට මැදිහත් වෙමින් යනකොට තමයි අපට මේ යුද තත්ත්වයටත් මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒකටත් අපේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කර තිබෙන ඒ සමාජ ආරක්ෂණ ක්‍රියාවලිය ඊයේ ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන වැදගත් වන කරුණ මේකයි. මේ රුපියල් බිලියන 500 වියදම් කරන්නේත්, ඊයේ ප්‍රකාශයට පත් කරපු ඒ සහන පැකේජ් එක සකස් කර තිබෙන්නේත් අපි මේ යන දිශාව, මේ රට කළමනාකරණය කරමින්, සංවර්ධනය කරමින් යන ඒ ගමන් මඟට හානියක් නොවන විධියටයි. ඒක කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. මම හිතන්නේ, එතැනදී තමයි අප test වෙන්නේ. ගරු සභානායකතුමා කිව්වා, අපේ litmus test එක වෙන්නේ මේ අවස්ථාව අපි කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක මතයි කියලා.

අපි මේ සියල්ලම කරන්නේ මුදල් අච්චු ගහලා නොවෙයි. මම දැක්කා, කොතැනක හරි කියැවිලා තිබුණා, "අපි නම් ආධාර දෙනකොට රුපියල් 5,000 සියලුදෙනාටම දුන්නා" කියලා. එදා ඒ රුපියල් 5,000 දුන්නේ කොහොමද? මුදල් අච්චු ගහලා. ඒ තුළ මොකක්ද ඊට පස්සේ සිද්ධ වුණේ? මුදල් අච්චු ගහලා විතරක් නොවෙයි, රටට දරාගන්න බැරි විධියේ ණය කන්දරාවක හිර කරලා තමයි ඒක සිද්ධ වුණේ. ඒකට මේ රටේ තිබෙන සම්පත් විකුණන්න සිද්ධ වුණා. ඒ විතරකුත් නොවෙයි, ජාත්‍යන්තරව අපේ තිබුණු සම්බන්ධතා ඉතාම අවුල් තැනකට පත් කරමින් තමයි ඒවා සිද්ධ වුණේ. නමුත්, අපි මේ අරගෙන තිබෙන ක්‍රියාවලිය තුළ, ජනතාව වෙනුවෙන් අපි අරගෙන තිබෙන මේ තීන්දු-තීරණ තුළ, ඒ මැදිහත්වීම තුළ, මේ අර්බුදයේදී අභියෝගයට පත්වන ඒ ජනතාවට, ඒ ව්‍යසනයට විශේෂයෙන්ම හසුවන ජනතාවට අපි මේ සහන දෙන්නේත්, මේ සමාජ ආරක්ෂණය තහවුරු කරන්නේත් මුදල් අච්චු ගහලාවත් නොවෙයි, දරාගත නොහැකි විධියට ණය වෙමිනුත් නොවෙයි, අපේ සම්පත් විකුණලාත් නොවෙයි, අපේ ජාත්‍යන්තර සම්බන්ධතාවලදී අපි පවත්වාගෙන යන අපක්ෂපාතී ප්‍රතිපත්තිය පාවා දීලාත් නොවෙයි. ඒ කිසිවක් නොකර අපි මේ කටයුත්ත කරන අතර, අපේ සංවර්ධන ක්‍රියාවලියත් අපි ඒ විධියටම පවත්වාගෙන යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ සියල්ල කරන අතර අපි සැලසුම් කරලා තිබුණු විධියට Pettah Central Bus Stand එක repair කළා. හෙට Fort Railway Station එකේ ප්‍රතිසංස්කරණ කටයුතු පටන් ගන්නවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඒ විධියටම සිද්ධ වෙනවා. කෘෂිකර්මයට අදාළ වාරිමාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය සිද්ධ වෙනවා. හෙට අලුත් සහල් මංගල්‍යය අනුරාධපුරයේ පවත්වනවා. අපේ පෙරහැරවල්, අපේ සංස්කෘතික කටයුතු අපි කරනවා. අලුත් අවුරුද්දට කරන්න ඕනෑ චාරිත්‍ර වාරිත්‍ර සියල්ලම කරන්න අපි සූදානම් වෙමින් ඉන්නේ. සාම පාගමනකුත් එනවා, ලංකාවට. මම හිතන්නේ, "ආලෝකා" කියන බල්ලාත් එනවද කොහෙද ඒ සුප්‍රසිද්ධ සාම පාගමනේ - peace march එකේ - star හැටියට. මේ සියල්ලම සිදුවන අතර තමයි අපි මේ අර්බුදවලටත් මුහුණ දෙන්නේ.

අපේ සමස්ත සැලසුම තුළ තිබෙන ඒ අරමුණු කිසිවක් පාවා නොදී, ඒවායින් divert නොවී, අපි ඉතාම සූක්ෂම විධියට තිබෙන

තත්ත්වය, තිබෙන ප්‍රශ්න හඳුනාගෙන, ඉතාම හොඳ කළමනාකාරිත්වයකුත් පෙන්වමින් තමයි මේවා සියල්ලම කරන්නේ. අපේ ගරු ජනාධිපතිතුමා ඊයේ කළ කථාව තුළත්, අපි ඒ තෝරාගත් මැදිහත් වීම් දෙසත් බලනකොටත් ඒ කළමනාකාරිත්වය තේරෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආර්ථිකයට අවදානම් වන තැන්වලට තමයි අපි මැදිහත් වෙන්නේ. ඒ කියන්නේ, සමස්ත ජන ජීවිතයට බලපාන තැන්වලට. ආර්ථිකය කඩා වැටෙන්නත් නොදී, අපේ ආහාර සුරක්ෂිතතාවත් තහවුරු කරමින් අපි කටයුතු කරනවා. ඒ නිසා තේ කෘෂිකර්මයටයි, ධීවර කර්මාන්තයටයි අපි විශේෂයෙන් මැදිහත් වෙන්නේ.

ජනතාවගේ ජන ජීවිතයට බලපාන ප්‍රවාහනයට මැදිහත් වෙමින්, විදුලි බිල වැඩි වන කොට එතැනදීත් යම් සහනයක් දෙමින්, ඒ සියල්ල සලකා බලමින්, ඒ සියල්ල කරන අතරම එදිනෙදා ජන ජීවිතයත් පවත්වාගෙන යෑමට අවශ්‍ය සාධක තවත් ශක්තිමත් කරන්නේ කොහොමද කියන එක ගැන අවධානය යොමු කරමින් තමයි අපි කටයුතු කරගෙන යන්නේ. මේ සහන පැකේජය ලබා දීමේ බලාපොරොත්තුවත් එයයි. අපි ඉතාම පැහැදිලිව ඉන්න ස්ථාවරය මොකක්ද? මොන අභියෝගය, මොන ප්‍රශ්නය ආවත් අප පුළුවන් තරම් උත්සාහ කරන්නේ සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යන්න අවශ්‍ය කොන්දේසි කොහොම හරි සපුරා ගන්නයි. අප බලාපොරොත්තු වන්නේ රට වහලා එය කරන්න නොවෙයි. දිනෙන් දින සිද්ධ වන දේ ගැන ඉතාම කිට්ටුවෙන් සහ ඉතාම ඕනෑකමින් නිරීක්ෂණය කරමින්, ඒවා ගැන අධ්‍යයනය කරමින්, අවශ්‍ය උපදෙස් අරගෙන ඒ වෙනස් වන තත්ත්වයන්ට අනුව තමයි අපි ගැටලුවලට මුහුණ දෙන්නේ.

අපි මුලින්ම බැලුවා, ඉන්ධන භාවිතයේ පාලනයක් සිදු කරන්නේ කොහොමද කියලා. ඒ සඳහා QR code එක ගෙනාවා. QR code එක මුලදී ආපු තත්ත්වයට වඩා වෙනස් කරමින්, වෙන්න ඕනෑ modifications කළා. එය තවදුරටත් පාලනය කරන්න ඕනෑ නිසා බදාදා රජයේ නිවාඩු දිනයක් හැටියට ප්‍රකාශ කරන්න ඕනෑ කියලා අපි තීරණය කළා. අපි ඒකත් කළා. සති 3කින් පමණ ඒ තීරණය වෙනස් කළ යුතු තත්ත්වයක් ආවාම අපි ඒ තීරණය වෙනස් කළා. අපි මොකක් හෝ එකක එල්බගෙනම ඉන්නේ නැහැ. දිනෙන් දින සිද්ධ වන දේවල් අනුව අපි වෙනස්කම් සිදු කරනවා. ඒ කියන්නේ, ජනතාවගේ ප්‍රශ්න පිළිබඳ ඉතාම කිට්ටුවෙන් තමයි, සමීප අවබෝධයක් ඇතිව තමයි මේ තීන්දු තීරණ ගන්නේ. අපි වගකීම් විරහිතව කිසිම තීරණයක් අරගෙන නැහැ. මම දන්නේ නැහැ, මේ සියලුම ක්ෂේත්‍ර එක්ක ජනාධිපතිතුමා රැස්වීම් කීයක් නම් තියන්න ඇද්ද කියලා. සියලුදෙනා එක්ක සාකච්ඡා කරමින්, එනම් විපක්ෂයේ කණ්ඩායම් එක්ක සාකච්ඡා කරමින්, විශේෂයෙන්ම ඒ තත්ත්වයට මුහුණ දෙන ප්‍රජාවන් එක්ක සාකච්ඡා කරමින්, මලෙයිගම් ප්‍රජාව එක්ක වෙනම සාකච්ඡා කරමින්, ඒ සියලුම කණ්ඩායම් එක්ක සාකච්ඡා කරමින් තමයි අපි මේ තීන්දු තීරණ අරගෙන තිබෙන්නේ. ඒ වාගේම අපි ඒ තීන්දු තීරණ අවශ්‍ය පරිදි වෙනස් කරනවා. අද ගන්නා තීරණය, ඉදිරියේදී වෙනස් වන තත්ත්වයන් අනුව ආයෙත් වෙනස් කරන්නත් සිද්ධ වෙන්න පුළුවන්.

විපක්ෂයේ සමහර අය අපෙන් අහනවා, මෙහෙම කළේ නැත්තේ ඇයි, හරම කළේ නැත්තේ ඇයි, සබ්මැරීන් එක එනවා කියලා දැනගෙන හිටියේ නැත්තේ ඇයි, ඊළඟ සබ්මැරීන් එක කොහෙන්ද එන්නේ කියලා දැනගන්නේ නැත්තේ ඇයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකය ගැනවත්, සාමාන්‍ය ජීවිතය ගැනවත් කිසිම ප්‍රායෝගික අත්දැකීමක් නැති කෙනෙකුට, නැති අයට තමයි ඔහොම කථා කරන්න පුළුවන් වෙන්නේ. පිටස්තරයෙකු හැටියට මේ දිහා බැලුවොත් මට කියන්න පුළුවන් එක දෙයක් වන්නේ, ජනතාවගේ ජන ජීවිත පිළිබඳ ඉතාම හොඳ දැනීමක්, සංවේදීකමක් එක්ක මේ ආණ්ඩුව මේ තීන්දු තීරණ ගන්නා බවයි. හැම තිස්සේම අපේ අවධානය කොතැනටද යොමු වෙලා තිබෙන්නේ. ඒ වෙන කාගේවත් දිහාවට නොව මේ රටේ ජනතාවගේ ජීවිත තවදුරටත් සුරක්ෂිත කරන්නේ කොහොමද කියන කාරණයටයි. මොන කොන්දේසිය තුළ වුණත් අප ඒ තත්ත්වය ආරක්ෂා කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් තමයි අපේ ප්‍රථම සහ අවසාන අවධානය යොමු වන්නේ. අපි අපේ අවධානය දෙන්නේ එතැනටයි. ඇත්තටම ආණ්ඩුවක් අවශ්‍ය වෙන්නේ ඒක කරන්නයි. ආණ්ඩුවේ අවසාන වගකීම එතැනයි තිබෙන්නේ. එහෙම නැතිව අර්බුදයකින් හෝ ආණ්ඩුකරණය හරහා ආණ්ඩුවේ ඉන්න අය තවත් ශක්තිමත් කරන එක නොවෙයි, ඒ අය ආරක්ෂා කරන එක නොවෙයි අපේ වගකීම වන්නේ. මා හිතන විධියට, අපේ ගරු සභානායකතුමාත් කියපු විධියට අපව politically audit කරනවා නම් audit කරන්න ඕනෑ තැන එතැනයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙයයි. බදු සහනාධාර ඕනෑ නැහැ කියන ස්වරයත් එක්ක මට ඇහුණා, බදු ගෙවන සහ බදු නොගෙවන කියලා කොටස් දෙකක් තිබෙනවා වාගේ කාරණාවක්. එවැනි කතන්දරත් සමහරු කියනවා මට ඇහුණා. එහෙම එකක් නැහැ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ සියලු දෙනාම බදු ගෙවනවා. එහෙම නම් අප කරගෙන යන මේ සමාජ ආරක්ෂණ ක්‍රියාවලිය කියන්නේ අපි කාටවත් කරන favour එකක් නොවෙයි. ඒවා පුරවැසියන්ගේ අයිතිවාසිකම්. අපේ රටේ සියලුම පුරවැසියන්ගේ අයිතිවාසිකම් තමයි අප මේ තහවුරු කරමින් යන්නේ, ආරක්ෂා කරමින් යන්නේ. කිසිම ප්‍රජාවක්, කිසිම කෙනෙක් අපි අතහරින්නේ නැහැ. කිසිම කෙනෙක් අවැදගත් නැහැ; ඒ සියලු දෙනාම අපට වැදගත්. විශේෂයෙන් ඓතිහාසික හේතු නිසාත්, ඒ ඓතිහාසික තත්ත්වයන් තුළ සෑම ව්‍යසනයකින්ම ඉතාම තදබල ලෙස ඒ ව්‍යසනයේ victimsලා බවට පත් වෙන අයට අපේ විශේෂ අවධානය යොමු කර තිබෙනවා. අපි එසේ අවධානය දිය යුතුයි. ඒ නිසා තමයි එම විශේෂ කණ්ඩායම් පිළිබඳව අපේ විශේෂ අවධානයක් යොමු කරමින් මේ සහනාධාර, සමාජ ආරක්ෂණ ක්‍රියාවලිය තහවුරු කරන්නේ.

ඒ සඳහා විපක්ෂයේ සිටින සියලු ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් යෝජනා අපට වැදගත් වෙනවා. එම ජනතාව වෙනුවෙන් ඉදිරිපත් කරන ඒ වැදගත් අදහස් සහ සියලු යෝජනා අපි භාර ගන්නවා. අපි ඒවා ගැන සාකච්ඡා කරනවා. ඒක තමයි අපි 225දෙනාගේ වගකීම. අවසාන වශයෙන් ජනතාව තමයි අපි සාර්ථකද, අසාර්ථකද කියන එක කියන්නේ. ඒක විපක්ෂයටත් එහෙමයි; අපටත් එහෙමයි. ඒ වෙනුවෙන් අපි වැඩ කරමු. මට කාලය ලබාදීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු අගමැතිතුමිය.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.51ට, 2026 අප්‍රේල් 09වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.51க்கு, பாராளுமன்றம் 2026 ஏப்பிரல் 09, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.51 p.m. until 9.30 a.m. on Thursday, 09th April, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர்  தமது உரையின்  இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.